# ශ්‍රී ලංකාවේ සුළු පරිමාණ කෘෂිකර්මාන්තයෙ හි තරුණ සහභාගීත්වය අඩුවීමට බලපාන සාධක

එම්.කේ. නදීකා දමයන්ති
ආර්.එම්.එම්.එච්.කේ. රම්බොඩගෙදර



1. 3

HARTI

2014/12
2015/11

# ශ්‍රී ලංකාවේ සුළු පරිමාණ කෘෂිකර්මාන්තයෙ හි තරුණ සහභාගීත්වය අඩුවීමට බලපාන සාධක

එම්.කේ. නදීකා දමයන්ති

ආර්.එම්.එම්.එච්.කේ. රම්බොඩගෙදර

සිංහල පරිවර්තන අංක: 04

2013 ජුලි

24183

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ 07.

24183

24183

පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

පළමු ප්‍රකාශනය: 2013 ජූලි

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පර්යේෂණ අධ්‍යයන අංක 154 වූ Factors Affecting Less Youth Participation in Smallholder Agriculture in Sri Lanka පර්යේෂණ වාර්තාවේ සිංහල පරිවර්තනය

© 2013, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

සියලු ම හිමිකම් ඇවිරිණි.

පිට කවර සැකසුම : උදේනි කරුණාරත්න

පරිගණක ගතකිරීම සහ පිටු සැකසීම : එන්.ජී. කාංචනා සඳමාලි

ISBN: 978-955-612-155-1

## පෙරවදන

සමස්ත ජනගහනයෙන් 1/3ට ආසන්න වූ තරුණ පිරිස, මෙරට අමිල සම්පත් අතුරින් එකකි. කෙසේ වුව ද, විරැකියාවෙන් පෙළෙන්නන්ගෙන් අතිබහුතරය තරුණයින් වේ. අනෙක් අතට, මෙරට ශ්‍රම බලකායෙන් 33%ක් කෘෂිකාර්මික අංශයට තම දායකත්වය ලබාදුන්න ද, බොහොමයක් පොදු ජන සාකච්ඡාවන්හි දී කියැවෙන අන්දමට කෘෂිකර්මාන්තයේ දී තරුණ දායක්තවය අඩු මට්ටමක පවතී.

ශ්‍රී ලංකාවේ සුළු පරිමාණ කෘෂිකර්මාන්තයට තරුණ සහභාගීත්වය අඩුවීමට බලපා ඇති හේතු සාධක අනාවරණය කරගැනීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ විය. අධ්‍යයනයෙන් හෙළි කරනු ලබන්නේ නියැදියට ඇතුළත් වූ තරුණයින්ගෙන් 70% ආසන්න ප්‍රතිශතයක් පූර්ණ කාලීනව, අර්ධ කාලීනව හෝ වැටුප් නො ලබන පවුලේ ශ්‍රමිකයින් ආදී වශයෙන් කුමන හෝ පදනමකින් කෘෂිකර්මාන්තයේ නියැලෙන බවයි. තව ද, අලෙවිකරණ ගැටලු, තම ශ්‍රමය සඳහා වන ලාභය අඩුවීම, රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් පවතින පහළ මට්ටමේ සමාජ පිළිගැනීම, අවිනිශ්චිතතාව, පවතින මූලික සම්පත්, පුහුණුවීම් සහ තොරතුරු, ව්‍යාප්ති සේවා, සමාජ ආරක්ෂණ ක්‍රමවේදයේ පවතින ගැටලු සහ ඒවාට ප්‍රවේශවීමේ ගැටලු කෘෂිකර්මාන්තයෙන් තරුණ ශ්‍රමය ඈත්කිරීමට හේතුවන බව අධ්‍යයනයෙන් හෙළි කෙරේ. කෘෂිකර්මාන්තයේ තරුණ සහභාගීත්වය දිරිමත් කිරීම සඳහා මහෝපකාරීවන උපක්‍රම රාශියක් අධ්‍යයනය අවසානයේ දී පර්යේෂණ කණ්ඩායම විසින් නිර්දේශ කරනු ලබයි.

මෙම අධ්‍යයනය සාර්ථකව නිම කිරීම සම්බන්ධයෙන් මාගේ සුභාශිංසනය පර්යේෂණ කණ්ඩායමට පුද කරමි. තවද, අධ්‍යයනයේ සොයාගැනීම් සහ නිර්දේශ ශ්‍රී ලංකාවේ සුළු පරිමාණ කෘෂිකර්මාන්තයේ තරුණ සහභාගීත්වය වර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින්ට ඉතාමත් ප්‍රයෝජනවත් වනු ඇති බව මාගේ විශ්වාසයයි.

**ටී.එම්. අභයරත්න**

**අධ්‍යක්ෂ**

# ප්‍රණාමය

මෙම අධ්‍යයනය සඳහා අවශ්‍ය වන වටිනා තොරතුරු සපයා දුන් තරුණ/තරුණියන්ටත්, ගොවි සංවිධානවල සාමාජික/සාමාජිකාවන්ටත් අපගේ හෘදයාංගම ස්තුතිය පළ කරන්නෙමු. එමෙන් ම, අධ්‍යයන ප්‍රදේශවල කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්/වරියන් සහ කෘෂිකර්ම උපදේශකවරුන්/වරියන් ලබාදුන් සහයෝගයට බෙහෙවින් ස්තුතිවන්ත වෙමු.

මෙම අධ්‍යයනය නිම කිරීම සඳහා අවශ්‍ය පරිපාලන සහාය ලබාදුන් ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ලලිත් කාන්ත ජයසේකර මහතාටත්, වාර්තාව මුද්‍රණය කිරීමට අවශ්‍ය පරිපාලන සහාය ලබාදුන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ වත්මන් අධ්‍යක්ෂ ටී.එම්. අභයරත්න මහතාටත් අපගේ ස්තුතිය පිරිනැමේ. අධ්‍යයනයට අවශ්‍ය සහාය නිරන්තරයෙන් ලබාදෙමින් වාර්තාවේ මුල් කෙටුම්පත හි අඩුලුහුඩුකම් පෙන්වා දුන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අතිරේක අධ්‍යක්ෂ ආචාර්ය එල්.පී. රූපසේන මහතාටත්, කෘෂිකාර්මික ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති ඇගයීම් අංශයේ අංශ ප්‍රධාන ජේ.කේ.එම්.ඩී චන්ද්‍රසිරි මහතාටත් අපගේ ස්තුතිය පිරිනැමේ. වාර්තා කෙටුම්පත හි ගුණදොස් පෙන්වාදුන් කොළඹ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය පූජ්‍ය ඩබ්. විමලරතන හිමිපාණන්ටත්, මොරටුව විශ්වවිද්‍යාලයේ මහාචාර්ය එස්.ටී.පී. පීරිස් මහතාටත් අපගේ ස්තුතිය පිරිනැමේ.

ක්ෂේත්‍ර තොරතුරු රැස්කිරීමේ දී හෙ.කො.ගො.ප.පු. ආයතනයේ හිටපු සංඛ්‍යාන සහකාර ආර්.පී. සේනාධීර මෙනවිය සහ අනියම් විමර්ශකවරුන් වූ පී.ඒ.සී. විජේධම්ම සහ ආර්.එම්.පී.සී. සිල්වා යන මහත්වරුන් දැක් වූ සහාය සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙමු. එමෙන් ම, දත්ත විශ්ලේෂණයෙන් සහාය වූ හෙ.කො.ගො.ප.පු ආයතනයේ ජ්‍යෙෂ්ඨ වැඩසටහන් විශ්ලේශක එම්.එල්.ඩී. සෙනරත් මහතාටත් අපගේ ස්තුතිය පිරිනැමේ.

වාර්තාවේ ඉංග්‍රීසි පිටපත හි සංස්කරණ කටයුතු සිදු කළ මහාචාර්ය ඩබ්.අයි. සිරිවීර මහතාටත්, වාර්තාව මුද්‍රණයෙන් පළ කිරීමට අවශ්‍ය සියලු කටයුතු සිදු කළ ප්‍රකාශන හා මුද්‍රණ ඒකකයේ කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් අපගේ ස්තුතිය පිරිනැමේ.

**එම්.කේ. නදීකා දමයන්ති**
**ආර්.එම්.එම්.එච්.කේ. රම්බොඩගෙදර**

## සංක්ෂේපය

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ සුළු පරිමාණ කෘෂිකර්මාන්තය සඳහා තරුණ සහභාගීත්වය අඩුවීමට බලපා ඇති හේතු සාධක විමසා බැලීම ය. මෙහි විශේෂිත අරමුණ වූයේ, රැකියාවක් වශයෙන් කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් තරුණ පිරිසගේ අදහස් විමසා බැලීම, තරුණයින් කෘෂිකර්මාන්තයට ඇදගැනීමටත්, ඉන් බැහැර කිරීමටත් බලපා ඇති සාධක හඳුනාගැනීම සහ විශ්ලේෂණය කිරීමත්, සුළු පරිමාණ කෘෂිකර්මාන්තයට තරුණ සහභාගීත්වය වැඩිකිරීම සඳහා තරුණයින් සහ අනෙකුත් හවුල්කාර පාර්ශවයන් වෙතින් ඉදිරිපත් වන අදහස් සාකච්ඡා කිරීමත් ය. ප්‍රාථමික දත්ත රැස් කිරීම ප්‍රශ්නාවලි, මූලික තොරතුරු සපයන්නන් හා ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා මාර්ගයෙන් සිදු විය. නුවරඑළිය, මාතලේ, හම්බන්තොට, අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල, අම්පාර, මඩකලපුව සහ මොණරාගල දිස්ත්‍රික්කවල ක්ෂේත්‍ර සමීක්ෂණය සිදු කෙරිණි. විශ්වවිද්‍යාල උපාධිධාරීන් සහ උපාධි අපේක්ෂකයින් ද ඇතුළත් වූ සමස්ත නියැදිය 533කි. ප්‍රතිචාරීන් සියලුදෙනා වයස අවුරුදු 15-29 කාණ්ඩයට අයත් වූහ.

තරුණ සහභාගීත්වයේ ස්වභාවය සහ ප්‍රමාණය, වගා ක්‍රමය සහ බෝගය අනුව වෙනස් වේ. සමස්ත නියැදියෙන් 70%ක් පූර්ණකාලීන, අර්ධකාලීන හෝ පවුලේ ශ්‍රමිකයින් වශයෙන් කෘෂිකර්මාන්තයට අදාළ විවිධ කාර්යන් හි නියුක්ත වූ අතර 7.3%ක් කෘෂිකර්මාන්තයට සම්බන්ධ කර්මාන්ත හෝ ව්‍යාපාරවල නිරත වූහ. සමස්ත නියැදියෙන් 58.2%ක් පූර්ණකාලීනව කෘෂිකර්මාන්තයේ නියැලීමට කැමති බව ප්‍රකාශ කළ අතර 39.6%ක් පූර්ණකාලීනව කෘෂිකර්මාන්තයේ නියැලීමට අකමැති බවත්, 2.3%ක් ඒ සම්බන්ධයෙන් තමන්ට පැහැදිලි අදහසක් නොමැති බවත් පැවසූ හ.

අනාගතයේ දී ද, පූර්ණකාලීන ව කෘෂිකර්මාන්තයෙන් නියැලීමට කැමැත්තෙන් පසු වූ ප්‍රතිචාරීන්ගෙන් බහුතරය කෘෂිකර්මාන්තයෙහි දිගුකාලීන අත්දැකීම් සහිත, ඉඩම් හිමි සහ ශ්‍රමය සපයාගත හැකි අය වූහ. අනෙක් අතට ඔවුන් බොහෝ දෙනෙක් 'යහපත් රැකියාවක්' සඳහා අවශ්‍ය පුහුණුවීම් හෝ ප්‍රමාණවත් හැකියාවන් සහිත අය නොවූ හ.

සුළු පරිමාණ කෘෂිකර්මාන්තයෙහි තරුණ සහභාගීත්වය, වයස, විවාහක/අවිවාහක බව, ගොඩ ඉඩම්, කුඹුරු ඉඩම්, ව්‍යාප්ති සේවා, අලෙවිකරණ පහසුකම් පැවතීම, ඒවාට ප්‍රවේශවීමේ හැකියාව සහ උසස් අධ්‍යාපනය යන සාධක සමග සැලකිය යුතු අන්දමින් සම්බන්ධ වේ. එමෙන් ම, ස්ත්‍රී/පුරුෂභාවය, කුඹුරු ඉඩම්වල ප්‍රමාණය, පවුලේ ආදායම, සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් හෝ විශ්‍රාම වැටුප් ක්‍රමයක් නොවීම, කෘෂිකර්මාන්තය සඳහා වන අඩු පිළිගැනීම හෝ පිළිගැනීමක් නොවීම ආදී සාධක ද කෘෂිකර්මාන්තයේ තරුණ සහභාගීත්වය සම්බන්ධයෙන් බලපානු ලබන සාධක වේ.

තරුණයින් කෘෂිකර්මාන්තයට ආකර්ෂණය කරගැනීම සඳහා යෝජනා රාශියක් ඉදිරිපත් කෙරේ. පවතින තරුණ ගොවි සමාජ ශක්තිමත් කිරීම, අවශ්‍ය සහාය ලබාදෙමින් වඩා ඵලදායී ආකාරයෙන් නව තරුණ

ගොවි සමාජ පිහිටුවීම, තරුණයින් සඳහා සමුපකාරික ක්‍රමයේ ව්‍යාපාර සහ කර්මාන්ත පිහිටුවීම, කෘෂිකර්ම උපදේශකවරුන් සංඛ්‍යාව ඉහළ දැමීම සහ ඔවුන් වෙතින් සැපයෙන සේවාවේ ගුණාත්මක භාවය වර්ධනය කිරීම, කෘෂිකර්මාන්තයට අදාළ අධි තාක්ෂණික ක්‍රමවේද හඳුන්වාදීම සහ ඒවා යොදාගෙන කෘෂිකර්මාන්තයේ නියැලීමට තරුණයින්ට සහායවීම, කෘෂිකර්මාන්තයට සම්බන්ධ රාජ්‍ය අංශයේ රැකියා (විශේෂයෙන් ම, අර්ධ ස්වායත්ත ආයතන සහ ව්‍යාප්ති සේවාව සඳහා) බඳවා ගැනීමේ දී කෘෂිකාර්මික පවුල්වල අයට විශේෂිත පංගු ක්‍රමයක් වෙන් කිරීම, තරුණ ගොවීන්ට අවම පොළී ප්‍රතිශත යටතේ ණය ලබාදීම සහ පුහුණුවීම් සැපයීම ඒ අතුරින් ප්‍රමුඛ වේ.

## පටුන


| | | |
|---|---|---|
| පෙරවදන | | i |
| ප්‍රණාමය | | ii |
| සංක්ෂේපය | | iii |
| පටුන | | v |
| වගු සටහන් ලැයිස්තුව | | viii |
| රූ සටහන් ලැයිස්තුව | | x |
| සිද්ධි අධ්‍යයන | | xi |
| කෙටි යෙදුම් | | xii |
| පළමු වැනි පරිච්ඡේදය | | 01 |
| හැඳින්වීම | | 01 |
| 1.1 | පසුබිම | 01 |
| 1.2 | අධ්‍යයන ගැටලුව | 03 |
| 1.3 | අරමුණු | 03 |
| 1.4 | උපකල්පන | 03 |
| 1.5 | පර්යේෂණ ක්‍රමවේදය | 04 |
| 1.5.1 | මූලාශ්‍ර සහ දත්ත රැස්කිරීම | 04 |
| 1.5.2 | අධ්‍යයන ප්‍රදේශය සහ නියැදියේ ප්‍රමාණය | 05 |
| 1.5.2.1 | අධ්‍යයන ප්‍රදේශය | 05 |
| 1.5.2.2 | නියැදියේ ප්‍රමාණය | 06 |
| 1.6 | දත්ත විශ්ලේෂණය | 07 |
| 1.7 | වාර්තාවේ සැකැස්ම | 07 |
| දෙ වැනි පරිච්ඡේදය | | 08 |
| සාහිත්‍ය විමර්ශනය | | 08 |
| 2.1 | හැඳින්වීම | 08 |
| 2.2 | සුළු පරිමාණ කෘෂිකාර්මික අංශය | 08 |
| 2.3 | ශ්‍රී ලංකාවේ සුළු පරිමාණ කෘෂිකාර්මික අංශය | 09 |
| 2.4 | තරුණයින් | 13 |
| 2.5 | ආර්ථිකමය වශයෙන් සක්‍රීය, සේවා නියුක්ත සහ සේවා වියුක්ත යන්නෙහි අර්ථ නිරූපණ | 13 |
| 2.6 | ශ්‍රී ලංකාවේ තරුණ සේවා වියුක්තිය | 14 |




පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

2.7 පෙර සිදු කළ අධ්‍යයන 17

**තෙ වැනි පරිච්ඡේදය** 21
**ප්‍රතිචාරීන්ගේ සමාජ-ආර්ථික පසුබිම** 21

3.1 හැදින්වීම 21
3.2 ප්‍රතිචාරීන්ගේ ජන විද්‍යාත්මක පසුබිම 21
3.3 කෘෂිකාර්මික කටයුතුවලට තරුණ මැදිහත්වීම 28
3.4 ප්‍රතිචාරීන්ගේ ඉඩම් පරිහරණ රටාව 32
3.5 වෘත්තීමය පුහුණුවීම්වල තත්ත්වය 34
3.6 සමාප්තිය 38

**සිව් වැනි පරිච්ඡේදය** 39
**සුළු පරිමාණ කෘෂිකර්මාන්තයෙහි තරුණ සහභාගීත්වය** 39

4.1 හැදින්වීම 39
4.2 කෘෂිකර්මාන්තයෙ හි තරුණ සහභාගීත්වය 39
4.3 කෘෂි පාදක කරගත් කර්මාන්ත සහ ව්‍යාපාරවල තරුණ සහභාගීත්වය 43
4.4 සමාප්තිය 45

**පස් වැනි පරිච්ඡේදය** 47
**කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් තරුණ ප්‍රජාවේ ආකල්ප** 47

5.1 හැදින්වීම 47
5.2 පූර්ණ කාලීන රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තයෙ හි නියැලීමට ඇති කැමැත්ත 47
5.3 කෘෂිකර්මය පාදක කොටගත් කර්මාන්ත සම්බන්ධ තරුණ ආකල්ප 59
5.4 වඩාත් කැමති රැකියා සහ ඒවා තෝරා ගැනීමට හේතු 62
5.5 සමාප්තිය 67

**සය වැනි පරිච්ඡේදය** 69
**ගොවිතැනෙ හි දී තරුණයින් මුහුණ දෙන ගැටලු** 69

6.1 හැදින්වීම 69
6.2 කෘෂිකර්මාන්තයෙහි දී තරුණයින් මුහුණ දෙන ගැටලු 69
- 6.2.1 අලෙවි පහසුකම් 69
- 6.2.2 කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය 72
- 6.2.3 කෘෂිකාර්මික පුහුණු 74
- 6.2.4 ඉඩම් 75
- 6.2.5 කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ 78

6.2.6 බෝග රක්ෂණය 82
6.2.7 කෘෂිකාර්මික යෙදවුම් 83
6.2.7.1 පොහොර 83
6.2.7.2 බීජ/රෝපණ ද්‍රව්‍ය 84
6.2.7.3 කෘමිනාශක/වල්නාශක 85
6.2.8 කෘෂිකාර්මික තොරතුරු 86
6.2.9 වාරි පහසුකම් 86
6.2.10 සමාජ වටිනාකම් 88
6.3 අනෙකුත් ආයතනික යාන්ත්‍රණ 88
6.4 සමාප්තිය 91

**සත් වැනි පරිච්ඡේදය** 93
**කෘෂිකර්මාන්තයෙ හි තරුණ සහභාගීත්වය වර්ධනය සඳහා වූ යෝජනා** 93
7.1 හැඳින්වීම 93
7.2 බෝග වගාවෙ හි තරුණ සහභාගීත්වය වර්ධනයට යෝජනා 93
7.3 කෘෂිකාර්මික කර්මාන්ත/ව්‍යාපාරවල තරුණ සහභාගීත්වය වර්ධනයට යෝජනා 98
7.4 සමාප්තිය 100

**අට වැනි පරිච්ඡේදය** 101
**සාරාංශ සහ යෝජනා** 101
8.1 සාරාංශය 101
8.2 ප්‍රතිපත්ති නිර්දේශ 104
8.2.1 රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තය සඳහා සමාජ සහ ආයතනික ක්ෂේත්‍රවල පවතින අඩු පිළිගැනීම 104
8.2.2 ව්‍යාප්ති සේවාවට අදාළ ගැටලු 105
8.2.3 තරුණ ගොවි සමාජ හා බැඳුණු ගැටලු 107
8.2.4 කෘෂි පාදක කරගත් කර්මාන්ත සහ ව්‍යවසායන් හා බැඳුණු ගැටලු 108
8.2.5 අලෙවි පහසුකම් සම්බන්ධ ගැටලු 109
8.2.6 මූලික පහසුකම් හා සම්බන්ධ ගැටලු 110
8.2.7 සමාජ ආරක්ෂණ ක්‍රමය හා කෘෂි රක්ෂණ සම්බන්ධ ගැටලු 112
8.2.8 තරුණයින් සඳහා වන වයස් සීමාව 112
8.2.9 සමාජ සාධාරණත්වය, යහ පාලනය සහ සමානාත්මතාව 112
8.3 වැඩිදුර පර්යේෂණයට ලක් කළ යුතු ක්ෂේත්‍ර 114

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය** 115

# වගු සටහන් ලැයිස්තුව


| | | |
|---|---|---|
| වගුව 1.1 | අධ්‍යයන ප්‍රදේශ සහ අදාළ ප්‍රදේශයේ වගා කරන ප්‍රධාන බෝගය | 06 |
| වගුව 2.1 | ප්‍රධාන ආර්ථික කාර්යය අනුව සේවා නියුක්තිය ('000) | 11 |
| වගුව 2.2 | සුළු පරිමාණ ඉඩම් කැබලි සංඛ්‍යාව සහ භූමි වපසරිය-2002 | 12 |
| වගුව 2.3 | තරුණ සේවා වියුක්තිය (අවුරුදු 15-29 වයස් කාණ්ඩය) | 15 |
| වගුව 3.1 | වයස සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව නියැදිය | 21 |
| වගුව 3.2 | වයස් කාණ්ඩය සහ විවාහක/අවිවාහක භාවය අනුව නියැදිය | 22 |
| වගුව 3.3 | ජනවාර්ගිකත්වය අනුව නියැදිය | 22 |
| වගුව 3.4 | ප්‍රාථමික රැකියාව සහ වයස අනුව නියැදිය | 25 |
| වගුව 3.5 | ස්ත්‍රී/පුරුෂ භාවය අනුව අධ්‍යයන මට්ටම | 27 |
| වගුව 3.6 | කෘෂිකර්මාන්තයට සම්බන්ධ ක්‍රියාකාරකම්වල යෙදීම | 28 |
| වගුව 3.7 | ස්ත්‍රී/පුරුෂ භාවය අනුව කෘෂි ක්‍රියාකාරකම්වල යෙදෙන ආකාරය | 28 |
| වගුව 3.8 | වගාකළ බෝගය/ක්‍රියාකාරකම | 29 |
| වගුව 3.9 | කෘෂිකර්මාන්තයේ යෙදෙන ආකාරය | 31 |
| වගුව 3.10 | ඉඩම් හිමිකම | 32 |
| වගුව 3.11 | සාමාන්‍ය ඉඩම් වපසරිය | 33 |
| වගුව 3.12 | ස්ත්‍රී/පුරුෂ භාවය සහ වෘත්තීය පුහුණුවේ ස්වභාවය | 36 |
| වගුව 3.13 | වෘත්තීය පුහුණුව සහ එහි ප්‍රයෝජනවත් භාවය අනුව නියැදිය | 37 |
| වගුව 4.1 | කෘෂිකර්මාන්තයේ අත්දැකීම් සහිත වසර ගණන සහ කෘෂිකාර්මික කටයුතුවල නියැලීම අනුව ප්‍රතිචාරීන්ගේ විසිරීම | 41 |
| වගුව 4.2 | අධ්‍යාපන මට්ටම සහ කෘෂිකර්මාන්තයේ යෙදෙන ආකාරය අනුව ප්‍රතිචාරීන් නියැලෙන කෘෂිකාර්මික කටයුතු | 43 |
| වගුව 4.3 | කර්මාන්තයේ/ව්‍යාපාරයේ ස්වභාවය අනුව ප්‍රතිචාරීන් නියැලෙන කෘෂිකාර්මික ව්‍යාපාරය/කර්මාන්තය | 45 |
| වගුව 5.1 | වයස අනුව පූර්ණකාලීන කෘෂිකර්මාන්තයේ නියැලීමට ඇති රුචිකත්වය | 49 |
| වගුව 5.2 | කෘෂි ක්‍රියාකාරකම් සහ පූර්ණකාලීන කෘෂිකර්මාන්තයේ නියැලීමට ඇති රුචිකත්වය | 50 |
| වගුව 5.3 | විවාහක/අවිවාහක බව සහ පූර්ණකාලීන කෘෂිකර්මාන්තයේ නියැලීමට ඇති රුචිකත්වය | 52 |
| වගුව 5.4 | පූර්ණකාලීන රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තය තෝරාගැනීමට හේතු | 56 |
| වගුව 5.5 | පූර්ණකාලීන රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තයේ නියැලීමට අකැමැතිවීමට හේතු | 57 |
| වගුව 5.6 | කෘෂි පාදක කර්මාන්තවල නියැලීමට අකැමැතිවීමට හේතු | 59 |
| වගුව 5.7 | කෘෂි පාදක කරගත් කර්මාන්ත/ව්‍යාපාරවල නිරත නොවීමට හේතු | 61 |

වගුව 5.8 පූර්ණකාලීනව කෘෂිකර්මාන්තයේ නො යෙදෙන ප්‍රතිචාරීන්ගේ ස්ත්‍රී/පුරුෂ භාවය අනුව නියැලීමට වඩාත් කැමති රැකියාව 62

වගුව 5.9 පූර්ණ කාලීනව කෘෂිකර්මාන්තයේ නො යෙදෙන ප්‍රතිචාරීන්ගේ වයස අනුව නියැලීමට වඩාත් කැමති රැකියාව 63

වගුව 5.10 නියැලීමට වඩාත් කැමති රැකියාව සඳහා හේතු 64

වගුව 6.1 කෘෂි ක්‍රියාකාරකම් සහ අලෙවි පහසුකම්වල ප්‍රමාණවත් භාවය 70

වගුව 6.2 කෘෂි ක්‍රියාකාරකම් සහ ව්‍යාප්ති පහසුකම්වල ප්‍රමාණවත් භාවය 73

වගුව 6.3 කෘෂි ක්‍රියාකාරකම් සහ පුහුණු පහසුකම්වල ප්‍රමාණවත් භාවය 74

වගුව 6.4 කෘෂි ක්‍රියාකාරකම් සහ කුඹුරු ඉඩම් පවතින ප්‍රමාණය 77

වගුව 6.5 කෘෂි ක්‍රියාකාරකම් සහ හේන් ඉඩම් පවතින ප්‍රමාණය 78

වගුව 6.6 කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණවල ප්‍රමාණවත් බව අනුව ප්‍රතිචාරීන්ගේ විසිරීම 79

වගුව 6.7 කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණවල ප්‍රමාණවත් බව අනුව පූර්ණකාලීන ගොවීන්ගේ විසිරීම 80

වගුව 6.8 කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණවල ප්‍රමාණවත් බව අනුව අර්ධකාලීන ගොවීන්ගේ විසිරීම 81

වගුව 6.9 කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණවල ප්‍රමාණවත් බව අනුව පවුලේ ශ්‍රමිකයින් විසිරී ඇති ආකාරය 81

වගුව 6.10 නියැලෙන කෘෂිකාර්මික කටයුතු අනුව පවතින වගා රක්ෂණය සහ එය ලබාගැනීමේ හැකියාවේ ප්‍රමාණවත් බව 82

වගුව 6.11 කෘෂිකාර්මික කටයුතු අනුව පවතින බීජ සහ ඒවා ලබාගැනීමේ හැකියාවේ ප්‍රමාණවත් බව 85

වගුව 6.12 කෘෂිකාර්මික කටයුතු අනුව වල්නාශක සහ කෘමිනාශක ලබාගැනීමේ ප්‍රමාණවත් බව 85

වගුව 6.13 කෘෂිකාර්මික කටයුතු අනුව පවතින තොරතුරු පහසුකම් සහ ඒවා ලබාගැනීමේ ප්‍රමාණවත් බව 86

වගුව 6.14 වාරි පහසුකම්වල ප්‍රමාණවත් බව 87

වගුව 7.1 සුළු පරිමාණ කෘෂිකර්මාන්තයෙ හි තරුණ සහභාගීත්වය වර්ධනය සඳහා ප්‍රතිචාරීන්ගේ යෝජනා 96

වගුව 7.2 සුළු පරිමාණ කෘෂිකර්මාන්තයෙ හි තරුණ සහභාගීත්වය වර්ධනය සඳහා කෘෂිකර්ම උපාධිධාරීන් සහ උපාධි අපේක්ෂකයින් ඉදිරිපත් කළ යෝජනා 97

වගුව 7.3 කෘෂිකර්මයට සම්බන්ධ කර්මාන්තවල තරුණ සහභාගීත්වය වර්ධනය සඳහා වූ යෝජනා 99

වගුව 7.4 කෘෂි ව්‍යාපාර සහ කර්මාන්තවල තරුණ සහභාගීත්වය වර්ධනය සඳහා කෘෂිකර්ම උපාධිධාරීන්/උපාධි අපේක්ෂකයින් ඉදිරිපත් කළ යෝජනා 100

# රූ සටහන් වගුව


| | | |
|---|---|---|
| රූ සටහන 2.1 | ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයෙ හි ආංශික සංයුතිය (1980-2010) | 10 |
| රූ සටහන 3.1 | කාර්යය සහ වයස අනුව නියැදිය | 23 |
| රූ සටහන 3.2 | කාර්යය සහ ස්ත්‍රී/පුරුෂ භාවය අනුව නියැදිය | 24 |
| රූ සටහන 3.3 | ගෘහ ඒකකයේ යැපෙන්නන් සංඛ්‍යාව අනුව නියැදිය | 26 |
| රූ සටහන 3.4 | කෘෂිකාර්මික කටයුතුවල අත්දැකීම් සහිත වසර ගණන | 30 |
| රූ සටහන 3.5 | සියලු ආකාර ඉඩම්වල සමස්ත බිම් ප්‍රමාණයෙ හි සහ වගා කළ බිම් ප්‍රමාණයෙ හි සාමාන්‍ය | 34 |
| රූ සටහන 3.6 | වෘත්තීයමය පුහුණුවීම්වල සහභාගීත්වය | 35 |
| රූ සටහන් 4.1 | කෘෂිකාර්මික කටයුතුවල යෙදෙන ආකාරය අනුව ප්‍රතිචාරීන් | 39 |
| රූ සටහන් 4.2 | ස්ත්‍රී/පුරුෂ භාවය අනුව කෘෂිකාර්මික කටයුතුවල නිරත ප්‍රතිචාරීන්ගේ විසිරීම | 40 |
| රූ සටහන් 4.3 | වයස් කාණ්ඩ අනුව කෘෂිකර්මාන්තයේ නියුතු ප්‍රතිචාරීන්ගේ විසිරීම | 42 |
| රූ සටහන් 4.4 | අධ්‍යාපන මට්ටම අනුව කෘෂි ව්‍යාපාර/කර්මාන්තවල නියුතු ප්‍රතිචාරීන්ගේ විසිරීම | 44 |
| රූ සටහන් 5.1 | පූර්ණකාලීනව කෘෂිකර්මාන්තයේ නියැලීමට ඇති කැමැත්ත | 47 |
| රූ සටහන් 5.2 | ස්ත්‍රී/පුරුෂ භාවය සහ පූර්ණකාලීන කෘෂිකර්මාන්තයේ නිරතවීමට ඇති කැමැත්ත | 51 |
| රූ සටහන් 5.3 | පවුලේ මාසික ආදායම සහ රැකියාවක් ලෙස පූර්ණකාලීන කෘෂිකර්මාන්තයේ නියැලීමට ඇති කැමැත්ත | 53 |
| රූ සටහන් 5.4 | අධ්‍යාපන මට්ටම සහ පූර්ණකාලීන රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තයේ නියැලීමට ඇතිරුචිකත්වය | 54 |
| රූ සටහන් 5.5 | කෘෂිකර්මාන්තයට අදාළ රැකියාවක් තෝරා ගැනීමට හේතු | 66 |
| රූ සටහන් 6.1 | අලෙවි පහසුකම්වල ප්‍රමාණවත් බව | 70 |
| රූ සටහන් 6.2 | ව්‍යාප්ති සේවාවේ ප්‍රමාණවත් භාවය අනුව ප්‍රතිචාරීන් | 72 |
| රූ සටහන් 6.3 | ගොඩ ඉඩම්වල ප්‍රමාණවත් බව අනුව ප්‍රතිචාරීන් | 75 |
| රූ සටහන් 6.4 | කෘෂිකර්මාන්තයේ නියැලෙන ආකාරය අනුව ගොඩ ඉඩම් පවතින ප්‍රමාණය | 76 |
| රූ සටහන් 6.5 | සමස්ත නියැදිය සඳහා පොහොර සහ ඒවා භාවිතා කිරීමේ ප්‍රමාණවත් බව | 83 |
| රූ සටහන් 6.6 | කෘෂිකර්මාන්තයේ නියැලෙන ආකාරය අනුව පොහොර පවතින ප්‍රමාණය සහ භාවිතා කිරීමේ හැකියාවේ ප්‍රමාණවත් බව | 84 |

## සිද්ධි අධ්‍යයන


| | | |
|---|---|---|
| සිද්ධි අධ්‍යයන 6.1 | සුජීව මහතා, රන්මුදුවැව, සූරියවැව | 71 |
| සිද්ධි අධ්‍යයන 6.2 | රනෝරාව තරුණ ගොවි සමාජය | 89 |
| සිද්ධි අධ්‍යයන 6.3 | මොණරාගල දිස්ත්‍රික්කයේ ගැමුණු තරුණ ගොවි සමාජය | 90 |

# කෙටි යෙදුම්

| | |
|---|---|
| ADC (ගො.ජ.සං.ම.) | ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානය |
| APRA (කෘ.ප.නි.ස.) | කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර |
| AI (කෘ.උ.) | කෘෂිකර්ම උපදේශක |
| CBCL (ශ්‍රී.ලං.ම.බැ.) | ශ්‍රී ලංකා මහ බැංකුව |
| EAP (ආ.ස.ජ) | ආර්ථිකමය වශයෙන් සක්‍රිය ජනගහනය |
| FAO (ආ.කෘ.ස) | ආහාර හා කෘෂිකර්ම සංවිධානය |
| GCE A/L (අ.පො.ස.උ.පෙළ) | අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ |
| GCE O/L (අ.පො.ස.සා.පෙළ) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ |
| GDP (ද.දේ.නි.) | දළ දේශීය නිෂ්පාදිතය |
| HARTI (හෙ.කො.ගො.ප.පු.ආ.) | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය |
| IPHT (ප.අ.තා.ආ.) | පසු අස්වනු තාක්ෂණ ආයතනය |
| KVS (කෘ.ව්‍යා.සේ.) | කෘෂිකර්ම ව්‍යාප්ති සේවක (ග්‍රාමීය මට්ටමේ ව්‍යාප්ති සේවක) |
| LKR (ශ්‍රී.රු.) | ශ්‍රී ලංකා රුපියල් |
| NCEUS (ස.නො.අ.ව්‍ය.ජා.කො.) | සංවිධානය නොවූ අංශවල ව්‍යවසායන් සඳහා වූ ජාතික කොමිසම |
| NYS (ජා.ත.ස.) | ජාතික තරුණ සමීක්ෂණය |
| NYSC (ජා.ත.සේ.ස.) | ජාතික තරුණ සේවා සභාව |
| OFC (අ.ක්.බෝ) | අනෙකුත් ක්ෂේත්‍ර බෝග |
| UNESCAP (ආ.පැ.එ.ජා.ආ.ස.කො.) | ආසියා පැසිෆික් කලාපය සඳහා වූ එක්සත් ජාතීන්ගේ ආර්ථික සමාජයීය කොමිසම |

පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

# පළමු වැනි පරිච්ඡේදය
# හැඳින්වීම

## 1.1 පසුබිම

ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයෙන් 28% ආසන්නව අවුරුදු 15-29 අතර වයස් කාණ්ඩයට අයත් වේ. තව ද, 1960-2000 කාල පරිච්ඡේදය තුළ මෙරට තරුණයින්ගෙන් 75%ට වැඩි ප්‍රමාණයක් ග්‍රාමීය අංශයේ වාසය කළ හ (Ibargüen, 2004). වගු සටහන් 2.4න් පෙන්නුම් කරන අන්දමට 1990-2011 කාල පරිච්ඡේදයේ දී මෙරට සමස්ත සේවා වියුක්තිකයන්ගෙන් 72.7%-84.4% තරුණයෝ වූහ. මෙරට තරුණ ජනගහනයෙන් අති බහුතරය ග්‍රාමීය ව වෙසෙන හෙයින් තරුණ සේවා වියුක්තිය යනු ග්‍රාමීය ප්‍රපංචයකි. රාජ්‍ය අංශයේ වඩාත් යහපත් රැකියාවක් සොයාගැනීමේ බලාපොරොත්තුවෙන් සිටීම, අධ්‍යාපනයේ සහ නිපුණතාවන් හි නො ගැළපීම ආදී සාධක රාශියක් තරුණයින් අතර ඉහළ මට්ටමේ සේවා වියුක්තියක් පැවතීම හා බැඳී පවතී (Ibargüen, 2004; Central Bank of Sri Lanka and Department of Census and Statistics, 2009; Ministry of Labour Relations and Foreign Employment, 2006; Rama, 2003; Heltberg and Vodopivec, 2008). කෙසේ වුව ද, ඇතැම් පර්යේෂකයින් තර්ක කරන අන්දමට, ශ්‍රී ලංකාවේ තරුණ සේවා වියුක්තිකයන්ගෙන් බහුතරය එම තත්ත්වයට පත්ව ඇත්තේ රැකියා අවස්ථා හිඟවීම නිසා නොව ස්වේච්ඡාවෙනි (Rama, 2003). කරුණාගොඩ (2004) පෙන්වාදෙන ආකාරයට ශ්‍රී ලංකාවේ ස්වේච්ඡා රැකියා වියුක්තියට අධ්‍යාපන මට්ටම දැඩිව බලපෑම් කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ වයස්ගත ජනගහනය සැලකිය යුතු අන්දමින් ඉහළ යන අතරතුර කෘෂිකාර්මික අංශයේ ශ්‍රම දායකත්වය 1977 දී 52% සිට 2010 වන විට 32.7% දක්වා පහළ බැස ඇත. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් සිදු කරනු ලැබූ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිය පිළිබඳ අධ්‍යයනයෙන්[1] හෙළි කළ අන්දමට දිස්ත්‍රික්කයේ වී ගොවීන්ගෙන් 50.4%ක් වයස අවුරුදු 50 ඉක්ම වූවන් වූ අතර 5.1%ක් පමණක් අවු 20-30 වයස් කාණ්ඩයට අයත් වූහ (දමයන්ති සහ බුලන්කුලම, 2006). හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය 2007 දී සිදු කළ තවත් අධ්‍යයනයකින් අනාවරණය වූ අන්දමට වී වගා කරන ගොවීන්ගේ වයසේ සාමාන්‍ය අවුරුදු 52ක් වන අතර වී වගා කරන ගොවීන්ගෙන් 16%ක් වයස අවුරුදු 64 ඉක්මවූවෝ වූහ (Gamage and Damayanthi, 2012)[2].

කෘෂිකාර්මික අංශයේ තරුණ සහභාගීත්වය සම්බන්ධයෙන් සලකා බලන කළ, සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින බොහොමයක් රටවල් ශ්‍රී ලංකාව හා සමාන තත්ත්වයන්ට මුහුණ දෙමින් සිටී. අයර්ලන්තයේ

---

[1] අධ්‍යයනයේ ගොවීන්ගේ නියැදිය 500කි.

[2] පොළොන්නරුව, මාතලේ, අනුරාධපුර, අම්පාර, ගාල්ල, මාතර, පුත්තලම, හම්බන්තොට සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල ගෘහ ඒකක 914ක් අධ්‍යයනයෙන් ආවරණය කරන ලදී.



පුස්තකාලය
LIBRARY

ගොවිපළ හිමිකරුවන් වශයෙන් නම්කර ඇති පුද්ගලයන්ගේ රැකියා තෝරාගැනීම සමඟ ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම, ගොවිපලේ ප්‍රමාණය (භූමි ප්‍රමාණය සහ සතුන් සංඛ්‍යාව) සහ පවතින ගොවිපළ ආදායම තදින් බැඳී පවතින බව අනාවරණය වී ඇත (Hennessy and Rehman, දාතම නොමැති). චීනයේ ග්‍රාමීය ප්‍රදේශවල ගොවිපළ සහ ගොවිපළ නොවන අංශවල රැකියා තෝරා ගැනීමේ දී ස්ත්‍රී/පුරුෂ භාවය, විවාහක/අවිවාහක බව, ගෘහ ඒකකයක් සඳහා වැඩ කිරීමට ඇති ඉඩම් ප්‍රමාණය, පවුලේ සංඛ්‍යාව, පවුලේ යැපෙන්නන් සංඛ්‍යාව, පවුලේ ආදායම ආදී සමාජයීය සාධක මෙන් ම අධ්‍යාපනය සහ නිපුණතා ආදී වෙළඳපොළ හා බැඳුනු සාධක ද තදින් බලපෑම් කරනු ලබයි. තව ද, ගොවිපළ හෝ ගොවිපළ නොවන රැකියා තෝරාගැනීමේ දී පක්ෂ සාමාජිකයෙක්වීම හෝ පළාත් පාලන ආයතනයක නිලධාරියෙක්/නියෝජිතයෙක් වීම ආදී දේශපාලන සාධකත්, සමීපතම නගරයට ඇති දුර සහ පවතින ප්‍රවාහන පහසුකම් ආදී භූගෝලීය සාධකත් ග්‍රාමීය චීන ජනතාවට බෙහෙවින් බලපෑම් කරනු ලබයි (Xia, දාතම නොමැති). ඕස්ට්‍රේලියාවට කෘෂිකාර්මික කටයුතු සඳහා තරුණ ශ්‍රම දායකත්වය වඩාත් අවශ්‍ය වුවත් ක්ෂේත්‍රයට ඔවුන් ආකර්ෂණය කර ගැනීමේ හැකියාවක් නො පවතී. කෘෂිකර්මාන්තයේ වෘත්තීයමය නැඹුරුව අඩුවීම, තරුණ අපේක්ෂාවන් එම ක්ෂේත්‍රයෙන් පරිබාහිර වීම සහ "සුදු කරපටි රැකියා" සඳහා වන අපේක්ෂාවන් එයට හේතු වේ (Livingstone, 2011). ෂර්මා (2007) විස්තර කරන අන්දමට, ඉන්දියාවේ තරුණයින්ගෙන් 34% ආසන්නව තමන්ගේ පියාගේ හෝ මාමණ්ඩියගේ කෘෂිකාර්මික කටයුතුවලට සහාය දෙමින් අර්ධකාලීනව කෘෂිකර්මාන්තයේ නියැලෙන අතර නගරාශ්‍රිත ගම්මානවල එම ප්‍රතිශතය 46% දක්වා වර්ධනය වී ඇත. ඉඩම් කැබලිවල ප්‍රමාණය, කෘෂිකාර්මික නිෂ්පාදනවල ඒක පුද්ගල අගය, අධ්‍යාපනික මට්ටම, නිපුණතා සහ කුල ක්‍රමය ආදී සාධක ගණනාවක් ඉන්දියාවේ කෘෂිකාර්මික අංශයේ තරුණ සහභාගීත්වය තීරණය කිරීමෙහි ලා දායක වේ (ඉන්දියාවේ පූර්ණ කාලීන කෘෂිකර්මාන්තයේ යෙදෙන පිරිසෙන් 60% ආසන්න ප්‍රමාණයක් පහත් යැයි සම්මත කුල නියෝජනය කරනු ලබයි).

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ තරුණ සහභාගීත්වය අඩුවීමෙහි ලා ඉඩම් අහිමිකම, කළමනාකරණ සහ තාක්ෂණික නිපුණතාවල අප්‍රමාණවත් බව, කෘෂිකර්මය පිළිබඳව වන ප්‍රතිශේධාත්මක ආකල්ප (Jayatissa, Seneviratne and Sankar, 2005) සහ "සුදු කරපටි" රැකියාවන් සඳහා වන ආකල්ප (Hettige and Mayer, 2002) බලපාන බවට ඇතැම් හු තර්ක කරති. 2011 වසරේ දී පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සිදු කරනු ලැබූ අධ්‍යයනයකින් හෙළි කරන අන්දමට වයස, කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ අත්දැකීම්, විධිමත් කෘෂිකාර්මික අධ්‍යාපනය, වෘත්තීය පුහුණුවීම්, කුඹුරු ඉඩම් වපසරිය වැඩිවීම, සත්ත්ව සම්පතෙහි හිමිකම යන සාධක රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තය තෝරාගැනීමට බලපෑම් කරනු ලබයි (Chandrasiri and Karunagoda, 2011)

## 1.2 අධ්‍යයන ගැටලුව

පසුගිය දශකය තුළ ශ්‍රී ලංකාවේ සේවා වියුක්තිය අඩු වී ඇත. කෙසේ වුව ද, පවතින දත්ත පෙන්නුම් කරන අන්දමට ශ්‍රී ලංකාවේ තරුණ ප්‍රජාවේ සේවා වියුක්තිය ඉහළ මට්ටමක පවතී. මෙම අධ්‍යයනයේ පසුබිම විස්තර කෙරෙන කොටසේ දී පෙන්වා දුන් අන්දමට, 1990 සිට 2011 පළමු කාර්තුව දක්වා වූ සේවා වියුක්තියෙන් අති බහුතරය අවුරුදු 15-29 අතර වයස් කාණ්ඩයට අයත් විය. මෙම තත්ත්වයට ප්‍රතිවිරුද්ධව යමින්, මෙරට කෘෂිකාර්මික ක්ෂේත්‍රය සඳහා වන තරුණ සහභාගීත්වය අඩු මට්ටමක පවතී. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට තරුණ සහභාගීත්වය අඩුවීමට බලපා ඇති හේතු සාධක කවරේ ද?

## 1.3 අරමුණු

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ, ශ්‍රී ලංකාවේ සුළු පරිමාණ කෘෂිකර්මාන්තය සඳහා (විශේෂයෙන් ම රැකියාවක් ලෙස ගොවිතැනෙහි නියැලීම) තරුණ සහභාගීත්වය අඩුවීමට බලපා ඇති සාධක විමර්ශනය කිරීමයි.

### විශේෂිත අරමුණු

01. රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් තරුණයින්ගේ ආකල්ප විමසීම.

02. ශ්‍රී ලංකාවේ සුළු පරිමාණ කෘෂිකර්මාන්තය සඳහා තරුණ සහභාගීත්වය තීරණය කිරීමෙහි ලා දායක වන සාධක හඳුනාගැනීම සහ විශ්ලේෂණය කිරීම.

03. සුළු පරිමාණ කෘෂිකර්මාන්තය සඳහා වන තරුණ සහභාගීත්වය සම්බන්ධයෙන් අනෙකුත් හවුල්කාර පාර්ශවයන්ගේ අදහස් විමසීම.

04. සොයාගැනීම් සහ නිර්දේශ සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන් දැනුවත් කිරීම.

## 1.4 උපකල්පන

i. ඉහළ මට්ටමේ අධ්‍යාපනය සුළු පරිමාණ කෘෂිකර්මාන්තය සඳහා තරුණ දායකත්වය අඩු කිරීමට හේතු වේ.

ii. ගෘහ ඒකකයේ ආදායම ඉහළ මට්ටමක පැවතීම සුළු පරිමාණ කෘෂිකර්මාන්තයට තරුණ සහභාගීත්වය අඩුකිරීමට හේතු වේ.

iii. ඉඩම් ලබා ගැනීමේ හැකියාව අඩුවීම, ඉඩම් අහිමිකම සහ ඉඩම් කැබලි කුඩා ප්‍රමාණයෙන් යුක්ත වීම සුළු පරිමාණ කෘෂිකර්මාන්තයට තරුණ සහභාගීත්වය අඩු කිරීමට හේතු වේ.

iv. ලාභය/ආදායම අඩුවීම, පාඩු සිදුවීම තරුණ සහභාගීත්වය අඩු කිරීමට හේතු වේ.

v. කෘෂිකර්මාන්තයේ යෙදීම වෙහෙසකර, දුෂ්කර කාර්යයක් වීම සහ අවිනිශ්චිතතාව සුළු පරිමාණ කෘෂිකර්මාන්තයට තරුණ දායකත්වය අඩු කිරීමට හේතු වේ.

## 1.5 පර්යේෂණ ක්‍රමවේදය

### 1.5.1 මූලාශ්‍ර සහ දත්ත රැස් කිරීම

මෙම අධ්‍යයනයේ නියැදිය තෝරා ගැනීම සඳහා බහුපියවර නියැදි ක්‍රමය සහ අහඹු නියැදි ක්‍රමය භාවිත කරන ලදී. පළමු පියවරේ දී බෝග වගාව සහ කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා වන දායකත්වය සැලකිල්ලට ගනිමින් දිස්ත්‍රික්ක නවයක් තෝරා ගැණිනි. දෙවනුව, එම දිස්ත්‍රික්කවල වගා කරන බෝගය මත පදනම්ව ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන (ගො.ජ.ස.ම.) තෝරා ගැණුනි. තෙවැනි පියවරේ දී, තෝරාගත් ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානවල වගා කරන බෝගය සහ කෘෂිකර්මාන්තයට දක්වන තරුණ සහභාගීත්වය සැලකිල්ලට ගනිමින් එක් ගො.ජ.ස. මධ්‍යස්ථානයකින් ග්‍රාම නිලධාරී වසම් දෙක බැගින් තෝරා ගැණුනි. ඉන් පසුව, ප්‍රදේශයේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරගෙන් ලබාගත් අවු. 15-29 අතර තරුණයින්ගේ නාම ලේඛනයෙන් ස්ත්‍රී/පුරුෂ මෙන් ම සේවා නියුක්ත/වියුක්ත පිරිස් ඇතුළත් වන සේ අහඹු ලෙස නියැදිය තෝරා ගැණුනි.

අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත සහ ද්විතියික යන දෙයාකාරයෙන් ම දත්ත භාවිතා කෙරිණි. කෘෂිකාර්මික ප්‍රදේශවල වයස අවු. 15-29 අතර තරුණ තරුණියන්, ගොවි සංවිධානවල නිලතල දරන්නන්, මූලික තොරතුරු සපයන්නන්, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්/වරියන් (කෘ.ප.නි.ස.), කෘෂිකර්ම උපදේශක, ගොවිජන සංවර්ධන නිලධාරී, තරුණ ගොවි සමාජවල නිලධාරීන් සහ සාමාජික සාමාජිකාවන්ගෙන් ප්‍රාථමික තොරතුරු රැස්කරගනු ලැබුවේ ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා, ප්‍රශ්නාවලි, සිද්ධි අධ්‍යයන ක්‍රමවේද සහ මූලික තොරතුරු සපයන්නන් සමග සිදු කළ සම්මුඛ සාකච්ඡා ඇසුරිණි. විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය භාවිතයෙන් පළ කරන ලද වාර්තා සහ ලිපි ලේඛන ආශ්‍රිතව ද්විතියික දත්ත සම්පාදනය කර ගැණුනි. 2012 අප්‍රේල්-මැයි කාලය තුළ ක්ෂේත්‍ර සමීක්ෂණය සිදු කරන ලදී.

අරමුණුවලට අදාළ දත්ත සහ තොරතුරු රැස් කිරීම සඳහා පහත සඳහන් දර්ශක භාවිතා කෙරිණි.

**අරමුණු 01: රැකියාවක් ලෙස කෘෂිකර්මය සහ එයට සම්බන්ධිත කර්මාන්ත පිළිබඳ තරුණයින්ගේ ආකල්ප විමසීම**

i. රැකියාවක් ලෙස පූර්ණකාලීන කෘෂිකර්මාන්තයේ නියැලීමට ඇති කැමැත්ත
ii. කෘෂිකර්මාන්තය හා සබැඳි කර්මාන්තයක/ව්‍යාපාරයක නියැලීමට ඇති කැමැත්ත

**අරමුණු 02: ශ්‍රී ලංකාවේ සුළු පරිමාණ කෘෂිකර්මාන්තයට තරුණ සහභාගීත්වය අඩුවීමට දායක වී ඇති සාධක හඳුනාගැනීම**

i. තරුණයින්ගේ සමාජ-ආර්ථික පසුබිම හඳුනාගැනීම (අධ්‍යාපන මට්ටම, ලබා ඇති වෘත්තීය පුහුණුවීම්වල ස්වභාවය, වයස, ස්ත්‍රී/පුරුෂ භාවය, විවාහක/අවිවාහක තත්ත්වය, දෙමාපියන්ගේ රැකියාව, පවුලේ ආදායම, පවුලේ සාමාජික සංඛ්‍යාව, පවුලේ යැපෙන්නන් සංඛ්‍යාව)
ii. කෘෂිකාර්මික සම්පත් සහ පහසුකම් පැවතීම හා ඒවා භාවිතා කිරීමේ හැකියාව (ඉඩම් පැවතීම, ඉඩම්වල ප්‍රමාණය, කෘෂි යන්ත්‍රෝපකරණ එනම් රෝද දෙකේ ට්‍රැක්ටර්, රෝද හතරේ ට්‍රැක්ටර්, අස්වනු නෙළන යන්ත්‍ර, ශ්‍රමය පැවතීම, සත්ත්ව සම්පත, ණය, බීජ සහ රෝපණ ද්‍රව්‍ය, අනෙකුත් යෙදවුම්, අලෙවිකරණ සහ ව්‍යාප්ති සේවා)
iii. රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තයට ඇති සමාජ පිළිගැනීම.

### 1.5.2 අධ්‍යයන ප්‍රදේශය සහ නියැදියේ ප්‍රමාණය

#### 1.5.2.1 අධ්‍යයන ප්‍රදේශය

එක් ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානයකින් ග්‍රාම නිලධාරී වසම් දෙක බැගින් තෝරා ගැණුනි. අදාළ කෘ.ප.නි.ස. වෙතින් ලබාගත් ග්‍රාම නිලධාරී වසමේ අවුරුදු 15-29 අතර තරුණ තරුණියන්ගේ නාම ලේඛනයෙන් ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයමත්, සේවා නියුක්ත සහ වියුක්ත පුද්ගලයින් ද ඇතුළත් වන සේ අහඹු ලෙස නියැදිය තෝරා ගැණිනි. රැකියා විරහිත පුද්ගලයින්ගෙන් ලබාගත් තොරතුරු තහවුරු කිරීමට සේවා නියුක්ත පුද්ගලයින් වෙතින් ලබාගත් තොරතුරු උපකාරී විය. මෙයට අමතරව, ගොවි සංවිධානවල සාමාජික/සාමාජිකාවන්, නිලධාරීන් සහ තරුණ ගොවි සංවිධානවල සාමාජික/සාමාජිකාවන් වෙතින් ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා ක්‍රමය ඔස්සේ තොරතුරු ලබා ගැණුනි. වගු සටහන් 1.1න් අධ්‍යයන ප්‍රදේශ සවිස්තරාත්මකව ඉදිරිපත් කෙරේ.

1.5.2.2 නියැදියේ ප්‍රමාණය

ප්‍රශ්නාවලී සමීක්ෂණය සඳහා බෝග වගාව සහ සත්ත්ව පාලනය මත පදනම්ව එක් එක් ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානවලින් තරුණ තරුණියන් 25 බැගින් තෝරා ගැණුනි. එයට අමතරව, නොයෙකුත් විශ්වවිද්‍යාලවලින් තෝරාගත් කෘෂිකර්ම උපාධිධාරීන් සහ උපාධි අපේක්ෂකයන් තිස්තුන්දෙනෙකුගෙන් ප්‍රශ්නාවලී මාර්ගයෙන් තොරතුරු ලබාගන්නා ලදී. මේ අනුව, සම්පූර්ණ නියැදිය 533ක් විය.

වගුව 1.1: අධ්‍යයන ප්‍රදේශ සහ එම ප්‍රදේශවල වගා කළ ප්‍රධාන බෝග

| දිස්ත්‍රික්කය | ගො.ජ.ස. මධ්‍යස්ථානය | ග්‍රාම නිලධාරී වසම | ප්‍රදේශයට විශේෂිත බෝග වගාව |
|---|---|---|---|
| නුවරඑළිය | නුවරඑළිය | ශාන්තිපුර සහ පට්ටිපොල | උඩරට එළවළු |
| නුවරඑළිය | කඳපොල | ජයලංකා සහ කඳපොල | උඩරට එළවළු සහ විසිතුරු මල් |
| මාතලේ | දඹුල්ල | කිරලැස්ස සහපොල්අත්තාව | ලොකුළුණු |
| මාතලේ | කිඹිස්ස | කිරලගොල්ල සහ පලුටාව | ලොකුළුණු |
| මාතලේ | යටවත්ත | වල්පොල සහ ඉඩම්ගම | බෝංචි සහ තක්කාලි |
| පොළොන්නරුව | සේවාගම | සේවාගම සහ මැණික්විල | මහාවාරි වී සහ ගස්ලබු |
| පොළොන්නරුව | වැලිකන්ද | විජයබාහුපුර සහ සිංහපුර | මහාවාරි වී |
| කුරුණෑගල | නිකවැරටිය | දිවුල්ලෑව සහ කැබැල්ලෑව | හේන් බෝග, වර්ෂා පෝෂිත වී |
| කුරුණෑගල | මාවතගම | වාඩියගොඩ සහ අකාඩේ | සුළු වාරි වී, බුලත්, පහතරට එළවළු |
| අම්පාර | දෙහිඅත්තකණ්ඩිය | බිහිරිසොරොව්ව සහ බක්මී දෙණිය | මහාවාරි වී |
| අම්පාර | උහන | හිම්දුරාව සහ කුමාරිගම | මහාවාරි වී, පහතරට එළවළු |
| හම්බන්තොට | තිස්සමහාරාම | විපිතපුර සහ සඳුන්ගම | ගව පාලනය |
| හම්බන්තොට | මීගහජඳුර | රන්මුදුවැව සහ නඹඩගස්වැව | කෙසෙල්, ගස්ලබු සහ පහතරට එළවළු |
| හම්බන්තොට | අගුණුකොළපැලැස්ස | මැටිගත්වල සහ හේලේකඩ | කෙසෙල්, එළවළු සහ මහාවාරි වී |
| මොණරාගල | තෙලුල්ල | ඇතිලිවැව සහ පුබුදුවැව | රතුළුණු සහ එළවළු |
| මොණරාගල | ඇතිමලේ | සිරිපුර සහ වත්තේගම | හේන් බෝග |
| අනුරාධපුර | නොච්චියාගම | තිඹිරිවැව සහ කටුපත්තෑව | සුළු සහ මහාවාරි වී, අතිරේක බෝග |
| අනුරාධපුර | තන්තිරිමලේ | නෙලුම්විල සහ ඔයාමඩුව | සුළුවාරි වී, අතිරේක බෝග |
| මඩකලපුව | කරදියනාරු | මාරප්පාලම් සහ මාවිලයියාරු | වර්ෂා පෝෂිත වී, හේන් බෝග, ගව පාලනය |
| මඩකලපුව | වාලච්චේන | සිත්තන්ඩි සහ ඔඩ්ඩමාවඩි | මහාවාරි වී, හේන් බෝග |



පුස්තකාලය
LIBRARY
හෙ.කො.ජා.ක.ප.පු.ආ
HARTI

## 1.6 දත්ත විශ්ලේෂණය

මූලික වශයෙන්, ප්‍රමාණාත්මක දත්ත සරල සංඛ්‍යානමය විධි ක්‍රම භාවිතයෙන් විශ්ලේෂණය කරන ලදී, ගුණාත්මක දත්ත සහ තොරතුරු විශලේෂණයේ දී විස්තරාත්මක විධි ක්‍රම භාවිතා කෙරිණි.

## 1.7 වාර්තාවේ සැකැස්ම

වාර්තාව පරිච්ඡේද අටකින් සමන්විත වේ. පළමු පරිච්ඡේදය අධ්‍යයනයේ පසුබිම, අරමුණු, අධ්‍යයන ගැටලුව, උපකල්පන සහ පරයේෂණ ක්‍රමවේදය ඇතුළත් වූ හැඳින්වීමයි. දෙ වැනි පරිච්ඡේදයෙන් තරුණයින් සහ සුළු පරිමාණ කෘෂිකර්මාන්තය සඳහා වන තරුණ දායකත්වයට අදාළ සාහිත්‍ය විමර්ශනය ඉදිරිපත් කෙරේ. තෙ වැනි පරිච්ඡේදයෙන් නියැදියේ සමාජ-ආර්ථික පසුබිම ඉදිරිපත් කෙරේ. සිව් වැනි පරිච්ඡේදයෙන්, සුළු පරිමාණ කෘෂිකර්මාන්තයෙ හි තරුණ සහභාගීත්වය පිළිබඳ දත්ත ඉදිරිපත් කෙරේ. පස් වැනි පරිච්ඡේදයෙන් කෘෂිකර්මාන්තය සම්බන්ධව විශේෂයෙන් ම, පූර්ණකාලීන කෘෂිකර්මාන්තය, කෘෂිපාදක කොටගත් කර්මාන්ත සහ රැකියා තෝරා ගැනීම සම්බන්ධයෙන් තරුණයින්ගේ ආකල්ප සාකච්ඡා කෙරේ. හය වැනි පරිච්ඡේදයෙන් කෘෂිකර්මාන්තයෙ හි නියැලීමේ දී මුහුණ දෙන ගැටලු විශ්ලේෂණය කෙරේ. සත් වැනි පරිච්ඡේයේ දී තරුණයින් සහ ගොවි සංවිධාන නියෝජිතයින් ඉදිරිපත් කළ යෝජනා විස්තර කෙරේ. අට වැනි පරිච්ඡේදයෙන් අධ්‍යයනයේ සොයාගැනීම් සාරාංශගතව ඉදිරිපත් කෙරෙන අතර ප්‍රතිපත්තිමය වශයෙන් වැදගත්වන නිර්දේශ සහ අධ්‍යයනයෙන් හඳුනාගත් තවදුරටත් පරයේෂණ සිදු කළ යුතු ක්ෂේත්‍ර පිළිබඳව කරුණු ඉදිරිපත් කෙරේ.

# දෙ වැනි පරිච්ඡේදය
# සාහිත්‍ය විමර්ශනය

## 2.1 හැඳින්වීම

පවතින සාහිත්‍ය විමර්ශනය කරමින් අධ්‍යයනයේ සංකල්ප පිළිබඳ විමසා බැලීමක් මෙම පරිච්ඡේදයෙන් සිදු කෙරේ. මෙම පරිච්ඡේදයේ දී තරුණ/තරුණියන් තරුණ සේවා වියුක්තිය සහ සුළු පරිමාණ කෘෂිකර්මාන්තය හා සබැඳි සංකල්ප කෙටියෙන් විමසා බැලේ. තව ද, අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළව ජාත්‍යන්තර, කලාපයීය සහ ජාතික මට්ටමින් සිදු කෙරුණු ප්‍රත්‍යෙයක අධ්‍යයන මෙම පරිච්ඡේදයේ දී සාකච්ඡාවට බඳුන් කෙරේ.

## 2.2 සුළු පරිමාණ කෘෂිකාර්මික අංශය

කුඩා පරිමාණ ගොවිපළ මත පදනම් වන සුළු පරිමාණ කෘෂිකර්මාන්තය සංවර්ධනය වෙමින් පවතින රටවල ඉතා බහුලව දැකිය හැකි ය. කුඩා ගොවිපළවල් නැතහොත් පවුලේ ගොවිපළවල් විවිධ ආකාරයට අර්ථකතනය කොට ඇත. කෙසේ වුව ද, ඒ සඳහා බොහෝවිට භාවිතා වන පොදු මිණුම් දණ්ඩ වන්නේ ගොවිපළේ ප්‍රමාණයයි. බොහෝ මූලාශ්‍රවලින් දැක්වෙන අන්දමට හෙක්ටයාර දෙකකට වඩා අඩු වගා බිම්, කුඩා ගොවිපළවල් ලෙස අර්ථ නිරූපණය කෙරේ (Ganesh and Raghav, 2011) . ඇතැම් නිර්වචනවලට අනුව ගොවිපළ සඳහා අවශ්‍ය ශ්‍රමයෙන් වැඩි කොටස පවුලේ සාමාජිකයින් වෙතින් සපයා ගන්නා හෝ යැපීම මූලික කොටගෙන කෘෂිකර්මාන්තයේ නියැලෙන සහ ගොවිපළේ ප්‍රධාන අරමුණ ගෘහයේ පරිභෝජනය සඳහා අවශ්‍ය වන ප්‍රධාන ආහාර ඇතුළුව අනෙකුත් ආහාර නිෂ්පාදනය කරන සුළු පරිමාණ ගොවිපළවල් වේ (Hazll, Poulton, Wiggins and Dorward, 2007). ලෝක බැංකුවේ ග්‍රාමීය සංවර්ධන උපාය මාර්ග (2003) පිළිබඳ ලේඛනයේ සඳහන් වන අන්දමට අඩු වත්කම් මත පදනම්ව හෙක්ටයාර දෙකකට වඩා අඩු බිම් ප්‍රමාණයක වගා කරන්නන් සුළු පරිමාණ ගොවීන් ලෙස අර්ථ නිරූපණය කෙරේ. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ අනෙකුත් ගොවීන්ට සාපේක්ෂව සීමාසහිත පහසුකම් සහිතව වගා කටයුතුවල නිරතවන ගොවීන් සුළු පරිමාණ ගොවීන් ලෙස ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය හඳුනාගෙන ඇත (Dixon, Taniguchi and Wattenbach, 2003) .

ආසියාතික කෘෂිකර්මාන්තයේ විශේෂිත ලක්ෂණයක් වන්නේ සුළු ඉඩම් හිමියන් විසින් කුඩා ඉඩම් කැබලි වගා කිරීම යි. සංවර්ධනය වෙමින් පවතින රටවල සුළු පරිමාණ ගොවිපළවල් අඩුවීමට වඩා වර්ධනය වීමක් වර්තමානයේ පෙන්නුම් කරනු ලබයි (Zhoal, 2010). මෙම දශකය තුළ බොහෝ ආසියාතික රටවල ගොවිපළවල සාමාන්‍ය බිම් ප්‍රමාණය අඩු වෙමින් පවතී. වගා කරන ඒක පුද්ගල සාමාන්‍ය බිම් ප්‍රමාණය බංගලාදේශයේ හෙක්ටයාර් 0.5 ද, නේපාලයේ හේකටයාර් 0.8 ද, ඉන්දියාවේ හෙක්ටයාර් 1.4 ද, පාකිස්ථානයේ හෙක්ටයාර් 3ක් ද වේ. ඉන්දියාවේ ගොවිපළවලින් 81%ක් හෙක්ටයාර දෙකකට වඩා අඩුවන

අතර එය සම්පූර්ණ වගා බිම් ප්‍රමාණයෙන් 44% කි (National Commission for Enterprises in the Unorganized Sector, 2008). එම නිසා, අවම වශයෙන් තවත් දශක කිහිපයක් සඳහා සංවර්ධනය වෙමින් පවතින රටවල කෘෂිකාර්මික ඉඩම්වල භාරකරුවන් වන්නේ සුළු පරිමාණ ගොවීන් ය.

සුළු පරිමාණ ගොවිපළවල් පුළුල් පරාසයක පැතිර ගිය බෝග වගාව කෙරෙහි යොමුව ඇති අතර ඉන් බොහොමයක් දේශීය ඒවා වේ. ක්ලෝසන් (Clawson, 1985) උපුටා දක්වමින් හඳුනා නොගත් අංශවල ව්‍යවසායන් සඳහා වන ජාතික කොමිසම (NCEUS, 2008) සඳහන් කරන අන්දමට නූතන බෝග ප්‍රභේද සමග සන්සන්දනය කිරීමේ දී එකී බෝගවලින් බොහොමයක් ජානමය වශයෙන් වඩාත් සමජාතීය වන අතර ඇතිවිය හැකි අන්තරායකාරී තත්ත්වයන්ට එරෙහිව වඩාත් විශ්වාසය රැඳවිය හැකි ඒවා වේ. ඒ අතරතුර මෙම ආවේණික ප්‍රභේද ලෙඩ රෝග, කෘමි සහ නියඟ වැනි පීඩන මධ්‍යයේ වුව අස්වනු සුරක්ෂිතතාව වර්ධනය කරයි. කෙසේ වුව ද, විශේෂයෙන් ම ආහාර නිෂ්පාදනයෙන් සැලකිය යුතු කොටසක් සපයනු ලබන්නේ සුළු පරිමාණ වගා අංශයක් වන අතර කුඩා ගොවිපළවල් එම රටවල බහුතර ග්‍රාමීය ජනතාවගේ මූලික ආර්ථික ඒකකය වේ.


බොහෝ ආසියාතික රටවල, සමස්ත කෘෂි නිෂ්පාදනයේ වටිනාකමට කැපී පෙනෙන දායකත්වයක් සුළු පරිමාණ අංශයෙන් ලැබේ. නිදසුන් වශයෙන් ඉන්දියාවේ සුළු පරිමාණ කෘෂිකාර්මික අංශය විසින් එරට ඉඩම්වලින් 44%ක් පමණක් වගා කළ ද, සමස්ත ගොවිපළ නිෂ්පාදනයෙ හි එම අංශයේ දායකත්වය 50% ඉක්මවනු ලබයි. ගොවිපළ භූමි ප්‍රමාණය සහ හෙක්ටයාරකට ලබා ගත හැකි ඵලදායීතාවය අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයක් පවතින බව බොහෝ අධ්‍යයනවලින් තහවුරු කොට තිබේ. කුඩා පරිමාණ ගොවිපළවල විශේෂිත ලක්ෂණයක් වන්නේ, ප්‍රාග්ධනය අඩුවෙන් යොදවන නමුත් ශ්‍රමය සහ පවුල සතු අනෙකුත් යෙදවුම් වැඩි වශයෙන් භාවිත කිරීමත්, බෝග විවිධාංගීකරණය සහ බෝග තීව්‍රතා දර්ශකය පොදුවේ ඉහළ මට්ටමක පැවතීමත් ය. ගොවිපළේ භූමි ප්‍රමාණය සහ ඵලදායීතාව අතර පවතින ඉහත කී ප්‍රතිලෝම සම්බන්ධතාව, කාර්යක්ෂමතාව සහ සමාජ සාධාරණත්වය උදෙසා ඉඩම් බෙදාදීම ඇතුළු ඉඩම් ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්ති සඳහා බලගතු තර්කානුකූල බවක් සපයයි.

## 2.3 ශ්‍රී ලංකාවේ සුළු පරිමාණ කෘෂිකාර්මික අංශය

සාම්ප්‍රදායිකව ශ්‍රී ලාංකික ජන සමාජය තුළ කෘෂිකර්මාන්තයෙ හි ආධිපත්‍ය ඉස්මතුව ඇත. මෙරට ජනගහනයෙන් වැඩි පිරිසක් ග්‍රාමීය ව වෙසෙන අතර ඔවුන්ගෙන් බහුතරය කෘෂිකර්මාන්තය මත යැපේ. සාමාන්‍යයෙන් කෘෂිකාර්මික අංශය බෝග, පශු සම්පත්, වන සහ ධීවර යන අංශවලින් සමන්විත වේ. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ වඩාත් විශේෂිත ලක්ෂණය වන්නේ ශ්‍රම බලකා දායකත්වය තවදුරටත් ඉහළ මට්ටමක පැවතෙමින් දළ දේශීය නිෂ්පාදිතය සඳහා වන ආංශික දායකත්වය පහළ බැසීමේ ප්‍රවණතාවයි. උදාහරණ වශයෙන් 1950 දී දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකාර්මික අංශයේ දායක්තවය 46.3%ක් වූ අතර (Damayanthi and Gamage, 2011) 2011 වන විට එය 11.2% දක්වා අඩු වී ඇත. රූ සටහන් 2.1න්

ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතියත්, වගු සටහන් 2.1න් ශ්‍රම බලකා සහභාගීත්වයත් නිරූපණය වේ.

රූ සටහන් 2.1: ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයෙ හි ආංශික සංයුතිය (1980-2010)




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා, 1985-2011

ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන, 2011, ශ්‍රී ලංකා මහ බැංකුව

2011 වසරේ දී මෙරට ශ්‍රම බලකායෙන් 32.9% කෘෂිකාර්මික අංශයේ සේවා නියුක්ත වූහ. දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකාර්මික අංශයේ දායකත්වය අඩු වුව ද, 2011 වසරේ දී එම අංශයේ ශ්‍රම බලකා සහභාගීත්වය ඉතා සුළු වශයෙන් වර්ධනය වී ඇත (වගුව 2.1). ග්‍රාමීය ශ්‍රම බලකායෙන් බහුතරය කෘෂිකාර්මික කටයුතුවල නිරත වුව ද ඔවුන්ගේ ඵලදායීතාව ගැටලු සහිත ය.

වගුව 2.1: ප්‍රධාන ආර්ථික කාර්යය අනුව සේවා නියුක්තිය ('000)

| වසර | සේවා නියුක්ත සංඛ්‍යාව | කෘෂිකාර්මික අංශයේ ශ්‍රම බලකාය | මුළු සංඛ්‍යාවෙන් ප්‍රතිශතය (%) | කර්මාන්ත අංශයේ ශ්‍රම බලකාය | මුළු සංඛ්‍යාවෙන් ප්‍රතිශතය (%) | සේවා අංශයේ ශ්‍රම බලකාය | මුළු සංඛ්‍යාවෙන් ප්‍රතිශතය% |
|---|---|---|---|---|---|---|---|
| 2003 | 6,609,466 | 2,223,691 | 33.6 | 1,539,035 | 23.3 | 2,846,760 | 43.1 |
| 2004 | 6,704,006 | 2,215,282 | 33.0 | 1,663,383 | 24.8 | 2,825,341 | 42.1 |
| 2005 | 6,788,119 | 2,059,293 | 30.3 | 1,787,274 | 26.3 | 2,941,552 | 43.3 |
| 2006 | 7,105,322 | 2,287,268 | 32.2 | 1,889,953 | 26.6 | 2,928,101 | 42.1 |
| 2007 | 7,041,874 | 2,202,098 | 31.3 | 1,873,857 | 26.6 | 2,965,919 | 42.1 |
| 2008 | 7,174,706 | 2,344,414 | 32.7 | 1,888,003 | 26.3 | 2,942,288 | 41.0 |
| 2009 | 7,139,536 | 2,318,620 | 32.5 | 1,822,684 | 25.5 | 2,998,231 | 42.0 |
| 2010 | 7,235,641 | 2,353,598 | 32.5 | 1,777,129 | 24.6 | 3,104,913 | 42.9 |
| 2011 | 7,894,000 | 2,602,000 | 32.9 | 1,915,000 | 24.3 | 3,380,000 | 42.8 |

මූලාශ්‍ර: ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකා සමීක්ෂණය, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2011 පළමු කාර්තුවේ වාර්තාව, වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව. 2011

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ දැකිය හැකි ප්‍රධාන ලක්ෂණය වන්නේ, ප්‍රධාන අපනයන බෝග (තේ, රබර්, පොල්) සඳහා වන වැවිලි අංශයත්, මූලික වශයෙන් ම දේශීය වෙළඳපොළ සඳහා සහල් සහ අනෙකුත් බෝග නිෂ්පාදනය කරන වැවිලි නොවන අංශයේ හෝ කුඩා පරිමාණ කෘෂි අංශයත් යන ද්විත්ව අංශවලින් සමන්විත වීමයි (Damayanthi and Gamage, 2011). මේ වන විට ද ග්‍රාමීය ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම කෘෂිකර්මාන්තය ලෙස ඇතැම්හු සලකති. විශේෂයෙන් ම, ග්‍රාමීය ආර්ථිකය සමග කුඩා පරිමාණ කෘෂිකාර්මික අංශය සමීපව බැඳී පවතී.[3]

බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනයට පෙර ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය ග්‍රාමීය කෘෂිකර්මාන්තය විසින් හසුරුවනු ලැබුව ද, දහනව වන ශතවර්ෂයේ වැවිලි කර්මාන්තයේ ව්‍යාප්තියක් සමග එය වෙනසකට ලක් විය. එම නිසා විසිවන ශතවර්ෂයේ මුල් භාගය වන තෙක් දිවයිනේ කෘෂිකර්මාන්තය වී, තේ, රබර් සහ පොල් යන ප්‍රධාන බෝග හතරෙහි ආධිපත්‍යයට නතුව පැවතිණි. නිදහස ලබා ගැනීමේ පටන් රජය විසින් දරිද්‍රතාව

[3] ග්‍රාමීය ආර්ථිකය නිර්වචනය කිරීම් දී බොහෝ විද්‍යාර්ථීන් ජනගහන ඝනත්වය සැලකිල්ලට ගනී. ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවට අනුව නාගරික ප්‍රදේශ (මහනගර සභා සහ නගර සභා යටතේ පාලනය වන) සහ අක්කර 20ට වැඩි තනි පරිපාලන ඒකකයක් යටතේ පාලනය වන, නේවාසිකයින් 10ට වැඩි වැවිලි අංශය ලෙස නිර්වචනය වන ප්‍රදේශ හැර අවශේෂ ප්‍රදේශ යන්නෙන් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශ අර්ථ දැක් වේ.

තුරන් කිරීමේ සහ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති රාශියක් හඳුන්වාදීමත්, ක්‍රියාත්මක කිරීමත් සිදු කරන ලදී. එම නිසා 1960 දශකයේ මැද භාගය වන විට සුළු පරිමාණ කෘෂිකාර්මික අංශයේ පරිවර්තනයක් උදෙසා වූ ප්‍රවණතාවක් පෙන්නුම් කෙරිණි. වාරි ජලය යටතේ වගා කෙරෙන කුඹුරු ඉඩම් ප්‍රමාණය වැඩිවීමත්, ඉහල අස්වැන්නක් ලබාදෙන බදු වර්ග සහ රසායනික පොහොර භාවිතය වැනි ඵලදායිතාව ඉහළ නංවන ක්‍රමවේද රට තුළ ව්‍යාප්තිවීම ආරම්භවීමත් වී වගා ක්ෂේත්‍රයේ දැඩි වෙනසකට හේතු විය. කෙසේ වුව ද, වර්තමානය වන විට සුළු ගොවි අංශයේ ගොවීන්ගෙන් බහුතරය ගෘහ පරිභෝජනයට වඩා වෙළඳපොළ අරමුණු කරගනිමින් භෝග නිෂ්පාදනය කරනු ලබයි (Damayanthi and Gamage, 2011).

2012 වර්ෂයේ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංගණනයට අනුව, රටේ සමස්ත සුළු පරිමාණ ඉඩම් ප්‍රමාණය කැබලි 3,264,678 ද, ඒවායේ සම්පූර්ණ බිම් වපසරිය හෙක්ටයාර් 1,531,461 ද විය (වගුව 2.2). ඒවායින් බිම් කැබලි 1,477,308ක් ප්‍රධාන වශයෙන් ගෘහීය පරිභෝජනය සඳහා නිපදවන අතර කැබලි 1,787,370 ක් අලෙවිය සඳහා භෝග නිෂ්පාදනය කරයි. තව ද, 2002 වසරේ දී සුළු පරිමාණ ගොවිපළවල සාමාන්‍ය බිම් ප්‍රමාණය හෙක්ටයාර 0.47 විය.

වගුව 2.2: සුළු පරිමාණ ඉඩම් කැබලි සංඛ්‍යාව සහ භූමි ප්‍රමාණය–2002

| භාවිතා කරන ආකාරය | කැබලි සංඛ්‍යාව | වපසරිය (හෙක්ටයාර්) |
|---|---|---|
| සම්පූර්ණ කුඩා ඉඩම් කැබලි | 3,264,678 | 1,531,461 |
| ආහාර නිෂ්පාදනය සඳහා භාවිතා කරන කුඩා ඉඩම් කැබලි | | |
| ප්‍රධාන වශයෙන් ම නිවසේ පරිභෝජනය සඳහා | 1,477,308 | 82,119 |
| ප්‍රධාන වශයෙන් ම අලෙවිය සඳහා | 1,787,370 | 1,449,342 |

මූලාශ්‍රය: කෘෂිකාර්මික සංගණනය, 2002

2002 වර්ෂයේ කෘෂිකර්ම සංගණනයෙන් හෙළි වූ අන්දමට, අක්කර 1/4 හෝ එයට අඩු ඉඩම් කැබලි සංඛ්‍යාව 162,904ක් වූ අතර ඒවායෙ හි සමස්ත බිම් ප්‍රමාණයේ එකතුව අක්කර 81,822 විය. වගා කළ හැකි ඉඩම් අඩුවීම, පවතින සීමිත ඉඩම් සඳහා ඉහළ ඉල්ලුමක් පැවතීම සහ ඉඩම් කැබලිවීම හේතුවෙන් මෙම කාණ්ඩයේ සමස්ත කැබලි සංඛ්‍යාව තවදුරටත් ඉහළ යාමේ නැඹුරුවක් පවතී.

## 2.4 තරුණයින්

'තරුණයින්' යන්නෙ හි අර්ථ නිරූපණය විවිධාකාරයෙන් වෙනස් වේ. මනෝ විද්‍යාඥයින් තරුණ යන්න 'යෞවනෝදය සහ වැඩිහිටි විය අතර කාල පරිච්ඡේදය' ලෙස අර්ථ දක්වන අතර නීතමය විවරණවල දී එය වයස මත පදනම් ව අර්ථ දක්වනු ලබයි. ආර්ථික විද්‍යානුකූල අර්ථයෙන් "තරුණ" යනු පුද්ගලයෙක් තම ජීවිතයේ වෘත්තීයමය ධාරිතාවන් සංවර්ධනය කරගනු ලබන කාල පරිච්ඡේදයයි. සමාජමය තත්ත්වයන් සැලකිල්ලට ගැනීමේ දී "තරුණයින්" යනු ආයෝජනය කරන කාල පරිච්ඡේදය ලෙස අර්ථ දැක්විය හැකි ය (Sessional Paper III, 1967).

එක්සත් ජාතීන්ගේ සංවිධානය තරුණයින් යන්න නිර්වචනය කරනු ලබන්නේ අවුරුදු 15-24 අතර පුද්ගලයින් වශයෙන් වන අතර ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සභාව (ජා.ත.සේ.ස) 'අවුරුදු 15-29 අතර පුද්ගලයින්' තරුණයන් ලෙස අර්ථ නිරූපණය කරයි (Ibargüen, 2004). වයස් සීමාවට අමතරව ශ්‍රී ලංකාව වැනි ඇතැම් රටවල් විවාහය සහ සේවා නියුක්ත බව ආදී සමාජ-ආර්ථික කෝණයන් ද තරුණයින් නිර්වචනය කිරීමේ දී භාවිතා කරනු ලබයි. 2000 වසරේ දී සිදු කරන ලද ජාතික තරුණ සමීක්ෂණයේ දී (ජා.ත.ස) තරුණයින් සඳහා භාවිතා කරන ලද අර්ථ නිරූපණය වූයේ අවුරුදු 15-29 අතර අවිවාහක, ස්ත්‍රී සහ පුරුෂයින් ඇතුළත් වූ ජනගහනය යන්නයි.

## 2.5 "ආර්ථික වශයෙන් සක්‍රිය", "සේවා නියුක්ත" සහ "සේවා වියුක්ත" යන්නෙ හි අර්ථ නිරූපණ

සේවා වියුක්ත, සේවා නියුක්ත සහ ආර්ථිකමය වශයෙන් සක්‍රිය යන සංකල්ප එකිනෙක හා සමීපව බැඳුණු සහ ආර්ථික, සමාජ සහ දේශපාලන දෘෂ්ටි කෝණයන්ගෙන් බලන කල රටකට වැදගත් වන සංකල්ප වේ. ශ්‍රී ලංකාවේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අර්ථ දක්වන අන්දමට ආර්ථිකමය වශයෙන් සක්‍රිය ජනගහනය (ආ.ස.ජ) පුළුල්ව නිර්වචනය කිරීමේ දී නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළ ආර්ථික භාණ්ඩ හා සේවා නිෂ්පාදනයට ශ්‍රමය සැපයිය හැකි හෝ දෙන ලද විශේෂිත වයස් මට්ටමකට ඉහළ (ශ්‍රී ලංකාවේ දී අවුරුදු 10 සහ එයට වැඩි), ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයේ ම සියළු පුද්ගලයින් ආවරණය වේ. එය මැනීම සඳහා සලකා බලන කාල පරිච්ඡේදය දිගු එකක් වන විට (අවුරුදු 01), ඒ සඳහා 'ආර්ථිකමය වශයෙන් සක්‍රිය ජනගහනය' යන්න භාවිත කෙරේ. එය කෙටි කාලයක් (සතියක් හෝ එක් දිනක්) සඳහා ගණනය කරන විට සංකල්පමය වශයෙන් 'ශ්‍රම බලකාය' යනුවෙන් භාවිත කෙරේ.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව, සලකා බලන කාල පරිච්ඡේදය තුළ මුදල් හෝ ද්‍රව්‍යමය වශයෙන් වැටුප්, ලාභ හෝ පවුල සඳහා වෙනත් ඉපැයීම් සඳහා කිසියම් කාර්යයක නියුක්ත වූ ගෘහයේ සියළු සාමාජිකයින් සේවා නියුක්ත පුද්ගලයින් ලෙස සැලකේ. කාලීන සේවා නියුක්ත පුද්ගලයින් යන්නට අන්තර් ජාතිකව පිළිගත් අර්ථ නිරූපණය වන්නේ, සලකනු ලබන කාල පරිච්ඡේදය තුළ (කාලීන රැකියා ගණනය කිරීමේ දී කෙටි කාලය සැලකීමේ දී කැලැන්ඩරයේ පෙර සතියේ) අවම වශයෙන් එක්



24183

පුස්තකාලය
LIBRARY
හෙ.ගො.ගො, ප.පු.ආ
HARTI

පැයක් හෝ ලාභය උදෙසා සේවකයෙක්, ස්වාමියෙක්, තමන්ගේ ම කාර්යයක නියුතු වන්නෙක් (ස්වයං රැකියා) හෝ පවුලේ ඉපැයීම සඳහා වැටුප් නො ලබා පවුලේ ශ්‍රමිකයෙක් ලෙස කටයුතු කළ අයෙකි (Nanayakkara, 2004).

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අර්ථ නිරූපණයට අනුව, 'සේවා වියුක්ත ජනගහනය' යන්නට අවුරුදු 10 (හෝ අවුරුදු 15) සහ එයට වැඩි, රැකියාවක යෙදීමට හැකි (වැටුප් ලබන හෝ ස්වයං රැකියා) සහ රැකියා බලාපොරොත්තුවෙන් සිටින නමුත් දෙන ලද විශේෂිත කාල පරිච්ඡේදය තුළ වැටුප් ලබන රැකියාවක හෝ ස්වයං රැකියාවක නිරත නොවූ සියලු පුද්ගලයින් අයත් වේ.

## 2.6 ශ්‍රී ලංකාවේ තරුණ සේවා වියුක්තිය

ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් 28%ට ආසන්න ප්‍රතිශතයක් අවුරුදු 15-29 වයස් කාණ්ඩයට අයත් වේ. තව ද, 1960-2000 කාලය තුළ ශ්‍රී ලංකාවේ තැරුණයින්ගෙන් 75%ට වැඩි ප්‍රමාණයක් ග්‍රාමීය අංශයේ ජීවත්ව ඇත (Ibargüen, 2004). වගු සටහන් 2.4න් පෙන්නුම් කරන පරිදි 1990-2011 කාල පරිච්ඡේදය තුළ, රටේ සමස්ත රැකියා වියුක්තියෙන් අති බහුතරය ග්‍රාමීයව වෙසෙන හෙයින් ශ්‍රී ලංකාවේ තරුණ සේවා වියුක්තිය ග්‍රාමීය ප්‍රපංචයකි.

1990-2011 කාලය තුළ මෙරට සේවා වියුක්තිය අඩු වී තිබේ. රැකියා අවස්ථා ඇතිවීම, ජනගහන වෙනස්වීම් සහ විදේශ සංක්‍රමණ ආදී හේතුවල සංකලනයක් මෙම ප්‍රවණතාවට බොහෝ දුරට හේතු වී ඇත (Nanayakkara, 2004). එසේ වුව ද, සමස්ත සේවා වියුක්තියෙන් අඩකට වඩා වැඩි වන මෙරට තරුණ සේවා වියුක්තිය තවදුරටත් තදබල ප්‍රශ්නයක්ව පවතී. වගු සටහන් 2.3න් පෙන්නුම් කෙරෙන අන්දමට, ශ්‍රී ලංකාවේ තරුණ සේවා වියුක්තිය ඉතා ඉහළ මට්ටමක පවතින අතර රටේ සාමාන්‍ය සේවා වියුක්ති ප්‍රතිශතය මෙන් කිහිප ගුණයක එය තවමත් පවතී. අධ්‍යාපනික අංශයෙන් ලබාගත් ඉහළ මට්ටමේ කාර්ය සාධනයේ ප්‍රතිඵලයක් ලෙස නිශ්චිත ක්ෂේත්‍රයක යහපත් රැකියාවක් ලබාගැනීමේ පැහැදිලි සහ අරුත් ගැන් වූ අභිලාෂයන් තරුණයින්ට පවතී. විද්‍යාර්ථීන් පෙන්වා දෙන අන්දමට, ආර්ථිකය විසින් නිර්මාණය කරනු ලබන රැකියා රටාවන් සහ රැකියා ලබාගැනීමේ බලාපොරොත්තුවෙන් සිටින පිරිසේ රැකියා තෝරා ගැනීමේ රටාව අතර කැපී පෙනෙන අන්දමේ නො ගැළපීමක් පවතී.

වගුව 2.3: තරුණ විරැකියාව (අවුරුදු 15-29 අතර වයස් කාණ්ඩය)

| වසර | මුළු රැකියා වියුක්තිකයින්ගේ ප්‍රතිශතයක් ලෙස තරුණ සේවා වියුක්තිය (අවුරුදු 15-29 අතර) | රැකියා විරහිත මුළු සංඛ්‍යාව | සමස්ත සේවා වියුක්තිය (ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස) |
|---|---|---|---|
| 1990 | 79.9 | 953,794 | 15.9 |
| 1991 | 78.2 | 861,680 | 14.7 |
| 1992 | 80.5 | 845,957 | 14.6 |
| 1993 | 77.8 | 830,910 | 13.8 |
| 1994 | 79.2 | 797,591 | 13.1 |
| 1995 | 79.4 | 749,021 | 12.3 |
| 1996 | 81.4 | 704,604 | 11.3 |
| 1997 | 83.0 | 658,297 | 10.5 |
| 1998 | 80.3 | 611,285 | 9.2 |
| 1999 | 81.6 | 590,846 | 8.9 |
| 2000 | 82.3 | 517,168 | 7.6 |
| 2001 | 84.4 | 537,246 | 7.9 |
| 2002 | 83.5 | 625,967 | 8.8 |
| 2003* | 82.9 | 640,961 | 8.4 |
| 2004** | 81.4 | 667,324 | 8.3 |
| 2005**** | 80.7 | 623,341 | 7.7 |
| 2006*** | 78.3 | 493,440 | 6.5 |
| 2007*** | 76.6 | 447,021 | 6.0 |
| 2008* | 75.1 | 433,397 | 5.4 |
| 2009* | 72.7 | 471,254 | 5.8 |
| 2010* | 74.7 | 215,578 | 7.7 |
| 2011 තෙවැනි කාර්තුව | 77.6 | 323,033 | 3.9 |

සටහන: *2002 වසරේ 2 වැනි කාර්තුව දක්වා උතුරු සහ නැගෙනහිර පළාත් ඇතුළත්ව නැත.

**නැගෙනහිර පළාත ඇතුළත්ව ඇති නමුත් උතුරු පළාත ඇතුළත්ව නැත.

***කිලිනොච්චි සහ මුලතිවු දිස්ත්‍රික්ක ඇතුළත්ව නොමැත.

****සියලු දිස්ත්‍රික්ක ඇතුළත්ව ඇත.

මූලාශ්‍ර: ශ්‍රම බලකා සමීක්ෂණය: වාර්ෂික වාර්තාව-2009, ශ්‍රම බලකා සමීක්ෂණය, තුන්වැනි කාර්තුවේ වාර්තාව-2011

ආර්ථිකයේ පවතින ඉල්ලුම සමග සැසඳීමේ දී, වෘත්තීයමය සහ "සුදු කරපටි රැකියා" සඳහා ඉල්ලුමට වඩා සැපයුමක් පැවතිය ද කෘෂිකර්ම, ධීවර, ශිල්පීය සහ සේවා ආදී අංශවල කය වෙහෙසා සිදු කළ යුතු සහ මූලික රැකියා \ සඳහා ශ්‍රම සැපයුම ඉල්ලුමට වඩා අඩු . මට්ටමක පවතී. හෙට්ටිගේ සහ මේයර් (2002) සඳහන් කරන පරිදි, ශ්‍රී ලංකාවේ තරුණ සේවා වියුක්තිය ඉහළ මට්ටමක පවතින අතර තරුණයින්ගෙන් ඉතා ඉහළ ප්‍රතිශතයක් අඛණ්ඩව අධ්‍යාපනයේ නිරතව සිටී. එම නිසා, තරුණයින්ගෙන් බොහෝ දෙනෙකු තම මූලික අවශ්‍යතා සඳහා ඔවුන්ගේ පවුල් මත යැපේ.

ශ්‍රී ලංකාවේ ශ්‍රම සහ සමාජ ප්‍රවණතා (2009) වාර්තාවේ විශ්ලේෂකයින් උපකල්පන තුනක් ඔස්සේ මෙරට තරුණ සේවා වියුක්තියේ පැවැත්ම විස්තර කිරීමට උත්සහ දරා ඇත.

1. නිරන්තර උපුටා දක්වන 'නිපුණතාවන්ගේ නො ගැළපීම' යන උපකල්පනය, අධ්‍යාපන ක්‍රමයේ දුර්වලතා හේතුවෙන් උගත් ශ්‍රමිකයින් කණ්ඩායමට නොගැළපෙන සහ අලෙවි කිරීමේ හැකියාවකින් තොර පුහුණුවීම් පවත්වාගෙන යාම මත පදනම් වේ.

2. ආරක්ෂාව, ඉහළ සමාජ පිළිගැනීම සහ නිර්ලෝභීව සැලසෙන වාසිවලින් සමන්විත වූ රාජ්‍ය අංශයේ "හොඳ රැකියා" සඳහා අවස්ථාවන් ලබාගැනීමේ බලාපොරොත්තුවෙන් විරැකියාවෙන් පසුවීම සම්බන්ධ කර ගනිමින් පෝලිම් ගැසී සිටීමේ උපකල්පනය ගොඩ නගනු ලබයි.

3. ශ්‍රම වෙළඳපොළේ පවතින ආයතන විධිමත් ආකාරයේ රැකියා උත්පාදනයේ පිරිවැය ඉහළ දමන බවත්, එයින් විධිමත් රැකියා උත්පාදන ප්‍රමාණය සකසන බවත්, සේවකයින්ගෙන් විශාල ප්‍රමාණයකට අවිධිමත් අංශයේ රැකියා සඳහා බල කෙරෙන බවටත් වන මතය "ආයතනික උපකල්පනයෙන්" ඉදිරිපත් කෙරේ. විශේෂයෙන් ම, දැඩි සේ සීමා පනවා ඇති රැකියා, ආරක්ෂිත නීති රෙගුලාසි, ඉහළ ශ්‍රම පිරිවැය සහ රැකියා ජනනය අවිධිමත්වීම මේ සඳහා බලපානු ලබයි.

තරුණ සේවා වියුක්ති අනුපාතය සහ සේවා වියුක්ති අනුපාතය ඉහළ නැංවීමට බලපානු ලබන වෙනත් සාධක රාශියකි. උදාහරණ වශයෙන් සමාජ අගය කිරීම් සහ ව්‍යවසායික සංස්කෘතියේ නිපුණතාවල හිඟය තරුණයින් තුළ ඉහළ ප්‍රමාණයක සේවා වියුක්තිය සඳහා බලපෑම් කරනු ලබන ඇතැම් සාධක වේ. කෙසේ වුව ද, යෝග්‍ය සහ මනාව ගෙවනු ලබන රැකියා අවස්ථා නො ලැබෙන විට අඩු වැටුප් සහිත නිරන්තරයෙන් අනාරක්ෂිත රැකියා හෝ සංවර්ධනය වෙමින් පවතින රටවල අඩු අස්වැන්නක් සහිත ඉඩම් කැබලි වගා කිරීම හෝ අවිධිමත් අංශයේ අස්ථාවර ආදායම් ලබන ස්වයං රැකියා වෙත යොමුවීමට පුද්ගලයින්ට බලකරනු ලබයි (Geest, 2010). ශ්‍රී ලංකාවේ තරුණයින් මේ හා සමාන තත්ත්වයන්ට මුහුණ දේ.

## 2.7 පෙර සිදු කරන ලද අධ්‍යයන

ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය (ලෝ.ආ.කෘ.ස.) සංවර්ධනය වන රටවල තරුණ සේවා වියුක්තිය සම්බන්ධව ලෝක ව්‍යාප්තව සිදු කරන ලද අධ්‍යයනයේ දී කෘෂිකර්මාන්තයේ යෙදෙන තරුණයින් පිළිබඳව අවධානය යොමු කර ඇත. මෙම අධ්‍යයනයට අනුව, කෘෂිකාර්මික චක්‍රයේ ප්‍රබල කන්න ක්‍රමයක් පවතින විට ඌන සේවා නියුක්තිය කෘෂිකර්මාන්තය තුළ දෘශ්‍යමාන වේ. එවැනි වගා ක්‍රමවල දී, අවුරුද්දේ නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළ ශ්‍රමය සඳහා ඉහළ ඉල්ලුමක් පවතී. වගා කටයුතු අඩුවෙන් සිදු කෙරෙන කන්නවල ග්‍රාමීය ශ්‍රම බලකායේ ඌන උපයෝජනයක් පවතී. මෙකී වාතාවරණය තුළ, කන්න ක්‍රමයේ පවතින දුබලකම පිටුදැකීම සඳහා වැදගත් උපක්‍රම වන්නේ වරින් වර පදිංචි ස්ථානයෙන් පිටට සිදුවන සංක්‍රමණ සහ එක් රැකියාවකින් තවත් රැකියාවකට සංක්‍රමණය වීමය. මෙකී ජීවනෝපායයන්ට අනුගතවීමේ ක්‍රමය කාලයත් සමග වෙනස් වෙමින් ශතවර්ෂ ගණනාවක් තිස්සේ පැවත එයි. ඉඩම් හිඟ ප්‍රදේශවල ද, පූර්ණ කාලීන අවධානය යොමු කිරීමට අවශ්‍ය නොවන ඉතා කුඩා ගොවිපළවල් ජනතාව සතුවන ප්‍රදේශවල ද ඌන සේවා නියුක්තිය දෘශ්‍යමාන විය හැකි ය. කෘෂිකර්මාන්තයෙ හි දෘශ්‍යමාන නොවී පවතින ඌන සේවා නියුක්තිය ඉතා දුප්පත් රටවල තියුණු ප්‍රශ්නයකි. සංවර්ධනය වෙමින් පවතින රටවල හිතකර නොවන පාරිසරික තත්ත්වයන්, නො දියුණු තාක්ෂණය, වෙළඳපොළට ප්‍රවේශවීමට ඇති අඩු හැකියාව සහ ප්‍රාග්ධන ආයෝජනයේ හිඟය හේතුවෙන් ගොවිපළ ශ්‍රමය සඳහා ලැබෙන ප්‍රතිලාභ නිරන්තරයෙන් පහළ මට්ටමක පවතී (Geest, 2010).

මෙම අධ්‍යයනයේ දී ග්‍රාමීය තරුණයින්ගේ රැකියාවල ගුණාත්මකභාවය සම්බන්ධයෙන් ද අවධානය යොමු කොට තිබේ. ඒ අනුව, ඌන සංවර්ධිත රටවල තරුණ පිරිස ඔවුන්ගේ දෙමාපියන්ගේ පරම්පරාවට වඩා හොඳ අධ්‍යාපනයක් ලබා ඇති අතර වෙනස්වීම් සඳහා බොහෝ විට කැමැත්තෙන් පසු වේ. එම නිසා කෘෂිකාර්මික ව්‍යාප්ති උත්සාහයන් තරුණයින්ගේ මතු බලාපොරොත්තු ඉලක්ක කොට ඇත. කෘෂිකාර්මික ශ්‍රමිකයෙකු, පවුලේ ශ්‍රමිකයෙකු හෝ ස්වාධීන ගොවියෙකු ලෙස හෝ ඉඩමේ වැඩකර තරුණයින්ට ඉහළ මට්ටමේ ජීවිතයක් ගත කළ හැකි නම් පමණක් ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ රැකියා කෘෂිකර්මාන්තයෙ හි පැවතිය හැකි ය. බෙනෙල් (Bennell, 2007) පෙන්වා දෙන අන්දමට, සංවර්ධනය වෙමින් පවතින රටවල බොහෝ තරුණයින් සේවා නියුක්තිකයින් (වැටුප් ලබන හෝ ස්වයං රැකියා) හෝ නැතහොත් ශ්‍රම බලකායට අයත් නොවන හෙයින් තරුණ විරැකියාව යනු තියුණු ගැටලුවක් නොවේ. කෙසේ වුව ද, දැඩි ඌන සේවා නියුක්තිය සහ ගෘහස්ථ ක්‍රියාකාරකම්වල අඩු ඵලදායීතාව සංවර්ධනය වෙමින් පවතින රටවල ප්‍රශ්නයකි. බෙනෙල් තවදුරටත් අනාවරණය කරන අන්දමට, තරුණයින් ජීවත් වන ගෘහ ඒකකවලින් 1/4ක, එක් පුද්ගලයෙකුගේ දෛනික ආදායම ඇමෙරිකානු ඩොලර් 01ට වඩා අඩු ය. සුළු පරිමාණ කෘෂිකර්මාන්තයෙන් ඉවත් වෙමින් වෙනත් රැකියා සඳහා ජාතික සහ අන්තර් ජාතික වශයෙන් පිටතට සංක්‍රමණය වීමේ නැඹුරුව තරුණයින් අතර වර්ධනය වෙමින් පවතී.

ග්‍රාමීය චීනයේ ගොවිපළ හා ගොවිපළ නොවන යන දෙඅංශයේ ම රැකියා තෝරා ගැනීම් දී ස්ත්‍රී/පුරුෂ භාවය, විවාහක/අවිවාහක භාවය, ගෘහ ඒකකයේ ශ්‍රමිකයින් සඳහා ඉඩම් පැවතීම, පවුලේ ප්‍රමාණය, පවුලේ යැපෙන්නන් සංඛ්‍යාව, ගෘහ ඒකකයේ ආදායම, අධ්‍යාපනය සහ නිපුණතා ඇතුළත් වූ වෙළඳපොළ සාධක තදින් බලපායි. තව ද, දේශපාලන පක්ෂ සාමාජිකයෙක් හෝ පළාත් පාලන ආයතනයේ නිලධාරියෙකු වීම වැනි දේශපාලන සාධක ද, සමීපතම නගරයට ඇති දුර ප්‍රමාණය, ප්‍රවාහන පහසුකම් පැවතීම ආදී භූගෝලීය සාධක ද, ග්‍රාමීය චීන ජනතාවගේ ගොවිපළ හෝ ගොවිපළ නොවන රැකියා තෝරා ගැනීමේ දී දැඩිව බලපෑම් කරනු ලබන සාධක වේ (xia, දාතම නොමැති).

ගොවිපළෙන් දැනට ලැබෙන ආදායම, අධ්‍යාපන මට්ටම, ගොවිපළේ හි ප්‍රමාණය (ඉඩම් ප්‍රමාණය සහ සතුන් සංඛ්‍යාව) අයර්ලන්තයේ පසු උරුමකරුවන් ලෙස නම් කර ඇති පුද්ගලයින් රැකියා තෝරා ගැනීම හා දැඩිව බැඳී පවතී (Hennessy and Rehman, දාතම නොමැති). හෙන්සි සහ රේමන්ට අනුව, ගොවි පවුල්වල තරුණයින් අතර තෘතියික අධ්‍යාපනය සඳහා යොමුවීමේ ඉහළ ප්‍රවණතාවක් පවතී. එහි ප්‍රතිඵලයක් ලෙස අයර්ලන්තයේ පූර්ණ කාලීන ගොවීන් සහ මුළු ගොවිපළවල් සංඛ්‍යාව අඩු වී ඇත. එම නිසා, තෘතියික අධ්‍යාපනයේ නියැලීමට ගනු ලබන තීරණය ගොවිපළ ආදායම කෙරෙහි නිශේධනාත්මක ලෙස බලපා තිබේ.

'කෘෂිකර්මාන්තයේ ග්‍රාමීය තරුණයින්ගේ භූමිකාව සහ පකිස්ථානයේ ග්‍රාමීය සංවර්ධනය' පිළිබඳ අධ්‍යයනයේ සොයාගැනීම් පෙන්නුම් කරන්නේ, තරුණියන් ජාතිය සතු වැදගත් සම්පතක් වුවත්, නොයෙක් නියෝජිත ආයතන විසින් ඔවුන් සුරාකෑමට ලක් කර ඇති බවත්, රජය හෝ ජාතිය විසින් ඔවුන්ගේ ධාරිතාවන් සහ හැකියාවන් පූර්ණ උපයෝජනයට ගෙන නොමැති බවත් ය (Tahir සහ වෙනත් අය, 2011). ඕස්ට්‍රේලියාවේ කෘෂිකාර්මික අංශයට වැඩිපුර ශ්‍රමය අවශ්‍ය වුවත්, එම ක්ෂේත්‍රය සඳහා තරුණයින් ආකර්ෂණය කර ගැනීමේ හැකියාවක් නොමැත. එයට හේතු වී ඇත්තේ කෘෂිකර්මාන්තයේ වෘත්තීයමය ස්වභාවය අඩුවීමත්, සුදු කරපටි රැකියාවන් සඳහා වන තරුණ අපේක්ෂාවන් සහ ආකල්පයන් ය (Livingstone, 2011).

ෂර්මා (Sharma, 2007) පෙන්වා දෙන අන්දමට කෘෂිකර්මාන්තයෙන් තරුණයන් ඉවත්වීමේ ප්‍රවණතාව සම්බන්ධයෙන් ප්‍රමාණවත් තරම් සාධක පවතී. ඉහළ කුලවල, වඩා යහපත් අධ්‍යයන මට්ටමක් සහිත සහ කෘෂිකාර්මික නොවන නිපුණතා සහිත තරුණයින් අතර පෞද්ගලික හෝ ගෘහ ඒකක මට්ටමින් ගත්ත ද මෙම ප්‍රවණතාව දැඩිව පවතී. ෂර්මා (2007) විස්තර කරන්නේ ඉන්දියාවේ තරුණයින්ගෙන් 34% තම පියාගේ හෝ මාමණ්ඩියගේ කෘෂිකාර්මික කටයුතුවලට සහාය දෙමින් අර්ධ කාලීනව කෘෂිකර්මාන්තයේ නියැලෙන අතර නගරාශ්‍රිත ගම්මානවල එය 46% දක්වා ඉහළ මට්ටමක පවතින බවයි. ඉඩම් කැබලිවල ප්‍රමාණය, කෘෂිකාර්මික නිෂ්පාදනවල ඒක පුද්ගල වටිනාකම, අධ්‍යාපන මට්ටම, නිපුණතා සහ කුල ක්‍රමය ආදී සාධක ගණනාවක් ඉන්දීය තරුණයින්ගේ කෘෂිකාර්මික සහභාගීත්වයට බලපානු ලබයි. පූර්ණ කාලීන කෘෂිකර්මාන්තය පිළිබඳ සැලකීමේ දී ගොවීන්ගෙන් 60% පමණ පසුගාමී සහ ලේඛනගත කුලවල

(Shedule) අය වේ. සිත් ඇදගන්නා සුළු කරුණ වන්නේ, කුඩා සහ ආන්තික ඉඩම් හිමි පන්ති සහ විශාල ඉඩම් හිමි පන්තිය යන දෙ කොට්ඨාසය ම කෘෂිකර්මාන්තයෙන් ඉවතට යන ප්‍රවණතාවක් පැවතීම ය.

ඉඩම් නොමැතිකම, කළමනාකරණ සහ තාක්ෂණික නිපුණතාවේ හිඟය, කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් වන නිශේධනාත්මක ආකල්ප (Jayatissa, Seneviratne and Sanker, 2005) සහ සුදු කරපටි රැකියා අවස්ථා සඳහා වන ආකල්පය (Hettige and Mayer, 2002) ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට තරුණ දායකත්වය අඩු කිරීම සඳහා බලපා ඇති බව ඇතැම් විද්‍යාර්ථීන්ගේ මතය යි. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ 2011 වසරේ දී සිදු කරන ලද සමීක්ෂණයකින් අනාවරණය කරනු ලැබ ඇත්තේ රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තය තෝරා ගැනීම සඳහා වයස, කෘෂිකර්මාන්තයේ අත්දැකීම්, කුඹුරු ඉඩම් ප්‍රමාණය වැඩිවීම, වෘත්තීය පුහුණුව, විධිමත් කෘෂිකාර්මික අධ්‍යාපනය සහ පශු සම්පතෙ හි හිමිකම ආදී සාධක රාශියක් පවතින බවයි (Chandrasiri and Karunagoda, 2011).

ආසියා පැසිෆික් කලාපය සඳහා වූ එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජයීය කොමිසම (UNESCAP) විසින් සිදු කළ ජාතික මට්ටමේ අධ්‍යයනයට අනුව, ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් විශාල පිරිසක් කුඩා ගොවිපළවල අයිතිකරුවන් ලෙස, වැටුප් ලබන ශ්‍රමිකයින් ලෙස හෝ හවුල්කරුවන් ලෙස කටයුතු කරති. මෙරට වී වගා ක්ෂේත්‍රය තුළ මේ තත්ත්වය විශේෂයෙන් ම දැකිය හැකි වේ. කෘෂිකාර්මික සමාජයේ මෙම කොටස විවිධ ආයතනික ව්‍යුහාත්මක ලක්ෂණවලින් අභිලක්ෂණීය වී ඇත. කුඩා සහ වගා කිරීම ආර්ථිකමය වශයෙන් වාසි සහගත නොවන, හවුල් භුක්තිය, අනුප්‍රාප්තික ඉඩම් හිමිකම ආදී පෞරාණික ඉඩම් භුක්ති ක්‍රම, ග්‍රාමීය ජීවිතයේ සාම්ප්‍රදායික බල ව්‍යුහය, ග්‍රාමීය ප්‍රදේශවල විධිමත් ණය දෙන ආයතන ව්‍යාප්තිය වෙනුවට අවිධිමත් ණය දෙන ආයතනවල ආධිපත්‍ය, කෘෂි නිෂ්පාදන අලෙවියේ දී අතරමැදියන්ගේ ක්‍රියාකාරකම් සහ ඵලදායී සමුපකාර සහ ගොවි සංවිධාන නොවීම ආදිය කෘෂිකාර්මික ක්ෂේත්‍රයට තරුණයින් ඇතුළුවීම වැළැක්වීමට ප්‍රමුඛව බලපාන සාධක වේ.

# තෙ වැනි පරිච්ඡේදය
# ප්‍රතිචාරීන්ගේ සමාජ-ආර්ථික පසුබිම

## 3.1 හැඳින්වීම

මෙම පරිච්ඡේදයෙන් අධ්‍යයනයේ ප්‍රතිචාරීන්ගේ සමාජ-ආර්ථික පසුබිම ඉදිරිපත් කරයි. ඒ අනුව, මෙම පරිච්ඡේදයෙන් ප්‍රතිචාරීන්ගේ ජන විකාශන පසුබිම, කෘෂිකර්මයට සම්බන්ධිත කාර්යයන් හි ඔවුන්ගේ සහභාගීත්වය, ඉඩම් හිමිකම, ඉඩම් පරිහරණ රටාව සහ වෘත්තීය පුහුණුවීම් විස්තර කෙරේ.

## 3.2 ප්‍රතිචාරීන්ගේ ජන විකාශන පසුබිම

අධ්‍යයනය ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක නවයක එනම්, නුවරඑළිය, කුරුණෑගල, මාතලේ, පොළොන්නරුව, අනුරාධපුර, හම්බන්තොට, මොණරාගල, මඩකලපුව සහ අම්පාර යන ප්‍රදේශවල සිදු කෙරිණි. අවුරුදු 15-29 අතර වයස් කාණ්ඩයට අයත් තරුණ තරුණියන් 533ක් අධ්‍යයන නියැදියට අයත් විය.

වගුව 3.1: ස්ත්‍රී/පුරුෂ භාවය හා වයස අනුව නියැදිය

| වයස් කාණ්ඩය | ස්ත්‍රී/පුරුෂ භාවය | | | | සමස්තය (සංඛ්‍යාව=533) | |
|---|---|---|---|---|---|---|
| | ස්ත්‍රී (සංඛ්‍යාව=181) | | පුරුෂ (සංඛ්‍යාව=352) | | | |
| | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
| අවුරුදු 15 | 13 | 7.2 | 22 | 6.3 | 35 | 6.6 |
| අවුරුදු 15-20 | 63 | 34.8 | 127 | 36.1 | 190 | 35.6 |
| අවුරුදු 20-25 | 52 | 28.7 | 81 | 23.0 | 133 | 24.9 |
| අවුරුදු 25-29 | 53 | 29.3 | 122 | 34.6 | 175 | 32.8 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

අධ්‍යයන නියැදියේ ප්‍රතිචාරීන්ගෙන් 35.6%ක් (190) අවුරුදු 15-20 අතර වයස් කාණ්ඩයට අයත් වූ අතර 24.9% (133)ක් වයස අවුරුදු 20-25 වයස් කාණ්ඩයට ද, 32.8%ක් (175) අවුරුදු 25-29 වයස් කාණ්ඩයට ද අයත් වූහ (වගුව 3.1). නියැදියේ සමස්ත ප්‍රතිචාරීන්ගෙන් 34%ක් (181) ස්ත්‍රීන් වූ අතර 66%ක් (352) පුරුෂයෝ වූහ (වගුව 3.1).

වගුව 3.2: වයස් කාණ්ඩය සහ විවාහක/අවිවාහක බව අනුව නියැදිය

| වයස් කාණ්ඩය | විවාහක/අවිවාහක බව | | | |
|---|---|---|---|---|
| | විවාහක | | අවිවාහක | |
| | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
| අවුරුදු 15 | 0 | 0.0 | 35 | 9.9 |
| අවුරුදු 15-20 | 10 | 5.6 | 180 | 50.8 |
| අවුරුදු 20-25 | 44 | 24.6 | 89 | 25.1 |
| අවුරුදු 25-29 | 125 | 69.6 | 50 | 14.1 |
| එකතුව | 179 | 100.0 | 354 | 100.0 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

වගු සටහන් 3.2න් පෙන්නුම් කෙරෙන අන්දමට ප්‍රතිචාරීන්ගෙන් 66.4% (354)ක් අවිවාහක අය වන අතර 33.6% (179)ක් විවාහකයෝ වූහ. විවාහක ප්‍රතිචාරීන් අතුරින් 69.6% (125)ක් අවුරුදු 25-29 වයස් කාණ්ඩයට අයත් වූහ. අවුරුදු 15-20 වයස් කාණ්ඩයේ 5.6% (10)ක් පමණක් විවාහකයෝ වූහ.


වගුව 3.3: ජනවාර්ගිකත්වය අනුව නියැදිය

| ජනවාර්ගිකත්වය | ස්ත්‍රී/පුරුෂ භාවය | | | | සමස්තය | |
|---|---|---|---|---|---|---|
| | ස්ත්‍රී | | පුරුෂ | | | |
| | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
| සිංහල | 162 | 89.5 | 313 | 88.9 | 475 | 89.1 |
| ශ්‍රී ලාංකික දෙමළ | 9 | 5.0 | 17 | 4.8 | 26 | 4.9 |
| ඉන්දියානු දෙමළ | 8 | 4.4 | 16 | 44.5 | 24 | 4.5 |
| මුස්ලිම් | 2 | 1.1 | 6 | 1.7 | 8 | 1.5 |
| එකතුව | 181 | 100.0 | 352 | 100.0 | 533 | 100.0 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

නියැදියෙන් 89.1% (475)ක් සිංහල වූ අතර 4.9% (26)ක් ශ්‍රී ලාංකික දෙමළ ද, 4.5% (24)ක් ඉන්දියානු දෙමළ ද, 1.5% (08) ක් මුස්ලිම් ද වූහ (වගුව 3.3).

රූ සටහන 3.1: කාර්යය සහ වයස අනුව නියැදිය





මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

නියැදියට ඇතුළත් වූ ශිෂ්‍යයන්ගෙන් බොහෝ දෙනෙක් වයස අවුරුදු 15 සහ අවුරුදු 15-20 වයස් කාණ්ඩවලට අයත් වූහ (රූ සටහන 3.1). මේ අනුව, අධ්‍යයන කටයුතුවල නිරතවන ප්‍රතිචාරීන්ගෙන් 25.4% (31)ක් වයස අවුරුදු 15 සහ 61.5% (75)ක් අවුරුදු 15-20 අතර කාණ්ඩවලට අයත් වූහ. සේවා නියුක්ත ප්‍රතිචාරීන්ගෙන් බහුතරය අවුරුදු 25-29 අයත් වූහ. සේවා නියුක්ත ප්‍රතිචාරීන් අතුරින් 53% (148)ක් අවුරුදු 25-29 කාණ්ඩයටත්, 27.2% (76)ක් අවුරුදු 20-25 වයස් කාණ්ඩයටත් අයත් වූහ. සේවා නියුක්තියන්ගෙන් අවුරුදු 25ට අඩු වයස් කාණ්ඩ සමඟ සන්සන්දනයේ දී වයස අවුරුදු 25-29 අතර කාණ්ඩයේ පැහැදිලි වැඩිවීමක් පෙන්නුම් කරනු ලැබිණි.

වයස සහ කාර්යය අතර පැහැදිලි සම්බන්ධයක් පවතී. ඒ අනුව ප්‍රතිචාරීන් අතුරින් බොහෝ ශිෂ්‍යයන් සහ සේවා වියුක්ත පුද්ගලයින් වයස අවුරුදු 20ට වඩා අඩු වූහ. එයට පරස්පරව, වයස අවුරුදු 20ට වැඩි ප්‍රතිචාරීන් අතර සේවා නියුක්තිකයින්ගේ ප්‍රතිශතය ඉහළ මට්ටමක පැවතුණි.

රූ සටහන 3.2: කාර්යය සහ ස්ත්‍රී-පුරුෂ භාවය අනුව නියැදිය




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

පුරුෂ පක්ෂයේ ප්‍රතිචාරීන්ගෙන්, 65.9% (232)ක් සේවා නියුක්ත වූ අතර 12.2% (143)ක් සේවා වියුක්තිකයෝ වූහ. ස්ත්‍රී ප්‍රතිචාරීන් අතර සේවා වියුක්ත සහ සේවා නියුක්ත ප්‍රමාණය අතර කැපී පෙනෙන වෙනසක් දැකිය නො හැකි විය. ප්‍රතිචාරීන්ගෙන් 26.5% (48)ක් සේවා නියුක්ත වූ අතර 27.6% (50)ක් සේවා වියුක්තිකයෝ වූහ.

පුරුෂ ප්‍රතිචාරීන්ගෙන් බහුතරය ආර්ථිකව සක්‍රීය වූ අතර ස්ත්‍රී ප්‍රතිචාරීන්ගෙන් සැලකිය යුතු පිරිසක් විශේෂයෙන් ම, ඔවුන්ගේ විවාහයෙන් පසුව ගෘහ ආශ්‍රිත කටයුතුවල නිරත වූහ. මෙවැනි තත්ත්වයක් පැවතිය ද, ස්ත්‍රීන් විසින් තම පවුල වෙනුවෙන් සිදු කරන ආර්ථිකමය දායකත්වය නො සලකමින් ඇතැම් අවස්ථාවල දී ස්ත්‍රීන්ගේ ආර්ථික දායකත්වය සැඟවුණු සාධකයක් ලෙස පවතී. උදාහරණ වශයෙන් ස්ත්‍රී ප්‍රතිචාරීන් අතර පවුලේ ශ්‍රමිකයින් ලෙස ශ්‍රම දායකත්වය සපයන සැලකිය යුතු පිරිසක් වූ නමුත් ඔවුන් විසින් ම තමන් සේවා වියුක්තිකයින් ලෙස හඳුනා ගැණිනි.

වගුව 3.4: ප්‍රාථමික රැකියාව සහ වයස අනුව නියැදිය


| රැකියාව | වයස් කාණ්ඩය | | | | සමස්තයෙහි ප්‍රතිශතය (සංඛ්‍යාව= 283) |
|---|---|---|---|---|---|
| | අවු: 15 | අවු: 15-20 | අවු.: 20-25 | අවු: 25-29 | |
| | ප්‍රතිශතය (සංඛ්‍යාව=2) | ප්‍රතිශතය (සංඛ්‍යාව=65) | ප්‍රතිශතය (සංඛ්‍යාව=76) | ප්‍රතිශතය (සංඛ්‍යාව=145) | |
| ගොවිතැන | 100 | 55.4 | 56.6 | 69.6 | 64.3 |
| නු පුහුණු ශ්‍රමික | 0 | 11.0 | 6.6 | 2.8.0 | 5.7 |
| ලිපිකරු/ගුරු | 0 | 0.0 | 2.6 | 1.4 | 1.4 |
| ස්වයංරැකියා/ව්‍යාපාර | 0 | 7.7 | 3.9 | 9.7 | 7.8 |
| විධායක රැකියා | 0 | 0.0 | 0.0 | 0.7 | 0.3 |
| පුහුණු රැකියා | 0 | 4.6 | 10.5 | 7.7 | 7.8 |
| ආරක්ෂක අංශ/පොලීසිය | 0 | 6.1 | 2.6 | 2.8 | 3.5 |
| පෞද්ගලික අංශයේ අනෙකුත් | 0 | 7.7 | 11.8 | 2.1 | 6.1 |
| රාජ්‍ය අංශයේ අනෙකුත් | 0 | 7.7 | 5.3 | 2.9 | 2.8 |
| බැංකු/සමුපකාර සහ අනෙකුත් මූල්‍ය ආයතන | 0 | 0.0 | 0.0 | 0.7 | 0.3 |
| එකතුව | 100 | 100 | 100 | 100 | 100 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

ප්‍රාථමික රැකියා සහිත ප්‍රතිචාරීන් අතුරින් 64.3% (183)ක් ගොවීන් වූ අතර 7.8% (22)ක් පුහුණු ශ්‍රමිකයින් ද, 5.7% (16)ක් නුපුහුණු ශ්‍රමිකයෝ ද වූහ (වගුව 3.4). ඉහළ වැටුප් සහ වඩා පිළිගත් රැකියා ලෙස පොදුවේ සලකන විධායක මට්ටමේ රැකියාවල නියුතු එක් පුද්ගලයෙක් සහ මූල්‍ය අංශයේ රැකියාවක නියුතු එක් පුද්ගලයෙකු නියැදියට අයත් විය.

සියලු වයස් කාණ්ඩවලට අයත් සේවා නියුක්තිකයන්ගෙන් බහුතරය ගොවීහු වූහ. ඒ අනුව, අවුරුදු 25-29 වයස් කාණ්ඩයේ සේවා නියුක්තිකයන්ගෙන් 69.6% (101)ගේ ප්‍රාථමික රැකියාව කෘෂිකර්මාන්තය විය. වයස අවුරුදු 15-20 කාණ්ඩයේ සේවා නියුක්තිකයන්ගෙන් 55.4% (36) ද, අවුරුදු 20-25 කාණ්ඩයේ සේවා නියුක්තියන්ගෙන් 56.6% (43) ද, ගොවීහු වූහ. වයස අවුරුදු 15 කාණ්ඩයේ ප්‍රතිචාරීන් තවමත් පාසැල් යන වයසේ පසු වුව ද, ඉන් දෙදෙනෙක් ගොවීහු ලෙස සේවා නියුක්ත වූහ.

රූ සටහන 3.3: ගෘහ ඒකකයේ යැපෙන්නන් සංඛ්‍යාව අනුව නියැදිය




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

ගෘහ ඒකකවලින් බහුතරයක යැපෙන්නන් සංඛ්‍යාව පහට වඩා අඩු විය. නියැදියේ ගෘහ ඒකකවලින් 35.8% (191)ක යැපෙන්නන් සංඛ්‍යාව දෙදෙනෙකු වූ අතර 23.6% (126)ක් එක් යැපෙන්නෙකු ද, 18% (96)ක යැපෙන්නන් තිදෙනෙකු ද සහිත ඒවා විය. ප්‍රතිචාරීන්ගේ ගෘහ ඒකකවලින් 9.4% (50)ක් යැපෙන්නන් රහිත ඒවා වූ අතර 0.6% (3)ක් යැපෙන්නන් පස් දෙනෙකුට වැඩි ඒවා විය (රූ සටහන 3.3).

වගුව 3.5: ස්ත්‍රී/පුරුෂ භාවය අනුව අධ්‍යාපන මට්ටම

| අධ්‍යාපන මට්ටම | ස්ත්‍රී | | පුරුෂ | | සමස්ත | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| පාසැල් අධ්‍යාපනය නොලත් | 1 | 0.6 | 1 | 0.3 | 2 | 0.4 |
| 1-5 වසර | 1 | 0.6 | 3 | 0.9 | 4 | 0.7 |
| 6 වසර-අ.පො.ස. සා.පෙළ | 69 | 38.1 | 166 | 47.2 | 235 | 44.1 |
| සා. පෙළ අධ්‍යාපනය ලබන | 7 | 3.9 | 20 | 5.7 | 27 | 5.1 |
| සා.පෙළ සමත් | 30 | 16.6 | 62 | 17.6 | 92 | 17.3 |
| උ. පෙළ අධ්‍යාපනය ලබන | 15 | 8.3 | 22 | 6.3 | 37 | 6.9 |
| උ. පෙළ දක්වා අධ්‍යාපනය ලද | 25 | 13.8 | 15 | 4.3 | 40 | 7.5 |
| උ. පෙළ සමත් | 21 | 11.6 | 35 | 9.9 | 56 | 10.5 |
| කෘෂිකර්ම ඩිප්ලෝමාධාරී | 0 | 0.0 | 2 | 0.6 | 2 | 0.4 |
| උපාධි අපේක්ෂක | 4 | 2.2 | 13 | 3.7 | 17 | 3.2 |
| උපාධිධාරී–කෘෂිකර්ම | 4 | 2.2 | 10 | 2.8 | 14 | 2.6 |
| උපාධිධාරී–අනෙකුත් | 3 | 1.7 | 2 | 0.6 | 5 | 0.9 |
| වෙනත් | 1 | 0.6 | 1 | 0.3 | 2 | 0.4 |
| එකතුව | 181 | 100.0 | 352 | 100 | 533 | 100.0 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

වගු සටහන් 3.5න් පෙන්නුම් කෙරෙන අන්දමට ප්‍රතිචාරීන්ගෙන් 44.1% (235)ක් 6 වසරේ සිට සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය ලබා ඇති අතර ප්‍රතිචාරීන්ගෙන් 17.3% (92)ක් සාමාන්‍ය පෙළ ද, 10.5% (56) උසස් පෙළ ද සමත්ව තිබේ. අධ්‍යයන නියැදියේ 2.6% (14)ක් කෘෂිකර්ම උපාධිධාරීන් වූ අතර 3.2% (17)ක් උපාධි අපේක්ෂකයෝ වූහ. එයට පරස්පරව ප්‍රතිචාරීන්ගෙන් 0.4% (2)ක් පාසැල් අධ්‍යාපනය නොලත් අය වූහ. නියැදියේ කෘෂිකර්ම උපාධිධාරීන්ගෙන් එක් අයෙකු (7.1%) පමණක් පූර්ණ කාලීන කෘෂිකර්මාන්තයේ නියැලුණු අතර උපාධි අපේක්ෂකයින් දෙදෙනෙකු (14.2%) අර්ධ කාලීනව කෘෂිකර්මාන්තයේ නියැලෙති. ක්ෂේත්‍ර සමීක්ෂණයෙන් අනාවරණය කෙරුණු අන්දමට, කෘෂිකාර්මික ප්‍රජාවේ තරුණ ජනගහනයෙන් බහුතරයක් ඔවුන්ගේ දෙමාපියන්ට වඩා ඉහළ මට්ටමේ අධ්‍යාපනයක් ලද, ගොවීන් මුහුණ දෙන දුෂ්කරතා පිළිබඳව තම ළමා වියේ සිට අත්දැකීම් සපිරි අය වූහ. අනෙක් අතට තම අධ්‍යාපන මට්ටම ඉහළ යාමත් සමග ප්‍රතිචාරීන්ගෙන් ඇතැමෙක් කෘෂිකර්මාන්තය සමග සසඳා බැලීමේ දී සමාජයීය වශයෙන් වඩා පිළිගත්, පහසු සහ ඉහළ වැටුප් සහිත රැකියා සඳහා කැමැත්තක් දක්වනු ලබයි.

## 3.3 කෘෂිකර්මාන්තය සම්බන්ධ ක්‍රියාකාරකම්වල තරුණ සහභාගීත්වය

නියැදියේ ප්‍රතිචාරීන්ගෙන් යම් කොටසක් පූර්ණ කාලීන, අර්ධ කාලීන සහ පවුලේ ශ්‍රමිකයින් ලෙස (රැකියාවක් නොවන අයුරින්) යනා දී කුමන හෝ අන්දමකින් කෘෂිකර්මාන්තය හා සබැඳි ක්‍රියාකාරකම්වල නිරත වූ අතර ම යම් කොටසක් කිසිදු ආකාරයකින් කෘෂිකාර්මික කටයුතුවල නිරත නො වූහ. ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී නිරීක්ෂණය කළ පරිදි කෘෂිකාර්මික පසුබිමක් සහිත පවුල්වල ප්‍රතිචාරීන්ගෙන් යම් සංඛ්‍යාවක් පවා කිසිදු ආකාරයක කෘෂිකාර්මික කටයුත්තක නිරත නො වූහ.

වගුව 3.6: කෘෂිකර්මාන්තය හා සබැඳි ක්‍රියාකාරකම්වල සහභාගීත්වය

| කෘෂිකර්මාන්තය හා සම්බන්ධ කාර්යයක නියැලේ ද යන වග | ප්‍රතිචාරීන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| කෘෂිකාර්මික කටයුතුවල නියැලේ | 375 | 70.4 |
| කෘෂිකාර්මික කටයුතුවල නිරත නොවේ | 158 | 29.6 |
| එකතුව | 533 | 100.0 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

වගු සටහන් 3.6න් පෙන්නුම් කෙරෙන අන්දමට, අධ්‍යයන නියැදියේ ප්‍රතිචාරීන්ගෙන් 70.4% (375)ක් කෘෂිකාර්මික කටයුතුවල නිරත වූහ. මෙසේ කෘෂිකාර්මික කටයුතුවල නිරත වූ පුද්ගලයින් පූර්ණ කාලීනව, වැටුප් ලබන ශ්‍රමිකයින් ලෙස අර්ධ කාලීනව හෝ පවුලේ ශ්‍රමිකයින් ලෙස එම කාර්යයන් හි නියැලුණි.

වගුව 3.7: ස්ත්‍රී/පුරුෂ භාවය අනුව කෘෂිකාර්මික කටයුතුවල නිරතවීමේ ස්වභාවය

| කෘෂිකාර්මික කටයුතුවල නිරතවන ස්වභාවය | ස්ත්‍රී/පුරුෂ භාවය | | | | සමස්ත ප්‍රතිචාරීන්ගේ සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|
| | ස්ත්‍රී | | පුරුෂ | | | |
| | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
| පූර්ණ කාලීන රැකියාවක් ලෙස | 26 | 26.3 | 122 | 44.2 | 148 | 39.5 |
| අර්ධ කාලීන රැකියාවක් ලෙස | 13 | 13.1 | 86 | 31.2 | 99 | 26.4 |
| පවුලේ ශ්‍රමිකයෙකු ලෙස (රැකියාවක් ලෙස නොව) | 60 | 60.6 | 67 | 24.3 | 127 | 33.9 |
| වෙනත් | 0 | 0.0 | 1 | 4.0 | 1 | 0.3 |
| එකතුව | 99 | 100.0 | 276 | 100.0 | 375 | 100.0 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

කෘෂිකාර්මික කටයුතුවල නිරත වූ ප්‍රතිචාරීන්ගෙන් 39.5% (148)ක් පූර්ණ කාලීනව එහි නිරත වූ අතර ප්‍රතිචාරීන්ගෙන් 26.4% (99)ක් අර්ධ කාලීනව එම කාර්යයන් හි නිරත වූහ (වගුව 3.7). පුරුෂ ප්‍රතිචාරීන්ගෙන් 44.2% (122) ද, ස්ත්‍රී ප්‍රතිචාරීන්ගෙන් 26.3% (26) ද, පූර්ණ කාලීනව කෘෂිකර්මාන්තයේ නියැලුන හ. කෘෂිකාර්මික කටයුතුවල නිරත ප්‍රතිචාරීන්ගෙන් 33.9%ක් වැටුප් රහිත පවුලේ ශ්‍රමිකයින් ලෙස කටයුතු කරන අතර ස්ත්‍රීන්ගෙන් 60.6% ද, පුරුෂයින්ගෙන් 24.3% ද එම කාණ්ඩයට අයත් වූහ. ක්ෂේත්‍ර සමීක්ෂණයෙන් හෙළි කරන අන්දමට අර්ධ කාලීනව කෘෂිකර්මාන්තයේ නියැලෙන පිරිසෙන් කොටසක්, කන්න අනුව එම කටයුතුවල නිරත වන අය වූහ. ඔවුන්ගෙන් බහුතරය කෘෂිකාර්මික කටයුතු නොමැති කාලවල පෙදරේරු, වඩු කාර්මික හෝ විශේෂයෙන් ම ඉදිකිරීම් අංශයේ වැටුප් ලබන ශ්‍රමිකයින් ආදී කෘෂිකාර්මික නොවන විකල්ප ආදායම් උත්පාදන කාර්යයන් හි නියැලුන හ.

වගුව 3.8: වගාකළ බෝගය/කාර්යය


| බෝගය/කාර්යයේ ස්වභාවය | ප්‍රතිචාරීන් සංඛ්‍යාව | ප්‍රතිශතය(%) සංඛ්‍යාව=375 |
|---|---|---|
| වී ගොවිතැන | 275 | 73.3 |
| මිශ්‍ර බෝග | 22 | 5.9 |
| එළවළු වගාව | 192 | 51.2 |
| පලතුරු වගාව | 45 | 12.0 |
| වෙනත් ධාන්‍ය බෝග වගාව | 81 | 21.6 |
| සත්ත්ව පාලනය | 21 | 5.6 |
| ගෙවතු වගාව | 14 | 3.7 |
| සුළු අපනයන බෝග/කුළුබඩු වගාව | 10 | 27.0 |
| ප්‍රධාන අපනයන බෝග (තේ, රබර්, පොල් වගාව) | 7 | 1.9 |
| විසිතුරු මල් වගාව | 3 | 0.8 |
| එළු වගාව | 27 | 7.2 |
| බිම්මල් වගාව | 2 | 0.5 |
| බුලත් වගාව | 5 | 1.3 |
| වෙනත් | 3 | 0.8 |

සටහන: එක ම ප්‍රතිචාරියා විසින් එක් බෝගයකට වඩා වගා කරන බව පැවසූ හෙයින් ප්‍රතිශතාත්මක එකතුව 100 සමාන නොවේ.

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

වගු සටහන් 3.8න් පෙන්නුම් කෙරෙන අන්දමට ප්‍රතිචාරීන්ගෙන් 73.3%ක් පූර්ණ කාලීනව, අර්ධ කාලීනව හෝ පවුලේ ශ්‍රමිකයින් ලෙස වී වගාවේ නිරත වූහ. ප්‍රතිචාරීන්ගෙන් 51% (192)ක් එළවළු වගාවේ ද 21.6%(81)ක් වී හැර වෙනත් ධාන්‍ය වර්ග ද, 12.0% (45)ක් පලතුරු ද, 7.2% (27)ක් ඇණු (බී ඇණු සහ රතු ඇණු) ද වගා කළ හ (වගුව 3.8). විසිතුරු මල්, බිම්මල් සහ බුලත් වගාවේ නිරත ප්‍රතිචාරීන් සංඛ්‍යාව ඉතා සුළු පිරිසක් වූහ. වගුවේ සටහන් කර ඇති අනෙකුත් කාණ්ඩයට පැළ තවාන් සහ කෘෂි නිෂ්පාදන අලෙවිසැල්, පවත්වාගෙන යාම හෝ කෘෂිකර්මාන්තයට අදාළ රජයේ රැකියාවන් හි නිරත වුවන් ඇතුළත් විය.

රූ සටහන 3.4: කෘෂිකාර්මික කටයුතුවල අත්දැකීම් සහිත වසර ගණන




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

රූ සටහන් 3.4න් පැහැදිළි කරන අන්දමට, කෘෂිකාර්මික කටයුතුවල නිරත ප්‍රතිචාරීන්ගෙන් බහුතරය (70.7%) වසර 10ට වඩා අඩු අත්දැකීම් සහිත අය වූහ. ප්‍රතිචාරීන්ගෙන් 31.2% (117)ක් අවුරුදු 2-5 අතර ද 33.4% (125)ක් අවුරුදු 5-10 අතර ද, 22.7% (85)ක් අවුරුදු 10-15 අතර ද අත්දැකීම් සහිත අය වූහ. ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් අනාවරණය වූ අන්දමට කුඩා කාලයේ පටන් විශේෂයෙන් ම පාසැල් දිනවල සහ පාසැල් කාලයෙන් පසුව සවස් කාලයේ දී ඔවුන් තම දෙමාපියන්ගේ කෘෂිකාර්මික කටයුතුවලට සහායවීම නිසා බොහෝ ප්‍රතිචාරීන්ට කෘෂිකාර්මික කටයුතු සම්බන්ධයෙන් සැලකිය යුතු වසර ගණනාවක අත්දැකීම් හිමි ව තිබුණි.

වගුව 3.9: නිරත වූ කෘෂිකාර්මික කටයුතුවල ස්වභාවය

| කාර්යයයේ ස්වභාවය | ප්‍රතිචාර | |
|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
| තමන්ගේ ම ගොවිපළක් පවත්වාගෙන යාම | 106 | 28.3 |
| පවුලේ සාමාජිකයින් සමඟ ගොවිපළක් පවත්වාගෙන යාම | 61 | 16.3 |
| පවුලට අයත් ගොවිපළ සඳහා ශ්‍රමය සැපයීම | 187 | 49.9 |
| යහළුවන් හෝ පිටස්තර පුද්ගලයන් සමඟ ගොවිපළක් පවත්වාගෙනයාම | 13 | 3.5 |
| දෛනික/වැටුප් ලබන කම්කරු | 5 | 1.3 |
| ගෙවතු වගාව | 4 | 1.1 |
| අඳ ගොවීන් (ඊ) | 1 | 0.3 |
| වෙනත් | 1 | 0.3 |

සටහන: එක ම ප්‍රතිචාරියා විසින් විවිධ කටයුතුවල නියැලෙන බව සඳහන් කිරීම නිසා ප්‍රතිශත එකතුව 100ට සමාන නොවේ.
මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

වගු සටහන් 3.9න් පෙන්නුම් කරන ආකාරයට, කෘෂිකාර්මික කටයුතුවල නිරත වුවන්ගෙන් 49.9% (187)ක් පවුලේ ශ්‍රමිකයින් ලෙස තම පවුලට අයත් ගොවිපළට ශ්‍රමය යොදවන අතර 28.3% (106)ක් තමන්ගේ ම ගොවිපළක ද, 16.3% (61)ක් හවුල් අයිතිය සහිත ගොවිපළක ද සේවා නියුක්ත වූහ. දෛනික වැටුප් ලබන කම්කරුවන් ලෙස කටයුතු කළ පිරිස 1.3% (5)ක් පමණක් විය.



පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො,ප.පු.ආ
HARTI

## 3.4 ප්‍රතිචාරීන්ගේ ඉඩම් පරිහරණ රටාව

වගුව 3.10: ඉඩම් කැබලිවල හිමිකම

| හිමිකමේ ස්වභාවය | ඉඩමේ ස්වභාවය | | | | | |
|---|---|---|---|---|---|---|
| | ගොඩ ඉඩම් | | මඩ ඉඩම් | | හේන් ඉඩම් | |
| | ඉඩම් සහිත ප්‍රතිචාරීන් සංඛ්‍යාව | ප්‍රතිශතය (%) | ඉඩම් සහිත ප්‍රතිචාරීන් සංඛ්‍යාව | ප්‍රතිශතය (%) | ඉඩම් සහිත ප්‍රතිචාරීන් සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
| තමන්ටම අයත් | 124 | 26.8 | 84 | 23.9 | 11 | 16.4 |
| දෙමාපියන්ට අයත් | 283 | 61.3 | 195 | 55.4 | 33 | 49.3 |
| අනෙකුත් ඥාතීන්ට අයත් | 27 | 5.8 | 23 | 6.5 | 4 | 6.0 |
| අනවසර | 6 | 1.3 | 2 | 0.6 | 12 | 17.9 |
| බදුගත්/උකස් ගත්/අඳ | 17 | 3.7 | 47 | 13.4 | 4 | 6.0 |
| සහකරු/සහකාරියට අයත් | 5 | 1.1 | 1 | 0.3 | 3 | 4.5 |
| එකතුව | 462 | 100.0 | 352 | 100.0 | 67 | 100.0 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

ප්‍රතිචාරීන්ගෙන් 87% ආසන්න සංඛ්‍යාවකට ඔවුන්ගේ ම හෝ පවුලේ සාමාජිකයින්ට (462) අයත් ගොඩ ඉඩම් පැවති අතර 66.4% (352)ට කුඹුරු ඉඩම් තිබුණි. ප්‍රතිචාරීන්ගෙන් 12.6% (67)ක් හේන් ඉඩම් පරිහරණය කළ බව සඳහන් කළ හ (වගුව 3.10).

ඉඩම්වල ස්වභාවය අනුව ප්‍රතිචාරීන් 61.3% (283)ක් භාවිතා කළ ගොඩ ඉඩම් ද, 55.4% (195) භාවිතා කළ කුඹුරු ඉඩම් ද, 49.3% (33) භාවිතා කළ හේන් ඉඩම් ද දෙමාපියන්ට අයත් වූ අතර තවත් ප්‍රතිචාරීන් 26.8% (124)ගේ ගොඩ ඉඩම් ද, 23.9% (84) ගේ කුඹුරු ඉඩම් ද, 16.4% (11)ගේ හේන් ඉඩම් ද තමන්ට ම අයත් විය. හේන් ඉඩම්වලින් බහුතරය අනවසරයෙන් අත්පත් කරගත් ඒවා විය. හේන් ඉඩම්වලින් සැලකිය යුතු ප්‍රමාණයක් රජයට අයත් රක්ෂිත විය. අනෙක් අතට බදු ගත්, උකස් කළ හෝ අඳ ඉඩම් ඒ වගාව සඳහා භාවිතා කෙරිණි. ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී නිරීක්ෂණය කළ ආකාරයට තරුණයින්ගෙන් බහුතරයක් භාවිතා කරන ඉඩම් ඔවුන් සතු නොවේ. ඇතැම් ප්‍රතිචාරීන් සඳහන් කළ අන්දමට ඉඩම් හිඟය සහ හිමිකමක් නොවීම කෘෂිකාර්මික කටයුතුවල ක්‍රමානුකූලව නිරතවීමට බලපානු ලබන ප්‍රශ්නය කි. ඉඩම් හිමිකම නොමැතිව ඔවුන්ට ගොවිපළ දියුණු කිරීම සඳහා ණය ලබාගැනීමට නො හැකි ය. තව ද, ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් හෙළි කරන අන්දමට තමන්ට ඉඩම් හිමිකම ඇති අවස්ථාවල දී තරුණ පිරිස වඩාත් උද්යෝගිමත්ව කෘෂිකාර්මික කටයුතුවල නියැලුන හ. සූරියවැව (හම්බන්තොට) සහ නුවරඑළිය වැනි ප්‍රදේශවල මෙය බොහෝවිට දැකිය හැකි වූ අතර තමන්ගේ ම ඉඩම් වගා කරමින් සතුටුදායක - අන්දමේ ලාභයක් ඉපයිය හැකිවීම එයට හේතු වේ.


වගුව 3.11: සාමාන්‍ය ඉඩම් ප්‍රමාණය

| සාමාන්‍ය ඉඩම් ප්‍රමාණය | ඉඩමේ ස්වභාවය | | | | | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | ගොඩ ඉඩම් | | මඩ ඉඩම් | | හේන් ඉඩම් | | | |
| | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
| අක්කර 1/4 ට අඩු | 42 | 9.1 | 2 | 0.6 | 0 | 0.0 | 44 | 5.0 |
| අක්කර 1/4-1/2 | 44 | 9.5 | 13 | 3.7 | 0 | 0.0 | 57 | 6.5 |
| අක්කර 1/2-3/4 | 87 | 18.8 | 36 | 10.2 | 8 | 11.9 | 131 | 14.9 |
| අක්කර 3/4-1 | 10 | 2.2 | 4 | 1.1 | 0 | 0.0 | 14 | 1.6 |
| අක්කර 1-2 | 116 | 25.1 | 109 | 31.0 | 18 | 26.9 | 243 | 27.6 |
| අක්කර 2-5 | 134 | 29.0 | 154 | 43.8 | 21 | 31.3 | 309 | 35.1 |
| අක්කර 5-10 | 23 | 5.0 | 34 | 9.7 | 16 | 23.9 | 73 | 8.3 |
| අක්කර 10ට වැඩි | 6 | 1.3 | 0 | 0.0 | 4 | 6.0 | 10 | 1.1 |
| එකතුව | 462 | 100.0 | 352 | 100.0 | 67 | 100.0 | 881 | 100 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

වගු සටහන් 3.11න් පෙන්නුම් කෙරෙන අන්දමට, ප්‍රතිචාරීන් භාවිතා කරන සම්පූර්ණ ඉඩම්වලින් 35.1% (309) අක්කර 2-5 අතර ප්‍රමාණයෙන් යුක්ත වු අතර ඉඩම්වලින් 27.6% (කැබලි 243)ක් අක්කර 1-2 අතර ප්‍රමාණයෙන් යුක්ත විය. ඉඩම් කැබලි 10ක ප්‍රමාණය අක්කර දහයට වැඩි විය. එම ඉඩම් කැබලි දහයෙන්, 04ක් තමන්ට ම අයත් ගොඩ ඉඩම් විය. අනෙක් අතට, ගොඩ ඉඩම්වලින් සැලකිය යුතු ප්‍රමාණයක් (28%)ක් අක්කර 01 ට වඩා අඩු වු අතර හේන් ඉඩම්වලින් බහුතරයක් (88.1%) අක්කර 01ට වඩා වැඩි විය.

රූ සටහන 3.5: සියලු ආකාර ඉඩම්වල සමස්ත බිම් ප්‍රමාණයෙ හි සහ වගා කළ බිම් ප්‍රමාණයෙ හි සාමාන්‍ය




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012


ක්ෂේත්‍ර සමීක්ෂණයට අනුව, සමස්ත, ඉඩම්වලින් 88.2% (කැබලි 779)ක් වගා කර තිබුණි. සියලු ඉඩම්වල සහ වගාකළ ඉඩම්වල සාමාන්‍ය භූමි ප්‍රමාණය අක්කර 02ක් විය. රූ සටහන් 3.6න් පෙන්නුම් කරන අන්දමට, සමස්ත ගොඩ ඉඩම් කැබලිවලින් 79% (කැබලි 365)ක් වගා කර තිබූ අතර සමස්ත කුඹුරු ඉඩම්වලින් 98.8%ක් සහ හේන් ඉඩම්වලින් 98.5%ක් වගා කොට තිබුණි. කුඹුරු ඉඩම් සහ වෙනත් ඉඩම්වල මුළු ඉඩම් ප්‍රමාණය සහ වගා කළ ඉඩම් ප්‍රමාණය අතර සැලකිය යුතු වෙනසක් නොවී ය. කෙසේ වුව ද, ගොඩ ඉඩම්වලින් 21% (කැබලි 97)ක් වගා නො කළ ඉඩම් විය. ඇතැම් අවස්ථාවල සඳහන් කළ අන්දමට එම ඉඩම්වල කොටසක නිවාස ගොඩනැඟීම නිසා ඔවුන්ගේ ගොඩ ඉඩම්වල වගා කටයුතු සිදු කිරීමට තරම් ප්‍රමාණවත් ඉඩකඩ නොමැත. අනෙක් අතට, ඇතැම් ස්ථානවල සාර්ථක ගෙවතු වගා දැකිය හැකි විය.

## 3.5 වෘත්තීය පුහුණුවීම්වල තත්ත්වය

ඉදිරියේ දී පැමිණිය හැකි නිරන්තර සහ නව අභියෝග එනම්, ව්‍යුහමය වෙනස්කම් මෙන් ම තාක්ෂණික, ආර්ථිකමය සහ පරිසරාත්මක වැඩි දියුණුවීම් සමඟ කෘෂිකර්මාන්තය තුළ සිදුවන වෙනස්වීම්වල පීඩනයට මුහුණු දීම සඳහා ගොවිපළ කළමනාකරුවන්ගේ දැනුම වර්ධනය අවශ්‍ය වේ. එම නිසා. වෘත්තීය සහ ව්‍යාපාරික වශයෙන් සාර්ථකවීම සඳහා සුදුසුකම් සහ මූලික වෘත්තීයමය දැනුම පමණක් ප්‍රමාණවත් නොවන අතර වෘත්තීය පුහුණුවීම්වල අඛණ්ඩ සහභාගීත්වය ද හේතු වේ (Spiller & Voss,2006 උපුටා දැක්වීම

N.N, 2006). එම නිසා, පුද්ගල නිපුණතා සංවර්ධනයටත්, තරඟකාරීත්වය පවත්වාගෙන යාමටත් වෘත්තීය පුහුණුවීම් වැදගත් භූමිකාවක් රඟ දක්වනු ලබයි.

**රූ සටහන 3.6: වෘත්තීය පුහුණුවීම්වල සහභාගීත්වය**




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

රූ සටහන් 3.6න් පෙන්වා දෙන ආකාරයට, ප්‍රතිචාරීන්ගෙන් 63.8% (340)ක් කිසිදු ආකාරයක වෘත්තීය පුහුණුවක් ලබා නොමැති අතර 36.2% (193)ක් පුහුණුවීම් ලබා ඇත. ඇතැම් ප්‍රතිචාරීහු විවිධ ක්ෂේත්‍ර හෝ විවිධ ආයතන යටතේ පුහුණු පාඨමාලා එකකට වැඩි ප්‍රමාණයක් හදාරා ඇත්තා හ. අධ්‍යයනයේ දී නිරීක්ෂණය කළ පරිදි, ප්‍රමාණවත් දැනුවත්වීමක් නොමැතිකම, ප්‍රවේශවීමේ දුෂ්කරතා සහ මූල්‍යමය අපහසුතා ඇතුළුව පුහුණුවීම් ලබාගැනීමට අවශ්‍ය පහසුකම්වල හිඟය, පුහුණුවීම් ලබා නො ගැනීමට බලපෑ හේතු විය.

වගු සටහන් 3.12න් පෙන්නුම් කෙරෙන අන්දමට, ප්‍රතිචාරීන් අතර ඉතාමත් ජනප්‍රිය වෘත්තීය පුහුණුව පරිගණක පුහුණුවයි. ඒ අනුව, වෘත්තීය පුහුණුවීම් ලද ස්ත්‍රී සහ පුරුෂ ප්‍රතිචාරීන්ගෙන් 37.8% (73)ක් අවම වශයෙන් එක් පරිගණක පාඨමාලාවක් හෝ හදාරා ඇත්තා හ. ප්‍රතිචාරීන්ගෙන් 12% (23)ක් විදුලි කාර්මික, මෝටර් කාර්මික සහ ඉංජිනේරු ක්ෂේත්‍ර ඇතුළත් වූ තාක්ෂණික කාර්යයන්ට සම්බන්ධ පුහුණු පාඨමාලා හදාරා තිබේ. වෘත්තීය පුහුණුවීම් තෝරා ගැනීමේ දී බලපාන ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ලක්ෂණ පෙන්නුම්

කරමින් වෑද්දුම් ශිල්පය, විදුලි කාර්මික, මෝටර් කාර්මික සහ ඉංජිනේරු පුහුණුවීම් ලද ප්‍රතිචාරීන්ගෙන් 100% ම පුරුෂයින් විය.

වගුව 3.12: ස්ත්‍රී/පුරුෂ භාවය සහ වෘත්තීය පුහුණුවේ ස්වභාවය

| පුහුණුවේ ස්වභාවය | ප්‍රතිචාර ස්ත්‍රී/ පුරුෂ භාවය | | | | ප්‍රතිචාරීන්ගේ සමස්ත එකතුව (සංඛ්‍යාව=193) | |
|---|---|---|---|---|---|---|
| | ස්ත්‍රී සංඛ්‍යාව=87 | | පුරුෂ සංඛ්‍යාව=125 | | | |
| | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
| පරිගණක | 40 | 45.98 | 33 | 26.4 | 73 | 37.8 |
| විදුලි ඉංජිනේරු/මෝටර් කාර්මික/ඉංජිනේරු | 0 | 0.00 | 23 | 18.4 | 23 | 11.6 |
| වෑද්දුම් ශිල්පය | 0 | 0.00 | 6 | 4.8 | 6 | 3.1 |
| පෙදරේරු/වඩු කාර්මික | 1 | 1.15 | 14 | 11.2 | 15 | 7.8 |
| ආහාර නිෂ්පාදනය/ආහාර තාක්ෂණය | 1 | 1.15 | 1 | 0.8 | 2 | 1.0 |
| සත්ත්ව පාලනය/මී මැසි පාලනය | 0 | 0.00 | 4 | 3.2 | 4 | 2.1 |
| ඇඳුම් මැසීම/ජුකී/අත්කම්/රෙදි මැසීම | 27 | 31.03 | 3 | 2.4 | 30 | 15.5 |
| රියදුරු/බරවාහන ක්‍රියාකරු | 0 | 0.00 | 15 | 12 | 15 | 7.8 |
| ආරක්ෂක අංශයට අදාළ පුහුණුවීම් | 0 | 0.00 | 5 | 4 | 5 | 2.6 |
| රූපලාවන්‍ය | 2 | 2.30 | 2 | 1.6 | 4 | 2.1 |
| හෝටල් පාඨමාලා | 0 | 0.00 | 5 | 4 | 5 | 2.6 |
| සමාජ වැඩ | 7 | 8.05 | 9 | 7.2 | 16 | 8.3 |
| අනෙකුත් | 9 | 10.34 | 5 | 4 | 14 | 7.2 |

සටහන: එක ම ප්‍රතිචාරියා විසින් එක පුහුණුවකට වඩා හදාරා ඇති බැවින් බහුවිධ ප්‍රතිචාර ගණනය කොට ඇත.
මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

කෘෂිකර්මාන්තය හා සෘජුව සම්බන්ධ වන ආහාර නිෂ්පාදනය හා ආහාර තාක්ෂණයට අදාළ වෘත්තීය පුහුණුවීම් හදාරා ඇති ප්‍රතිචාරීන්ගේ ප්‍රතිශතය 01% (2)ක් පමණක් වන අතර ප්‍රතිචාරීන්ගෙන් 2.1% (4)ක් පමණක් සත්ත්ව පාලන පුහුණුවීම් ලබා ඇත. එයට පරස්පරව යමින් සැලකිය යුතු පිරිසක් ඇඳුම් මැසීම/ජුකී/අත්කම් සහ රෙදි විවීමේ පුහුණු පාඨමාලා හදාරා තිබේ. මෙවන් පුහුණුවීම් ලබා ඇති ප්‍රතිචාරීන් සංඛ්‍යාව 30ක් වන අතර ඔවුන්ගෙන් 90% (27)ක් කාන්තාවන් ද, 10% (3)ක් පුරුෂයෝ ද වූහ. අධ්‍යයනයෙන් හෙළි කරන අන්දමට අනෙක් පාඨමාලාවලට වඩා මෙම පාඨමාලා හැදෑරීමෙන් ග්‍රාමීය ප්‍රජාවේ තරුණ ස්ත්‍රීන්හට ඇඟළුම් කම්හල්වල රැකියා ලබාගැනීමට හෝ ස්වයං රැකියාවක් ආරම්භ කිරීමට පවතින අවස්ථා බහුල ය. වගු සටහන් 3.12හි දැක්වෙන 'අනෙකුත්' කාණ්ඩයට පායාරූපකරණය, ශීතුම්කරණය, ව්‍යාපාර සහ පූර්ව ළමා විය ගුරු පුහුණුව ආදිය ඇතුළත් වේ. කෙසේ වුව ද, ගොවිතැනට සම්බන්ධ

පුහුණුවීම් සඳහා ප්‍රතිචාරින් අතර පවතින්නේ අඩු ඉල්ලුමකි. එයට පරස්පරව, පෞද්ගලික අංශයේ රැකියා ඉලක්ක කරගත් පුහුණුවීම් ඔවුන් අතර ඉහළ මට්ටමෙන් ජනප්‍රිය ය.

**වගුව 3.13: වෘත්තීය පුහුණුව සහ එහි ප්‍රයෝජනවත් බව අනුව නියැදිය**

| පුහුණුවීමේ ස්වභාවය | රැකියාවක් ලබා ගැනීමට ප්‍රයෝජනවත් විය (%) | රැකියාවක් ලබා ගැනීමට ප්‍රයෝජනවත් නො විය (%) | රැකියාවක් ලබා ගැනීමට උත්සාහ කර නොමැත(%) |
|---|---|---|---|
| පරිගණක (සංඛ්‍යාව=73) | 8.2 | 72.6 | 19.2 |
| විදුලි කාර්මික/මෝටර් කාර්මික ඉංජිනේරු (සංඛ්‍යාව=23) | 30.4 | 65.2 | 4.3 |
| වෑද්දුම්කරු (සංඛ්‍යාව=6) | 33.3 | 66.7 | 0.0 |
| පෙදරේරු/වඩුකාර්මික (සංඛ්‍යාව=15) | 46.7 | 53.3 | 0.0 |
| ආහාර නිෂ්පාදනය/ආහාර තාක්ෂණය (සංඛ්‍යාව=2) | 50.0 | 50.0 | 0.0 |
| සත්ත්ව පාලනය/මී මැසි පාලනය (සංඛ්‍යාව=4) | 75.0 | 25.0 | 0.0 |
| ඇඳුම් මැසීම/පුකී/අත්කම්/රෙදි විවීම (සංඛ්‍යාව=30) | 26.7 | 63.3 | 10.0 |
| රියදුරු/බර වාහන ක්‍රියාකරු (සංඛ්‍යාව=15) | 60.0 | 40.0 | 0.0 |
| ආරක්ෂක අංශයට අදාළ පුහුණුවීම්/ශිෂ්‍යභට පුහුණුවීම් (සංඛ්‍යාව=5) | 0.0 | 100.0 | 0.0 |
| රූපලාවන්‍ය (සංඛ්‍යාව=4) | 0.0 | 50.0 | 50.0 |
| හෝටල් පාඨමාලා (සංඛ්‍යාව=5) | 40.0 | 20.0 | 40.0 |
| සමාජ වැඩ (සංඛ්‍යාව=16) | 18.8 | 75.0 | 6.3 |
| වෙනත් (සංඛ්‍යාව=14) | 28.6 | 64.3 | 7.1 |
| එකතුව | 24.5 | 64.2 | 11.3 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

ප්‍රතිචාරින් විසින් හැදෑරූ වෘත්තීය පුහුණු පාඨමාලාවල ප්‍රයෝජනවත් භාවය පිළිබඳ සැලකීමේ දී ලැබූ පුහුණුව රැකියාවක් ලබාගැනීම සඳහා ප්‍රයෝජනවත් නොවූ බව පුහුණුව ලැබූ ප්‍රතිචාරීන්ගෙන් 64.2% (136)ක් සඳහන් කළ අතර රැකියාවක් ලබාගැනීම සඳහා එම පුහුණුව ප්‍රයෝජනවත් වූ බව 24.5% (52)ක් සඳහන් කළ හ (3.13 වගුව). වෘත්තීය පුහුණු පාඨමාලා හැදෑරූ ප්‍රතිචාරීන්ගෙන් 11.3% (24)ක් රැකියාවක්

ලබාගැනීම සඳහා කිසිදු උත්සාහයක් දරා නො තිබුණි. ප්‍රතිචාරීන්ගෙන් සැලකිය යුතු පිරිසක් පරිගණක පාඨමාලා හදාරා තිබුණ ද, රැකියාවක් ලබාගැනීම සඳහා එය ප්‍රයෝජනවත්ව තිබුණේ ප්‍රතිචාරීන්ගෙන් 8.2% (6)ක් සඳහා පමණි. මැහුම්/ප්‍රකී/අත්කම් සහ රෙදි විවීමේ පුහුණුව ලත් ප්‍රතිචාරීන්ගෙන් 26.7% (08)ට රැකියා ලබාගැනීම සඳහා එම පුහුණුව ප්‍රයෝජනවත් වී තිබුණි. සත්ත්ව පාලනය සහ මී මැසි පාලනය සම්බන්ධයෙන් පුහුණුව ලත් ප්‍රතිචාරීන් විසි දෙනාගෙන් 75% (03) රැකියා ලබාගැනීම සඳහා හෝ තම ආදායම් උත්පාදන කාර්යයන් වර්ධනය කරගැනීම සඳහා එය උපකාරී වී තිබුණි. පොදුවේ ගත් කළ, ප්‍රතිචාරීන් ලැබූ වෘත්තීය පුහුණුව රැකියා වෙළඳපොළ සඳහා ප්‍රවේශවීමට ප්‍රයෝජනවත් වී නොමැත.

### 3.6 සමාප්තිය

අධ්‍යයන නියැදියේ ප්‍රතිචාරීන්ගෙන් 66%ක් පුරුෂයින් වූ අතර 34%ක් ස්ත්‍රීහු වූහ. ප්‍රතිචාරීන්ගෙන් 66.4%ක් විවාහකයින් වූ අතර බහුතර ප්‍රතිචාරීන් සිංහල ජනවර්ගයට අයත් වූහ. වයස අවුරුදු 20ට වැඩි ප්‍රතිචාරීන් අතර සේවා නියුක්ත ප්‍රතිශතය ඉහළ මට්ටමක පවතී. ගොවි ප්‍රජාවේ බොහෝ තරුණයින් තම දෙමාපියන්ට වඩා ඉහළ මට්ටමක අධ්‍යාපනයක් ලබා ඇත. තම පවුලේ පසුබිම කෘෂිකාර්මික අංශයට අදාළ වුව ද ප්‍රතිචාරීන්ගෙන් ඇතැම්හු කෘෂිකාර්මික අංශයට සම්බන්ධ කිසිදු ආකාරයක කාර්යයක නිරත නො වූහ. කෙසේ වුව ද , ප්‍රතිචාරීන්ගෙන් 70.4%ක් කෘෂිකාර්මික කටයුතුවල නිරත වූ අතර කිසිදු ආකාරයක කෘෂිකාර්මික කාර්යයක නිරත නොවූ පිරිස 29.6% කි. කෘෂිකාර්මික කටයුතුවල නිරත වන ප්‍රතිචාරීන්ගෙන් 39.5%ක් පූර්ණ කාලීනව කෘෂිකාර්මික කටයුතුවල නිරත වේ. ප්‍රතිචාරීන් විසින් වගා කරන ප්‍රධාන බෝග වූයේ වී, එළවළු සහ ධාන්‍ය වර්ග ය. කෘෂිකාර්මික කටයුතුවල නිරත වන ප්‍රතිචාරීන්ගෙන් බහුතරයක් අවුරුදු 10ට වඩා අඩු අත්දැකීම සහිත අය වූහ. ප්‍රතිචාරීන්ගෙන් 50% තම පවුලේ ගොවිපළෙහි කටයුතුවල නිරත වන අතර ප්‍රතිචාරීන්ගෙන් 28.4%ක් තමන්ගේ ම ගොවිපළක් පවත්වාගෙන ගිය හ. සියලු ආකාර ඉඩම්වල සාමාන්‍ය මෙන් ම වගා කළ ඉඩම්වල සාමාන්‍ය බිම් ප්‍රමාණය අක්කර දෙක විය. ප්‍රතිචාරීන්ගෙන් 63.8% කිසිදු ආකරයක වෘත්තීය පුහුණුවක් ලබා නොමැත. කෘෂිකාර්මික අංශයට අදාළ පුහුණුවීම් වන ආහාර නිෂ්පාදනය, ආහාර තාක්ෂණය සහ සත්ත්ව පාලනය සම්බන්ධ පුහුණුවීම් ප්‍රතිචාරීන් අතර ජනප්‍රිය නොවූ අතර එවැනි පුහුණුවීම් ලබා තිබුණේ ප්‍රතිචාරීන්ගෙන් සුළු පිරිසකි.

# සිව් වැනි පරිච්ඡේදය

# සුළු පරිමාණ කෘෂිකර්මාන්තයෙ හි තරුණ සහභාගීත්වය


## 4.1 හැඳින්වීම

මෙම පරිච්ඡේදයෙන් වගා කටයුතු මෙන් ම කෘෂිකර්මාන්තය හා සබැඳි කර්මාන්ත/ව්‍යාපාරවල තරුණ සහභාගීත්වය සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කෙරේ. තව ද, ස්ත්‍රී/පුරුෂ භාවය, වයස, අධ්‍යාපනය මට්ටම සහ බෝගය අනුව තරුණ සහභාගීත්වයේ වෙනස මෙම පරිච්ඡේදයෙන් විශ්ලේෂණය කෙරේ.

## 4.2 කෘෂිකර්මාන්තයෙ හි තරුණ සහභාගීත්වය

ප්‍රතිචාරීන්ගෙන් 70.4% (375)ක් තමන් විවිධ ආකාරයෙන් කෘෂිකාර්මික කටයුතුවල යෙදෙන බව සඳහන් කළ හ. ඔවුන්ගෙන් 39.5% (148)ක් පූර්ණ කාලීන ගොවීන් ලෙස ද, 33.9%ක් වැටුප් නො ලබන පවුලේ ශ්‍රමිකයින් ලෙස ද කෘෂිකර්මයෙහි නිරත වූහ (රූ සටහන 4.1). ප්‍රතිචාරීන්ගෙන් 26.4% (99)ක් අර්ධ කාලීනව කෘෂිකර්මාන්තයෙහි යෙදුණ අතර 0.3% (01)ක් තම රැකියාවේ කොටසක් වශයෙන් වගා කටයුතුවල නිරත විය. අවසානයට සඳහන් කළ කොටසට ඉහළ නිලධාරීන් විසින් වගා කිරීමට අණ කරනු ලැබූ නියමිත බිම් ප්‍රමාණය වගා කරන සිවිල් ආරක්ෂක බලකායේ සාමාජිකයෙක් ඇතුළත් විය.


රූ සටහන 4.1: කෘෂිකාර්මික කටයුතුවල යෙදෙන ආකාරය අනුව ප්‍රතිචාරීන්




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

කෘෂිකර්මාන්තයේ නිරත අයගෙන් 73.6%ක් පුරුෂයින් ද, 26.4%ක් ස්ත්‍රීහු ද වෙති. රූ සටහන් 4.2න් පෙන්නුම් කෙරන අන්දමට, පවුලේ ශ්‍රමිකයින් හෝ වැටුප් නො ලබන්නන් ලෙස කටයුතු කරන්නන් හැරුණු කොට කෘෂිකාර්මික කටයුතුවල නිරත වන්නන්ගේ ස්ත්‍රී/පුරුෂ භාවය අනුව විමසා බැලීමේ දී පුළුල් වෙනසක් පවතී. පූර්ණ කාලීනව කෘෂිකර්මාන්තයෙ හි නිරත පිරිසෙන් 82.4%ක් පුරුෂයින් වන අතර සෙසු පිරිස ස්ත්‍රීහු වූහ. අර්ධ කාලීනව කෘෂිකර්මාන්තයෙ හි යෙදුණු පිරිසෙන් 86.9%ක් පුරුෂයන් ද ඉතිරි පිරිස ස්ත්‍රීහු ද වූහ. කෙසේ වුව ද, පවුලේ ශ්‍රමිකයින් සම්බන්ධයෙන් මෙම රටාව වෙනසකට ලක්ව ඇත්තේ එම කාණ්ඩයෙ හි පුරුෂයින් 52.7% ද, ස්ත්‍රීන් 47.2% ද වශයෙන් නියෝජනය වෙමිනි.

රූ සටහන 4.2: ස්ත්‍රී/පුරුෂ භාවය අනුව කෘෂිකාර්මික කටයුතුවල නිරත ප්‍රතිචාරින්ගේ ව්‍යාප්තිය




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

අධ්‍යයනයෙන් අනාවරණය වූ අන්දමට, කෘෂිකාර්මික කටයුතුවල නිරත පිරිසෙන්, 61.7% (231)ක් අවුරුදු පහට වැඩි අත්දැකීම් සහිත අය වූ අතර 6.2% (23)ක් අවුරුදු දෙකට අඩු අත්දැකීම් සහිත අය වූහ (වගුව 4.1). බොහෝ ගොවි පවුල්වල දෙමාපියන් සහ වැඩිහිටියන් දරුවන්ගේ ළමා කාලයේ සිට ම කෘෂිකාර්මික කටයුතු සඳහා ඔවුන් යොමු කරනු ලබයි. කෘෂිකාර්මික කටයුතුවල දිගු කාලීන අත්දැකීම් සහිත අයට එම අත්දැකීම් ලැබීමට එක් හේතුවක් වන්නේ එයයි. එපමණක් නොව, ඉහළ වටිනාකමක් සහිත වාණිජ බෝග වගා කරන නුවරඑළිය වැනි ප්‍රදේශවල තරුණයින් එම බෝගවලින් ඉහළ ආදායමක් ලබාගත හැකිවීම නිසා කෘෂිකාර්මික කටයුතුවල නිරත වීමේ නැඹුරුවක් පවතී. නුවරඑළිය දිස්ත්‍රික්කයේ කඳපොල, ජයලංකාගම ගොවි සංවිධානයේ සාමාජිකයින් පැවසූ පරිදි එම ගම්මානයේ අවුරුදු 12 වයසේ ළමුන් පවා අවම වශයෙන් එළවළු පැළ තවානක් හෝ පවත්වාගෙන යමින් ආදායම් උපයයි. තවදුරටත්, අධ්‍යාපන පහසුකම් අඩුවීම, ගෘහ ඒකකයේ පවතින ඉහළ මට්ටමේ දරිද්‍රතාව පවුලේ වගකීම් භාරගැනීම සඳහා වෙනත් කිසිවෙකු නොවීම සහ පවුලට අයත් ඉඩම් වගා කිරීමට වෙනත් අයෙකු නොමැතිවීම ආදී හේතු ගණනාවක්

මත වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ (ප්‍රා.ලේ.කො.) සිංහපුර, නොච්චියාගම ප්‍රා.ලේ. කොට්ඨාසයේ ඔයාමඩුව, කරදියනාරු ප්‍රා.ලේ. කොට්ඨාසයේ මාවිලයියාරු සහ මාරප්පාලම් වැනි දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශවල තරුණයින් කෘෂිකර්මාන්තයට නැඹුරුවන බව පර්යේෂණ කණ්ඩායම විසින් හඳුනා ගැණිනි. කෙසේ වුව ද, ගොවි සංවිධානවල බොහෝ සාමාජිකයින් පෙන්වාදුන් ආකාරයට, මඩ සහිත කුඹුරුවල වැඩ කිරීමට අකැමැත්ත වැනි හේතු නිසා වී ගොවිතැන සඳහා තරුණයින්ගේ සහයෝගය ලබාගැනීමට අපහසු ය. තව ද, වී ගොවිතැනෙ හි සිදුවන පාඩු හෝ ලාභය අවම වීම තරුණ පරම්පරාව වී ගොවිතැන කෙරෙහි අධෛර්යමත් වීමට බලපාන බව ද ඔවුහු සඳහන් කළ හ. කෘෂිකර්මාන්තයේ තරුණ සහභාගීත්වය බෝග වගාව අනුව වෙනස්වන බව මේ අනුව පැහැදිළි වේ.

**වගුව 4.1: කෘෂිකර්මාන්තයේ අත්දැකීම් සහිත වසර ගණන අනුව ප්‍රතිචාරින්ගේ විසිරීම**


| වසර ගණන | ප්‍රතිචාරීන් සංඛ්‍යාව | ප්‍රතිශතය (කෘෂිකර්මාන්තයේ නිරත අයගේ ප්‍රතිශතයක් ලෙස) |
|---|---|---|
| වසර 10 අඩු | 4 | 1.1 |
| වසර 1-2 | 19 | 5.1 |
| වසර 2-5 | 117 | 31.2 |
| වසර 5-10 | 121 | 32.3 |
| වසර 10-15 | 85 | 22.7 |
| වසර 150 වැඩි | 25 | 6.7 |
| වාර්තා නො කළ | 4 | 1.1 |
| එකතුව | 375 | 100.0 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

කෘෂිකර්මාන්තයේ නිරත පිරිසෙන් වැඩි ම ප්‍රතිශතය (38.9%) වයස අවුරුදු 25-29 කාණ්ඩයට අයත් වූ අතර අඩු ම ප්‍රතිශතය (5.3%) අවුරුදු 15 කාණ්ඩයෙ හි නියෝජනය විය. දෙවනු ව වැඩි ම ප්‍රතිශතය (30.7%) අවුරුදු 15-20 වයස් කාණ්ඩයෙ හි ද, තෙවනුව (24.8%) අවුරුදු 20-25 වයස් කාණ්ඩයෙ හි ද, නියෝජනය විය. අවුරුදු 15හි වයස් කාණ්ඩයෙ හි කිසිවෙකු පූර්ණ කාලීනව කෘෂිකර්මාන්තයේ නිරත නො වන අතර පූර්ණ කාලීන කෘෂිකර්මාන්තයේ යෙදෙන්නන් වැඩි ම පිරිස (68%) අවුරුදු 25-29 වයස් කාණ්ඩයෙ හි විය. එම පිරිසට සමාජ සහ පවුලේ වගකීම් රාශියක් පැවරී ඇති හෙයින් කුමන හෝ රැකියාවක නිරතවීමට පවතින තත්ත්වය බලපෑම් කරනු ලබයි. මුහුකුරා ගිය පුද්ගලයන් බවට පත්වෙමින් වගකීම් දරන විට, වඩා යහපත් රැකියා බලාපොරොත්තුවෙන් සිටීම අත්හැර ජීවත්වීම සඳහා රැකියාවක් සොයා ගැනීමට ඔවුන්ට සිදු වේ. බොහෝ ගොවි සංවිධානවල නායකයින් සහ තරුණයින් පෙන්වා දුන් අන්දමට ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම්වලට සරිලන අන්දමේ රැකියාවක් සොයාගත නො හැකි වූ විට, අවම වශයෙන් ඔවුන්ට රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තයේ හෝ නියැලීමට සිදු වේ.

අර්ධ කාලීන නිරතවීම් සලකන විට, අවම සංඛ්‍යාව (5%) අවුරුදු 15 වයස් කාණ්ඩයේ ද, ඉහළ ම සංඛ්‍යාව (37.4%) අවුරුදු 25-29 වයස් කාණ්ඩයේ ද විය. පවුලේ ශ්‍රමිකයින් හෝ වැටුප් නො ලබන ශ්‍රමිකයින්ගේ කාණ්ඩයෙන් වැඩි ම කොටස (49.6%) වයස අවුරුදු 15-20 කාණ්ඩයෙන් ද, අඩු ම කොටස අවුරුදු 15 වයස් කාණ්ඩයෙන් ද වාර්තා විය (රූ සටහන 4.3).

**රූ සටහන 4.3: වයස් කාණ්ඩය අනුව කෘෂිකර්මාන්තයේ නියුතු ප්‍රතිචාරීන්ගේ විසිරීම**




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

කෘෂිකාර්මික කටයුතුවල නිරත පිරිසෙන්, 50.1% (ප්‍රතිචාරීන් 187)ක් තම පවුලේ ගොවිපළ සඳහා ශ්‍රමය යොදවන අතර 28.4% (ප්‍රතිචාරීන් 104) තම පෞද්ගලික ගොවිපළ සඳහා ශ්‍රමය යෙදවූහ. කෘෂිකර්මාන්තයේ නිරත ප්‍රතිචාරීන්ගෙන් 16.4%ක් පවුලේ සාමාජිකයින් සමග හවුලේ ගොවිපළක් පවත්වාගෙන ගිය අතර 3.5%ක් මිතුරන් සමග හෝ පවුලේ ඥාතීන් නොවන අය සමග ගොවිපළක් පවත්වාගෙන ගිය හ. ප්‍රතිචාරීන්ගෙන් 1.1% (ප්‍රතිචාරීන් 4)ක් පමණක් දෛනික වැටුප් ලබන කම්කරුවන් ලෙස කටයුතු කළ හ.

වගු සටහන් 4.2න් පෙන්නුම් කෙරෙන අන්දමට, 5 වසර දක්වා අධ්‍යාපනය ලැබූ (66.6%), සා.පෙළ. දක්වා අධ්‍යාපනය ලැබූ සහ සා.පෙළ. සමත් (52.4%) ප්‍රතිචාරීන්ගෙන් බහුතරය පූර්ණ කාලීනව කෘෂිකර්මාන්තයේ නියැලුන හ. වෙනත් අන්දමකට පවසන්නේ නම් පූර්ණ කාලීන කෘෂිකර්මාන්තයේ නිරත ප්‍රතිචාරීන්ගෙන් 57.4%ක් සා.පෙළ දක්වා පමණක් අධ්‍යාපනය ලැබුවන් වූහ. මෙයට පරස්පරව යමින් බහුතර සා.පෙළ. අධ්‍යාපනය හදාරන සිසුන් (50%), උසස් පෙළ දක්වා අධ්‍යාපනය හැදෑරූවන් (48.4%), උසස් පෙළ. පන්තිවල අධ්‍යාපනය හදාරන්නන් (79.2%), උපාධි අපේක්ෂකයින් (46.2%), කෘෂිකර්ම උපාධිධාරීන් (66.6%) සහ පශ්චාත් උපාධිධාරීන් (100%) පවුලේ ශ්‍රමිකයින් ලෙස කෘෂිකාර්මික කටයුතුවල නිරත වූහ.

මෙයට පෙර සිදු කරන ලද අධ්‍යයනවල සොයා ගැනීමක් වන අධ්‍යාපනය සහ රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තයේ නියැළීම අතර පවතින ප්‍රතිලෝම සම්බන්ධතාව ඉහත දත්ත මඟින් තහවුරු කරනු ලබයි (Chandrasiri and Karunagoda, 2011; Sharma, 2007).

වගුව 4.2: අධ්‍යාපන මට්ටම සහ නියැලි කාර්යයේ ස්වභාවය අනුව කෘෂිකාර්මික කටයුතුවල නිරත ප්‍රතිචාරීන්

| අධ්‍යාපන මට්ටම | පූර්ණ කාලීන | | අර්ධ කාලීන | | පවුලේ ශ්‍රමික | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | (%) | සංඛ්‍යාව | (%) | සංඛ්‍යාව | (%) | සංඛ්‍යාව | (%) |
| පාසැල් නො ගිය | 1 | 50.0 | 1 | 50.0 | 0 | 0.0 | 2 | 100.0 |
| 1-5 ශ්‍රේණිය දක්වා උගත් | 2 | 66.6 | 1 | 33.3 | 0 | 0.0 | 3 | 100.0 |
| සා.පෙළ. දක්වා උගත් | 85 | 46.2 | 48 | 26.1 | 50 | 27.2 | 184 | 99.5* |
| සා.පෙළ. සමත් | 32 | 52.4 | 12 | 19.6 | 17 | 27.9 | 61 | 100.0 |
| සා.පෙළ. හදාරන | 4 | 25.0 | 4 | 25.0 | 8 | 50.0 | 16 | 100.0 |
| උ.පෙළ. දක්වා උගත් | 7 | 22.6 | 9 | 29.0 | 15 | 48.4 | 31 | 100.0 |
| උ.පෙළ. හදාරන | 1 | 4.2 | 4 | 16.7 | 19 | 79.2 | 24 | 100.0 |
| උ.පෙළ. සමත් | 11 | 36.7 | 13 | 43.3 | 6 | 20.0 | 30 | 100.0 |
| කෘෂිකර්ම උපාධිධාරී | 1 | 50.0 | 0 | 0.0 | 1 | 50.0 | 2 | 100.0 |
| උපාධි අපේක්ෂක | 2 | 15.4 | 5 | 38.5 | 6 | 46.2 | 13 | 100.0 |
| කෘෂිකර්ම නො වන උපාධිධාරීන් | 1 | 20.0 | 2 | 40.0 | 2 | 40.0 | 5 | 100.0 |
| කෘෂිකර්ම උපාධිධාරී | 1 | 33.3 | 0 | 0.0 | 2 | 66.6 | 3 | 100.0 |
| කෘෂිකර්ම නො වන පශ්චාත් උපාධිධාරී | 0 | 0.0 | 0 | 0.0 | 1 | 100.0 | 1 | 100.0 |
| එකතුව | 148 | 39.6 | 99 | 26.5 | 127 | 33.9 | 375 | 100.0 |

සටහන: සා.පෙළ දක්වා උගත් 0.5%.(එක් අයෙකු) තම රැකියාවේ කොටසක් ලෙස කෘෂිකර්මාන්තයේ නියැලේ.
මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012


### 4.3 කෘෂි පාදක කොටගත් කර්මාන්ත සහ ව්‍යාපාරවල තරුණ සහභාගීත්වය

සමස්ත නියැදියෙන් 7.3% (ප්‍රතිචාරීන් 39)ක් තමන් කෘෂිකර්මාන්තයට අදාළ කර්මාන්ත හෝ ව්‍යාපාරවල නිරත බව පැවසූ හ. ඔවුන්ගෙන් 84.6% (ප්‍රතිචාරීන් 6)ක් ස්ත්‍රීහු වූහ. කෘෂිකර්මාන්තයට අදාළ ව්‍යාපාර/කර්මාන්තවල නිරත වූවන්ගෙන් 51.3%ක් වයස අවුරුදු 15-29 කාණ්ඩයට අයත් වූහ. කෘෂි ව්‍යාපාර හෝ කර්මාන්තවල නිරත පිරිසෙන් 25.6%ක් වයස අවුරුදු 15-20 කාණ්ඩයට අයත් වූහ. කෘෂි

ව්‍යාපාර/කර්මාන්තවල නිරත ප්‍රතිචාරීන්ගෙන්, වැඩිම කොටස (46.2%) සා.පෙළ.දක්වා අධ්‍යාපනය ලැබුවන් වූ අතර 2.6%ක් පමණක් උපාධිධාරීහු වූහ (රූ සටහන 4.4).

කෘෂි ව්‍යාපාරවල/කර්මාන්තවල නිරත ප්‍රතිචාරීන්ගෙන් තනි බහුතරය (18.9%) ඇඹරුම්හල් පවත්වාගෙන ගිය හ. වගු සටහන් 4.3න් පෙන්නුම් කෙරෙන අන්දමට, ප්‍රතිචාරීන්ගෙන් 16.2% බැගින් මී කිරි/යෝගට් නිෂ්පාදනයේ සහ එළවළු සහ පලතුරු තොග වෙළඳාමේ යෙදුන හ. මේවායින් බොහොමයක්, කර්මාන්තවලට වඩා කෘෂිකර්මාන්තයට අදාළ සුළු පරිමාණ ව්‍යාපාර වේ.

රූ සටහන 4.4: අධ්‍යාපන මට්ටම අනුව කෘෂි ව්‍යාපාර/කර්මාන්තවල නිරත ප්‍රතිචාරීන්ගේ විසිරීම




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

වගුව 4.3: ස්වභාවය අනුව ප්‍රතිචාරීන් යෙදී ඇති කෘෂිකාර්මික කර්මාන්ත/ව්‍යාපාරවල ස්වභාවය

| කර්මාන්තය/ව්‍යාපාරය | පුද්ගල සංඛ්‍යාව | ප්‍රතිශතය (සංඛ්‍යාව=39) |
|---|---|---|
| ඇඹරුම්හල් පවත්වාගෙන යාම | 7 | 18.9 |
| කෘෂි යන්ත්‍රෝපකරණ කුලියට දීම | 5 | 13.5 |
| රසකැවිලි නිෂ්පාදනය | 1 | 2.7 |
| කුළුබඩු සහ ධාන්‍ය ඇසුරුම් කිරීම සහ අලෙවිය | 3 | 8.1 |
| බීජ සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය | 1 | 2.7 |
| විසිතුරු පැළෑටි නිෂ්පාදනය | 1 | 2.7 |
| මී කිරි/යෝගට් නිෂ්පාදනය | 6 | 16.2 |
| එළවළු/පලතුරු සහ වෙනත් බෝග තොග අලෙවිය | 6 | 16.2 |
| කාබනික පොහොර නිෂ්පාදනය සහ අලෙවිය | 2 | 5.4 |
| බිම්මල් නිෂ්පාදන සහ අලෙවිය | 2 | 5.4 |
| කුකුළු ගොවිපළවල් සහ මස් වෙළඳසැල් පවත්වාගෙන යාම | 2 | 5.4 |
| පුවක් වෙළඳාම | 1 | 2.7 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

කෘෂිකර්මාන්තය හා සබැඳි කර්මාන්ත හෝ ව්‍යාපාරවල දැනට නිරත නොවන ප්‍රතිචාරීන්ගෙන් 73.2% (ප්‍රතිචාරීන් 360)ක් අනාගතයේ ඒවායෙ හි යෙදීමට කැමැත්තෙන් පසුවූ හ. ඔවුන්ගෙන් 65.2% (234) පුරුෂයෝ වූහ.

## 4.4 සමාප්තිය

සමස්ත නියැදියෙන් 70.4%ක් කෘෂිකර්මාන්තයේ නිරත වුවත් එහි ප්‍රමාණය සහ ස්වභාවය විවිධ ය. කෘෂිකර්මාන්තයේ නිරත පිරිසෙන් 40% ආසන්න ප්‍රමාණයක් නැතහොත් සමස්ත නියැදියෙන් 27.8%ක් පූර්ණ කාලීනව කෘෂිකර්මාන්තයේ නියැලෙන අතර 34%ක් වැටුප් නො ලබන ශ්‍රමිකයින් හෝ පවුලේ ශ්‍රමිකයෝ ලෙස කටයුතු කළ හ. සමීක්ෂණයේ දත්ත අනාවරණය කරනු ලැබුවේ අධ්‍යයන මට්ටම සහ කෘෂිකර්මාන්තයේ නියැලීම අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයක් පවතින බවයි. ප්‍රතිචාරීන්ගෙන් 7%ට ආසන්න ප්‍රමාණයක් කෘෂිකර්මය හා සබැඳි කර්මාන්ත හෝ ව්‍යාපාරවල නිරත වුව ද, ඔවුන්ගෙන් බහුතරය ද සුළු පරිමාණ කර්මාන්තවල නිරත වූහ.

## පස් වැනි පරිච්ඡේදය
## කෘෂිකර්මාන්තය පිළිබඳ තරුණ ප්‍රජාවේ ආකල්ප


### 5.1 හැඳින්වීම

විශේෂයෙන් ම, පූර්ණ කාලීන රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තය හා සබැඳි ක්‍රියාකාරකම් පිළිබඳ තරුණයින්ගේ ආකල්ප මෙම පරිච්ඡේදයෙන් විස්තර කෙරේ. යථා තත්ත්වය හඳුනා ගැනීම සඳහා තරුණයින් කෘෂිකර්මාන්තයට අදාළ ක්‍රියාකාරකම්වල නියැලෙන ආකාරයන්, එම මැදිහත්වීම පිටුපස ඇති හේතූන් මෙහි දී ඉලක්ක කොට ඇත. එමෙන් ම, මෙම පරිච්ඡේදයෙන් කෘෂි පාදක කොටගත් කර්මාන්ත සම්බන්ධයෙන් තරුණ ආකල්ප විස්තර කෙරේ. එයට අමතරව, පූර්ණ කාලීන රැකියාවක නිරත නො වන තරුණයින්, යෙදීමට වඩාත් කැමති රැකියා කාණ්ඩ පිළිබඳව ද සාකච්ඡා කෙරේ.

### 5.2 පූර්ණ කාලීන රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තයෙ හි නියැලීමට ඇති කැමැත්ත

අධ්‍යයන නියැදියේ ප්‍රතිචාරින්ගෙන් 58.2%ක් පූර්ණ කාලීන රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තයට අදාළ ක්‍රියාකාරකම්වල යෙදීමට කැමති බව ප්‍රකාශ කළ අතර 39.6%ක් පූර්ණ කාලීන රැකියවක් ලෙස කෘෂිකර්මාන්තයේ නියැලීමට අකමැති බව ප්‍රකාශ කළ හ (රූ සටහන 5.1). එයට අමතරව, ප්‍රතිචාරින්ගෙන් 2.3%ක් පූර්ණ කාලීන රැකියාවක් ලෙස කෘෂිකාර්මික ක්‍රියාකාරකම්වල නියැලීමට ඇති කැමැත්ත සම්බන්ධයෙන් පැහැදිළි අදහසක් නොමැති බව පැවසූ හ. ක්ෂේත්‍රයේ ප්‍රතිලාභ මෙන් ම අවාසිදායක තත්ත්වයන් ද පවතින බව ඔවුහු සඳහන් කළ හ.

රූ සටහන 5.1: පූර්ණ කාලීන ව කෘෂිකර්මාන්තයේ නියැලීමට ඇති කැමැත්ත




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

පූර්ණ කාලීන රැකියාවක් ලෙස කෘෂිකාර්මික ක්‍රියාකාරකම්වල යෙදීමට ප්‍රතිචාරීන්ගේ කැමැත්ත විවිධාකාර වන අතර එය ඔවුන්ගේ අත්දැකීම්, දැනුම, ආර්ථික ප්‍රතිලාභ සහ පෞද්ගලික චරිත ලක්ෂණ මත පදනම් වේ. පූර්ණ කාලීන රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තයේ නියැලීමට කැමැත්තක් දැක් වූ ප්‍රතිචාරීන්ගෙන් බහුතරයට කුඩා කාලයේ සිට එම කාර්යයන් සම්බන්ධයෙන් අත්දැකීම් පැවති හෙයින් කෘෂිකර්මාන්තයට අදාළ කාර්යයන් ඉටු කිරීමට දක්ෂතාව පැවතිණි. අනෙක් අතට, ඔවුන්ට ප්‍රමාණවත් තරම් ශ්‍රමය (විශේෂයෙන් ම පවුලේ ශ්‍රමය) සහ ඉඩම් ඇතුළු මූලික වත්කම් පැවතිණි. එම නිසා, ඔවුහු ප්‍රමාණවත් නිපුණතා, පුහුණුව සහ අධ්‍යාපනය රහිතව විවෘත රැකියා වෙළෙඳපොළේ වෙනත් රැකියාවක් සොයාගෙන ඉවතට යාම වෙනුවට කෘෂිකාර්මික ක්‍රියාකාරකම්වල නිරතවීම තෝරා ගැනීමට වැඩි කැමැත්තක් දැක්වූ හ.

එමෙන් ම, කෘෂිකර්මාන්තයට සම්බන්ධ ක්‍රියාකාරකම්වලින් වැඩි ප්‍රමාණයක් ප්‍රතිචාරීන්ගේ ගම්වල සිට සිදුකරන හෙයින් ඔවුන්ගෙන් ඇතැමෙකු තම හුරු පුරුදු වටපිටාවෙන් බැහැරට නො ගොස් කෘෂිකාර්මික කටයුතුවල යෙදීමට තීරණය කොට තිබේ. එයට අමතරව, ප්‍රතිචාරීන් අතුරින් තරුණයින් රාශියක් ඔවුන්ගේ පවුල්වලට විවිධාකාරයේ යුතුකම් ඉටුකිරීමට බැඳී සිටිය හ. ඒ අනුව, ඔවුන්ගේ නිවෙස්වලින් බැහැරව යාමේ දුෂ්කරතා හේතුවෙන් ගම්වල ඇතැම් තරුණයින් පූර්ණ කාලීනව කෘෂිකාර්මික කටයුතුවල නිරත වී සිටිය හ. ළමුන්, ස්ත්‍රීන්, ආබාධිත පුද්ගලයින්, රෝගී දුබල හෝ වයස්ගත පුද්ගලයින් පමණක් ඇතැම් නිවාසවල ජීවත් වන අතර ඔවුන්ට උරුම වී ඇති කෘෂිකාර්මික ඉඩම්වල වගා කටයුතු සිදු කිරීමට තරුණ ප්‍රතිචාරීන් හැර වෙනත් ඥාතීහු කිසිවෙක් නොවූ හ. ඇතැමෙකුට තම දෙමාපියන්ගේ කෘෂිකාර්මික කටයුතුවලට සහාය වීමට සිදු වන නිසා වෙනත් රැකියාවක් සඳහා ගමෙන් බැහැරට යාම දුෂ්කර ය. මෙම තත්ත්වය ගොවි සංවිධාන නියෝජිතයින් විසින් ද තහවුරු කරනු ලැබූ හ.

ක්ෂේත්‍ර සමීක්ෂණයේ දී අනාවරණය වූ අන්දමට, අධ්‍යාපන කටයුතු නිම කළ පසු තරුණයින් රාශියක් පෞද්ගලික හෝ අවිධිමත් අංශයේ රැකියා සඳහා නිවෙසින් බැහැර වී ඇත්තා හ. රැකියා සඳහා ගමෙන් පිටතට සංක්‍රමණය වූ ඇතැම් ප්‍රතිචාරීන්ගේ අත්දැකීම්වලට අනුව ඔවුන්ට ලැබී ඇති අඩු වැටුපෙන් තම මාසික වියදම පවා ආවරණය කරගැනීම අපහසු ය. මෙවැනි අත්දැකීම් සහිත ප්‍රතිචාරීන්ගෙන් බහුතරය විවෘත රැකියා සඳහා වෙළඳපොළේ රැකියා කිරීමෙන් විඩාවට පත්ව ඇත්තා හ. එම නිසා, කාෂිකාර්මික අංශයේ කටයුතුවල යෙදීම ඔවුන් විසින් තෝරාගෙන තිබේ. එවැනි ප්‍රතිචාරීන්ගේ අදහසට අනුව ඔවුන් ගමෙන් බැහැරව නිරත වූ එකී රැකියාවලින් සත්‍ය වශයෙන් ම උපයාගෙන ඇත්තේ. තමන් ගම් ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතුවල යෙදීමෙන් උපයාගත් මුදලට වඩා අඩු ආදායමකි. එම නිසා, අඩු පීඩනයක් සහ වැඩි නිදහසක් භුක්ති විඳිමින්, අඩු ජීවන වියදමක් සහිත ගම් ප්‍රදේශයේ ජීවත් වෙමින්, කෘෂිකාර්මික කටයුතුවල යෙදීමට ඔවුහු කැමැත්තෙන් පසුවෙති. මෙම හේතුවලට අමතරව, ස්වයං කැමැත්ත සහ ස්වයං තෘප්තිය කෘෂිකර්මාන්තය ආශ්‍රිත රැකියාවන් හි නිරත වීමට තෝරා ගැනීම සඳහා ඔවුන් සැලකිල්ලට ගනු ලැබූ කරුණු වේ.

පූර්ණ කාලීනව කෘෂිකාර්මික කටයුතුවල යෙදීම සඳහා තරුණයින්ගේ කැමැත්ත තීරණය කිරීමෙහි ලා ලාභදායී, කෘෂි ක්‍රියාකාරකම් වැදගත් භූමිකාවක් රඟ දක්වයි. නුවරඑළිය දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍ර සමීක්ෂණයට අනුව, කුඩා ඉඩම් කැබැල්ලක් හෝ වගා කිරීමෙන් ඉහළ ආදායමක් උපයාගත හැකි හෙයින් උඩරට එළවළු වගා කරන

ගොවි පවුල්වල තරුණ පරම්පරාව අනෙකුත් ප්‍රදේශවලට වඩා කෘෂි ක්‍රියාකාරකම්වල නිරතවීමට කැමැත්තක් දක්වති. තව ද, වී වගාවට වඩා එළවළු පලතුරු සහ අනෙකුත් ක්ෂේත්‍ර බෝග වගාව බොහෝ ලාභදායක ය. එම නිසා, වී වගාවට වඩා මෙම බෝග වගා කිරීමට තරුණයෝ කැමැත්තක් දක්වති. කෙසේ. වුව ද, අස්වැන්න සාධාරණ මිලකට අලෙවි කරගැනීමේ අපහසුව, ඉහළ නිෂ්පාදන පිරිවැය, ඉඩම් සහ ජල හිඟය නිසා තරුණයින් බොහෝ පිරිසක් වී වගාවේ යෙදීමට කැමැත්තක් නො දක්වති. විශේෂයෙන් ම, අද ගොවිතැන් ක්‍රමයට වගා කිරීමට තරුණයින් අකැමැතිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ගම්වල පුරන් කුඹුරු විශාල ප්‍රමාණයක් දැකිය හැකි ය.

අනෙක් අතට, ඉලක්ක ගත කණ්ඩායම් සාකච්ඡාවලට අනුව, කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ භාවිතා වන සාම්ප්‍රදායික ක්‍රම නිසා ගොවි සමාජයේ තරුණ පරම්පරාවේ ඇතැම් සාමාජිකයින් වගා කටයුතුවල නිරතවීමට අකැමැති ය. බොහෝ තරුණයෝ නවීන ජීවන රටාව අනුගමනය කිරීමට කැමැත්තක් දක්වන අතර දැඩි ගැහැට සහිත ව වැඩ කරන වාතාවරණයක් යටතේ වගා කටයුතු කිරීමට කැමැත්තක් නො දක්වති.

**වගුව 5.1: වයස සහ පූර්ණ කාලීන රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තයේ යෙදීමට ඇති කැමැත්ත**

| වයස් කාණ්ඩය | කැමැත්ත | | | | | |
|---|---|---|---|---|---|---|
| | කැමැති | | අකැමැති | | පැහැදිලි අදහසක් නොමැති | |
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| අවුරුදු 15 | 19 | 54.2 | 14 | 40.0 | 2 | 5.8 |
| අවුරුදු 15 ≤20 | 87 | 45.8 | 100 | 52.6 | 3 | 1.6 |
| අවුරුදු 20 ≤25 | 82 | 61.7 | 47 | 35.3 | 4 | 3.0 |
| අවුරුදු 25≤29 | 122 | 69.7 | 50 | 28.6 | 3 | 1.7 |
| එකතුව | 310 | 58.2 | 211 | 39.6 | 12 | 2.2 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

වගු සටහන් 5.1න් පෙන්නුම් කෙරෙන අන්දමට, අවුරුදු 25≤29 වයස් කාණ්ඩයේ ප්‍රතිචාරින්ගෙන් 69.7% (ප්‍රතිචාරින් 122) පූර්ණ කාලීනව කෘෂිකර්මාන්තයේ නියැලීමට කැමැත්තක් දැක් වූ අතර අවුරුදු 20≤25 වයස් කාණ්ඩයේ ප්‍රතිචාරින්ගෙන් 61.7% (ප්‍රතිචාරින් 82) පූර්ණ කාලීනව කෘෂිකර්මාන්තයේ නියැලීමට කැමැත්තක් දැක්වූ හ. අනෙක් අතට, අවුරුදු 15≤20 වයස් කාණ්ඩයේ ප්‍රතිචාරින්ගෙන් 52.6% (ප්‍රතිචාරින් 100) පූර්ණ කාලීනව කාෂිකර්මාන්තයේ නියැලීමට තමන් අකැමැති බව පැවසූ හ.

අවුරුදු 25ට අඩු බොහෝ තරුණයින් ප්‍රකාශ කළේ ඔවුන් පූර්ණ කාලීනව කෘෂිකාර්මික කටයුතුවල නියැලීමට කැමැත්තක් නො දක්වන බවත්, විවෘත රැකියා වෙළඳපොළේ රැකියාවක් සඳහා යොමු වීමට හෝ ඔවුන්ගේ ඉදිරි අධ්‍යාපන කටයුතුවල නිරතවීමට අදහස් කර සිටින බවත් ය. ඔවුන් අතුරින් අඩු අධ්‍යාපන මට්ටමක් සහිත තරුණයින් ත්‍රීරෝද රථ රියදුරු, කර්මාන්තශාලාවල රැකියා, විදේශ රැකියා හෝ ඉදිකිරීම් අංශයේ රැකියා වැනි රැකියා සඳහා කැමැත්තක් දැක්වූ හ. ඉදිකිරීම් අංශයේ අත්දැකීම් සහිත අයට කෙටි කාල පරිච්ඡේදයක් තුළ කෘෂිකර්මාන්තයෙන් ඉපැයිය නො හැකි වඩා හොඳ ආදායමක් ඉපැයිය හැකි ය. ඔවුන් පැවසූ අන්දමට මෙම රැකියා ආර්ථිකමය අඩු අවදානම් සහිත ඒවා වන අතර කෘෂිකර්මාන්තයට වෙනස්ව යමින් ඔවුන්ගේ ආදායම සහතික කරනු ලබයි.

අවුරුදු 25ට වැඩි ප්‍රතිචාරීන් බොහොමයක් පූර්ණ කාලීන කෘෂිකර්මාන්තයේ නියැලීමට කැමති බව ප්‍රකාශ කළ හ. ක්ෂේත්‍ර සමීක්ෂණයෙන් හෙළි කළ අන්දමට ඔවුන්ගේ කැමැත්තට හේතු රාශියකි. ඔවුන් ජීවිත අත්දැකීම් ලබාගනිමින් පරිණත භාවයට පත් වීමත් සමග ම වඩාත් ගැළපෙන රැකියාව පිළිබඳ සිතීමට පෙළඹීම ඉන් වඩාත් ම වැදගත් කරුණ වේ. ඇතැම් ප්‍රතිචාරීන්ගේ ඔවුන්ගේ ගැටවර වියෙහි දී හෝ වයස විසි ගණන්වල මුල් භාගයේ දී විවිධ ආකාරයේ රැකියාවල නිරත වී ඇත්තා හ. කෙසේ වුව ද, එම .රැකියාවල වසර ගණනක් නිරත වීමෙන් පසුව, එයින් පීඩාවට පත් වී ඇති ඔවුහු කෘෂිකර්මාන්තය තුළ එයට වඩා නිදහසක් ඇති බව වටහා ගෙන සිටිති. කර්මාන්තශාලාවල සහ නුපුහුණු ශ්‍රමය යොදා ගැනෙන, සාධාරණ වැටුප් හිමි නොවන, බොහෝ ක්ෂේත්‍රවල කර්කශ බව ඔවුහු වැඩිදුරටත් වටහාගෙන ඇත්තා හ.

**වගුව 5.2 : කෘෂිකර්මාන්තයේ නිරතවන ආකාරය සහ පූර්ණ කාලීනව කෘෂිකර්මාන්තයේ නියැලීමට ඇති කැමැත්ත**

| කාර්යයේ ස්වභාවය | කැමැත්ත | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | කැමති | | අකමැති | | පැහැදිළි අදහසක් නොමැති | | සමස්තය (සංඛ්‍යාව=375) | |
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| පූර්ණ කාලීන රැකියාවක් ලෙස | 115 | 77.7 | 31 | 20.9 | 2 | 1.4 | 148 | 100.0 |
| අර්ධ කාලීන රැකියාවක් ලෙස | 56 | 56.6 | 38 | 38.4 | 5 | 5.1 | 99 | 100.0 |
| පවුලේ ශ්‍රමිකයින් ලෙස (රැකියාවක් ලෙස නො වන) | 67 | 52.3 | 61 | 47.7 | 0 | 0.0 | 128 | 100.0 |

සටහන: මෙම වගුවට ඇතුළත් කර ඇත්තේ තමන් පූර්ණ කාලීනව, අර්ධ කාලීනව හෝ පවුලේ ශ්‍රමිකයින් ලෙස කෘෂිකාර්මික කටයුතුවල යෙදෙන බව සඳහන් කළ ප්‍රතිචාරීන් පමණි.

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012




පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො,ප.පු.ආ
HARTI

කුමන ආකාරයෙන් හෝ කෘෂිකර්මයේ නියැලෙන පිරිසෙන් 44.6% (238) ඉදිරියේ දී පූර්ණ කාලීනව කෘෂිකර්මාන්තයේ නියැලීමට කැමැත්තෙන් පසු වේ. වගු සටහන් 5.2න් පෙන්නුම් කරන අන්දමට පූර්ණ කාලීනව කෘෂිකාර්මික කටයුතුවල යෙදෙන්නන්ගේ බහුතරය (77.7%) ඉදිරියේ දී ද අඛණ්ඩව පූර්ණ කාලීන කෘෂිකර්මාන්තයේ නියැලීමට කැමති බව ප්‍රකාශ කළ හ. සමස්ත නියැදියේ ප්‍රතිශතයක් ලෙස ගත්විට එය 21.6% (115)කි. දැනට අර්ධ කාලීනව කෘෂිකාර්මික කටයුතුවල නියැලෙන පිරිසෙන් 56.6% ඉදිරියේ දී පූර්ණ කාලීනව කෘෂිකර්මාන්තයේ නියැලීමට කැමැත්තෙන් පසුවූ හ. තවදුරටත්, දැනට පවුලේ ශ්‍රමිකයින් ලෙස කටයුතු කරන්නන්ගෙන් 52.3%ක් ඉදිරියේ දී පූර්ණ කාලීනව කෘෂිකාර්මික කටයුතුවල නිරතවීමට කැමැත්තෙන් පසුවෙති.

අධ්‍යයනයට අනුව, නියැදියට ඇතුළත් වූ පූර්ණ කාලීනව කෘෂිකාර්මික කටයුතුවල නිරත වන්නන්ගෙන් බහුතරයක් සතුව ඉඩම් වැනි තමන්ගේ ම වත්කම් පැවතිණි. තම ඉඩම දියුණු කිරීමේ සියලු වාසි සැලසෙන්නේ තමන්ට වන හෙයින් තම ඉඩම් සංවර්ධනය කිරීමට ප්‍රශස්ත උත්සාහයක් ඔවුන් විසින් දරා ඇත. එයට අමතරව, සමස්ත ගොවිපළ හෝ ව්‍යාපාරය ඔවුන් විසින් ම පාලනය කරන හෙයින් තම කාර්යය සම්බන්ධයෙන් තනි වගකීම ඔවුන් වෙත ම පැවරී තිබේ.

පවුලේ ශ්‍රමිකයින් සම්බන්ධයෙන් සැලකීමේ දී ඔවුන්ට ඉඩම් හිමිකමක් නොමැති අතර ප්‍රතිලාභ පිළිබඳ සහතිකයක් ද නොමැත. අනෙක් අතට, නිෂ්පාදන අලෙවි කළ පසු ඔවුන්ගේ දෙමාපියන් විසින් පවුලේ ශ්‍රමිකයින් ලෙස කටයුතු කරන අයගෙන් ඇතැම් පිරිසකට පාරිතෝෂික හෝ ත්‍යාග ලෙස මුදල් ලබා දී තිබේ. එසේ වුව ද, බොහෝ අවස්ථාවල දී සිදු ව ඇත්තේ දෙමාපියන් විසින් දරුවන්ගේ එදිනෙදා අවශ්‍යතා සහ අධ්‍යාපනය ඇතුළු අනෙකුත් අත්‍යවශ්‍ය කටයුතු සඳහා මුදල් වියදම් කිරීම ය. විශේෂයෙන් ම, පවුලේ ශ්‍රමිකයින් ලෙස කටයුතු කළ ඇතැම් ප්‍රතිචාරීන් වෘත්තීයමය රැකියා අපේක්ෂාවෙන් ඉගෙනීමේ කටයුතු කරන අවස්ථාවල එය දැකිය හැකි ය.

**රූ සටහන 5.2 : ස්ත්‍රී/පුරුෂ භාවය සහ පූර්ණ කාලීන කෘෂිකර්මාන්තයේ නිරතවීමට ඇති කැමැත්ත**




| | කැමති | අකැමති | පැහැදිළි අදහසක් නොමැති |
|---|---|---|---|
| ■ ස්ත්‍රී | 50.8 | 47 | 2.2 |
| ▒ පුරුෂ | 61.9 | 35.8 | 2.3 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

රූ සටහන් 5.2න් පෙන්නුම් කෙරෙන අන්දමට, පූර්ණ කාලීන කෘෂිකර්මාන්තයේ නියැලීමට තරුණියන්ට වඩා තරුණයෝ කැමැත්තක් දක්වති. ඒ අනුව, තරුණයින්ගෙන් 61.9%ක් කෘෂිකර්මාන්තයට අදාළ කටයුතුවල නිරත වීමට කැමැත්තක් දක්වන අතර රැකියාවක් ලෙස පූර්ණ කාලීනව කෘෂිකර්මාන්තයෙ හි නියැළීමට කැමති තරුණයින්ගේ ප්‍රතිශතය 50.8% කි. ඇතැම් තරුණියන්ගේ අදහසට අනුව, ගෘහාශ්‍රිත කටයුතු සමග පූර්ණ කාලීනව කෘෂිකර්මාන්තයේ යෙදීම අපහසු ය. විශේෂයෙන් ම, ගොවිජන සමාජයේ දී, තම සහකරුගේ ගොවිපළ කටයුතුවලට සහායවීම සහ ඔවුන් වෙනුවෙන් ආහාර සැකසීම ආදී විශේෂිත වූ කාර්යයන් ඔවුන් වෙත පැවරී ඇත. එයට අමතරව, තම කුඩා දරුවන් බලා ගැනීමේ කටයුතු ද ඔවුන් වෙත පැවරී ඇත. අනෙක් අතට, තම සහකරු මුදල් උපයන නිසාත්, ගෘහණියක් වශයෙන් ගෙදර දොර කටයුතු සිදු කරමින් නිවසේ නතර වී සිටීමට ඔවුන්ට පවසා ඇති නිසාත්, ඇතැම් ස්ත්‍රීන් කෘෂිකර්මාන්තයේ හෝ වෙනත් රැකියාවක නියැලීමට අකැමැති බව ප්‍රකාශ කළ හ. අනෙක් අතට, තමන් කෘෂිකාර්මික කටයුතුවල හෝ ස්වයං රැකියාවල හෝ ව්‍යවසායකයින් ලෙස හෝ කටයුතු කිරීමට කැමති බව ස්ත්‍රීන්ගෙන් පිරිසක් පැවසූ හ. තරුණයින් සම්බන්ධයෙන් සැලකීමේ දී තමන්ගේ පවුල රැකබලා ගැනීමේ වගකීම තමන්ට පැවරී ඇති හෙයින් කෘෂිකාර්මික කටයුතුවල නිරතවීමට කැමති බව සැලකිය යුතු පිරිසක් ප්‍රකාශ කළ හ. මෙයට පරස්පරව යමින්, පූර්ණ කාලීනව කෘෂිකර්මාන්තයේ නිරත වී සිටින තරුණයින්ගෙන් පිරිසක් ප්‍රකාශ කරනු ලැබුවේ ඉහළ නිෂ්පාදන පිරිවැයක් සමග පහළ ආදායමක් පමණක් ලැබෙන හෙයින් පූර්ණ කාලීන රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තයේ නියැලීමට අකැමැති බවයි.

වගුව 5.3: විවාහක/අවිවාහක භාවය සහ පූර්ණ කාලීන රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තයේ නියැලීමට ඇති කැමැත්ත

| විවාහක තත්ත්වය | කැමැත්ත | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | කැමති | | අකමැති | | පැහැදිලි අදහසක් නොමැති | | සමස්තය | |
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| විවාහක | 127 | 70.6 | 50 | 27.8 | 3 | 1.7 | 180 | 100 |
| අවිවාහක | 183 | 51.8 | 161 | 45.6 | 9 | 2.5 | 353 | 100 |
| එකතුව | 310 | 58.2 | 211 | 39.6 | 12 | 2.3 | 533 | 100 |


මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

විවාහක ප්‍රතිචාරීන්ගෙන් බහුතරය (70.6%)ක් ද, අවිවාහක ප්‍රතිචාරීන්ගෙන් 51.8% ද, පූර්ණ කාලීනව කෘෂිකාර්මික කටයුතුවල නිරතවීමට රුචියක් දැක්වූ හ (5.3 වගුව). අධ්‍යයනයට අනුව, අවිවාහක තරුණ ප්‍රතිචාරීන්ගෙන් (ගැටවර වියේ පසුවන සහ වයස විසි ගණන්වල මුල් භාගයේ සිටින) බහුතරය සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් තම පවුල්වලින් යැපෙති. කෙසේ වුව ද, අවිවාහක අයට වඩා විවාහක ප්‍රතිචාරීන්ට

පවුලේ වගකීම් දැරීමට සිදුව තිබිණි. එම නිසා, ඔවුන්ගෙන් (විවාහක ප්‍රතිචාරීන්ගෙන්) බහුතරය ගොවිපළ කටයුතුවලින් බැහැර වීමට වඩා ඒවායෙහි නිරතවීමට කැමැත්තක් දැක්වූ හ.

රූ සටහන් 5.3න් පෙන්නුම් කෙරෙන අන්දමට, ආදායම් කාණ්ඩ කිහිපයක් හැරුණු කොට පවුලේ ආදායම් සහ කෘෂිකාර්මික කටයුතුවල නිරතවීමට ඇති කැමැත්ත අතර සබඳතාවේ විශේෂිත වෙනස්කමක් නොමැත. ඒ අනුව, රුපියල් 5,000/=ට වඩා මාසික ආදායමක් සහිත පවුල්වල ප්‍රතිචාරීන්ගෙන් 71.5%ක් පූර්ණ කාලීනව කෘෂිකර්මාන්තයේ නියැලීමට කැමැත්තෙන් පසුවූ හ. තව ද, රු. 5,000/= සිට රු.10,000/= දක්වා වූ ආදායම් කාණ්ඩයට ඇතුළත් ප්‍රතිචාරීන්ගෙන් 62.8% ද, රු. 20,000/= සිට 30,000/= අතර ආදායම් කාණ්ඩයේ ප්‍රතිචාරීන්ගෙන් 64.1% ද පූර්ණ කාලීනව කෘෂිකාර්මික කටයුතුවල නිරතවීමට කැමැත්තක් දැක්වූ හ.

**රූ සටහන් 5.3: පවුලේ මාසික ආදායම සහ රැකියාවක් ලෙස පූර්ණ කාලීන කෘෂිකර්මාන්තයේ නියැලීමට ඇති කැමැත්ත**





| | මාසික ආදායම 5,000 (සංඛ්‍යාව = 14) | මාසික ආදායම 5,000-10,000 (සංඛ්‍යාව = 43) | මාසික ආදායම 10,000-20,000 (සංඛ්‍යාව 60) | මාසික ආදායම 20,000-30,000 (සංඛ්‍යාව = 128) | මාසික ආදායම 30,000-40,000 (සංඛ්‍යාව = 69) | මාසික ආදායම 40,000-50,000 (සංඛ්‍යාව = 37) | මාසික ආදායම 50,000 ට වැඩි (සංඛ්‍යාව = 75) |
|---|---|---|---|---|---|---|---|
| කැමති | 71.5 | 62.8 | 54.4 | 64.1 | 52.1 | 54 | 57.3 |
| අකැමති | 28.5 | 37.3 | 44.4 | 33.6 | 46.4 | 43.2 | 36 |
| පැහැදිළි අදහසක් නොමැති | 0 | 0 | 1.3 | 2.3 | 1.4 | 2.7 | 6.7 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

ඉහත රූ සටහනෙන් පෙන්නුම් කෙරෙන රටාව සඳහා හේතු මනාව පැහැදිළි නොවේ. කෙසේ වුව ද, පහළ ආදායම් කාණ්ඩවල ප්‍රතිචාරීන්ට ඉතා සුළු වත්කම් ප්‍රමාණයක් හිමිව තිබීමත්, ගොවිතැන හැර වෙනත් රැකියා සඳහා යොමු වීමට ඇති ප්‍රවේශ සීමාවීමත්, පහළ ආදායම් කාණ්ඩවල ප්‍රතිචාරීන් වැඩි වශයෙන් කෘෂිකර්මාන්තයට යොමුවීමට හේතු වේ. මෙම කාණ්ඩවල ප්‍රතිචාරීන් වෙනත් රැකියා සඳහා යොමුවීම සීමා කිරීම සඳහා මූල්‍ය පහසුකම්වල හිඟය, රැකියා සඳහා ඔවුන්ගේ කැමැත්තට බාධා කරන විවෘත රැකියා

වෙළඳපොළ සහ අඩු අධ්‍යාපන මට්ටම බලපා තිබේ. අනෙක් අතට, ඔවුන් ජීවත් වන ගම්වල ඉතා අවම පහසුකම් යටතේ කෘෂිකාර්මික කටයුතුවල නිරතවීමට ඔවුන්ට සිදු වී ඇත. ඉහළ ආදායම් මට්ටම්වලට අයත් ප්‍රතිචාරීන්ට ඔවුන්ගේ ආර්ථික පසුබිම අනුව වෙනත් ජීවනෝපාය මාර්ගයන්ට අවතීර්ණවීමට අවස්ථා මෙන් ම පහසුකම් ද පැවතිණි. එම නිසා, එවැනි පවුල්වල තරුණයින්ට පහළ ම ආදායම් කාණ්ඩවලට මෙන් නොව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට හෝ විදේශ රැකියා ඇතුළු වෙනත් රැකියා වෙත යොමුවීමට හෝ ප්‍රමාණවත් තරම් ආර්ථික ස්ථාවරත්වයක් පැවතිණි.

රූ සටහන 5.4: අධ්‍යාපන මට්ටම සහ පූර්ණ කාලීන රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තයේ නියැලීමට ඇති කැමැත්ත




| | පාසැල් අධ්‍යාපන-ය නොලත් | 1-5 වසර දක්වා | 6-සා.පෙළ දක්වා | සා.පෙළ සමත් | සා.පෙළ හදාරන | උ.පෙළ දක්වා | උ.පෙළ හදාරන | උ.පෙළ සමත් | කෘෂිකර්ම ඩිප්ලෝමා-ධාරී | උපාධි අපේක්ෂක | කෘෂිකර්ම උපාධිධාරී | වෙනත් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කැමති | 100 | 75 | 67.7 | 68.5 | 48.1 | 37.5 | 29.7 | 44.6 | 50 | 58.8 | 28.6 | 57.2 |
| අකැමති | 0 | 25 | 30.2 | 30.4 | 51.9 | 55 | 64.9 | 55.4 | 50 | 41.2 | 64.3 | 42.9 |
| පැහැදිළි අදහසක් නොමැති | 0 | 0 | 2.1 | 1.1 | 0 | 7.5 | 5.4 | 0 | 0 | 0 | 7.1 | 0 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

රූ සටහන් 5.4න් පෙන්නුම් කෙරෙන අන්දමට, පොදුවේ අඩු අධ්‍යාපන මට්ටමක් සහිත ප්‍රතිචාරීන්, ඉහළ අධ්‍යාපන මට්ටමක් සහිත ප්‍රතිචාරීන්ට වඩා පූර්ණ කාලීන රැකියාවක් ලෙස කෘෂිකාර්මික කටයුතුවල නිරතවීමට කැමැත්තක් දැක්වූ හ. විශේෂයෙන් ම, සාමාන්‍ය පෙළට වඩා අඩු අධ්‍යාපන මට්ටමක් සහිත ප්‍රතිචාරීන්ගෙන් බහුතරය පූර්ණ කාලීන රැකියාවක් ලෙස කෘෂිකාර්මික කටයුතුවල නිරතවීමට කැමැත්තක් දැක්වූ හ. එයට පරස්පරව, සා.පෙළ දක්වා හෝ වැඩිදුර අධ්‍යාපනය ලත් ප්‍රතිචාරීන්ගෙන් බහුතරය පූර්ණ කාලීනව කෘෂිකාර්මික කටයුතුවල නිරතවීමට අකැමැති බව ප්‍රකාශ කළ හ.

එයට අනුකූලව, 1-5 වසර දක්වා අධ්‍යාපනය හැදෑරූවන්ගෙන් 75% ද, 6 වසරේ සිට සාමාන්‍ය පෙළ දක්වා උගත් ප්‍රතිචාරීන්ගෙන් 67.7% ද, සා.පෙළ සමත් ප්‍රතිචාරීන්ගෙන් 68.5% ද, පූර්ණ කාලීනව කෘෂිකාර්මික කටයුතුවල නිරතවීමට කැමැත්තෙන් පසුවූ හ. අධ්‍යාපන මට්ටම ඉහළ යන විට මෙම රටාව ආපස්සට

ගමන් කිරීමක් සිදු වේ. ඒ අනුව, උසස් පෙළ දක්වා අධ්‍යාපනය හදාරන්නන්ගෙන් 55% ද, උසස් පෙළ අධ්‍යාපනය හදාරන්නන්ගෙන් 64.9% ද, පූර්ණ කාලීන පදනමකින් කෘෂිකාර්මික කටුතුවල නිරතවීමට අකැමැති බව ප්‍රකාශ කළ හ.

උපාධි අපේක්ෂකයින් යම්තාක් දුරට වෙනස් ආකල්පයක් දැරූ අතර අනාගතයේ දී පූර්ණ කාලීනව කෘෂිකර්මාන්තයේ නියැලීමට කැමති බව ඔවුන්ගෙන් 58.8%ක් ප්‍රකාශ කළ හ. කෘෂිකර්ම උපාධිධාරීන්ගෙන් 28.6%ක් පමණක් කෘෂිකර්මාන්තයට සම්බන්ධ රැකියාවල නිරතවීමට කැමති බව පැවසූ හ. ඔවුන්ගේ අධ්‍යාපනය සම්පූර්ණයෙන් ම කෘෂිකර්මය මත පදනම් වන හෙයින් මෙය විවාදාත්මක මතයකි. කෙසේ වුව ද, ඔවුන්ගේ අදහසට අනුව, සංවර්ධිත රටවල මෙන් නොව ශ්‍රී ලංකාවේ පූර්ණ කාලීන කෘෂිකාර්මික කටයුතුවල නියැලීමට අපහසු ය.

ඉහත තොරතුරුවලට අනුව කෘෂිකර්මාන්තයට අදාළ ක්‍රියාකාරකම්වල යෙදීමට ඇති කැමැත්ත සහ අධ්‍යාපන මට්ටම අතර සමීප සබඳතාවක් පවතී. කෘෂිකර්මය ඇතුළු විවිධ අංශවල ඩිප්ලෝමාධාරීන් සහ ගිණුම්කරණය වැනි වෘත්තීයමය විභාග අර්ධ වශයෙන් සම්පූර්ණ කළ පිරිස්වලින් 5.4 රූ සටහනෙහි 'අනෙකුත්' යනුවෙන් දැක්වෙන කාණ්ඩය සමන්විත වේ.

අනෙක් අතට, උසස් පෙළට සමාන අධ්‍යාපන සුදුසුකම්ලත් හෝ අඛණ්ඩව අධ්‍යාපන කටයුතු කරගෙන යන අය රජයේ හෝ පෞද්ගලික අංශයේ, සමාජමය වශයෙන් හොඳින් පිළිගත්, ඉහළ වැටුප් ලැබෙන සහ සුරක්ෂිත රැකියා කෙරෙහි යොමු වීමට උනන්දුවෙන් කටයුතු කරති. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් තම අධ්‍යාපන මට්ටමට ගැලපෙන රැකියා බලාපොරොත්තුවෙන් සිටිති. එම තත්ත්වය ඔවුන් පවුල මත යැපීමේ ස්වභාවය වර්ධනය කරයි. ඔවුන් නඩත්තු කිරීමේ බර දරාගනිමින් වුව ද, ඔවුන්ගේ දෙමාපියන් විසින් ද එවැනි රැකියා සොයා ගැනීම සඳහා ඔවුන් උනන්දු කරනු ලබයි. ගොවි සංවිධාන සමඟ පැවති සාකච්ඡාවලට අනුව, ප්‍රධාන වශයෙන් ම ආදායමේ අවිනිශ්චිතතාව නිසා ඇතැම් සාමාජිකයින් තම දරුවන් කෘෂිකාර්මික කටයුතුවල යෙදීමට ධෛර්යමත් කිරීමට අකැමැති ය. ඔවුන් තවදුරටත් ප්‍රකාශ කළේ, තමන් අත්දැක ඇති කෘෂිකාර්මික ක්‍රියාකාරකම්වල දී මුහුණ දීමට සිදුවන ගැහැටට මුහුණ දී දුක් පීඩා විඳිනවාට වඩා තම දරුවන් ස්ථිර රැකියාවක නියැලෙනු දැකීමට කැමති බවයි. අනෙක් අතට, ගොවි ප්‍රජාවේ බොහෝ තරුණයින් විශේෂයෙන් ම උගත් තරුණයන්ට, රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ රැකියා බලාපොරොත්තුවෙන් සිට තම අපේක්ෂාවන් මුදුන් පත් නොවූ විට අවසන් විකල්පය ලෙස වගා කටයුතුවල නිරතවීමට පවතින තත්ත්වය විසින් බලකරනු ලබයි.

වගුව 5.4: පූර්ණ කාලීන රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තය තෝරාගැනීමට හේතු

| හේතුව | ප්‍රතිචාර සංඛ්‍යාව | ප්‍රතිශතය (%) (සංඛ්‍යාව=148) |
|---|---|---|
| නිදහස් රැකියාවක් වීම/තමන් විසින් ම මෙහෙයවන රැකියාවක් වීම | 125 | 84.5 |
| වෙනත් රැකියාවක් නො ලැබීම/වෙනත් විකල්පයක් නොවීම | 104 | 70.3 |
| ස්වයං තෘප්තිය සඳහා | 33 | 22.3 |
| දෙමාපියන්/පවුලේ සාමාජිකයින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නියැලීම | 31 | 20.9 |
| මූලික පහසුකම් පැවතීම | 29 | 19.6 |
| ඉහළ ආදායමක් ලැබිය හැකිවීම | 24 | 16.2 |
| නගරයට සංක්‍රමණයවීමට ඇති අකැමැත්ත | 21 | 14.2 |
| කෘෂිකර්මයට සම්බන්ධ අධ්‍යාපනය/අත්දැකීම් ලබා තිබීම | 13 | 8.8 |

සටහන: එක ම ප්‍රතිචාරියා විසින් ප්‍රතිචාර කිහිපයක් සඳහන් කිරීම නිසා ප්‍රතිශතාත්මක එකතුව 100 ට සමාන නොවේ.
මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය. 2012

ප්‍රතිචාරීන් අතුරින් 148 (සමස්ත නියැදියෙන් 27.8%) පූර්ණ කාලීන රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තයෙ හි නිරත වෙමින් සිටි අතර එම තෝරා ගැනීම සඳහා විශේෂිත හේතු සාධක පැවතිණි. වගු සටහන් 5.4න් පෙන්නුම් කෙරෙන අන්දමට එම හේතු සාධක ආර්ථික සාධකවලට වඩා සමාජ සාධක සහ පෞද්ගලික චරිත ලක්ෂණ මත පදනම්ව තිබුණි. එයට අනුකූලව, කෘෂිකර්මාන්තයෙ හි පූර්ණ කාලීනව නිරත වන්නන්ගෙන් 84.5% (125)ක් රැකියාවේ පවතින නිදහස නිසා එය තෝරාගත් බව සඳහන් කළ හ. ප්‍රතිචාරීන් නිරත වූ කෘෂිකාර්මික කටයුතුවලින් බොහොමයක් ස්වයං මෙහෙයවීමක් සහිත කාර්යයන් වූ හෙයින් කෘෂි රසායනික වෙළඳුන් සමග පවතින අවිධිමත් ණය බැඳීම් ආදී සැඟවුණු ඇතැම් බාධා හැරුණු කොට රැකියාවේ තීරණ ගැනීමේ බලය ඔවුන් සතු වේ. විශේෂයෙන් ම, රැකියා තෝරා ගැනීමේ දී බොහෝ දුරට බලපා ඇති පවුලේ වගකීම්/කටයුතු සහ තම ගෘහස්ථ කටයුතු සිදු කරමින් කෘෂිකාර්මික ක්‍රියාකාරකම්වල යෙදීමට දැඩි බාධාවක් හෝ අවහිරයක් නොමැත.

පූර්ණ කාලීන ගොවීන්ගෙන් 70.3% (104)ක් සඳහන් කරනු ලැබුවේ වෙනත් රැකියාවක් ලබාගැනීමට නො හැකි වූ හෙයින් ඔවුන් කෘෂිකර්මාන්තයේ නියැලෙන බවයි. මෙසේ අවසන් විකල්පය වශයෙන් කෘෂිකර්මාන්තය තෝරා ගත් බවට සිදු කෙරෙන ප්‍රකාශයේ හරය වන්නේ වෙනත් විකල්ප රැකියාවක් ලැබුනහොත් ඔවුන් කෘෂිකර්මය අත්හැරීමේ නැඹුරුවක් පවතින බවයි. ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවලට අනුව, පූර්ණ කාලීන රැකියාවේ නිරත බහුතරය, අඩු අධ්‍යාපන මට්ටමක් සහිත අය වෙති. ඔවුන් තවදුරටත් කෘෂිකර්මාන්තයේ රැඳී සිටින්නේ වෙනත් රැකියාවක් සොයා ගැනීම සඳහා ප්‍රමාණවත් අධ්‍යාපන හෝ වෘත්තීය සුදුසුකම් නොමැති හෙයිනි. අනෙක් අතට, අධ්‍යාපන මට්ටමෙන් වඩා ඉහළ සහ වෘත්තීයමය වශයෙන් සුදුසුකම් සහිත

තරුණ පිරිස් රැකියා සඳහා නගරයට සංක්‍රමණය වෙති. ඉතා පළපුරුදු සහ වයස්ගත ගොවීන්ගෙන් පවා සැලකිය යුතු පිරිසක් පැවසුවේ ජීවනෝපාය මාර්ගයක් වශයෙන් කෘෂිකර්මාන්තයෙ හි තිරසාර බවෙහි දුෂ්කරතා පවතින හෙයින් වෙනත් විකල්ප රැකියා පවතීනම් ඒ වෙතට යාමට කැමැත්තෙන් පසුවන බවයි. ප්‍රතිචාරීන්ට අනුව, පූර්ණ කාලීන රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තය තෝරා ගැනීමට ස්වයං තෘප්තිය (22.3%), දෙමාපියන්/පවුලේ සාමාජිකයින් කෘෂිකාර්මික කටයුතුවල නිරත වී සිටීම (20.9%), මූලික පහසුකම් පැවතීම (19.6%), ඉහළ ආදායමක් ඉපැයිය හැකි වීම (14.2%), කෘෂිකර්මයට අදාළ අධ්‍යාපනයක් සහ එවැනි කටයුතුවල අත්දැකීම් පැවතීම (8.8%) යන හේතු බලපා තිබේ.

වගුව 5.5: පූර්ණ කාලීන රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තයෙ හි නියැලීමට අකැමැති වීමට හේතු

| හේතු | ප්‍රතිචාර සංඛ්‍යාව | මුළු සංඛ්‍යාවේ ප්‍රතිශතය (%) (සංඛ්‍යාව=211) |
|---|---|---|
| මූලික පහසුකම් ලබා ගැනීමේ දුෂ්කරතාව/නො හැකියාව | | |
| *I. ඉඩම්* | 83 | 26.0 |
| *II. මූල්‍ය පහසුකම්* | 31 | 9.7 |
| *III. ශ්‍රමය* | 17 | 5.3 |
| *IV. යෙදවුම් (පොහොර සහ බීජ ආදිය)* | 27 | 8.5 |
| *V. වාරි සහ ජල පහසුකම්* | 28 | 8.8 |
| වෙළඳපොළ අවිනිශ්චිතතාව සහ අඩු ආදායම | 186 | 58.1 |
| පෞද්ගලිකව වෙනත් රැකියාවන්ට කැමැත්ත දැක්වීම | 50 | 15.7 |
| අධ්‍යාපන සුදුසුකම් සමග නො ගැළපීම | 41 | 12.9 |
| අධ්‍යාපන කටයුතුවල නිරතවීම | 39 | 12.2 |
| සමාජයෙන් පිළිගැනීමක් නො වීම | 39 | 12.1 |
| රැකියා සුරක්ෂිතතාවක් නො වීම | 36 | 11.3 |
| වෙනත් විකල්ප රැකියාවක යෙදීම වඩාත් සාර්ථකවීම | 34 | 10.7 |
| කෘෂිකර්මාන්තය සම්බන්ධ පුහුණුවීම්/ දැනුවත් කිරීම් නො වීම හෝ හිඟය/ නවීන තාක්ෂණය හඳුන්වා නො දීම | 31 | 9.7 |
| දෙමාපියන් වෙනත් රැකියාවන්ට කැමැත්ත දැක්වීම | 27 | 8.5 |
| වෙහෙස වී වැඩ කිරීමට සිදුවීම/ඉටු කළ යුතු කාර්යය ප්‍රමාණය වැඩිවීම | 24 | 7.5 |
| ප්‍රමාණවත් තරම් වේලාවක් නො වීම | 17 | 5.3 |
| වෙනත් ක්ෂේත්‍රයක රැකියාවක් ලැබීම | 16 | 5.0 |
| වගා රක්ෂණයක් නො වීම | 11 | 3.4 |
| ආකර්ෂණීය නො වීම | 9 | 2.8 |
| සෞඛ්‍ය ගැටලු/සෞඛ්‍ය උවදුරු ඇතිවීමේ නැඹුරුව | 8 | 2.5 |
| වෙනත් | 12 | 3.6 |

සටහන: එක ම ප්‍රතිචාරියා විසින් ප්‍රතිචාර කිහිපයක් දැක්වීම නිසා ප්‍රතිශත එකතුව 100ට සමාන නොවේ.

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

පූර්ණ කාලීන ජීවනෝපාය මාර්ගයක් ලෙස කෘෂිකර්මාන්තය තෝරා ගැනීමේ ප්‍රධාන නිර්ණායකයක් ලෙස ආර්ථික සාධකය නො සැලකුණ ද ඇතැම් ප්‍රතිචාරීන් ප්‍රකාශ කළේ ඔවුන් පූර්ණ කාලීන රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තය තෝරා ගැනීමට හේතුව ඉන් හොඳ ආදායමක් උපයා ගැනීමට හැකිවීම නිසා බවයි. ඉහත සඳහන් කළ පරිදි පූර්ණ කාලීන රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තය තෝරා ගැනීමේ දී ආර්ථික සාධකය දැඩි බලපෑමක් සිදු කොට නැත. කෙසේ වුව ද, කෘෂිකර්මාන්තය පූර්ණ කාලීන රැකියාවක් ලෙස තෝරා නො ගත් ප්‍රතිචාරීන්ට එම තීරණය සඳහා ආර්ථික සාධකය දැඩිව බලපෑම් කර ඇත. එම ප්‍රතිචාරීන්ට අනුව, මූලික පහසුකම්වල හිඟය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පූර්ණ කාලීනව නිරතවීමට අකැමැතිවීමට බලපෑ ප්‍රධාන හේතුවකි. ප්‍රතිචාරීන්ගෙන් 26% (ප්‍රතිචාරීන් 83) තමන්ට ඉඩම් සම්බන්ධයෙන් ගැටලු ඇති බව ප්‍රකාශ කළ අතර 9.7% (ප්‍රතිචාරීන් 31) සතුව ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් නොමැති බවත්, 8.8% (ප්‍රතිචාරීන් 28)ට ප්‍රමාණවත් තරම් ජල/වාරි පහසුකම් නොමැති බවත් පැවසූ හ. තවත් 8.5% (ප්‍රතිචාරීන් 27)ක් පොහොර සහ බීජ වැනි කෘෂිකාර්මික යෙදවුම් ප්‍රමාණවත් නොවූ බවත්, 5.3% (ප්‍රතිචාරීන් 17) ප්‍රමාණවත් තරම් ශ්‍රමය නොමැති බවත් පැවසූ හ (වගුව 5.5).

එයට අමතරව, ප්‍රතිචාරීන්ගෙන් 58.1%(186)ක් පැවසුවේ වෙළඳපොළ අවිනිශ්චිතතාව සහ කෘෂිකර්මාන්තයෙන් ලැබෙන පහළ ආදායම පූර්ණ කාලීන රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තයෙන් නිරතවීම අධෛර්යමත් කරන බවයි. ප්‍රතිචාරීන් බොහෝ දෙනෙකුට අනුව, කෘෂිකාර්මික ක්‍රියාකාරකම් තුළින් හොඳ ආදායමක් ඉපැයිය හැකි නම් ඔවුන් පූර්ණ කාලීනව කෘෂිකර්මාන්තයේ නියැලීමට කැමැත්තෙන් පසු වේ. පාඩු සිදුවීම නිසා තරුණයින් විශාල සංඛ්‍යාවක් කෘෂිකර්මාන්තයෙන් ඉවතට ගිය බව පවසමින් ගොවි සංවිධානවල නියෝජිතයෝ ද එම කරුණ තහවුරු කළ හ. මාතලේ දිස්ත්‍රික් ගොවි සංවිධාන නියෝජිතයින් පෙන්වා දුන් පරිදි තක්කාලි සහ බෝංචි වැනි බෝගවලින් ඉහළ ලාභයක් ඉපැයිය හැකි වූ නිසා කලකට ඉහත එම බෝග වගාවන් සඳහා තරුණයින් අතර ඉහළ ඉල්ලුමක් පැවතී ඇත. කෙසේ වුවත්, මිල අවිනිශ්චිතතාව නිසා තරුණ ගොවීහු මෑත කාලීනව කෘෂිකර්මාන්තය අතහැර ගොස් සිටිති. මෙම ගැටලුව හය වැනි පරිච්ඡේදයේ දී සවිස්තරාත්මකව සාකච්ඡාවට බඳුන් කෙරේ.

තව ද, ප්‍රතිචාරීන්ගෙන් 15.7% (ප්‍රතිචාරීන් 15)ක් තමන් පෞද්ගලිකව කැමැත්තක් දක්වන වෙනත් රැකියාවක් ඇති බවත්, පූර්ණ කාලීනව කෘෂිකාර්මික කටයුතුවල නිරතවීමට කැමැත්තක් නොමැති බවත් සඳහන් කළ හ. විශේෂයෙන් ම, ප්‍රතිචාරීන් අතුරින් ලාබාල තරුණයින්ට ඔවුන්ගේ ම ඉඩම් නොමැති අතර ඉඩම් හිමිකම නොමැතිව ගොවියෙක් හෝ ව්‍යවසායකයෙකු ලෙස ගොවිපළක් හෝ කර්මාන්තයක් පාලනය කිරීමේ හැකියාවක් ඔවුන්ට නොමැත.

පූර්ණ කාලීන කෘෂිකර්මාන්තයේ තරුණ සහභාගීත්වය තීරණය කිරීමෙහි ලා බලපාන සැඟවුණු අනෙක් ප්‍රධාන සාධක වන්නේ, අධ්‍යාපන සුදුසුකම් සමඟ නො ගැළපීම (12.9%), අධ්‍යාපන කටයුතුවල නිරතවීම (12.2%) සමාජයෙන් පිළිගැනීමක් නොවීම (12.1%), රැකියා සුරක්ෂිතතාවක් නො වීම (11.3%) අනෙකුත් ආදායම් උත්පාදන කාර්යයන් වඩා යහපත්වීම (10.7%), තාක්ෂණික දැනුමේ පරතරය ඇතුළුව දැනුවත් කිරීමේ/පුහුණු වැඩසටහන් නො වීම/හිඟය (9.7%), දෙමාපියන් වෙනත් රැකියාවක් සඳහා කැමැත්තක් දැක්වීම (8.5%), වෙහෙස වී වැඩ

කටයුතු කිරීමට සිදුවීම/වැඩ කටයුතු අධිකවීම (7.5%) ය. වගුවේ 'අනෙකුත්' යනුවෙන් සඳහන් වන කොටස පවුලේ ආර්ථික ස්ථාවරත්වය, උපකාර නොමැතිව කෘෂිකර්මාන්තයේ යෙදීමට නො හැකිවීම, ස්වාමි පුරුෂයාගේ අකැමැත්ත, ස්වාමි පුරුෂයාගේ ජීවනෝපාය මාර්ගයන්ට උපකාරීවීමට සිදුවීම, රැකියාවක් කිරීමට තරම් පරිණත නො වීම, තවමත් ලාබාල වියේ පසුවීම සහ කෘෂිකාර්මික කටයුතුවල යෙදීම නිසා සමාජ චලනතාවට බාධාවක් වීම ය.

## 5.3. කෘෂිකර්මය පාදක කොටගත් කර්මාන්ත කෙරෙහි තරුණ ආකල්ප

කෘෂිකර්මාන්තයට සම්බන්ධ ප්‍රධාන ජීවනෝපායයන් අතර කෘෂි පාදක කොටගත් කර්මාන්ත ඉතා වැදගත් අංගයක් ලෙස සැලකිය හැකි ය. කෙසේ වුව ද, අධ්‍යයනයෙන් හෙළි කරන අන්දමට ග්‍රාමීය තරුණයින් අතර කෘෂි පාදක කොටගත් කර්මාන්ත එතරම් ජනප්‍රිය නොවේ. මුළු ප්‍රතිචාරීන්ගෙන් 23.6% (126)ක්, නොයෙක් හේතු නිසා කෘෂිපාදක කොටගත් රැකියාවල නිරතවීමට අකමැති බව ප්‍රකාශ කළ හ (වගුව 5.6).

වගුව 5.6: කෘෂි පාදක කොටගත් කර්මාන්තවල නිරතවීමට අකැමැතිවීමට හේතු

| හේතු | කෘෂිපාදක කොටගත් කර්මාන්තවල නිරතවීමට අකමැති පුද්ගලයින් (සංඛ්‍යාව=126) | |
|---|---|---|
| | සංඛ්‍යාව | % |
| සාර්ථකත්වයක් අත්කර ගැනීම පිළිබඳ අවිනිශ්චිතතාව | 39 | 31.0 |
| අඩු ආදායම | 26 | 20.9 |
| අධ්‍යාපන සුදුසුකම් සමඟ නො ගැළපීම | 25 | 19.7 |
| දැනුවත්වීම්/පුහුණුවීම් නො වීම හෝ භිතය | 25 | 19.7 |
| නිසි වෙළඳපොළක්/වෙළඳපොළ ඉල්ලුමක් නො වීම | 16 | 12.7 |
| කාලය නොමැතිවීම | 20 | 16.2 |
| වෙනත් විකල්ප ආදායම් උත්පාදන මාර්ග වඩා එලදායී වීම | 20 | 16.2 |
| මූලික පහසුකම් සපයා ගත නො හැකිවීම/අපහසු වීම | 18 | 13.9 |
| දෙමාපියන්ගේ සහයෝගයක් නොවීම/ප්‍රමාණවත් නො වීම | 10 | 8.1 |
| සමාජමය පිළිගැනීමක් නොවීම | 10 | 8.1 |
| වෙනත් | 10 | 8.1 |

සටහන: එක ම ප්‍රතිචාරියා විසින් ප්‍රතිචාර කිහිපයක් දැක්වීම නිසා ප්‍රතිශතාත්මක එකතුව 100ට සමාන නොවේ.

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

වගු සටහන් 5.6න් පෙන්නුම් කෙරෙන ආකාරයට සාර්ථකවීම පිළිබඳ පවතින අවිනිශ්චිතතාව හේතුවෙන් ප්‍රතිචාරීන්ගෙන් 31.0% (ප්‍රතිචාරීන් 39) කෘෂි පාදක කොට ගත් කර්මාන්තවල නිරතවීමට අකැමැති ය. එම නිසා කෘෂි පාදක කොටගත් කර්මාන්තයක නියැලීමට වඩා,. වෙනත් රැකියාවක නිරතවීම තරුණ පරම්පරාවට වඩාත් ආකර්ෂණීය වන අතර එය සුරක්ෂිතතාවක් සපයයි. කෘෂිපාදක කොටගත් බොහෝ කර්මාන්ත සාම්ප්‍රදායික, කුඩා පරිමාණ, සුළු ලාභ සහිත සහ ගතිකත්වයෙන් අඩු ඒවා වේ. කෘෂි පාදක කොටගත් කර්මාන්තවල මෙවන් ලක්ෂණ තරුණ පරම්පරාව ආකර්ෂණය කර ගැනීමට සමත් නොවේ.

අඩු ආදායම (20.9%), ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම හා නො ගැළපීම (19.7%), දැනුවත් කිරීම්/පුහුණුව නොමැතිවීම හෝ හිඟය (19.7%), නිසි වෙළඳපොළක් හෝ ඉල්ලුමක් නො වීම (12.7%), ප්‍රමාණවත් තරම් කාලයක් නො වීම (16.2%), කෘෂි පාදක කොටගත් කර්මාන්තවලට වඩා වෙනත් ආදායම් උත්පාදන මාර්ග ඵලදායීවීම (16.2%), මූලික පහසුකම් ලබාගත නො හැකිවීම/අපහසුවීම (13.9%), දෙමාපියන්ගේ සහයෝගයක් නො වීම/ප්‍රමාණවත් නො වීම (8.1%), සමාජ පිළිගැනීමක් නො වීම (8.1%), කෘෂි පාදක කොටගත් කර්මාන්තවල නියැලීමට තරුණයින් අකමැති වන අනෙකුත් හේතු වේ. "අනෙකුත්" යනුවෙන් වර්ග කරන ලද කාණ්ඩයට අධ්‍යයන කටයුතුවල නිරතවීම, ප්‍රතිචාරීන් ජීවත්වන ග්‍රාමීය පරිසරයට නො ගැළපීම, වඩා හොඳ රැකියාවක නිරතවීම සහ කෘෂි පාදක කොටගත් කර්මාන්තයක නියැලීමට තරම් ප්‍රමාණවත් අත්දැකීම් නො වීම ඇතුළත් වේ.

වගු සටහන් 5.7න් පෙන්නුම් කරන ආකාරයට, කෘෂිකාර්මික කටයුතු ඇරඹීමට කැමැත්තෙන් පසුවන නමුත් මෙතෙක් එහි නිරතවීමට නො හැකි වූ ප්‍රධාන හේතුව වශයෙන් ප්‍රතිචාරීන් සඳහන් කරනු ලැබුවේ මූලික පහසුකම්වල හිඟය එයට බලපෑ බවයි. ඒ අනුව, ප්‍රතිචාරීන්ගෙන් 63.6% (ප්‍රතිචාරීන් 232)ක් සඳහන් කරනු ලැබුවේ කෘෂි පාදක කොටගත් කර්මාන්තය ආරම්භ කිරීමට හෝ එය අඛණ්ඩව පවත්වා ගෙන යාමට තරම් ශක්තිමත් මූල්‍ය වටපිටාවක් තමන්ට නොමැති බවයි. කෘෂි පාදක කොටගත් කර්මාන්තයක නියැලීමට කැමැත්තෙන් පසුවන, එසේ වුවද, එහි නිරත නො වන ප්‍රතිචාරීන්ගෙන් 25.2%ක් ඒ සඳහා ගැළපෙන ස්ථානයක් හෝ ගොඩනැගිල්ලක් තමන්ට නොමැති බවත් පැවසූ හ. තවත් 28.8%ක් යන්ත්‍ර සූත්‍ර සහ අමුද්‍රව්‍ය ලබාගැනීමේ ගැටලුවක් පවතින බවත් පැවසූ අතර තවත් 3.8%ක් සුදුසු ශ්‍රමිකයින් ප්‍රමාණවත් පිරිසක් සපයා ගැනීම ගැටලුවක් බව සඳහන් කළ හ. දැනුම සහ පුහුණුව ලබා ගැනීමේ දුෂ්කරතා සහ ඒ සඳහා වන ප්‍රවේශ මාර්ග අඩුවීම කෘෂි පාදක කොටගත් කර්මාන්ත ආරම්භ කිරීමට බාධාවක් බව සැලකිය යුතු ප්‍රතිචාරීන් පිරිසකගේ (38.1%) මතය විය. තම දෙමාපියන් සතුව එවන් කර්මාන්ත පැවතිය ද තාක්ෂණික දැනුමේ අඩුලුහුඩුකම් ඇතුළුව දැනුමේ පවතින පරතරය නිසා එවැනි තරුණයින්ට එම කර්මාන්ත වැඩි දියුණු කර ගැනීමේ දුෂ්කරතා පවතී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් අවම වශයෙන් ප්‍රාදේශීය මට්ටමේ මහා පරිමාණ හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරික තරඟකරුවන් හෝ අනෙකුත් ව්‍යවසායකයින් සමඟ තරඟ කිරීම ඔවුන්ට දුෂ්කර වී තිබේ.

එසේ ම, තරුණයින් කෘෂි පාදක කොටගත් කර්මන්තවල නිරතවීමට බාධා පමුණුවන එක් ප්‍රධාන කාරණයක් වන්නේ නිසි දැනුවත් කිරීමක් නො වීම යි (23.6%). මෙමඟින් අදහස් වන්නේ, කෘෂි පාදක කොටගත් කර්මාන්තවල නිරත නො වන බොහෝ තරුණයින්ට කෘෂිපාදක කොටගත් කර්මාන්ත සිදු කරන්නේ කෙසේ ද යන්න පිළිබඳ මූලික මට්ටමේ හෝ වැටහීමක් නො වන බවත්, එවන් දැනුවත් භාවයකින් තොරව කෘෂි පාදක කොටගත් ව්‍යවසායකයකු ලෙස ඔවුන්ට ඉදිරියට යා නො හැකි බවත් ය.

කෘෂිපාදක කොටගත් කර්මාන්තයක නිරත නො වීමට බලපෑ අනෙකුත් සාධක අතර අධ්‍යාපන කටයුතුවල නිරතවීම (18.4%), වෙළඳපොළ පහසුකම් නො වීම හෝ හිඟය (18.1%), කාලය සපයා ගැනීම පිළිබඳ ගැටලු (8%), පවුලේ බර ඉසිලීමට සිදුවීම (2.2%), කෘෂි පාදක කොටගත් කර්මාන්තයක් ඇරඹීමට නිසි සැලසුමක් නො වීම (1.4%) හා සාර්ථකත්වයක් අත්කර ගත හැකි වේද යන්න සම්බන්ධයෙන් පවතින අවිනිශ්චිතතාව/අවදානම (0.8%) විය.

වගු 5.7: **කෘෂිපාදක කොටගත් කර්මාන්තයක/ව්‍යාපාරයක නිරත නොවීමට හේතු**

| හේතුව | ප්‍රතිචාරින් සංඛ්‍යාව=365 | |
|---|---|---|
| | සංඛ්‍යාව | % |
| මූලික පහසුකම් සපයා ගැනීමේ දුෂ්කරතා/සපයාගත නො හැකිවීම | | |
| *i. මූල්‍ය පහසුකම්* | 232 | 63.6 |
| *ii. ස්ථානය* | 92 | 25.2 |
| *iii. දැනුම/පුහුණුව* | 139 | 38.1 |
| *iv. යන්ත්‍ර සහ අමුද්‍රව්‍ය* | 105 | 28.8 |
| *v. ශ්‍රමය* | 14 | 3.8 |
| කර්මාන්ත සම්බන්ධ දැනුවත් කිරීම් නො වීම | 86 | 23.6 |
| අධ්‍යාපනයේ නිරතවීම | 67 | 18.4 |
| වෙළෙඳපොළ පහසුකම් නොවීම/හිඟය | 66 | 18.1 |
| කෘෂි පාදක කොටගත් කර්මාන්ත සඳහා යෙදවීමට තරම් ප්‍රමාණවත් කාලයක් නො වීම | 29 | 8.0 |
| පවුලේ බර/ප්‍රශ්න | 8 | 2.2 |
| වෙනත් රැකියාවක නිරතවීම | 8 | 2.2 |
| සාර්ථකත්වයක් අත්කරගත හැකිදැයි සම්බන්ධයෙන් පවතින අවිනිශ්චිතතාව/අවදානම | 3 | 0.8 |
| නිසි සැලැස්මක් නොවීම | 5 | 1.4 |
| වෙනත් | 4 | 1.2 |

සටහන: එක ම ප්‍රතිචාරියා විසින් ප්‍රතිචාර කිහිපයක් දැක්වීම නිසා ප්‍රතිශතාත්මක එකතුව 100ට සමාන නොවේ.

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

ප්‍රතිචාරීන්ගේ අදහසට අනුව, අලෙවි පහසුකම් නො වීම නිසා එවන් කර්මාන්තයක් ආරම්භ කිරීම දැඩි අවදානම් සහගත ක්‍රියාවලියකි. බොහොමයක් තරුණයින්ට මූල්‍ය පහසුකම් ලබා ගැනීමේ සීමාවන් පවතින අතර එවන් ගැටලු යටතේ සාර්ථකවීම පිළිබඳ පවතින ඉතා සුළු නැඹුරුව සමඟ එවන් කර්මාන්ත ඇරඹීමට හැකියාවක් නොමැත. එසේ ම, දැනුමේ පරතරය ද ග්‍රාමීය තරුණ ව්‍යවසායකයින්ට බාධාවකි.

## 5.4 වඩාත් රුචිකත්වයක් දක්වන රැකියා සහ ඒවා තෝරා ගැනීමට හේතු

පූර්ණ කාලීන රැකියාවක් නොමැති වුව ද, විවිධ අංශවල නොයෙකුත් රැකියා සඳහා කැමැත්තක් දක්වන පිරිසක් (238) ප්‍රතිචාරීන් අතර විය.

වගුව 5.8: පූර්ණ කාලීන රැකියාවක නිරත නොවූ ප්‍රතිචාරීන් නියැලීමට වඩාත් කැමති රැකියාව

| රුචිකත්වයක් දැක් වූ රැකියාව | ස්ත්‍රී/පුරුෂ භාවය | | | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | ස්ත්‍රී | | පුරුෂ | | | |
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| රජයේ රැකියා | 80 | 48.2 | 86 | 51.8 | 166 | 58.7 |
| පෞද්ගලික රැකියා | 11 | 35.5 | 20 | 64.5 | 31 | 11.0 |
| විදේශ රැකියා | 0 | 0 | 7 | 100.0 | 7 | 2.5 |
| කෘෂිකාර්මික අංශයේ රැකියා (ගොවිතැන ද ඇතුළුව) | 13 | 35.1 | 24 | 64.9 | 37 | 13.1 |
| කාර්මික අංශයේ රැකියා | 2 | 28.6 | 5 | 71.4 | 7 | 2.5 |
| ස්වයං රැකියා | 18 | 81.8 | 4 | 18.2 | 22 | 7.8 |
| ආරක්ෂක අංශයේ රැකියා | 0 | 0 | 2 | 100.0 | 2 | 0.7 |
| රැකියාවක් කිරීමට අදහසක් නොමැති | 4 | 100 | 0 | 0.0 | 4 | 1.4 |
| පැහැදිළි අදහසක් නොමැති | 6 | 85.7 | 1 | 14.3 | 7 | 2.5 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

වගු සටහන් 5.8න් පෙන්නුම් කරන අන්දමට, ග්‍රාමීය ප්‍රදේශවල රජයේ රැකියාවලට ඇති ඉහළ ඉල්ලුම පෙන්නුම් කරමින් පූර්ණ කාලීන රැකියාවක නිරත නොවූ ප්‍රතිචාරීන්ගෙන් 58.7%ගේ වඩාත් රුචිකත්වයක් දක්වන රැකියා ක්ෂේත්‍රය වූයේ, රාජ්‍ය අංශයයි. රජයේ රැකියා සඳහා ඔවුන්ගේ කැමැත්තට බලපෑ මුඛ්‍ය හේතු වූයේ, සමාජ පිළිගැනීම, රැකියා සුරක්ෂිතතාව, විශ්‍රාම වැටුප ක්‍රමය සහ නියමිත ආදායමයි. ප්‍රතිචාරීන්ගෙන් සැලකිය යුතු කොටසක් (13.1%) කෘෂිකාර්මික අංශයට අදාළ රැකියාවල නිරතවීමට කැමති බව පැවසූ හ. ප්‍රතිචාරීන්ගෙන් 11%ක් පුද්ගලික අංශයේ රැකියා සඳහාත් 7.8%ක් ස්වයංරැකියා/ව්‍යාපාර සඳහාත් කැමැත්තක් දැක්වූ හ.

රජයේ රැකියා සම්බන්ධයෙන් කැමැත්තක් දැක් වූ ප්‍රතිචාරීන් අතර ස්ත්‍රී/පුරුෂ භේදය අනුව පැහැදිළි වෙනසක් දැකිය නො හැකි විය. කෙසේ වුව ද, ඇතැම් රැකියා තෝරා ගැනීමේ දී ස්ත්‍රී පුරුෂ භේදය අනුව රැකියා තෝරා ගැනීම දැකිය හැකි විය. පෞද්ගලික අංශයේ රැකියා, කෘෂිකර්මයට සම්බන්ධ රැකියා, විදේශ රැකියා, ආරක්ෂක අංශයේ සහ කාර්මික අංශයේ රැකියා සඳහා ස්ත්‍රී ප්‍රතිචාරීන්ට වඩා පුරුෂ ප්‍රතිචාරීහු කැමැත්තක් දැක්වූ හ. එයට පරස්පරව යමින්, ස්වයංරැකියා/ව්‍යාපාර සඳහා තරුණියන් 18 (තරුණියන්ගෙන් 81.8%) ද, තරුණයන්ගෙන් 04 (18.2%) ද ,කැමැත්ත දැක්වූ හ. ඇතැම් ස්ත්‍රී ප්‍රතිචාරීන් දැක් වූ අන්දමට ඔවුන් විවාහ වී ගෘහස්ථ කාර්යයන්ට පූර්ණ කාලීනව කැපවී සිටින හෙයින් රැකියාවක් කිරීම සඳහා කිසිදු කැමැත්තක් නොමැත.

වගු සටහන් 5.9න් පෙන්නුම් කෙරෙන අන්දමට, සියලු වයස් කාණ්ඩවල වඩාත් කැමති රැකියාව රාජ්‍ය අංශයේ රැකියා වේ. විශේෂයෙන් ම, අවුරුදු 15 වයස් කාණ්ඩයේ 76.7% ද, අවුරුදු 15-20 වයස් කාණ්ඩයේ 70.4% ද, රාජ්‍ය අංශයේ රැකියා සඳහා කැමැත්තක් දැක්වූ හ. අවුරුදු 20-25 සහ අවුරුදු 25-29 අතර වයස් කාණ්ඩවල සැලකිය යුතු තරම් ප්‍රතිචාරීන් සංඛ්‍යාවක් කෘෂිකාර්මික අංශයේ රැකියා සඳහා කැමැත්තක් දැක්වූ හ.

**වගුව 5.9 : පූර්ණ කාලීනව රැකියාවක නිරත නොවන ප්‍රතිචාරීන්ගේ වයස අනුව වඩාත් කැමති රැකියාව**

| කැමැත්ත දක්වන රැකියාව | වයස් කාණ්ඩය (සංඛ්‍යාව=283) | | | | සමස්තය (සංඛ්‍යාව=238) | |
|---|---|---|---|---|---|---|
| | අවු: 15 (සංඛ්‍යාව=30) | අවු: 15 (සංඛ්‍යාව=145) | අවු: 15 (සංඛ්‍යාව=67) | අවු: 15 (සංඛ්‍යාව=41) | | |
| | % | % | % | % | | % |
| රජයේ රැකියා | 76.7 | 70.4 | 46.3 | 24.4 | 166 | 58.7 |
| පෞද්ගලික අංශයේ රැකියා | 10.0 | 10.3 | 14.9 | 7.3 | 31 | 11.0 |
| විදේශ රැකියා | 6.7 | 0.7 | 1.5 | 7.3 | 7 | 2.5 |
| කෘෂිකාර්මික අංශයේ රැකියා (ගොවිතැන ද ඇතුළුව) | 0.0 | 9.7 | 20.9 | 22 | 37 | 13.1 |
| කාර්මික අංශයේ රැකියා | 3.3 | 2.8 | 3.0 | 0.0 | 7 | 2.5 |
| ස්වයංරැකියා/ව්‍යාපාර | 3.3 | 4.2 | 9.0 | 22 | 22 | 7.8 |
| ආරක්ෂක අංශයේ රැකියා | 0.0 | 0.7 | 1.5 | 0.0 | 2 | 0.7 |
| රැකියාවක් කිරීමට කැමැත්තක් නොමැති | 0.0 | 0.0 | 3.0 | 4.9 | 4 | 1.4 |
| පැහැදිළි අදහසක් නොමැති | 0.0 | 1.4 | 0.0 | 12.2 | 7 | 2.5 |
| එකතුව | 100 | 100 | 100 | 100 | 283 | 100 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

ක්ෂේත්‍ර සමීක්ෂණයේ දී අනාවරණය වූ අන්දමට, තරුණයින් පරිණත භාවයට පත්වීමත් සමඟ රැකියා සඳහා තමන්ගේ අපේක්ෂාවන් සහ සත්‍ය ලෙස එම අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දුෂ්කරතා අතර පවතින පරතරය වටහා ගනී. අනෙක් අතට, කෘෂිකර්මාන්තය සහ ඒ හා සබැඳි රැකියා පිළිබඳ ඔවුන්ට මනා අත්දැකීම් සහ දැනුමක් ද විය. පවතින දුෂ්කරතා හේතුවෙන් අවුරුදු 20-25 සහ අවුරුදු 25-29 වයස් කාණ්ඩවල තරුණයින් අනෙක් වයස් කාණ්ඩවල අයට වඩා පූර්ණ කාලීනව කෘෂිකාර්මික රැකියාවල නිරතවීමට වැඩි කැමැත්තක් දැක්වූ හ.

වර්තමානයේ පූර්ණ කාලීන රැකියාවක නිරත නො වන ප්‍රතිචාරීන්ගේ රුචිකත්වයක් දක්වන රැකියාව තීරණය කිරීමෙ හි ලා හේතු ගණනාවක් පවතී. ඇතැම් ප්‍රතිචාරීන්ගේ තෝරා ගැනීමට එක් හේතුවක් පාදක වී ඇති නමුත් ඇතැමුන්ගේ තෝරා ගැනීම් සඳහා හේතු ගණනාවක් පාදක වී තිබේ.

වගුව 5.10: වඩාත් කැමති රැකියාව සඳහා හේතු

| හේතුව | ප්‍රතිචාර සංඛ්‍යාව (සංඛ්‍යාව=283) | ප්‍රතිශතය (%) |
|---|---|---|
| ආර්ථික ස්ථාවරත්වය/ඉහළ ආදායමක් ඉපැයිය හැකිවීම | 129 | 45.6 |
| රැකියා සුරක්ෂිතතාව | 90 | 31.8 |
| ඉහළ මට්ටමේ සමාජ පිළිගැනීම | 75 | 26.5 |
| අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් සමඟ ගැලපීම | 75 | 26.5 |
| ආකර්ෂණීය රැකියාවක් වීම | 35 | 12.4 |
| දෙමාපියන්ගේ කැමැත්ත නිසා | 30 | 10.6 |
| විශ්‍රාම වැටුපක් පැවතීම | 25 | 8.8 |
| කය වෙහෙසා වැඩ කිරීමට අවශ්‍ය නොවීම/වෙහෙසකර බව අඩුවීම | 21 | 7.4 |
| රැකියාවේ නිදහසක් පැවතීම | 19 | 6.7 |
| වැඩ කරන පැය ගණන පැහැදිළිව ලබා දී තිබීම | 17 | 6.0 |
| නිවසේ සිට රැකියාවේ නිරත වීමට හැකිවීම | 10 | 3.5 |
| පැහැදිළි අදහසක් නොමැත | 9 | 3.2 |
| අත්දැකීම්, පුහුණුව සහ හුරුවක් තිබීම | 8 | 2.8 |
| වෙනත් | 10 | 3.5 |

සටහන: එක ම ප්‍රතිචාරියා විසින් ප්‍රතිචාර කිහිපයක් දැක්වීම නිසා ප්‍රතිශතාත්මක එකතුව 100ට සමාන නොවේ.
මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

තමන් වඩාත් කැමති රැකියාව ඔස්සේ ආර්ථික ස්ථාවරත්වය ළඟා කර ගත හැකිවීම ප්‍රතිචාරීන්ගෙන් 45.6%ට අදාළ රැකියාව තම අනාගත වෘත්තිය ලෙස තෝරා ගැනීමේ රුචිකත්වය කෙරෙහි බලපා තිබේ. ප්‍රතිචාරීන්ගෙන් 32% (ප්‍රතිචාරීන් 90)ට රැකියා සුරක්ෂිතතාව ද, ප්‍රතිචාරීන්ගෙන් 26.5% (ප්‍රතිචාරීන් 75)ට ඉහළ සමාජ පිළිගැනීම ද තම රැකියාව පිළිබඳ තීරණය කිරීමට බලපා ඇත. ප්‍රතිචාරීන්ගෙන් තවත් 26.5%


(ප්‍රතිචාරීන් 75)ක් සඳහන් කළේ තම අධ්‍යාපනය හා වෘත්තීය සුදුසුකම් හා සැසඳීම නිසා අදාළ වෘත්තීය කෙරෙහි කැමැත්තක් දැක්වීමට හේතු වූ බවයි. විශේෂිත රැකියා කෙරෙහි කැමැත්තක් ඇතිවීමට බලපෑ අනෙකුත් හේතූන් අතර රැකියාව ආකර්ෂණීය වීම (12.4%), විශේෂයෙන් සඳහන් කරනු ලැබූ රැකියාව සඳහා දෙමාපියන්ගේ කැමැත්තක් පැවතීම (10.6%), විශ්‍රාම වැටුපක් පැවතීම (8.8%), කය වෙහෙසා වැඩ කිරීමට සිදු නො වීම (7.4%), රැකියාවේ පවතින නිදහස (6.7%), වැඩ කරන පැය ගණන නිශ්චිත වීම (6%), නිවසේ සිට රැකියාවේ නිරතවීමට හැකිවීම (3.5%), අත්දැකීම්, හුරුව සහ කැමැත්තක් දක්වන රැකියාවට අදාළ පුහුණුවීම් පැවතීම (2.8%) විය (වගුව 5.10). ඇතැම් ප්‍රතිචාරීන් සඳහන් කරනු ලැබුවේ තමන් වඩා රුචිකත්වයක් දක්වන රැකියාව තෝරා ගැනීම සඳහා බලපෑ හේතු සම්බන්ධයෙන් පැහැදිළි අදහසක් නොමැති බවයි. 'අනෙකුත්' යන කාණ්ඩය යටතේ රටට සේවය කිරීමට හැකිවීම, ස්වයං-තෘප්තිය, වෙනත් රැකියාවක් ලබාගැනීමේ දුෂ්කරතා, රැකියාව ඔස්සේ විවාහක සහකරු තෝරා ගැනීමට පහසුවීම ආදිය ඇතුළත් වේ.

ක්ෂේත්‍ර සමීක්ෂණයෙන් හෙළි වූ අන්දමට නාගරික ප්‍රදේශවල මෙන් ම බොහෝ ග්‍රාමීය ප්‍රදේශවල තරුණයින් ද රැකියාවක් තෝරා ගැනීමේ දී ලබා ගත හැකි ආදායම පිළිබඳව සැලකිලිමත් වේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස ග්‍රාමීය තරුණ පිරිසෙන් විශාල ප්‍රමාණයක් නගරයේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නුපුහුණු ශ්‍රමිකයින් ලෙස ගමෙන් නගරයට සංක්‍රමණය වෙති.

කෙසේ වුව ද, රජයේ රැකියාවලට කැමැත්තක් දක්වන තරුණ පිරිස, එම අංශයේ ඇතැම් රැකියා සඳහා අඩු වැටුප් ලැබුන ද සමාජ පිළිගැනීම නිසා ඒ කෙරෙහි යොමු වී ඇත්තා හ. එමෙන් ම, මෙයට ඉහත ද සඳහන් කළ අන්දමට, රැකියා සුරක්ෂිතතාව ද ඔවුන් විසින් සැලකිල්ලට ගනු ලැබූ සාධකයකි. රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ රැකියා තුළින් ලැබෙන නිශ්චිත ආදායම සමඟ රැකියා සුරක්ෂිතතාව විශේෂයෙන් ම සම්බන්ධ වී තිබේ.

රැකියා තෝරා ගැනීමේ දී බලපාන තවත් ප්‍රමුඛ සාධකයක් වන්නේ අධ්‍යාපන සුදුසකම් ය. ශ්‍රී ලාංකික සමාජය තවමත් සලකනු ලබන්නේ රැකියාවක් ලෙස ගොවිතැන් කටයුතුවල නිරත වන්නේ අඩු අධ්‍යාපන මට්ටමක් සහිත පිරිස් බවයි. තමන්ගේ දරුවන් අධ්‍යාපනය ලැබ සමාජය පිළිගත් රැකියාවක නිරත වනු දැකීමට කැමති බව පවසමින් ගොවි සංවිධාන සාමාජිකයින් විසින් එම මතය තහවුරු කරනු ලැබිණි. මෙම ආකල්පය ගොවි පවුල්වල තරුණ තරුණියන්ට ද බලපෑම් කරනු ලබයි. එම නිසා, ගොවි පවුල්වල කිසියම් ආකාරයක ඉහළ මට්ටමක අධ්‍යාපනයක් එනම්, උසස් පෙළ සමත් හෝ එයට ඉහළ මට්ටමේ අධ්‍යාපනයක් ලත් තරුණ පිරිස නිරන්තරයෙන් රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ ස්ථිර රැකියා බලාපොරොත්තු වේ. කෘෂිකාර්මික කටයුතුවල නිරතවීමට තරම් ප්‍රමාණවත් වත්කම් පැවතියත්, තම අධ්‍යාපනයට සරිලන රැකියාවක් සොයා යාමේ නැඹුරුවක් ඔවුන් තුළ පවතී. ඇතැම් අවස්ථාවල එවන් රැකියා බලාපොරොත්තුවෙන් වසර ගණනාවක් තිස්සේ ඔවුහු බලා සිටිති.

රූ සටහන 5.5: කෘෂිකර්මාන්තයට අදාළ රැකියා තෝරා ගැනීමට හේතු




සටහන: එක ම ප්‍රතිචාරියා විසින් ප්‍රතිචාර කිහිපයක් දැක්වීම නිසා ප්‍රතිශතාත්මක එකතුව 100ට සමාන නොවේ (ප්‍රතිචාර සංඛ්‍යාවේ එකතුව 47කි)

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

ක්ෂේත්‍ර සමීක්ෂණයට අනුව ඇතැම් තරුණයින් ගොවිතැන සහ කෘෂි පාදක කොටගත් කර්මාන්ත ඇතුළු කෘෂිකර්මාන්තයට අදාළ රැකියා පිළිබඳ සත්‍ය වශයෙන් ම උද්‍යෝගීමත් ය. කෙසේ වුව ද, නොයෙකුත් බාධා හේතුවෙන් එවැනි ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට හෝ අඛණ්ඩව පවත්වා ගෙනයාමට නො හැකි වී ඇත. පූර්ණ කාලීන රැකියාවක් නොමැති ප්‍රතිචාරීන්ගෙන් 13.1% (ප්‍රතිචාරීන් 34) පූර්ණ කාලීනව කෘෂිකර්මාන්තයේ නියැළීමට කැමැත්තක් දැක්වූ හ. තම තෝරා ගැනීම සම්බන්ධයෙන් ඔවුන්ට විවිධ ආකල්ප සහ ප්‍රතිචාර පවතී. ඔවුන් අතුරින් 71.9% සඳහන් කරනු ලැබුවේ කෘෂිකර්මාන්තය තුළ පවතින නිදහස සහ කෘෂි ක්‍රියාකාරකම් බොහොමයක් ස්වයංව මෙහෙයවන ඒවා වන හෙයින් තමන් වෘත්තියක් ලෙස එය තෝරා ගැනීමට කැමැත්තෙන් පසුවන බවයි. නිදහස යන්න ඔවුන් විවිධ අන්දමින් අර්ථ නිරූපණය කළ හ. ඒ අනුව, රැකියාව වෙනත් අයෙකුගේ අධීක්ෂණයට ලක් නො වන හෙයින් වෙනත් අය මත යැපීමට සිදු නො වීම එක් අර්ථ නිරූපණයකි. අනෙක් අතට, ගොවිතැන සහ කෘෂිකර්මාන්තයට අදාළ වෙනත් කටයුතු තම ගෘහ සහ පෞද්ගලික කාර්යන් ද ඉටු කරගන්නා අතර ම සිදු කළ හැකි ය. කෘෂිකර්මාන්තයට අදාළ රැකියාවක නිරත වන විට බොහෝ අවස්ථාවන් හි තීරණ ගැනීමේ බලය ගොවියා හෝ ව්‍යවසායකයා සතු වේ. මෙයට අමතරව නාගරික ජීවිතයට වඩා, ගමේ වාසය කිරීම නිදහස් සහ සුවපහසු දෙයක්වීම ගමේ රැඳී සිට කෘෂිකර්මාන්තයෙ හි නිරත වීමට බලපා ඇති කරුණක් වේ.

ප්‍රතිචාරීන්ගෙන් තවත් 71.9%ක් සඳහන් කළේ, කෘෂිකර්මාන්තයට අදාළ පුහුණුව, හුරුව, අත්දැකීම් සහ අධ්‍යාපනය තමන් සතු නිසා එය රැකියාවක් ලෙස තෝරා ගැනීමට කැමැත්තෙන් පසුවන බවයි. පූර්ණ කාලීනව කෘෂිකර්මාන්තයේ නියැලීමෙන් තමන්ට ඉහළ ආදායමක් උපයා ගත හැකි බව පූර්ණ කාලීන රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තයේ නියැලීමට කැමති ප්‍රතිචාරීන්ගෙන් 44.2%ක් පැවසූ හ. කෘෂිකර්මය නිරතුරුව ම ලාභදායී නො වන බවට වන ආකල්පය නො සලකා කෘෂිකර්මාන්තය ආශ්‍රිත රැකියාවල පවතින ආර්ථික ලාභය සැලකිල්ලට ගනිමින් ඇතැම් තරුණයින් කෘෂිකර්මාන්තයේ නිරතවීමට කැමති බව මෙමගින් පෙන්නුම් කෙරේ.

## 5.5 සමාප්තිය

ප්‍රතිචාරීන්ගෙන් බහුතරය පූර්ණ කාලීනව කෘෂිකාර්මික කටයුතුවල නිරතවීමට කැමැත්තක් දක්වන අතර සැලකිය යුතු ප්‍රමාණයක් කෘෂිකාර්මික කටයුතුවල පූර්ණ කාලීනව නියැළීමට කැමැත්තක් නො දැක්වූ හ. පූර්ණ කාලීන රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තය තෝරා ගැනීමේ දී ආර්ථික සාධකය දැඩි බලපෑමක් නො කරයි. කෙසේ වුව ද, පූර්ණ කාලීන රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තය තෝරා නො ගත් පිරිසට ඒ සඳහා බලපෑ ප්‍රධාන කාරණාව ආර්ථික සාධකය විය. දැනට පූර්ණ කාලීනව කෘෂිකර්මාන්තයේ නියැලී සිටින්නන් රැකියාවක් ලෙස එය තෝරා ගැනීමට හේතු වී ඇත්තේ, රැකියාවේ පවතින නිදහස, වෙනත් රැකියාවක් නො ලැබීම/වෙනත් විකල්ප නොවීම, ස්වයං තෘප්තියක් ලැබීමට හැකිවීම, පවුලේ සාමාජිකයින් කෘෂිකාර්මික කටයුතුවල නිරත වී සිටීම, මූලික පහසුකම් පැවතීම ආදියයි. පූර්ණ කාලීනව කෘෂිකර්මාන්තයේ නිරත නො වන නමුත් කිසියම් ආකාරයකින් කෘෂිකාර්මික කටයුතුවලට සම්බන්ධ වන පිරිස; වෙළඳපොළ අවිනිශ්චිතතාව, අඩු ආදායම, පෞද්ගලිකව කැමැත්තක් දක්වන වෙනත් රැකියාවක් පැවතීම, අධ්‍යයන කටයුතුවල නිරත වී සිටීම, සමාජයෙන් පිළිගැනීමක් නොවීම ආදිය ඒ සඳහා බලපෑ හේතු ලෙස දැක්වූ හ.

ප්‍රධාන වශයෙන් ම මූලික පහසුකම් සපයා ගැනීමේ දුෂ්කරතාව සහ දැනුවත් බවේ අඩුපාඩු හේතුවෙන් කෘෂි පාදක කොටගත් කර්මාන්ත තරුණයින් අතර එතරම් ජනප්‍රිය වී නොමැත. පූර්ණ කාලීනව රැකියාවක නිරත නො වන ප්‍රතිචාරීන් වැඩි දෙනෙක් රාජ්‍ය අංශයේ රැකියා සඳහා කැමැත්තක් දැක් වූ අතර සැලකිය යුතු ප්‍රතිචාරීන් සංඛ්‍යාවක් පෞද්ගලික අංශයේ හෝ ස්වයංරැකියාවක නිරතවීමට කැමැත්ත දැක්වූ හ. ආර්ථික ස්ථාවරත්වය, රැකියා සුරක්ෂිතතාව, සමාජ පිළිගැනීම සහ අධ්‍යාපන සුදුසුකම් හා ගැළපීම යන ප්‍රධාන කරුණු හතර වඩාත් කැමති රැකියාව තීරණය කිරීම සඳහා දායක වේ.



පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

# සය වැනි පරිච්ඡේදය

# ගොවිතැනේ දී තරුණයින් මුහුණදෙන ගැටලු

## 6.1 හැඳින්වීම

රැකියාවක් ලෙස ගොවිතැනෙ හි නිරතවීමට උත්සාහ කිරීමේ දී තරුණ පරම්පරාව මුහුණ දෙන ප්‍රශ්න සහ දුෂ්කරතා මෙම පරිච්ඡේදයෙන් ඉදිරිපත් කෙරේ. මෙම පරිච්ඡේදයෙන්, මූලික පහසුකම්, වත්කම් සහ ගොවිතැනෙ හි යෙදීමේ දී ලැබෙන සමාජ පිළිගැනීම හා සබැඳි ප්‍රශ්න සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කෙරේ. මෙහි දී, තරුණයින් ඉදිරිපත් කළ අදහස් පැහැදිළි කිරීම සඳහා ගොවි සංවිධානවල නියෝජිතයින් විසින් සපයන ලද තොරතුරු ද භාවිතා කරයි.

## 6.2 ගොවිතැනෙ හි දී තරුණයින් මුහුණ දෙන ගැටලු


### 6.2.1 අලෙවි පහසුකම්

රැකියාවක් ලෙස ගොවිතැනෙ හි යෙදීමේ දී තරුණයින් මුහුණ දෙන ගැටලු සහ දුෂ්කරතා රාශියක් අතුරින් වඩාත් ම තියුණු ප්‍රශ්නය වන්නේ කෘෂි නිෂ්පාදන සඳහා ලැබෙන අඩු මිල හෝ ගොවිතැනින් ලැබෙන අඩු ආදායමයි. බොහෝ තරුණයින් විස්තර කළ පරිදි ගොවිපළ මට්ටමේ දී ලැබෙන අඩු මිල විසින් ඔවුන් කෘෂිකර්මාන්තය සඳහා යොමුවීම අධෛර්යමත් කොට ඇත. ගොවිපළ මට්ටමේ දී ලැබෙන අඩු මිල හේතුවෙන් සතුටුදායක ආදායමක් ලබාගත නො හැකි වූ විට රැකියාවක් ලෙස ගොවිතැනෙ හි යෙදී සිටින තරුණයින් අනියම් රැකියා සොයමින් කොළඹ හෝ වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වේ. මෙම තත්ත්වය සිද්ධි අධ්‍යයන 6.1න් තවදුරටත් විස්තර කෙරේ. එමෙන් ම, බොහෝ තරුණයින් විස්තර කළ අන්දමට ඔවුන් ගොවිතැනෙ හි යෙදීමට රුචියක් දැක්වුව ද, ගොවිතැනින් උපයන අඩු ආදායම නිසා මතුවන ගැටලු සහ අලෙවිකරණ ගැටලු හේතු සාධක කරගනිමින් තම දෙමාපියන් නගන දුක් අඳෝනා ඇසීමෙන් ඔවුන් ගොවිතැනින් ඉවතට තල්ලු කරනු ලබයි.

ක්ෂේත්‍ර සමීක්ෂණයේ දත්ත අනුව, සමස්ත ප්‍රතිචාරින්ගෙන් 13.4%ට කිසි ලෙසකින් හෝ ප්‍රමාණවත් අන්දමේ වෙළඳපොළ පහසුකම් නොමැත. වෙළඳපොළ පහසුකම් යන්නට, කෘෂි බෝග සහ යෙදවුම් සඳහා මිල සාධාරණ නොවීම, යෙදවුම්වල ගුණාත්මකභාවය, යන්ත්‍රෝපකරණ ගාස්තු සහ එකතු කිරීමේ මධ්‍යස්ථාන ආදිය ඇතුළත් කර තිබුණි. තම නිෂ්පාදන සඳහා ප්‍රමාණවත් අලෙවි පහසුකම් නොමැති බව පූර්ණ කාලීන ගොවීන්ගෙන් 14.3%ක් ද, අර්ධ කාලීන ගොවීන්ගෙන් 12.2% ද, පවුලේ ශ්‍රමිකයින්ගෙන් 13.4% ද සඳහන් කළ හ (රූ සටහන 6.1).

සමස්ත ප්‍රතිචාරීන්ගෙන් 59%ක් අලෙවි පහසුකම් මද වශයෙන් ප්‍රමාණවත්ව පවතින බව සඳහන් කළ අතර පූර්ණ කාලීන ගොවීන්ගේ සම්බන්ධයෙන් 70.4%ක් දක්වා එය විචල්‍ය විය. අලෙවි පහසුකම් ඉතා ප්‍රමාණවත් බව සමස්ත ප්‍රතිචාරීන්ගෙන් 13.4%ක් පැවසූ අතර පවුලේ ශ්‍රමික කාණ්ඩයේ දී එය 10.3% සිට පූර්ණ කාලීන ගොවීන්ගේ ප්‍රතිශතයක් වශයෙන් සැලකීමේ දී 17% දක්වා පරාසයක පැතිර පැවතිණි (වගුව 6.1). මෙම සංඛ්‍යාවලින් මතු කර දක්වන්නේ ඔවුන්ට අලෙවි ගැටලු පවතින බවයි.

රූ සටහන 6.1: අලෙවි පහසුකම්වල ප්‍රමාණවත් බව




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

වගුව 6.1: කෘෂිකාර්මික කටයුතුවල යෙදෙන ආකාරය අනුව අලෙවි පහසුකම්වල ප්‍රමාණවත් බව

| ප්‍රමාණවත් බවේ තරම | පූර්ණ කාලීන ගොවීන් (සංඛ්‍යාව=148) | අර්ධ කාලීන ගොවීන් (සංඛ්‍යාව=98) | පවුලේ ශ්‍රමිකයින් (සංඛ්‍යාව=127) |
|---|---|---|---|
| කිසිසේත් ප්‍රමාණවත් නැත | 14.3 | 12.2 | 13.4 |
| මද වශයෙන් ප්‍රමාණවත් | 64.0 | 61.3 | 70.4 |
| ඉතා ප්‍රමාණවත් | 17.0 | 11.2 | 10.3 |
| අවශ්‍ය නොවේ | 4.8 | 15.3 | 6.3 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

අලෙවි පහසුකම් සම්බන්ධයෙන් බොහෝ දුෂ්කරතා සහ ගැටලුවලට ඔවුන් මුහුණ දුන්න ද, ඔවුන් නිෂ්පාදනය කරන සියලු ම බෝග සඳහා ලැබෙන පහළ මට්ටමේ ගොවිපළ මිල ඒ අතුරින් ප්‍රමුඛ ගැටලුව වේ. සමීක්ෂණය සිදු කළ කාලය තුළ සියළු ම අධ්‍යයන ප්‍රදේශවල වී මිල දී ගත්තේ කිලෝවක් රුපියල් 20ට

ආසන්න මිලකට ය[4]. ප්‍රතිචාරීන් අනාවරණය කළ පරිදි කිසිවෙකුට බුලත් විටක් මිල දී ගැනීමට අවශ්‍ය වුවහොත් ඔහු/ඇය අවම වශයෙන් වී කිලෝ ග්‍රෑම් 01ක් අලෙවි කළ යුතු වේ. ඔවුන් තවදුරටත් විස්තර කළ පරිදි, බොහෝ ගොවි පවුල්වල සබන් කැටයක් භාවිතා කළ හැක්කේ දිනක් හෝ දෙකක් පමණි. ඔවුන්ට මාසික සබන් අවශ්‍යතාව කැට 30ක් වුවහොත් ඒ සඳහා මාසයකට රුපියල් 1200/=ක මුදලක් වැය කිරීමට සිදු වේ. එම මුදල උපයා ගැනීම සඳහා ගොවීන්ට වී කිලෝ ග්‍රෑම් 60ක් අලෙවි කිරීමට සිදු වේ. ඉහත සඳහන් කළ තත්ත්වය නිසා තරුණ ගොවීන් කෘෂිකාර්මික අංශය අත්හැර වෙනතකට යොමුවීමේ නැඹුරුවක් පවතී. තව ද, ඔවුන් කෘෂිකාර්මික කටයුතුවල නිරත වුව ද, ගොවිතැන ද්විතියික ආදායම් මාර්ගයක් ලෙස සලකා ආදායම් ඉපැයීමේ වෙනත් මාර්ගවලට යොමුවීමේ නැඹුරුවක් පවතී.

**සිද්ධි අධ්‍යයන 6.1: සුජීව මහතා, රන්මුදුවැව, සූරියවැව**

විසිහය හැවිරිදි සුජීව පරණමාන්න පූර්ණ කාලීන ව කෘෂිකර්මාන්තයේ නියැලෙන්නෙකි. ඔහුගේ බිරිඳ සහ දියණිය සමග ඔහු සූරියවැව ප්‍රදේශයේ ජීවත් වේ. අක්කර 2 1/2 ට ආසන්න ඔහුගේ ගොවිපළේ වම්බටු, මාළුමිරිස්, අමුමිරිස්, පිපිඤ්ඤා, තක්කාලි ආදී බෝග රාශියක් වගා කොට තිබුණි. එක් වගා කන්නයක් සඳහා ඔහු අවම වශයෙන් රුපියල් 150,000/= ක මුදලක් ආයෝජනය කළේ ය. බෝග සඳහා ලැබෙන ගොවිපළ මිල සාධාරණ හෝ ඉහළ මට්ටමක පවතින විට අක්කරයක් සඳහා එක් කන්නයක දී ඔහු අවම වශයෙන් රු. 75,000/= ලාභයක් ඉපැයී ය.

2010 සහ 2011 වසරවල එළවළු මිල අඩුවීම දැඩිව සිදු විය. උදාහරණ වශයෙන් වම්බටු කිලෝවක මිල රුපියල් 2-5 අතර විය. එම කාල පරිච්ඡේදය තුළ ප්‍රවාහන වියදම් දරාගෙන ඔහුගේ නිෂ්පාදන වෙළඳපොළට ගෙන ගිය ද හම්බේගමුව වෙළඳපොළේදීවත් එළවළු විකුණා ගැනීමට ඔහු අපොහොසත් විය. අවස්ථා තුනක දී තම නිෂ්පාදන ඒවායේ ඇසුරුම් සමගම හම්බේගමුව වෙළඳපොළේ දී ඉවත හළ ඔහු හිස් අතින් නිවසට පැමිණුනි. මෙම කාල පරිච්ඡේදය තුළ තම නිෂ්පාදනවලින් රුපියලක් හෝ ආදායම් ලැබීමට ඔහුට නො හැකි විය. එම නිසා, තම එදිනෙදා අවශ්‍යතා සහ එළවළු ප්‍රවාහන ගාස්තු ගෙවීම සඳහා ගමේ මුදල් ණයට දෙන පුද්ගලයෙකුගෙන් මුදල් ණයට ලබාගෙන ඇත. ඔහු විස්තර කළ අන්දමට, ඔහුට විධිමත් ආයතනයකින් ණය මුදල ලබා ගැනීමට අවශ්‍ය වුව ද, වත්කමක් ලෙස ඇපයට තැබීමට කිසිවක් (ඔහුගේ ඉඩමේ ඔප්පුව හෝ) ඔහු සතු නොවූ හෙයින් කිසිදු බැංකුවකින් ඔහුට ණය ලබා ගැනීමට නො හැකි වී තිබේ.

ඔහු වෙළඳපොළේ සිට හිස් අතින් නිවසට පැමිණි විට ඔහුගේ දියණිය, ඇය වෙනුවෙන් ඔහු විසින් වෙළඳපොළේ සිට රැගෙන ආවේ මොනවාදැයි විමසූ අවස්ථාවේ ඔහු සම්පූර්ණයෙන් ම අසරණභාවයට පත්ව ඇත. වගා කටයුතුවලින් සිදු වූ පාඩුව නිසා තවදුරටත් එහි නිරතවීමට අකැමැති වූ ඔහු ගොඩනැගිලි ඉදිකිරීම් බිමක අත්උදව්කරුවෙකු වශයෙන් කොළඹට පැමිණ ඇත.

අධ්‍යයන ප්‍රදේශවල ගොවි සංවිධානයන් හි බොහෝ නියෝජිතයින් අනාවරණය කළ ආකාරයට, තරුණයින් කෘෂිකර්මාන්තයෙන් ඉවත් කිරීමට හේතු වන්නේ අලෙවිකරණ ගැටලු වේ. රජය විසින් සහතික මිලට වී මිල දී ගැනීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබුව ද, අවක්‍රියාකාරකම් සහ දුර්වල සැලසුම් හේතුවෙන් වී අලෙවි ගැටලුවට හෝ විසඳුමක් ලබාදීමට එය අපොහොසත් වී ඇත. උහන, හිඹුටුරාව ප්‍රදේශයේ ගොවි සංවිධානයේ එක්තරා නායකයෙකු බෝග අලෙවිකරණ ගැටලුව සම්බන්ධයෙන් තම අදහස පහත සඳහන් පරිදි ප්‍රකාශ කළේ ය.

[4] මෙම මිල සම්බා සඳහා රුපියල් 20-24 අතර ද, නාඩු සඳහා 16-19 අතර ද විචලනය විය.


"යම් දෙයක් නිපදන - මිනිසා මිලක් පවසන
එය නොමැති ගොවිතැන - තිබේ මුදලාලිලා බදුගෙන"

(යම් කිසිවෙක් කිසියම් නිෂ්පාදනයක් කළ විට නිෂ්පාදනයේ මිල තීරණය කිරීමේ අයිතිය නිෂ්පාදකයා සතු වේ. එසේ වුව ද, මිල දී ගන්නන්ගේ ඒකාධිකාරී හෝ කතිපයාධිකාරී බලය හේතුවෙන් ගොවීන්ට තම නිෂ්පාදන සම්බන්ධයෙන් මිල තීරණය කිරීමේ හැකියාවක් නොමැත).

### 6.2.2 ව්‍යාප්ති සේවාව

ව්‍යාප්ති සේවාවේ දුර්වලකම් තරුණ ගොවීන් මුහුණ දෙන තවත් ගැටලුවකි. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන් විශාල පිරිසක් යොදවා සිටිය ද ගොවීන් සහ අධ්‍යයනයේ තරුණ ප්‍රතිචාරීන් පෙන්වාදුන් අන්දමට ඔවුන්ගෙන් බොහොමයකට බෝග වගා ක්‍රම සහ බෝගවලට වැළදෙන ලෙඩ රෝග සම්බන්ධයෙන් ප්‍රමාණවත් දැනුමක් නොමැත. ව්‍යාප්ති සේවාව කිසිසේත් ප්‍රමාණවත් නො වන බව ප්‍රතිචාරීන්ගෙන් 18.7% පැවසූ අතර එය මද වශයෙන් ප්‍රමාණවත් බව ප්‍රතිචාරීන්ගෙන් 51.7%ක් පවසන ලදී, සමස්ත ප්‍රතිචාරීන්ගෙන් 5.9% තමන්ට ව්‍යාප්ති සේවාව අවශ්‍ය නො වන බව පැවසූ අතර තම කෘෂිකාර්මික කටයුතු සඳහා ව්‍යාප්ති සේවයෙන් ලැබෙන සහාය ප්‍රමාණවත් බව 20% ක් සඳහන් කළ හ (රූ සටහන 6.2).

රූ සටහන 6.2: ව්‍යාප්ති සේවාවේ ප්‍රමාණවත් භාවය අනුව ප්‍රතිචාරීන්




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

ව්‍යාප්ති සේවාව කිසිසේත් ම ප්‍රමාණවත් නො වන බව පැවසූ තරුණ ප්‍රතිචාරීන්ගේ ප්‍රතිශතය පූර්ණ කාලීන ගොවීන්ගෙන් 16.9% සිට පවුලේ ශ්‍රමිකයින්ගෙන් 21.3% දක්වා පරාසයක පැතිර පැවති අතර මඳ වශයෙන් ප්‍රමාණවත් බව පැවසූ කාණ්ඩය පූර්ණ කාලීන ගොවීන්ගෙන් 48.6% සිට අර්ධ කාලීන ගොවීන්ගෙන් 63.3% දක්වා පරාසයක පැතිර පැවතිණි (වගුව 6.2). තරුණ ගොවීන්ගෙන් 20% සිට 30% දක්වා ප්‍රමාණයක් ව්‍යාප්ති සේවාව ඉතා ප්‍රමාණවත් බව පැවසුව ද, ප්‍රතිචාරීන්ගෙන් ඉහළ ප්‍රතිශතයක් එය ප්‍රමාණවත් නො වන බව පැවසූ හ. ඒ අනුව, ඉහත දත්ත තහවුරු කරනු ලබන්නේ තරුණ ගොවීන් ව්‍යාප්ති සේවාවේ හිඟයෙන් පීඩා විඳින බවයි. සැලකිය යුතු ප්‍රතිචාරීන් පිරිසක් විසින් ව්‍යාප්ති සේවාව ඉතා ප්‍රමාණවත් බව පැවසුව ද, නියැඳිය තුළ අධි තාක්ෂණය යොදාගෙන වගා කටයුතු සිදු කරන එක ද තරුණ ගොවියෙකු හෝ අධ්‍යයන කණ්ඩායමට හමු නොවිණි.

6.2 වගුව: කෘෂිකාර්මික කටයුතු අනුව ව්‍යාප්ති පහසුකම්වල ප්‍රමාණවත් භාවය

| ප්‍රමාණවත් බවේ තරම | කෘෂිකර්මාන්තයේ යෙදෙන්නන්ගෙන් ප්‍රතිශතයක් ලෙස | | |
|---|---|---|---|
| | පූර්ණ කාලීන ගොවීන් (සංඛ්‍යාව=148) | අර්ධ කාලීන ගොවීන් (සංඛ්‍යාව=98) | පවුලේ ශ්‍රමික (සංඛ්‍යාව=127) |
| කිසිසේත් ප්‍රමාණවත් නැත | 16.9 | 14.3 | 21.3 |
| මඳ වශයෙන් ප්‍රමාණවත් | 48.6 | 63.3 | 53.8 |
| ඉතා ප්‍රමාණවත් | 30.4 | 21.4 | 22.1 |
| අවශ්‍ය නොවේ | 4.1 | 1.0 | 3.1 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

වෙනත් අධ්‍යයනයන්ගෙන් හෙළිදරවු කර ඇති ආකාරයට, පළාත් සභා පිහිටුවීමෙන් පසු ව්‍යාප්ති සේවාවේ ආයතනික බෙදීමක් සිදු විය. තව ද, 1988 දී ග්‍රාමීය මට්ටමේ ව්‍යාප්ති සේවකයින් (කේ.වී.එස්.) 2400ක් ග්‍රාම නිලධාරීන් ලෙස ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතට අනුයුක්ත කිරීම නිසා ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටම අතර විශාල හිදැසක් මතු විය. එයට පසුව, ව්‍යාප්ති සේවක සහ ගොවි අනුපාතය එක් කෘෂිකර්ම උපදේශකවරයෙකු/වරියකට ගොවි පවුල් 3000 පමණ ආවරණය කිරීමට සිදුවන අන්දමින් ඉහළ ගියේ ය. ඇතැම් ප්‍රදේශවල එය එක් කෘෂිකර්ම උපදේශකයෙකු සඳහා ගොවි පවුල් 7,000ක් පමණ වන අන්දමට ඉහළ ගොස් ඇත. 1990 දී, රජය විසින් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ක්ෂේත්‍ර නිලධාරීන් ලෙස (කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර) 9,600ක් පමණ බඳවා ගැණුනි. කෘෂි ව්‍යාප්ති සේවා ක්‍රියාත්මක කිරීම සඳහා සතියේ දින තුනක් ඔවුන්ගේ සහාය කෘෂිකර්ම උපදේශක වෙත ලබාදිය යුතු වුවත්, 2008 වසර වන විට ද, කෘෂිකර්ම ඩිප්ලෝමාව හදාරා තිබුණේ ඔවුන්ගෙන් 10%ක් පමණකි (Damayanthi and Nanayakkara, 2008).

ඇතැම් ගොවීන් ප්‍රකාශ කළේ, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්ට/වරියන්ට (කෘ.ප.නි.ස.) ගොවීන් තම අත්දැකීම් තුළින් උපයා ගත දැනුම තරම් හෝ වගා ක්‍රම පිළිබඳ දැනුමක් නොමැති බවයි. ඉහත ගැටලු හේතුවෙන් සතුටුදායක ව්‍යාප්ති සේවාවක් ලබා ගැනීමට ගොවීන් අසමත් ය. බොහෝ තරුණයන් ප්‍රකාශ කළේ තම වගාව රෝගයකට ගොදුරු වූ විට ඉහත කී තත්ත්වය මත තමන් කෘෂි රසායන අලෙවිකරුවන්ගේ උපදෙස් ලබාගන්නා බවයි. කෙසේ වුව ද, අලෙවිකරුවන් තම අලෙවිය වැඩි කරගැනීමට බීජ සහ රසායනික ද්‍රව්‍ය නිර්දේශ කරන නමුත් ගොවීන්ගේ අවශ්‍යතාවය සැලකිල්ලට නො ගනී. මෙයට සමගාමීව ග්‍රාමීය පාසැල්වල සිසුන්ට මූලික විද්‍යාත්මක දැනුම ලබාදීමට සමත් සුදුසුකම් සහිත කෘෂිකර්ම ගුරුවරුන්ගේ හිඟය ද, කෘෂිකර්මාන්තය සම්බන්ධ දැනුවත් බව අඩුවීමට දායක වී ඇති සාධකයකි.

### 6.2.3 කෘෂිකර්ම පුහුණු

තරුණ ගොවීන් මුහුණ දෙන තවත් ගැටලුවක් වන්නේ කෘෂිකර්මයට අදාළ පුහුණුවීම්වල හිඟය සහ පවතින පුහුණුවීම් ලබා ගැනීමේ ගැටලුවයි. සමස්ත ප්‍රතිචාරීන්ගෙන් 58.9% සඳහන් කළ අන්දමට කෘෂිකර්මාන්තයට අදාළ පුහුණුවීම් හෝ ඒ සඳහා පවතින පහසුකම් කිසිසේත් ප්‍රමාණවත් නොවේ (වගුව 6.3). අනෙක් අතට පුහුණුවීම් ඉතා ප්‍රමාණවත් බව පැවසූ ප්‍රතිචාරීන්ගේ සංඛ්‍යාව නො සැලකිය යුතු තරම් ය. පූර්ණ කාලීන, අර්ධ කාලීන සහ පවුලේ ශ්‍රමිකයන් ආදී කුමන ආකාරයකින් හෝ කෘෂිකර්මාන්තයේ නියැලෙන සියළු දෙනාට ම මෙය පොදු තත්ත්වයක් විය.

**වගුව 6.3: කෘෂිකර්මාන්තයේ නියැලෙන ආකාරය අනුව පුහුණු පහසුකම්වල ප්‍රමාණවත් භාවය**

| ප්‍රමාණවත් බව | කෘෂිකර්මාන්තයේ නියැලෙන්නන්ගේ ප්‍රතිශතයක් ලෙස | | | සමස්ත ප්‍රතිචාරීන් ප්‍රතිශතයක් ලෙස (සංඛ්‍යාව=525) |
|---|---|---|---|---|
| | පූර්ණ කාලීන ගොවීන් (සංඛ්‍යාව=148) | අර්ධ කාලීන ගොවීන් (සංඛ්‍යාව=99) | පවුලේ ශ්‍රමිකයින් (සංඛ්‍යාව=127) | |
| කිසිදු ආකාරයකින් ප්‍රමාණවත් නැත | 61.4 | 55.1 | 67.7 | 58.9 |
| මද වශයෙන් ප්‍රමාණවත් | 32.5 | 38.8 | 22.1 | 29.3 |
| ඉතා ප්‍රමාණවත් | 7.4 | 5.1 | 8.7 | 7.4 |
| අවශ්‍ය නැත | 2.0 | 1.0 | 1.6 | 4.4 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012


සාම්ප්‍රදායික කෘෂිකාර්මික පුරුදු පාඩු හෝ අඩු ලාභ ගෙන දුන්න ද, අධි තාක්ෂණික කෘෂිකර්මය, පශු සම්පත් සහ විසිතුරු මල් වගාව වැනි ඇතැම් ගොවිතැන් ක්‍රමවේද සාමාන්‍යයෙන් වැඩි ලාභ ගෙන දේ. එසේ වුව ද එවැනි ක්‍රමවේදයන්ට අනුගතවීම සඳහා තරුණ ගොවීන්ට දැනුම, අත්දැකීම්, ප්‍රාග්ධන සහ වෙළඳපොළ තොරතුරු නො පවතී. තව ද, පසු අස්වනු තාක්ෂණ ආයතනය (ප.අ.තා.ආ), කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

සහ කර්මාන්ත සංවර්ධන මණ්ඩලය වැනි රාජ්‍ය ආයතන සතුව අගය එකතු කළ නිෂ්පාදන සහ පසු අස්වනු හානිය අඩු කිරීම සඳහා අවශ්‍ය නව තාක්ෂණය පැවතිය ද ඒවා බිම් මට්ටමට ළඟා වී නොමැත. උදාහරණ වශයෙන්, පළතුරු ජෑම්, කෝඩියල්, ක්ෂණික පළතුරු යුෂ, සියඹලා පල්පය, බිස්කට් සහ සහල්වලින් සකසන නිෂ්පාදන, පැසවීම මගින් එළවළු කල් තබාගැනීම ආදී තාක්ෂණය පසු අස්වනු තාක්ෂණ ආයතනය සතුව පවතී. එසේ වුවත්, පුහුණුකරුවන් සඳහා වන වියදම්, තාක්ෂණය සහ වැඩසටහන් සම්බන්ධයෙන් වන තොරතුරුවල හිඟය සහ ක්‍රියාත්මක කිරීමේ ගැටලු නිසා එම පුහුණුවීම් ලබාගැනීමට එතරම් කැමැත්තක් නො දැක්වීම ආදී හේතු සාධක රාශියක් නිසා එම තාක්ෂණය ග්‍රාමීය මට්ටමට ප්‍රමාණවත් ආකාරයෙන් ළඟා වී නොමැත.

### 6.2.4 ඉඩම්

තරුණ ප්‍රතිචාරීන්ට අනුව ගොඩ ඉඩම් නො පැවතීමත්, පවතින ඉඩම් වගා කටයුතු සඳහා ලබාගැනීමත් ඔවුන් මුහුණ දෙන තවත් ගැටලුවකි. ප්‍රතිචාරීන්ගෙන් 16% පවසන්නේ ගොඩ ඉඩම්වල හිඟය නිසා තමන් වගා කටයුතුවල නො යෙදෙන බවයි. විශේෂයෙන් ම, වාණිජ බෝග වගා කෙරෙන නුවරඑළිය සහ මාතලේ දිස්ත්‍රික්කයේත්, සූරියවැවත් (මහවැලි බල ප්‍රදේශය) තරුණයින් නිරන්තරයෙන් එම ගැටලුව සඳහන් කරනු ලැබී ය. පවතින ගොඩ ඉඩම් ප්‍රමාණයත්, ගොඩ ඉඩම් වගා කටයුතුවලට භාවිතා කිරීමේ හැකියාවත් ප්‍රමාණවත් බව පැවසූ ප්‍රතිචාරීන් ප්‍රතිශතය 24.2% කි. ප්‍රතිචාරීන්ගෙන් 58.7% ක් පවතින ගොඩ ඉඩම් ප්‍රමාණය සහ ඒවා භාවිතා කිරීමේ හැකියාව මඳ වශයෙන් ප්‍රමාණවත් බව පැවසූ හ (රූ සටහන 6.3).


**රූ සටහන 6.3: ගොඩ ඉඩම්වල ප්‍රමාණවත් භාවය අනුව ප්‍රතිචාරීන්**




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

ගොඩ ඉඩම් පවතින ප්‍රමාණය සහ ඒවා භාවිතා කිරීමේ හැකියාව ප්‍රමාණවත් බව කෘෂිකර්මාන්තයේ නියැලෙන ආකාරය අනුව වෙනස් වේ. අර්ධ කාලීන ගොවීන්ගෙන් 12.1% සිට පූර්ණ කාලීන ගොවීන්ගෙන් 16.2% දක්වා වූ පරාසයක ගොඩ ඉඩම් කිසිසේත් ප්‍රමාණවත් නො වන බව පැවසූ ප්‍රතිචාරීන් විසිර පැවතිණි. මද වශයෙන් ප්‍රමාණවත් බව පැවසූ ප්‍රතිචාරීන් අර්ධ කාලීන ගොවීන්ගෙන් 58.7% සිට පවුලේ ශ්‍රමිකයින්ගෙන් 68.7% දක්වා වූ පරාසයක පැතිරිණි. ඉතා ප්‍රමාණවත් බව පැවසූ ප්‍රතිචාරීන් පූර්ණ කාලීන ගොවීන්ගෙන් 21.9% සිට පවුලේ ශ්‍රමිකයින්ගෙන් 20.4% දක්වා පරාසයක විචලනය විය (රූ සටහන 6.4). කෘෂිකර්මාන්තයේ නියැලීමට කැමති තරුණ පරම්පරාවට ගොඩ ඉඩම් නොමැතිවීම ගැටලුවක් බව මෙයින් ගම්‍යමාන වේ. ඉහළ වටිනාකමකින් යුතු වාණිජ බෝග වගා කරන ප්‍රදේශවල බොහෝ තරුණයින් විස්තර කළ පරිදි, ඔවුන්ට ඉඩම් මිලට ගැනීමට වත්කම් නොමැති අතර දෙමාපියන්ගේ ඉඩම් හෝ බද්දට ගත් ඉඩම් වගා කිරීමට සිදු වේ. ඉඩම් හිමි පවුලක වුව ද, දරුවන් කිහිප දෙනෙකු සිටින විට ප්‍රමාණවත් ඉඩම් කොටසක් වගා කිරීම දුෂ්කර ය. තව ද, ඉහළ වටිනාකමකින් යුතු වාණිජ බෝග වගා කරන ප්‍රදේශවල ඉඩම් මිල ඉහළ බැවින් ඉඩමක් බද්දට ගැනීම පවා දුෂ්කර ය.

රූ සටහන 6.4: කෘෂිකර්මාන්තයේ නියැලෙන ආකාරය අනුව ගොඩ ඉඩම් පවතින ප්‍රමාණය




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

පවතින කුඹුරු ඉඩම් සහ ඒවා භාවිතා කිරීමේ හැකියාව ඉතා ප්‍රමාණවත් බව ප්‍රතිචාරීන්ගෙන් 1/4 පමණ පැවසූ අතර පූර්ණ කාලීන ගොවි කාණ්ඩයේ දී එය 29.4% තරම් ඉහළ අගයක් ගනු ලැබිණි. කෙසේ වුව

ද, පවතින කුඹුරු ඉඩම් ප්‍රමාණය සහ ඒවා භාවිතා කිරීමේ හැකියාව කිසිසේත් ප්‍රමාණවත් නො වන බව සමස්ත ප්‍රතිචාරීන්ගෙන් 17.9% පැවසූ අතර පූර්ණ කාලීන ගොවීන් අතර එය 19.9% ක් විය. තව ද, සමස්ත ප්‍රතිචාරීන්ගෙන් 28.5 පැවසුවේ පවතින කුඹුරු ඉඩම් ප්‍රමාණය සහ ඒවා භාවිතා කිරීමේ හැකියාව මද වශයෙන් ප්‍රමාණවත් බවයි. මෙම ප්‍රතිශතය අර්ධ කාලීන ගොවීන්ගෙන් 57.9%ක් සහ පූර්ණ කාලීන ගොවීන්ගෙන් 45.2%ක් තරම් ඉහළ අගයක් ගනු ලැබිණි (වගුව 6.4). විශේෂයෙන් ම, ඇතැම් පවුලේ ශ්‍රමිකයින් සඳහන් කළේ, "අපට ප්‍රමාණවත් ඉඩම් ඇත්නම් රැකියා සොයමින් කාලය සහ මුදල් වැය කරනවාට වඩා එම ඉඩම් වගා කිරීමේ හැකියාව ඇත" යනුවෙනි. රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තයේ යෙදීමට කුඹුරු ඉඩම් නොමැතිකම තරුණ පරම්පරාවට බලපාන එක් බාධාවක් බව මෙයින් ගම්‍ය වේ.

කෙසේ වුව ද, සමස්ත ප්‍රතිචාරීන්ගෙන් 9.8% ද, පවුලේ ශ්‍රමිකයින්ගෙන් 27.4% ද පැවසුවේ ඔවුන්ට කුඹුරු ඉඩම් අනවශ්‍ය බවයි. ඉහත තත්ත්වය සඳහා කරුණු දෙකක් බලපානු ලබයි. එනම්, වී වගාවේ නිරතවීමට කැමැත්තක් නො වීම සහ ඔවුන්ගේ පවුල් සතුව වගා කිරීමට ප්‍රමාණවත් තරම් ඉඩම් පැවතීම යන කරුණු ය.

**වගුව 6.4: කෘෂිකර්මාන්තයේ නියැලෙන ආකාරය අනුව කුඹුරු ඉඩම්වල ප්‍රමාණවත් බව**

| ප්‍රමාණවත් බව | කෘෂිකර්මාන්තයේ නියැලෙන්නන්ගේ ප්‍රතිශතයක් ලෙස | | | සමස්ත ප්‍රතිචාරීන්ගේ ප්‍රතිශතයක් ලෙස (සංඛ්‍යාව=525) |
|---|---|---|---|---|
| | පූර්ණ කාලීන ගොවීන් (සංඛ්‍යාව=148) | අර්ධ කාලීන ගොවීන් (සංඛ්‍යාව=98) | පවුලේ ශ්‍රමිකයින් (සංඛ්‍යාව=127) | |
| කිසිදු ආකාරයකින් ප්‍රමාණවත් නැත | 19.9 | 10.5 | 16.0 | 17.9 |
| මද වශයෙන් ප්‍රමාණවත් | 45.2 | 57.9 | 42.7 | 48.5 |
| ඉතා ප්‍රමාණවත් | 29.4 | 23.2 | 16.2 | 23.7 |
| අවශ්‍ය නැත | 5.5 | 8.4 | 27.4 | 9.8 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

මොණරාගල දිස්ත්‍රික්කයේ ඇතිමලේ, අම්පාර දිස්ත්‍රික්කයේ උහන සහ අනුරාධපුර දිස්ත්‍රික්කයේ තන්තිරිමලේ සහ නොච්චියාගම වැනි දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශවල වෙසෙන ජනතාව එක් ජීවනෝපාය මාර්ගයක් ලෙස හේන් වගාවේ නිරත වන අතර එය ඔවුන්ට ඉතා වැදගත් ආදායම් මාර්ගයකි. කෙසේ වුව ද, සමස්ත ප්‍රතිචාරීන්ගෙන් ඉහළ ප්‍රතිශතයක් (38.1%) වගා කිරීම සඳහා තමන්ට හේන් ඉඩම් අනවශ්‍ය බව පැවසූ අතර, අර්ධ කාලීන ගොවීන්ගෙන් 53.8%ක් එසේ පැවසූ හ. පවතින හේන් ඉඩම් සහ ඒවා භාවිතා කිරීමේ හැකියාව කිසිසේත් ප්‍රමාණවත් නොවන බව සමස්ත ප්‍රතිචාරීන්ගෙන් 14% පැවසූ හ (වගුව 6.5). සමස්ත ප්‍රතිචාරීන්ගෙන් 33.5% සඳහන් කළේ තමන්ට හේන් ඉඩම් පවතින නමුත් එය මද වශයෙන් ප්‍රමාණවත්

බවයි. එය අර්ධ කාලීන ගොවීන්ගෙන් 31.9% සිට පවුලේ ශ්‍රමිකයින්ගෙන් 42.7% විචලනය විය. මෙම සංඛ්‍යා ලේඛනවලින් හැඟී යන්නේ ඔවුන් හේන් වගාවේ නිරතවීමට කැමැත්තක් දැක්වුව ද ඒ සඳහා අවශ්‍ය ඉඩම් නොමැති බවයි.

**වගුව 6.5: කෘෂිකර්මාන්තයේ නියැලෙන ආකාරය අනුව හේන් ඉඩම්වල ප්‍රමාණවත් බව**

| ප්‍රමාණවත් බව | කෘෂිකර්මාන්තයේ නියැලෙන්නන්ගේ ප්‍රතිශතයක් ලෙස | | | සමස්ත ප්‍රතිචාරින්ගේ ප්‍රතිශතයක් ලෙස (සංඛ්‍යාව=525) |
|---|---|---|---|---|
| | පූර්ණ කාලීන ගොවීන් (සංඛ්‍යාව=148) | අර්ධ කාලීන ගොවීන් (සංඛ්‍යාව=98) | පවුලේ ශ්‍රමිකයින් (සංඛ්‍යාව=127) | |
| කිසිදු ආකාරයකින් ප්‍රමාණවත් නැත | 14.6 | 5.5 | 13.7 | 14.3 |
| මඳ වශයෙන් ප්‍රමාණවත් | 32.3 | 31.9 | 42.7 | 33.5 |
| ඉතා ප්‍රමාණවත් | 18.4 | 7.7 | 16.2 | 14.1 |
| අවශ්‍ය නැත | 34.6 | 53.8 | 27.4 | 38.1 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

### 6.2.5 කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ

වගු සටහන් 6.6න් අනාවරණය කෙරන අන්දමට සමස්ත ප්‍රතිචාරින්ගෙන් සැලකිය යුතු පිරිසක් කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ නොමැතිකම සහ ඒවා භාවිතයට ලබාගැනීමේ දුෂ්කරතා නිසා පීඩා විඳිති. සමස්ත ප්‍රතිචාරින්ගෙන් 15%-20% අතර ප්‍රමාණයක් ඔවුන්ගේ කෘෂිකාර්මික කටයුතු සඳහා පවතින කෘෂි යන්ත්‍රෝපකරණ සහ අවශ්‍ය අන්දමට ඒවා ලබාගැනීමට ඇති හැකියාව කිසිසේත් ප්‍රමාණවත් නො වන බව පැවසූ හ. සමස්ත ප්‍රතිචාරින්ගෙන් පවතින සහ අවශ්‍ය අන්දමට යන්ත්‍රෝපකරණ ලබාගැනීමේ හැකියාව ඉතා ප්‍රමාණවත් බව පැවසූ පිරිස ඇඹිලිමෙක් යන්ත්‍ර සඳහා 3% සිට කෘෂි රසායනික ඉසින යන්ත්‍ර (ස්ප්‍රේයර්) සඳහා 24.3% දක්වා වූ පරාසයක විචලනය විය. මඳ වශයෙන් ප්‍රමාණවත් බව පැවසූ පිරිස, ඇඹිලිමෙක් යන්ත්‍ර සඳහා 41.2% සිට කෘෂි රසායනික ඉසින යන්ත්‍ර සඳහා 46.5% දක්වා පරාසයක පැවතිණි. සමස්ත ප්‍රතිචාරින්ගෙන් 1/3 ප්‍රමාණයක්, තමන්ට ඇඹිලිමෙක්, සුනාමි, සංයුක්ත අස්වනු නෙළන යන්ත්‍රය හෝ රෝද හතරේ ට්‍රැක්ටර් අනවශ්‍ය බව පැවසුවේ ඒ සඳහා ආදේශිත යන්ත්‍ර සූත්‍ර තමන් භාවිතා කරන හෙයිනි.

වගුව 6.6: කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණවල ප්‍රමාණවත් බව

| ප්‍රමාණවත් බවේ තරම | සමස්ත ප්‍රතිශතය (සංඛ්‍යාව=525) | | | | | |
|---|---|---|---|---|---|---|
| | රෝද 2 ට්‍රැක්ටර | රෝද 4 ට්‍රැක්ටර | කෘෂි රසායනික ඉසින යන්ත්‍ර | ධාන්‍ය වෙන් කරන යන්ත්‍රය (ඇග්‍රිමෙක්) | ධාන්‍ය වෙන් කරන යන්ත්‍රය (සුනාමි) | අස්වනු නෙළන සංයුක්ත යන්ත්‍රය (භූතයා) |
| කිසිදු ආකාරයකින් ප්‍රමාණවත් නැත | 17.3 | 19.2 | 14.6 | 16.4 | 18.5 | 16.6 |
| මඳ වශයෙන් ප්‍රමාණවත් | 44.2 | 43.6 | 46.5 | 41.2 | 44.2 | 42.3 |
| ඉතා ප්‍රමාණවත් | 16.7 | 4.5 | 24.3 | 4.3 | 7.8 | 4.7 |
| අවශ්‍ය නැත | 21.9 | 32.6 | 14.8 | 38.1 | 29.2 | 36.4 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

තම වගා කටයුතු සඳහා පවතින කෘෂි යන්ත්‍රෝපකරණ සහ ඒවා අවශ්‍ය පරිදි යොදා ගැනීමේ හැකියාව ප්‍රමාණවත් නො වන බව පැවසූ ප්‍රතිචාරීහු ඒ සඳහා බලපාන හේතු සාධක ගණනාවක් විස්තර කළ හ. එනම්, යන්ත්‍රෝපකරණවල මිල ඉතා අධිකවීම මෙන් ම ධාන්‍ය වෙන් කරන යන්ත්‍ර, සුනාමි හෝ සංයුක්ත යන්ත්‍රය කුලියට යොදවා ගැනීමේ පිරිවැය අධික වීම සහ අස්වනු නෙළන සමයේ දී අවශ්‍ය අවස්ථාවෙ හි සේවාව ලබාගැනීමේ දුෂ්කරතාව ඒ අතර විය. උදාහරණයක් වශයෙන් සුනාමි යන්ත්‍රයක් සඳහා පැයකට රු. 4000/= සිට 5000/= අතර මුදලක් ගෙවීමට ගොවීන්ට සිදුවීම දැක්විය හැකි ය.

පූර්ණ කාලීනව කෘෂිකර්මාන්තයේ නියැලෙන තරුණ ගොවීහු රෝද හතරේ ට්‍රැක්ටර හිඟයෙන් බොහෝ විට පීඩා විඳිති (වගුව 6.7). පවතින රෝද හතරේ ට්‍රැක්ටර සහ අවශ්‍ය වේලාවට භාවිතා කිරීමේ හැකියාව කිසිසේත් ප්‍රමාණවත් නො වන බව සහ මඳ වශයෙන් ප්‍රමාණවත් බව පැවසූ පිරිසේ ප්‍රතිශතාත්මක එකතුව 74.3% තරම් ඉහළ අගයක් ගනී. පූර්ණ කාලීන ගොවීන්ගෙන්, කෘෂි යන්ත්‍රෝපකරණ පවතින ප්‍රමාණය සහ ඒවා අවශ්‍ය පරිදි භාවිතා කිරීමේ හැකියාව කිසිසේත් ප්‍රමාණවත් නො වන සහ මඳ වශයෙන් ප්‍රමාණවත් බව පැවසූ පිරිසේ ප්‍රතිශතාත්මක එකතුව ඇග්‍රිමෙක් යන්ත්‍ර සඳහා 63.5% ද, සුනාමි යන්ත්‍ර සඳහා 70.3% ද, සංයුක්ත යන්ත්‍ර සඳහා 66.2% ද විය. පූර්ණ කාලීන ව කෘෂිකර්මාන්තයේ නියැලෙන තරුණයින් එම යන්ත්‍රෝපකරණවල හිඟය නිසා ගැහැට විඳින බව ඉහත තොරතුරුවලින් පැහැදිළිව පෙන්නුම් කරයි.

වගුව 6.7: කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණවල ප්‍රමාණවත් බව අනුව පූර්ණ කාලීන ගොවීන්

| ප්‍රමාණවත් බවේ තරම | සමස්තයෙන් ප්‍රතිශතය (සංඛ්‍යාව=98) | | | | | |
|---|---|---|---|---|---|---|
| | රෝද 2 ට්‍රැක්ටර | රෝද 4 ට්‍රැක්ටර | කෘෂි රසායනික ඉසින යන්ත්‍ර | ධාන්‍ය වෙන් කරන යන්ත්‍රය (ඇඹිමෙක්) | ධාන්‍ය වෙන් කරන යන්ත්‍රය (සුනාමි) | අස්වනු නෙළන සංයුක්ත යන්ත්‍රය (භූතයා) |
| කිසිදු ආකාරයකින් ප්‍රමාණවත් නැත | 17.3 | 19.2 | 14.6 | 16.4 | 18.5 | 16.6 |
| මද වශයෙන් ප්‍රමාණවත් | 44.2 | 43.6 | 46.5 | 41.2 | 44.2 | 42.3 |
| ඉතා ප්‍රමාණවත් | 16.7 | 4.5 | 24.3 | 4.3 | 7.8 | 4.7 |
| අවශ්‍ය නැත | 21.9 | 32.6 | 14.8 | 38.1 | 29.2 | 36.4 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

වගු සටහන් 6.8ට අනුව අර්ධ කාලීනව කෘෂිකර්මාන්තයේ නියැලෙන පිරිස කෘෂි රසායනික ඉසින යන්ත්‍ර හැර අනෙකුත් කෘෂි යන්ත්‍රෝපකරණවල හිඟය සහ අවශ්‍ය පරිදි භාවිතා කිරීමේ හැකියාව අඩුවීම නිසා බොහෝ දුරට පීඩා විඳ ඇත්තා හ. යන්ත්‍රෝපකරණ කිසිසේත් ප්‍රමාණවත් නො වන සහ මද වශයෙන් ප්‍රමාණවත් බව පැවසූ පිරිසේ මුළු එකතුව රෝද දෙකේ ට්‍රැක්ටර සඳහා 70.4% ද, රෝද හතරේ ට්‍රැක්ටර සඳහා 67.4% ද, කෘෂි රසායනික ඉසින යන්ත්‍ර සඳහා 63.7% ද, ඇඹිමෙක් යන්ත්‍ර සඳහා 67.7% ද, සුනාමි යන්ත්‍ර සඳහා 72.6% ද, සංයුක්ත යන්ත්‍ර සඳහා 64.6% ද විය.



පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.,ප.පු.ආ
HARTI

වගුව 6.8: කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණවල ප්‍රමාණවත් බව අනුව අර්ධ කාලීන ගොවීන්

| ප්‍රමාණවත් බවේ තරම | සමස්තයෙන් ප්‍රතිශතය (සංඛ්‍යාව=127) | | | | | |
|---|---|---|---|---|---|---|
| | රෝද 2 ට්‍රැක්ටර | රෝද 4 ට්‍රැක්ටර | කෘෂි රසායනික ඉසින යන්ත්‍ර | ධාන්‍ය වෙන් කරන යන්ත්‍රය (ඇඹුමෙක්) | ධාන්‍ය වෙන් කරන යන්ත්‍රය (සුනාමි) | අස්වනු නෙළන සංයුක්ත යන්ත්‍රය (භූතයා) |
| කිසිදු ආකාරයකින් ප්‍රමාණවත් නැත | 23.5 | 27.6 | 17.2 | 24.7 | 28.4 | 23.7 |
| මඳ වශයෙන් ප්‍රමාණවත් | 46.9 | 39.8 | 46.5 | 43.0 | 44.2 | 40.9 |
| ඉතා ප්‍රමාණවත් | 17.3 | 7.1 | 27.3 | 2.2 | 7.4 | 4.3 |
| අවශ්‍ය නැත | 12.2 | 25.5 | 9.1 | 30.1 | 20.0 | 31.2 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

පවුලේ ශ්‍රමිකයින් අතර ද කෘෂි යන්ත්‍රෝපකරණ සම්බන්ධයෙන් පවතින්නේ ඉහත පැවසූ තත්ත්වයට සමාන තත්ත්වයකි. යන්ත්‍රෝපකරණ කිසිසේත් ප්‍රමාණවත් නොමැති සහ මද වශයෙන් ප්‍රමාණවත් බව පැවසූ පිරිසේ එකතුව ඇඹුමෙක් සඳහා 68.0%, සුනාමි යන්ත්‍ර සඳහා 72.%, සංයුක්ත යන්ත්‍ර සඳහා 70.9% ද, රෝද හතරේ ට්‍රැක්ටර් සඳහා 73.0% ද, කෘෂි රසායනික ඉසින යන්ත්‍ර සඳහා 68.5% ද, විය (වගුව 6.9). මෙයින් පැහැදිළිව පෙන්නුම් කරන්නෙ අර්ධ කාලීන ගොවීන් ලෙස හෝ පවුලේ ශ්‍රමිකයින් ලෙස කටයුතු කරන තරුණයින් එකී කෘෂි යන්ත්‍රෝපකරණ ලබා ගැනීමේ ගැටලුවකට මුහුණ පා සිටින බවයි.

වගුව 6.9: කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණවල ප්‍රමාණවත් බව අනුව පවුලේ ශ්‍රමිකයින්

| ප්‍රමාණවත් බවේ තරම | සමස්තයෙන් ප්‍රතිශතය (සංඛ්‍යාව=127) | | | | | |
|---|---|---|---|---|---|---|
| | රෝද 2 ට්‍රැක්ටර | රෝද 4 ට්‍රැක්ටර | කෘෂි රසායනික ඉසින යන්ත්‍ර | ධාන්‍ය වෙන් කරන යන්ත්‍රය (ඇඹුමෙක්) | ධාන්‍ය වෙන් කරන යන්ත්‍රය (සුනාමි) | අස්වනු නෙළන සංයුක්ත යන්ත්‍රය (භූතයා) |
| කිසිදු ආකාරයකින් ප්‍රමාණවත් නැත | 12.7 | 11.9 | 7.9 | 10.4 | 13.6 | 12.1 |
| මඳ වශයෙන් ප්‍රමාණවත් | 60.3 | 61.2 | 60.6 | 57.6 | 58.4 | 58.8 |
| ඉතා ප්‍රමාණවත් | 11.9 | 5.6 | 21.2 | 4.8 | 5.6 | 6.4 |
| අවශ්‍ය නැත | 15.1 | 21.4 | 10.2 | 27.2 | 22.4 | 22.6 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

## 6.2.6 බෝග රක්ෂණය

රජය විසින් කෘෂි රක්ෂණයක් ක්‍රියාත්මක කළ ද බොහෝ ගොවීහු ඒ සම්බන්ධයෙන් තෘප්තිමත් නො වේ. (Rambukwella *etal*, 2008). මෙම අධ්‍යයනයේ දත්තවලින් අනාවරණය කරන පරිදි, ප්‍රතිචාරීන්ගෙන් 81% කෘෂි රක්ෂණ පහසුකම් පිළිබඳ දැනුවත් භාවයෙන් තොර ය. පවතින කෘෂි රසායනය සහ එයට ප්‍රවේශවීමේ/එහි පහසුකම් ලබාගැනීමේ හැකියාව කිසිසේත් ම ප්‍රමාණවත් නො වන බව සමස්ත ප්‍රතිචාරීන්ගෙන් 73.8%ක් පැවසූ හ. එය පූර්ණ කාලීන ගොවීන් සම්බන්ධයෙන් එය 73% ද, අර්ධ කාලීන ගොවීන් සම්බන්ධයෙන් 74% ද, පවුලේ ශ්‍රමිකයින් සම්බන්ධයෙන් 59.2% තරම් ඉහළ අගයක් ගනු ලැබිණි. අනෙක් අතට ඉතා ප්‍රමාණවත් බව පැවසූ ප්‍රතිශතය අර්ධ කාලීන ගොවීන්ගෙන් 1.0% සිට පූර්ණ කාලීන ගොවීන්ගෙන් 5.4% දක්වා පරාසයක පැතිර පැවතිණි. ගොවිතැන අවදානම් සහිත කාර්යයක් වන හෙයින් බොහෝ තරුණයෝ කෘෂි රක්ෂණයේ අවශ්‍යතාව දැඩිව අවධාරණය කළ හ. මන්ද යත්, ස්වාභාවික උවදුරකින් හෝ රෝගයකින් ඔවුන්ගේ වගාවට හානි සිදු වුවහොත් හෝ විනාශ වුවහොත් එය ආවරණය කරගැනීම සඳහා පවතින එක ම ක්‍රමවේදය එය බැවිණි. එසේ වුව ද, දැනට පවතින කෘෂි රක්ෂණ ක්‍රමයේ අකාර්යක්ෂමතාව සහ ඵලදායී නො වන ස්වාභාවය නිසා ගොවීන්ගේ වගාවට වන හානි පූරණය කරගත නො හැකි ය. තරුණ ප්‍රතිචාරීන් දැක් වූ අන්දමට ඔවුන් ගොවිතැනින් ඉවතට තල්ලු කිරීම සඳහා මෙම තත්ත්වය දායක වේ.

වගු 6.10: කෘෂිකර්මාන්තයෙ හි යෙදෙන ආකාරය අනුව පවතින කෘෂි රක්ෂණයේ සහ එයට යොමුවීමේ ප්‍රමාණවත් බව

| ප්‍රමාණවත් බව | කෘෂිකර්මාන්තයේ නියැලෙන්නන්ගේ ප්‍රතිශතයක් ලෙස | | | සමස්ත ප්‍රතිචාරීන් ප්‍රතිශතයක් ලෙස (සංඛ්‍යාව=525) |
|---|---|---|---|---|
| | පූර්ණ කාලීන ගොවීන් (සංඛ්‍යාව=148) | අර්ධ කාලීන ගොවීන් (සංඛ්‍යාව=99) | පවුලේ ශ්‍රමිකයින් (සංඛ්‍යාව=127) | |
| කිසිදු ආකාරයකින් ප්‍රමාණවත් නැත | 73.0 | 59.2 | 74.0 | 73.8 |
| මඳ වශයෙන් ප්‍රමාණවත් | 18.3 | 34.6 | 20.4 | 12.3 |
| ඉතා ප්‍රමාණවත් | 5.4 | 1.0 | 1.6 | 2.7 |
| අවශ්‍ය නැත | 3.4 | 5.1 | 3.9 | 7.6 |


මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

### 6.2.7 කෘෂිකාර්මික යෙදවුම්

#### 6.2.7.1 පොහොර

රූ සටහන් 6.5න් නිරූපණය කෙරෙන අන්දමට, තම අවශ්‍යතා සඳහා පවතින සහ යොදා ගත හැකි පොහොර ප්‍රමාණය කිසිසේත් ප්‍රමාණවත් නො වන බව සඳහන් කළ ප්‍රතිශතය 4% කි. කෙසේ වුව ද, එය මඳ වශයෙන් ප්‍රමාණවත් බව පැවසූ ප්‍රතිශතය 68%ක් වූ අතර එය පූර්ණ කාලීන ගොවීන් සම්බන්ධයෙන් 6.2% ද, අර්ධ කාලීන ගොවීන් සම්බන්ධයෙන් 77.6% ද දක්වා වූ පරාසයක පැතිර පැවතිණි (රූ සටහන 6.6). ඉහත තොරතුරුවලින් අනාවරණය කෙරෙන අන්දමට කෘෂි ක්‍රියාකාරකම්වල නිරත ප්‍රතිචාරීන් පවතින පොහොර සහ ඒවා භාවිතා කිරීම සම්බන්ධයෙන් වන ගැටලුවලට මුහුණ දී සිටිය හ. සහනාධාර පොහොර බෙදාහැරීමේ ප්‍රමාදය (9.7%), වී හැර අනෙකුත් බෝග සඳහා පොහොර ලබා නොදීම[5] (12.5%), පොහොර මිල අධික වීම (17.2%) සහ ප්‍රමාණවත් අන්දමින් ලබා ගැනීමේ ගැටලුව (7.3%) එම තත්ත්වය පිටුපස විය.


**රූ සටහන 6.5: සමස්ත නියැදිය සඳහා පවතින පොහොර සහ ඒවා භාවිතා කිරීමේ ප්‍රමාණවත් බව**




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

[5] එළවළු ඇතුළු සියළු බෝග සඳහා සහනාධාර පොහොර ලබාදීමට රජය පියවර ගත්ත ද, ක්ෂේත්‍ර සමීක්ෂණය සිදු කරන අවස්ථාව වන විට එය ක්‍රියාත්මක වී නො තිබුණි.

රූ සටහන 6.6: කෘෂිකර්මාන්තයේ නියැලෙන ආකාරය අනුව පොහොර පවතින ප්‍රමාණය සහ භාවිතා කිරීමේ හැකියාවේ ප්‍රමාණවත් බව




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

### 6.2.7.2 බීජ/රෝපණ ද්‍රව්‍ය

මිල අධිකවීම (34.4%), ඉල්ලුම වැඩිවන අවස්ථාවල දී අවශ්‍ය ප්‍රමාණ ලබාගැනීමේ දුෂ්කරතා (26.7%), පහළ ගුණාත්මක තත්ත්වය (6.8%), ණයට ලබා ගැනීමේ දී වෙළෙන්දා වෙත ඉහළ පොළී ප්‍රතිශතයක් ගෙවීමට සිදුවීම (9.5%) සහ වෙළෙන්දා සමඟ ඇතිවන අවිධිමත් බැඳීම හේතුවෙන් ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ බීජ සහ රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීමේ ගැටලුවකට තමන් මුහුණ දෙන බව තරුණ ප්‍රතිචාරීහු පැවසූ හ. ණයට යෙදවුම් ලබාගැනීමෙන් වෙළෙන්දා සහ ගොවියා අතර ඇතිවන බැඳීම නිසා හෙට්ටු කිරීමකින් තොරව ම නිෂ්පාදන අදාළ වෙළෙන්දා වෙත අලෙවි කිරීමට සිදු කෙරෙන බලපෑම ගොවියාට හානිකර වේ. 6.11 වගුවේ දත්තවලින් පෙන්නුම් කෙරෙන අන්දමට, බීජ ලබා ගැනීමේ හැකියාව ප්‍රමාණවත් නො වන බව පැවසූ පිරිස (කිසිසේත් ප්‍රමාණවත් නො වන සහ මඳ වශයෙන් ප්‍රමාණවත් බව පැවසූ ප්‍රතිචාරීන්ගේ ප්‍රතිශත එකතුව) සමස්ත ප්‍රතිචාරීන්ගෙන් 77.2% කි. මෙය පූර්ණ කාලීන ගොවීන්ගෙන් 78.2% සහ අර්ධ කාලීන ගොවීන්ගෙන් 84.6%ක් තරම් ඉහළ අගයක් ගනු ලැබූ අතර පවුලේ ශ්‍රමිකයින් සම්බන්ධයෙන් එය 83.5% කි.

වගුව 6.11: කෘෂිකර්මාන්තයේ නියැලෙන ආකාරය අනුව බීජ ලබා ගැනීමේ හැකියාවේ ප්‍රමාණවත් බව

| ප්‍රමාණවත් බව | කෘෂිකර්මාන්තයේ නියැලෙන්නනගේ ප්‍රතිශතයක් ලෙස | | | සමස්ත ප්‍රතිචාරීන් ප්‍රතිශතයක් ලෙස (සංඛ්‍යාව=525) |
|---|---|---|---|---|
| | පූර්ණ කාලීන ගොවීන් (සංඛ්‍යාව=148) | අර්ධ කාලීන ගොවීන් (සංඛ්‍යාව=99) | පවුලේ ශ්‍රමිකයින් (සංඛ්‍යාව=127) | |
| කිසිදු ආකාරයකින් ප්‍රමාණවත් නැත | 12.9 | 12.2 | 8.7 | 10.9 |
| මඳ වශයෙන් ප්‍රමාණවත් | 65.3 | 72.4 | 74.8 | 66.3 |
| ඉතා ප්‍රමාණවත් | 17.7 | 12.3 | 13.3 | 13.9 |
| අවශ්‍ය නැත | 4.1 | 3.1 | 3.1 | 8.8 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

### 6.2.7.3 කෘමිනාශක/වල්නාශක

මිල අධිකවීම (32%), ණයට ලබාගැනීමේ දී ඉහළ පොළී අනුපාතයක් ගෙවීමට සිදුවීම (28.4%), ගුණාත්මක තත්ත්වයෙන් බාල වීම (26.2%) ආදී හේතු නිසා තරුණයින්ට කෘමිනාශක සහ වල්නාශක ලබාගැනීමේ දී දුෂ්කරතාවලට මුහුණදීමට සිදු වේ. සමස්ත ප්‍රතිචාරීන්ගෙන් 82.7%ක් (කිසිසේත් ප්‍රමාණවත් නොවන සහ මඳ වශයෙන් ප්‍රමාණවත් යන කාණ්ඩ දෙක ම ඇතුළත් ව) සඳහන් කරනු ලැබුවේ කෘමි නාශක සහ වල් නාශක ලබා ගැනීමේ හැකියාව ප්‍රමාණවත් නො වන බවයි (වගුව 6.12). වගු සටහන් 6.12න් පෙන්නුම් කෙරෙන අන්දමට, පවුලේ ශ්‍රමිකයින් සම්බන්ධයෙන් එය 83.5% සිට අර්ධ කාලීන ගොවීන් සම්බන්ධයෙන් 91.8% පරාසයක පැතිර පවතී.

වගුව 6.12: කෘෂිකර්මාන්තයේ නියැලෙන ආකාරය අනුව කෘමිනාශක/වල්නාශක ලබා ගැනීමේ හැකියාවේ ප්‍රමාණවත් බව

| ප්‍රමාණවත් බව | කෘෂිකර්මාන්තයේ නියැලෙන්නන්ගේ ප්‍රතිශතයක් ලෙස | | | සමස්ත ප්‍රතිචාරීන් ප්‍රතිශතයක් ලෙස (සංඛ්‍යාව=525) |
|---|---|---|---|---|
| | පූර්ණ කාලීන ගොවීන් (සංඛ්‍යාව=148) | අර්ධ කාලීන ගොවීන් (සංඛ්‍යාව=99) | පවුලේ ශ්‍රමිකයින් (සංඛ්‍යාව=127) | |
| කිසිදු ආකාරයකින් ප්‍රමාණවත් නැත | 14.2 | 16.5 | 11.8 | 13.2 |
| මඳ වශයෙන් ප්‍රමාණවත් | 73.6 | 75.3 | 71.7 | 69.5 |
| ඉතා ප්‍රමාණවත් | 8.1 | 5.1 | 12.6 | 8.0 |
| අවශ්‍ය නැත | 4.1 | 3.1 | 3.9 | 9.2 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

## 6.2.8 කෘෂිකාර්මික තොරතුරු

ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවල දී තරුණ ප්‍රතිචාරීන් අනාවරණය කළ අන්දමට, ලාභදායී අන්දමින් කෘෂිකර්මාන්තයේ නිරතවීමට ඔවුන් කැමැත්තක් දැක්වුව ද, නව තාක්ෂණික ක්‍රමවේද සහ ඒවා සපයන ආයතන, ව්‍යවසායන් සඳහා පුහුණුවීම් සහ අනෙකුත් පහසුකම් සහ අධි තාක්ෂණික කෘෂිකර්මාන්තය, මිල සහ විවිධ බෝග වගා කර ඇති භූමි වපසරිය ආදී අදාළ තොරතුරු ඔවුන් සතුව නො පවතී. එම නිසා, තොරතුරු හිඟය ඔවුන්ට බාධාවකි. වගු සටහන් 6.13න් පෙන්නුම් කෙරෙන අයුරින් තොරතුරු වෙත ප්‍රවේශවීමේ හැකියාව කිසිසේත් ප්‍රමාණවත් නො වන බව ප්‍රතිචාරීන්ගෙන් 14.1% ද, මඳ වශයෙන් ප්‍රමාණවත් බව 65.7% ද ප්‍රකාශ කළ හ. තොරතුරුවලට ප්‍රවේශවීමේ හැකියාව කිසිසේත් ප්‍රමාණවත් නො වන බව පැවසූ ප්‍රතිචාරීන් පවුලේ ශ්‍රමිකයින්ගෙන් 6.3% ද, අර්ධ කාලීන ගොවීන්ගෙන් 16.3% ද තරම් පරාසයක විචලනය විය. තව ද, තොරතුරු වෙත ප්‍රවේශවීමේ හැකියාව මඳ වශයෙන් ප්‍රමාණවත් බව පැවසූ ප්‍රතිශතය අර්ධ කාලීන ගොවින්ගෙන් 68.9% සිට පවුලේ ශ්‍රමිකයින්ගෙන් 79.5% දක්වා වූ පරාසයක විසිර පැවතිණි. එයට පරස්පරව තොරතුරු වෙත ප්‍රවේශ වීමේ හැකියාව ඉතා ප්‍රමාණවත් බව පැවසූ ප්‍රතිශතය 15.4%ක් වූ අතර එය අර්ධ කාලීන ගොවීන්ගෙන් 10.2% ද, පවුලේ ශ්‍රමිකයින්ගෙන් 13.4% වූ පරාසයක පැතිර පැවතිණි.

වගුව 6.13: කෘෂිකර්මාන්තයේ නියැලෙන ආකාරය අනුව තොරතුරු වෙත ප්‍රවේශවීමේ හැකියාවේ ප්‍රමාණවත් බව

| ප්‍රමාණවත් බව | කෘෂිකර්මාන්තයේ නියැලෙන්නන්ගේ ප්‍රතිශතයක් ලෙස | | | සමස්ත ප්‍රතිචාරීන්ගේ ප්‍රතිශතයක් ලෙස (සංඛ්‍යාව=525) |
|---|---|---|---|---|
| | පූර්ණ කාලීන ගොවීන් (සංඛ්‍යාව=148) | අර්ධ කාලීන ගොවීන් (සංඛ්‍යාව=99) | පවුලේ ශ්‍රමිකයින් (සංඛ්‍යාව=127) | |
| කිසිදු ආකාරයකින් ප්‍රමාණවත් නැත | 15.5 | 16.3 | 6.3 | 14.1 |
| මඳ වශයෙන් ප්‍රමාණවත් | 68.9 | 70.4 | 79.5 | 65.7 |
| ඉතා ප්‍රමාණවත් | 12.8 | 10.2 | 13.4 | 15.4 |
| අවශ්‍ය නැත | 2.7 | 3.1 | 0.8 | 4.8 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

## 6.2.9 වාරි පහසුකම්

කෘෂිකර්මාන්තය සඳහා අවශ්‍ය වාරි පහසුකම් සම්බන්ධයෙන් සලකන කළ ප්‍රතිචාරීන්ගෙන් 38.7%ක් පවතින වාරි පහසුකම් සහ ඒවා භාවිතා කිරීමේ හැකියාව ඉතා ප්‍රමාණවත් බව පැවසූ අතර එය කිසිසේත් ප්‍රමාණවත් නො වන බව 10.2%ක් පැවසූ හ (වගුව 6.14). සමස්ත ප්‍රතිචාරීන්ගෙන් 47.2%ක් වාරි පහසුකම්

මඳ වශයෙන් ප්‍රමාණවත් බව පැවසූ හ. වාරි පහසුකම් ප්‍රමාණවත් නො වන බව පැවසූ මඩකලපුව, කුරුණෑගල, හම්බන්තොට සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල ප්‍රතිචාරීන්ගෙන් බොහොමයක් එය තමන් ගොවිතැනින් ඉවතට තල්ලු කිරීම සඳහා බලපාන සාධකයක් ලෙස ක්‍රියාකරන බව පැවසූ හ. තම කෘෂි ක්‍රියාකාරකම් සඳහා වාරි පහසුකම් ප්‍රමාණවත් නො වන බව පැවසූ ප්‍රතිචාරීන් ප්‍රදේශයේ වාරි පහසුකම් නො වීම හෝ ඇල මාර්ග හෝ වැව් අබලන් වීම නිසා වාරි ජලය නිසි පරිදි බෙදා නො හැරීම (37.9%), වාරි ජල පහසුකම් නො වීම නිසා වගාවට අවශ්‍ය ළිං වලින් පොම්ප කිරීමට සිදුවීම (27.1%) ආදී හේතු රාශියක් ඉදිරිපත් කළ හ. වාරි පහසුකම් පැවතිය ද, ජලාශවල ජලය හිඟවීම සහ ජල සම්පත් නිසි පරිදි කළමනාකරණය නො කිරීම නිසි කාලයට හෝ ප්‍රමාණවත්ව ජලය සැපයීම වළක්වාලන හේතුවක් බව (20.8%) තරුණයන් විසින් ඉදිරිපත් කළ තවත් හේතුවකි. විශේෂයෙන් ම, මඩකලපුව දිස්ත්‍රික්කයේ සිත්තන්ඩි, මාවලයියාරු සහ අම්පාර දිස්ත්‍රික්කයේ හිම්දුරාව සහ දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශවල ඇතැම් බැම්, අමුණු සහ ඇල මාර්ග ගැටුම් පැවති කාලයේ දී පුපුරවා හරිනු ලැබූ ඇල මාර්ග සහ වාරි මාර්ග දිගු කාලයක් තිස්සේ ප්‍රතිසංස්කරණය නො කිරීමත් නිසා ගොවීහු වාරි ජලය පිළිබඳ ගැටලුවකට මුහුණ දී සිටිති.

කෘෂිකර්මාන්තයේ නියැලෙන ආකාරය අනුව වාරි පහසුකම් සම්බන්ධයෙන් තරුණයින්ගේ ආකල්පවල වෙනසක් දැකිය හැකි ය. වාරි පහසුකම් කිසිසේත් ප්‍රමාණවත් නොවන බව සහ මඳ වශයෙන් ප්‍රමාණවත් බව පැවසුවන්ගේ මුළු ප්‍රතිශත එකතුව පූර්ණ කාලීන ගොවීන්ගෙන් 56.1% සිට අර්ධ කාලීන ගොවීන්ගෙන් 67.3% ද, දක්වා වූ පරාසයක පැතිර පැවතිණි. එම නිසා, වාරි ජල පහසුකම්වල හිඟය තරුණයින් කෘෂිකර්මාන්තයෙන් ඉවතට තල්ලු කිරීමට බලපාන සාධකයක් ලෙස තර්ක කළ හැකි ය.

වගුව 6.14: වාරි පහසුකම්වල ප්‍රමාණවත් බව

| ප්‍රමාණවත් බව | කෘෂිකර්මාන්තයේ නියැලෙන්නන්ගේ ප්‍රතිශතයක් ලෙස | | | සමස්ත ප්‍රතිචාරීන්ගේ ප්‍රතිශතයක් ලෙස (සංඛ්‍යාව=525) |
|---|---|---|---|---|
| | පූර්ණ කාලීන ගොවීන් (සංඛ්‍යාව=148) | අර්ධ කාලීන ගොවීන් (සංඛ්‍යාව=99) | පවුලේ ශ්‍රමිකයින් (සංඛ්‍යාව=127) | |
| කිසිදු ආකාරයකින් ප්‍රමාණවත් නැත | 9.5 | 16.3 | 7.1 | 10.2 |
| මඳ වශයෙන් ප්‍රමාණවත් | 46.6 | 51.0 | 59.0 | 47.2 |
| ඉතා ප්‍රමාණවත් | 40.6 | 31.6 | 33.8 | 38.7 |
| අවශ්‍ය නැත | 3.4 | 1.0 | 0.0 | 3.8 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

### 6.2.10 සමාජ වටිනාකම්

බොහෝ තරුණයින් සහ ගොවි නියෝජිතයින් විස්තර කළ අන්දමට, ගොවීන් රටට ආහාර නිෂ්පාදනය කළ ද සමාජයේ හෝ විධිමත් ආයතන පද්ධතියෙන් ඔවුන්ට නිසි පරිදි පිළිගැනීමක් නො ලැබේ. ඔවුන් විස්තර කළ අන්දමට "මඩ සෝදා ගත් කළ ගොවියා රජකමටත් සුදුසු ය" යන සිංහල කියමනෙන් ගොවීන්ගේ ප්‍රෞඩත්වය සහ වැදගත්කම විස්තර කෙරුණ ද වර්තමාන සමාජ සන්දර්භය තුළ මෙන් ම නිලබල තාන්ත්‍රිකයින් ද ගොවීන් බල රහිත, දුබල, අන්/අයගෙන් යැපෙන්නෙකුගේ තත්ත්වයෙ හි ලා සලකනු ලබයි. තරුණයින්ට අනුව, යමෙකු ඔහුගේ/ඇයගේ වෘත්තීය ලෙස කෘෂිකර්මාන්තය තෝරා ගෙන එහි නියැලෙන අතර විධිමත් ආයතනයකට ගිය විට (රාජ්‍ය හෝ පෞද්ගලික භේදයකින් තොරව) නිලධාරීන්ට වඩා උසස් අධ්‍යාපන මට්ටමක් සහ ආදායමක් ගොවීන්ට පැවතිය ද, බොහෝ නිලධාරීන් විසින් ඔවුන්ට සලකනු ලබන්නේ ද්විතියික මට්ටමේ පුරවැසියන් හෝ අතවැසියන් පිරිසක් ලෙස ය.

ඇතැම් තරුණ ප්‍රතිචාරීන් සඳහන් කළ අන්දමට, රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තයේ නියැලීම ඇතැම් අවස්ථාවල විවාහය සඳහා නුසුදුසු කමකි. එවැනි අවස්ථාවල ස්ථිර මාසික ආදායම සහ සමාජ ආරක්ෂණය හේතුවෙන් කාර්යාල කාර්ය සහායක හෝ ආබාධිත සෙබලෙක්/සිවිල් ආරක්ෂක බලකා සාමාජිකයෙක් (ග්‍රාමාරක්ෂක) හට එයට වඩා යහපත් ලෙස සලකනු ලබයි. එම නිසා, තමන් සතුව ඉඩම් සහ අනෙකුත් පහසුකම් පැවතිය ද, රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තයේ යෙදීමට වඩා "යහපත් රැකියාවක්" සෙවීමට තරුණයෝ නැඹුරු වී ඇත්තා හ.

යෝග්‍ය විශ්‍රාම වැටුප් හෝ සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් ගොවීන්ට නොමැති හෙයින් බොහෝ විට ඔවුන් අවදානම් සහිත තත්ත්වයන්ට පත්වීමේ ඉඩකඩක් පවතී. ඔවුන්ට ප්‍රමාණවත් තරම් ඉඩම් නොමැති විට හෝ කුඩා ඉඩම් කැබලිවල අධි තාක්ෂණික ක්‍රමවේද යොදා ගනිමින් වගා කටයුතු සිදු නො කරන විට මෙම තත්ත්වය වඩාත් සංකීර්ණ වේ. එම නිසා, ඔවුන්ට ඉඩම් පැවතිය ද ද්විතීයික ආදායම් මාර්ගයක් ලෙස ඒවා වගා කිරීම වඩා යෝග්‍ය බව ඔවුන්ගේ අදහසයි.

## 6.3 අනෙකුත් ආයතනික යාන්ත්‍රණ

මෙරට බලයට පත් වූ සියලු ආණ්ඩු සහ පළාත් සභා සුළු පරිමාණ කෘෂිකර්මාන්තයෙ හි තරුණ සහභාගීත්වය ඉහළ නැංවීම සඳහා යම් යම් පියවර ගෙන ඇත. රජය විසින් වරින් වර තරුණ ගොවි සංවිධාන ආදිය පිහිටුවමින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කොට තිබේ. කෙසේ වුව ද, මෙම වැඩසටහන්වල යම් ශක්තීන් මෙන් ම දුර්වලතා ද පවතී. සිද්ධි අධ්‍යයනය 6.2 සහ 6.3 මෙම ප්‍රපංච පැහැදිළි කරනු ලබයි.

**සිද්ධි අධ්‍යයන 6.2: රනෝරාව තරුණ ගොවි සමාජය**

නොච්චියාගම, රනෝරාව ප්‍රදේශයේ තරුණ/තරුණියන්ගේ සහභාගීත්වය සහිතව 1992 දී රනෝරාව තරුණ ගොවි සමාජය පිහිටුවන ලදී, පිහිටුවා වසර 6ක් පමණක් එය ක්‍රියාත්මක වී ඇත. එහි දුර්වල ක්‍රියාකාරීත්වය නිසා ආරම්භක සාමාජික/සාමාජිකාවන් වරින් වර සංවිධානය අත්හැර ගොස් තිබේ. 2007 වසරේ දී සාමාජික/සාමාජිකාවන්ගේ සහභාගීත්වයෙන් සංවිධානය නැවත පිහිටුවා ඇත.

අවුරුදු 14-30 අතර සාමාජික/සාමාජිකාවන් පහළොස් දෙනෙකුගෙන් වර්තමාන සංවිධානය සමන්විත වේ. රනෝරාව තරුණ ගොවි සමාජයේ සාමාජික/සාමාජිකාවන් වයස අනුව අවු: 14-18, අවු: 18-25 සහ අවු: 25-30 යන කාණ්ඩ තුනට බෙදා දැක්විය හැකි ය. නීතියක් වශයෙන් නිලධාරී මණ්ඩලයට පත්වන්නේ අවු: 18-25 අතර කාණ්ඩයේ අය පමණි. සංවිධානය පිහිටුවන අවස්ථාවේ දී සංවිධානයේ සාමාජිකත්වය ලැබුවන් අතර පුරුෂයින් ද වූ නමුත් මේ වන විට සංවිධානය තරුණියන්ගෙන් පමණක් සැදුම් ලැබ ඇත. අළුතින් පිහිටුවන ලද සංවිධානයේ සාමාජිකත්වය ලද තරුණියන් වෙනත් රැකියා ලැබීම නිසා සංවිධානය හැර ගොස් තිබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් මේ වන විට තරුණියෝ 15ක් පමණක් සංවිධානයේ තවදුරටත් රැඳී සිටිති.

සංවිධානයේ සාමාජික ගාස්තුව රුපියල් 10ක් වන අතර යම් සාමාජිකයෙක් මාසික රැස්වීමට නො පැමිණියේනම් එක් නො පැමිණෙන අවස්ථාවක් සඳහා රුපියල් 25/= බැගින් සංවිධානයට ගෙවිය යුතු ය. පිළිගත හැකි කරුණක් මත රැස්වීමට නො පැමිණියේ නම් එකී දඩ මුදල අය නො කෙරේ. සාමාන්‍යයෙන්, සංවිධානයේ සභාපතිගේ නිවසේ රැස්වීම් පවත්වනු ලබයි.

අවශ්‍ය වුවහොත් මාසික රැස්වීම සඳහා සහභාගීවීමට කෘෂිකර්ම උපදේශකට ඇරයුම් කරයි. වර්තමානයේ සංවිධානයේ අරමුදල රුපියල් 36,000ක් වන අතර වගා කටයුතු සිදු කෙරෙන කාලවල එම මුදලින් සාමාජිකයින්ට මාසිකව සියයට පහේ පොළියට ණය ලබා දේ. රුපියල් 2,900/= උපරිම ණය සීමාව වේ. ණය මුදල් ලබාගන්නා සාමාජිකයින් වාරික තුනකින් පොළිය ද සමග ණය මුදල ගෙවිය යුතු ය. තෙ මසක් ඇතුළත ණය මුදල ගෙවීමට යම් සාමාජිකයෙකු අපොහොසත් වුවහොත් පොළිය සියයට 10 දක්වා ඉහළ දමන අතර මාස 6ක් ඇතුළත ණය මුදල ගෙවීමට ඔවුහු බැඳී සිටිති. කෙසේ වුව ද, නොච්චියාගම මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන රනෝරාව තරුණ ගොවි සමාජයේ වර්තමාන ගිණුම් ශේෂය රුපියල් 4000ක් පමණි.

රනෝරාව තරුණ ගොවි සමාජයේ සාමාජිකයෝ, සාමාජිකයින් ලෙස යම් යම් ප්‍රතිලාභ අත්කරගෙන ඇත්තා හ. 2008 වසරේ දී සංවිධානයේ සියලු සාමාජිකයින් හට වගාව සඳහා උඳු බීජ කිලෝ ග්‍රෑම් 01 බැගින් ලබා දී ඇත. 2007 වසරේ දී අක්කරයක බඩඉරිඟු වගාව සඳහා සහනදායී මිලට අවශ්‍ය පොහොර ඔවුන්ට ලබා දී තිබේ: වී වගාවේ යෙදෙන සාමාජිකයින් හය දෙනෙකුට, 2011 දෙසැම්බර් මස වී තම්බන බැරල් නොමිලේ ලබා දී ඇත. කෙසේ වුව ද, එම බැරල් භාවිතා කර වී තම්බා ගන්නා ආකාරය සම්බන්ධයෙන් පුහුණුව මේ වන විට ද (මාස 05 ආසන්න කාලයක් ගත වී ද) ලබා දී නොමැත. මෙම ප්‍රතිලාභවලට අමතරව තෝරාගත් සාමාජිකයින්ට මහඉලුප්පල්ලම සහ ගන්නෝරුව ගොවිපළවල්වල දී කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සහ ලොකු ළූණු වගාව සම්බන්ධයෙන් පුහුණුවීම් ලබා දී ඇත. කෘෂිකර්ම උපදේශක වරින් වර ක්ෂේත්‍රයට පැමිණ පුහුණුවීම්වලින් ලබාගත් දැනුම නිසි පරිදි යොදවා ගන්නේදැයි පසු විපරම් කරයි. කෙසේ වුව ද, කෘෂිකර්ම උපදේශකට විශාල ප්‍රදේශයක් ආවරණය කිරීමට ඇති හෙයින් ඇය නිතර නො පැමිණේ.

තව ද, 2007 වසරේ දී ඔවුහු පසු අස්වනු තාක්ෂණ ආයතන වෙතින් ආහාර සැකසීම පිළිබඳ පුහුණුව ලබා ඇත. මෙම පුහුණුව යටතේ ස්වාභාවික පලතුරු බීම සහ බිස්කට් නිෂ්පාදනයත්, ඒවා ඇසුරුම්කරණය සහ ගබඩාකරණයත් පිළිබඳ පුහුණු කොට ඇත. මෙම පුහුණුව අවසාන වූ විගස, ඇතැම් සාමාජිකාවෝ බිස්කට් නිෂ්පාදනය කොට ඇසුරුම් කර අසල්වැසියන්ට අලෙවි කිරීම සිදු කර ඇත්තා හ. සහල් පිටි යොදා ගනිමින් එම බිස්කට් නිෂ්පාදනය කළ සාමාජිකාවන් එක් පැකැට්ටුවකින් රුපියල් 20ක ලාභයක් ලැබ ඇත. කෙසේ වුව ද, අස්වනු නෙළීමෙන් පසු කාලය වැනි ඇතැම් කාලපරිච්ඡේදවල ඔවුන්ගේ අසල්වැසියන්ට ඒවා මිලට ගැනීමට මුදල් පැවති නිසා අලෙවි කර ගැනීමේ හැකියාව පැවතිය ද බොහෝ අවස්ථාවල එම නිෂ්පාදන සඳහා නිසි වෙළඳපොළක් නොමැති හෙයින් නිෂ්පාදන අලෙවි කර ගැනීම දුෂ්කර කාර්යයක් බවට පත්ව තිබේ. කෙසේ වුව ද, වගා කරන සහ අස්වනු නෙළන කාලය තුළ එම නිෂ්පාදන කාර්යයන් හි ඔවුන් නිරත නොවේ. එම නිසා, වගා කරන සහ අස්වනු නෙළන කාලයෙන් පසු ඇතැම් සාමාජිකාවන්ට ඔවුන් පුහුණුව ලැබූ බිස්කට් සහ අනෙකුත් නිෂ්පාදන නිපදවීමේ ක්‍රමවේදය අමතකව ගොස් ඇත.

**සිද්ධි අධ්‍යයනය 6.2: රනෝරාව තරුණ ගොවි සමාජය (ඉතිරි කොටස)**

කෘෂිකර්මය සම්බන්ධයෙන් තරුණ ගොවීන්ගේ දැනුම මැන බැලීම සඳහා සකස් කර ඇති "ගොවි පැණ වැඩසටහනට" සහභාගී වීම ගොවි සංවිධානයේ තවත් ජනප්‍රිය ක්‍රියාකාරකමකි. මෙම වැඩසටහනේ දී වෙනත් ගොවි සංවිධාන නියෝජනය කරන තරුණ ගොවීන්/ගෙවිළියන් මුණගැසීමට ඔවුන්ට අවස්ථාව හිමිවන්නාක් සේ ම අත්දැකීම් හුවමාරුවට ද අවස්ථාව සැලසේ. කෙසේ වුව ද, මෙම වැඩසටහනට සහභාගීවීමට සාමාජිකාවන් ඉමහත් උනන්දුවෙන් බලා සිටිය ද, බොහෝ අවස්ථාවල දී වැඩසටහන පැවැත්වෙන බවට ඔවුන් දැනුවත් කෙරෙන්නේ වැඩසටහන පැවැත්වෙන දිනට පෙර දිනයේ ය.

අළු පුහුල්, වට්ටක්කා, අමු මිරිස්, බඩඉරිඟු සහ කව්පි රනෝරාව ප්‍රදේශයේ වගා කරන ප්‍රධාන බෝගයන් ය. ඔවුන්ගේ කෘෂි නිෂ්පාදන සඳහා ඔවුන්ට නිසි අලෙවි පහසුකම් නොමැත. අනෙක් අතට, නිෂ්පාදන පිරිවැය ඉහළයාම නිසා අස්වැන්නෙන් ලබන ලාභය ද අඩු වී ඇත. සංවිධානයේ සාමාජිකයන් තම අවම අත්දැකීම් සමඟ වගා කටයුතු සිදු කරන හෙයින් නිසි ක්‍රමවේද භාවිතා කොට වගාවන් සිදු නො කරයි. එය ඔවුන්ගේ අස්වැන්නේ ගුණාත්මක තත්ත්වය කෙරෙහි බලපානු ලබයි. කිසිදු ස්ථානයකින් ප්‍රමාණවත් දැනුමක් ලබාගැනීමට අපොහොසත් වීම හේතුවෙන් දැනට පවතින කෘෂිකාර්මික දැනුම බොහෝ සාමාජිකයින්ට කෘෂිකර්මාන්තය ජීවනෝපාය ක්‍රියාකාරකමක් වශයෙන් සංවර්ධනය කිරීම සඳහා ප්‍රමාණවත් නොවේ.

වඩා යෝග්‍ය අයුරින් වගා කටයුතුවල නියැලීම සඳහා අවශ්‍ය නිසි උපදෙස් සහ පුහුණුවීම් රනෝරාව තරුණ ගොවි සංවිධානයේ සාමාජිකාවෝ අපේක්ෂා කරති. තව ද, තරුණ ගොවීන් වශයෙන්, මෙතෙක් ඔවුන්ට නො ලැබුණු සාර්ථක ගොවීන් වීමට අවශ්‍ය නව දැනුම, නව බෝග ප්‍රභේද, නව වගා ක්‍රමවේද ලබා ගැනීමේ අපේක්ෂාවෙන් පසු වේ.

**සිද්ධි අධ්‍යයන 6.3: මොණරාගල දිස්ත්‍රික්කයේ ගැමුණු තරුණ ගොවි සමාජය**

2002 වසරේ දී පිහිටුවන ලද ගැමුණු තරුණ ගොවි සමාජයේ වත්මන් සාමාජික සංඛ්‍යාව 25 කි. කෙසේ වුව ද, සමස්ත සාමාජිකත්වයෙන්, සාමාජිකයින් 18ක් පමණක් වර්තමානයේ ක්‍රියාකාරීව සහභාගී වේ. ප්‍රදේශයේ වෙසෙන අවුරුදු 15-30 අතර තරුණ/තරුණියන්ට මෙහි සාමාජිකත්වය ලබාගත හැකි ය. ගැමුණු තරුණ ගොවි සමාජය 2010 වසරේ ඌව පළාතේ හොඳ ම තරුණ ගොවි සමාජය ලෙස ත්‍යාග ලබා ඇත. මෙම ජයග්‍රහණය සඳහා හේතු වී ඇත්තේ ඌව පළාතේ ගොවි පැණ වැඩසටහනින් දෙවන ස්ථානය දිනා ගැනීමත්, පළාතේ අනෙකුත් තරුණ ගොවි සමාජවලට වඩා පොදු සහ සුබසාධන කටයුතුවල නියැලීමත් ය.

සංවිධානයේ එක් ප්‍රධාන කාර්යයක් වන්නේ කෘෂිකර්ම උපදේශක හරහා සංවිධානයේ සාමාජිකයින්ට මෙන් ම වැසිහිටියන්ට බීජ බෙදා දීම ය. ඒ අනුව, සංවිධානයේ සාමාජිකයින් වෙත මිරිස්, උඳු , මුං ඇට සහ කව්පි බීජ බෙදා දී තිබුණි. මෙයට අමතරව, සංවිධානයේ රටකජු වගා කළ ගොවීන්ට බීජ සඳහා වැය වූ මුදලින් 50%ක දායකත්වයක් ලබා දී තිබුණි.

තරුණ ගොවි සමාජයේ සාමාජිකයින්ට කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳ පුහුණුව තෙ වරක් ලබා දී තිබේ. කෙසේ වුව ද ඔවුහු ව්‍යාපාරයක් ලෙස කාබනික පොහොර නිෂ්පාදනයේ නිරත නො වෙති. මෙයට අමතරව, තරුණ ගොවි සංවිධානයේ සාමාජික සාමාජිකාවෝ මාර්ග සහ විහාරස්ථාන සංවර්ධන කටයුතු සහ පිරිසිදු කිරීම් සඳහා වන ශ්‍රමදාන සංවිධානය කිරීමත් ඒවාට සහභාගීවීමත් සිදු කරති.

ඉදහිට ක්ෂේත්‍රයට පැමිණෙන කෘෂිකර්ම උපදේශක යම් යම් පුහුණුවීම් තරුණ ගොවි සමාජ සාමාජික/සාමාජිකාවන්ට ලබා දේ. එයට අමතරව, කෘෂිකර්මයට සම්බන්ධ ප්‍රමාණවත් පුහුණුවක් ඔවුන්ට නො ලැබේ. තව ද, කෘෂි නිෂ්පාදන කර්මාන්ත/ව්‍යාපාර සඳහා වන ඵලදායී පුහුණුවීම් ඔවුන් අපේක්ෂා කළ ද එවන් පුහුණුවීම් ඔවුන් කිසිදා ලැබී නොමැත. තම නිෂ්පාදන සඳහා නිසි වෙළඳපොළක් සොයා ගැනීමත්, විශ්වාසවන්ත ස්ථානයකින් ගුණාත්මක තත්ත්වයෙන් උසස් බීජ සපයා ගැනීමත් ඔවුන් මුහුණ දෙන ප්‍රධාන අභියෝග වේ.

පුස්තකාලය
LIBRARY

## 6.4 සමාප්තිය

තරුණ ප්‍රතිචාරිහු අනාවරණය කළ අන්දමට, ඔවුහු පවතින අලෙවි පහසුකම්, කෘෂිකාර්මික තොරතුරු, වගාකළ හැකි ඉඩම්, බෝග රක්ෂණය, ව්‍යාප්ති සේවාව සහ ඒවා භාවිතා කිරීමේ හැකියාව සම්බන්ධ ගැටලු, ණය සහ මුල්‍ය පහසුකම් ලබාගැනීමේ ගැටලු, තම නිෂ්පාදන සඳහා ලැබෙන අඩු මට්ටමේ ගොවිපළ මිල, පුහුණු පහසුකම් නොවීම හෝ නව තාක්ෂණය සහ පහසුකම් වෙත ප්‍රවේශවීමට පවතින බාධක, සීමිත වාරි ජල පහසුකම්, අධික මිලෙන් යුතු සහ ගුණාත්මක තත්ත්වයෙන් අඩු බීජ සහ කෘෂි රසායනික, කෘෂි යන්ත්‍රෝපකරණ කුලියට ගැනීමේ දී ගෙවීමට සිදු වන ඉහළ පිරිවැය යන ගැටලුවලට මුහුණ දෙති. තව ද, යෝග්‍ය සමාජ ආරක්ෂණ ක්‍රමයක් හෝ විශ්‍රාම වැටුප් ක්‍රමයක් නො වීම, කෘෂිකර්මයට සම්බන්ධ රැකියා සඳහා සමාජ පිළිගැනීමක් නො වීම හෝ අඩු සමාජ පිළිගැනීමක් පැවතීම තරුණයින් කෘෂිකර්මාන්තයෙන් ඉවතට තල්ලු කිරීම සඳහා බලපාන සාධක වේ.

## සත් වැනි පරිච්ඡේදය

## කෘෂිකර්මාන්තයෙ හි තරුණ සහභාගීත්වය වර්ධනය සඳහා වන යෝජනා

### 7.1 හැඳින්වීම

මෙම පරිච්ඡේදයෙන් ශ්‍රී ලංකාවේ සුළු පරිමාණ කෘෂිකර්මාන්තයට තරුණ සහභාගීත්වය වර්ධනය කිරීම සඳහා තරුණ ප්‍රතිචාරින් විසින් ඉදිරිපත් කළ යෝජනා සාකච්ඡා කෙරේ. එයට අමතරව, සුළු පරිමාණ කෘෂිකර්මාන්තයේ තරුණ සහභාගීත්වය වර්ධනය සඳහා ගොවි සංවිධාන නියෝජිතයින් ඉදිරිපත් කළ කරුණු පැහැදිළි කෙරේ.

### 7.2 බෝග වගාව සඳහා තරුණ සහභාගීත්වය වර්ධනයට වූ යෝජනා

වගු සටහන් 7.1න් පෙන්නුම් කරන අන්දමට, ප්‍රතිචාරින් යෝජනා රාශියක් ඉදිරිපත් කර ඇත. ඔවුන් විසින් යෝජනා රාශියක් ඉදිරිපත් කර ඇතත් ඉන් බොහොමයක් ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි ගැටලුව හා සම්බන්ධ වී තිබේ. ප්‍රතිචාරින්ගෙන් 43% ආසන්න ප්‍රතිශතයක් කෘෂි නිෂ්පාදන සඳහා සාධාරණ/ප්‍රමාණවත් මිලක් ලබාදීමට කටයුතු කළ යුතු බව පැවසූ අතර ගොවිතැන වෙනුවෙන් සිදු කරන වියදම හෝ දැඩි මහන්සිය වෙනුවෙන් ප්‍රතිලාභ ලබාදීමේ ක්‍රමවේදයක් සඳහා රජය පියවර ගත යුතු බව ප්‍රතිචාරින්ගෙන් 15%ගේ යෝජනාව විය. තව ද, විෂයය සම්බන්ධයෙන් වගකීම දරන අමාත්‍යාංශ විසින් ග්‍රාමීය හෝ ප්‍රාදේශීය මට්ටමින් අලෙවි පහසුකම් සහතික කිරීම සඳහා පියවර ගත යුතු බව ප්‍රතිචාරින්ගෙන් 29.5%ක් පැවසූ හ. දිස්ත්‍රික්කයේ වගා කරන ප්‍රධාන බෝග සැලකිල්ලට ගනිමින් ආහාර සැකසීමේ කර්මාන්තශාලා පිහිටුවීමට පියවර ගත යුතු බවට එම පිරිසේ ඇතැමෙක් අදහස් පළකළ හ. පර්යේෂණ කණ්ඩායම විසින් අධ්‍යයන ප්‍රදේශවල ගොවි සංවිධාන නියෝජිතයින් සමග සිදු කළ සාකච්ඡාවල දී ගොවි නියෝජිතයින් විසින් ද එම අදහස තහවුරු කරනු ලැබිණි. තමන්ට ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුතු යෙදවුම්; විශේෂයෙන් ම, කෘමි නාශක, වල් නාශක සහ වැඩි දියුණු කරන ලද බීජ ප්‍රභේද ලබා ගැනීමට නො හැකි බවට තරුණ නියෝජිතයින්ගෙන් බොහෝ දෙනෙක් චෝදනා කළ හ.

තවදුරටත් ඔවුන් විස්තර කළ පරිදි බීජ පැකැට්ටුවේ හෝ ඇසුරුමෙ හි උපරිම සිල්ලර මිල මුද්‍රණය කොට තිබුණ ද පැළ සිටුවන කාල පරිච්ඡේදයේ හෝ බීජ සඳහා වැඩි ඉල්ලුමක් පවතින කාලවල දී උපරිම සිල්ලර මිලට වඩා වැඩි මිලක් ගෙවීමට සිදු වේ. බොහෝ ප්‍රතිචාරින් තවදුරටත් සඳහන් කරනු ලැබුවේ, අත්පිට මුදලට කෘෂි රසායනික මිලට ගැනීමේ දී වෙළෙන්දා විසින් වට්ටම් ලබාදෙන නමුත් ණයට ලබා ගැනීමේ දී එවැන්නක් හිමි නොවන බවයි. එයට අමතරව, ඔවුන් ණය මුදල පියවීමේ දී ඒ සඳහා පොළිය වශයෙන් කිසියම් මුදලක් වෙළෙන්දා හට ගෙවීමට ගොවියාට සිදු වේ. මෙකී ගැටලු මත පදනම්ව, අලෙවිකරණ ගැටලුව සම්බන්ධයෙන් වෙනත් යෝජනා කිහිපයක් එනම්, ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුතු යෙදවුම් (බීජ හා රෝපණ ද්‍රව්‍ය සහ කෘෂි රසායනික) වෙළඳපොළෙ හි පැවතීම සහතික කිරීම (29.5%), බදුවලින් නිදහස්

කිරීමේ කාලපරිච්ඡේදයක් සඳහා අවස්ථාව සැලසීම සහ නීති සහ රෙගුලාසි සරල කිරීම (2.5%) මෙන් ම යෙදවුම් මිල අඩු කිරීමට කටයුතු කිරීම (2.5%) සම්බන්ධයෙන් රජය නිසි ක්‍රියාමාර්ග ගැනීම කළ යුතු බව එම ප්‍රතිචාරිහු විසින් සඳහන් කළ හ.

ඉහත පරිච්ඡේදයෙ හි විස්තර කළ පරිදි, තරුණයින් කෘෂිකර්මාන්තයෙන් ඉවත් කිරීමට බලපාන ප්‍රධාන ම සාධකය අලෙවි ගැටලුව බව ගොවි සංවිධාන නියෝජිතයෝ හඳුනා ගත් හ. එම නිසා, අලෙවි ගැටලුව විසඳීම තුළින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයට තරුණ සහභාගීත්වය වර්ධනය කිරීමෙහි ලා දායක වන ක්‍රියාමාර්ග ගණනාවක් ඔවුහු යෝජනා කළ හ. සමුපකාර සහ ගොවි සංවිධාන අතර සම්බන්ධ ගොඩ නැංවීම, පසු අස්වනු තාක්ෂණය සම්බන්ධ දැනුම ලබාදීම, සියළු බෝග සඳහා සහතික මිලක් නියම කිරීම, කෘෂි යෙදවුම් සඳහා පාලන මිලක් ක්‍රියාත්මක කිරීම, ප්‍රාදේශීය මට්ටමින් ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීම, අස්වනු නෙළන සමයේ දී නිෂ්පාදන ආනයනය සීමා කිරීම/තහනම් කිරීම, ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුතු රෝපණ ද්‍රව්‍ය වෙළඳපොළෙ හි පැවතීමට කටයුතු කිරීම, අතිරික්ත ආහාර ද්‍රව්‍ය අපනයනයට ව්‍යාපෘති සකසා ක්‍රියාත්මක කිරීම සහ එම වැඩසටහන ගම් මට්ටමේ ගොවි සංවිධාන සමඟ සම්බන්ධ කිරීම, නිසි සැලැස්මක් අනුව වගා කිරීම, වෙළඳපොළෙ හි පවතින අතිරේක බීජ සැපයුම පාලනය කිරීම සහ ප්‍රදේශයේ අවශ්‍යතාව අනුව ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානවල ණය පහසුකම් (යෙදවුම් ණය) වර්ධනය කිරීම එම යෝජනා විය.

අලෙවිකරණ ගැටලුව විසඳීම සඳහා වූ යෝජනාවලට අමතරව, පුහුණු අවශ්‍යතා සම්බන්ධයෙන් යෝජනා ගණනාවක් තරුණ/තරුණයෝ ඉදිරිපත් කළ හ. කෘෂිකර්මාන්තය හා බැඳුණු රැකියා, ව්‍යවසායන් සහ ව්‍යාපාර අවස්ථා රාශියක් පැවතිය ද, තමන් දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන හෙයින් ඒ සම්බන්ධයෙන් අදාළ තොරතුරු ලබාගැනීම දුෂ්කර බවත්, තමන්ට ඒ සම්බන්ධයෙන් පැහැදිළි අදහසක් නොමැති බවත්, ප්‍රතිචාරීන්ගෙන් 1/4 පමණ පැවසු හ. එම නිසා, රජය විසින් තරුණයින් සඳහා වන කෘෂිකාර්මික අංශයේ රැකියා සහ ව්‍යාපාරික අවස්ථා සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විය යුතු බවට ප්‍රතිචාරීන්ගෙන් 26.5%ක් යෝජනා කළ හ. අලෙවිකරණ පහසුකම් ණය සහ අනෙකුත් පහසුකම් පිළිබඳ තොරතුරු ද එයට ඇතුළත් විය යුතු ය.

තරුණ ප්‍රතිචාරීන් මෙන් ම ගොවි සංවිධාන නියෝජිතයින් ද සඳහන් කළ අන්දමට ව්‍යාප්ති සේවා පහසුකම් හිඟයකට ඔවුහු මුහුණ දී ඇත. එම නිසා, තරුණයින් සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම් සැයි ද ඇතුළත් වූ නව කෘෂි තාක්ෂණ පිළිබඳ පුහුණුවීම් ලබා දිය යුතු බවට ප්‍රතිචාරීන්ගෙන් 21.4%ක් යෝජනා කළ හ. ප්‍රතිචාරීන්ගෙන් තවත් 21.4%ක්, රජය පළාත් සභා හෝ වෙනත් අදාළ ආයතන විසින් කාබනික ගොවිතැන ද ඇතුළත් වන අයුරින් පුහුණුවීම් පැවැත්වීමට අවශ්‍ය පියවර ගත යුතු බවට යෝජනා කළ හ. මොවුන්ගෙන් බොහෝ දෙනෙකු සඳහන් කළේ මෙවැනි පුහුණු වැඩසටහන් ග්‍රාමීය මට්ටමේ පුහුණු සැයි ලෙස පැවැත්වීම වඩාත් යෝග්‍ය බවයි. රජය හෝ වෙනත් අදාළ ආයතන විසින් වගා ආදර්ශන සහ විශිෂ්ට ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීමට අවස්ථාව සලසා දීම තුළින් තරුණයින් දිරිගැන්විය යුතු බව ප්‍රතිචාරීන්ගෙන් තවත් 7.9% ක් ප්‍රකාශ කළ හ. රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ ගොවිපළවල් නැරඹීම සඳහා

සංවිධානය කරනු ලබන අධ්‍යාපනික චාරිකා තුළින් මෙය ඉටු කළ හැකි ය. තරුණයින්ට කළමනාකරණ පුහුණුව, විශේෂයෙන් ම ගොවිපළ කළමනාකරණය සම්බන්ධයෙන් පුහුණුවීම් ලබාදීම තුළින් තරුණ සහභාගීත්වය වර්ධනය කළ හැකි බව තරුණයින්ගෙන් 7%ක් සඳහන් කළ හ.

ගොවි සංවිධානවල නියෝජිතයින් පෙන්වා දුන් අන්දමට, ව්‍යාප්ති සේවාව සම්බන්ධයෙන් බැරෑරුම් ප්‍රශ්නවලට ගොවීහු මුහුණ දෙති. මෙයට ඉහත සිදු කරන ලද පර්යේෂණ අධ්‍යයනවල දී ද දේශපාලන බලතල බෙදා හැරීම තුළ ව්‍යාපාති සේවා යාන්ත්‍රණයේ සිදු වූ බෙදීම නිසා පරිපූර්ණ ව්‍යාප්ති සේවාවක් ලබාගැනීමට අපොහොසත් බවට තර්ක කර ඇත (Damayanthi and Nanayakkara, 2008). තව ද, බෝගයට වැළඳුණු රෝගයක් සඳහා උපදෙස් අවශ්‍ය වූ විට, නිලධාරීන්ගේ හිඟය සහ සිටින නිලධාරීන්ගේ සේවය ලබා ගැනීමේ ප්‍රායෝගික දුෂ්කරතා හේතුවෙන් තමන් කෘෂි රසායනික වෙළඳුන්ගේ උපදෙස් ලබාගන්නා බව ගොවීහු පැවසූ හ. එම නිසා, ව්‍යාප්ති නිලධාරීන්ගේ සංඛ්‍යාව වැඩි කිරීමටත්, ව්‍යාප්ති සේවාවේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීමටත්, ව්‍යාප්ති සේවාව සඳහා නිසි ඇගයීම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමටත් ගොවි සංවිධාන නියෝජිතයෝ යෝජනා කළ හ.

සුළු පරිමාණ කෘෂිකර්මාන්තයෙ හි තම දායකත්වය වර්ධනය කිරීම සඳහා නැවත බෙදා හැරීමේ ප්‍රතිපත්ති හා බැඳුණු යෝජනා කිහිපයක් තරුණයින් විසින් ඉදිරිපත් කළ හ. කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ, වාරි සහ වගාවට යෝග්‍ය ඉඩම් ආදී මූලික පහසුකම් තරුණයින්ට සැපයීමට රජය ක්‍රියාකළ යුතු බව ප්‍රතිචාරීන්ගෙන් 50% පමණ යෝජනා කළ අතර තරුණයින්ට කෘෂිකාර්මික ඉඩම් බෙදාදීම කළ යුතු බව ප්‍රතිචාරීන්ගෙන් තවත් 3.8% ද, යන්ත්‍රෝපකරණ බෙදා දිය යුතු බව තවත් 3.2% ද යෝජනා කළ හ. තරුණ ප්‍රතිචාරීන්ගෙන් 34.4%ක් යෝජනා කළේ රජය විසින් සහනාධාර ලබාදීමෙන් සුළු පරිමාණ කෘෂිකර්මාන්තයට තරුණ සහභාගීත්වය වර්ධනය කළ හැකි බවයි. සියලු බෝග සඳහා පොහොර සහනාධාරය, සහනදායී මිලකට බීජ, රෝපණ ද්‍රව්‍ය, කෘමි නාශක හා වල් නාශක ලබාදීම මෙයට ඇතුළත් විය. ක්ෂේත්‍ර සමීක්ෂණය සිදුවන අවස්ථාව වන විට ද රජයේ පොහොර සහනාධාරය ක්‍රියාත්මක වුව ද ඒ වන විට වී හැර වෙනත් බෝග සඳහා එය නිකුත් නො කෙරිණි.

රාජ්‍ය මුදල් වැය කරමින් සිදු කරන වැඩසටහන් සම්බන්ධයෙන් පසු විපරමක් සහ ඇගයීමක් සිදු කළ යුතු බව පවසමින් රාජ්‍ය වැඩසටහන් ඇගයීමේ සහ පසු විපරම් කිරීම සඳහා වන යෝජනාවක් ප්‍රතිචාරීන්ගෙන් 10%ක් ඉදිරිපත් කළ හ. ගොවි සංවිධානවල බොහෝ නියෝජිතයින් අනාවරණය කළ අන්දමට රැකියාවක් ලෙස ගොවිතැනට සමාජයෙන් ප්‍රමාණවත් ගරුත්වයක් නො ලැබේ. පාසැල් මට්ටමේ සිට ම කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් වඩා යහපත් ආකල්පයක් ඇති කිරීමට රජය පියවර ගත යුතු බවට ප්‍රතිචාරීන්ගෙන් 15%ක් යෝජනා කළ හ.

එයට අමතරව, ගොවීන් සඳහා සමාජ ආරක්ෂණ සහ රක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට රජය පියවර ගත යුතු බව ගොවි සංවිධාන නියෝජිතයෝ සඳහන් කළ හ. මෙයට අදාළව, පවතින ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය සහ රක්ෂණය පිළිඳව පූර්ණ ඇගයීමක් සිදු කොට ඒවා වැඩි දියුණු කළ හැකි බවට ඔවුහු යෝජනා කළ හ.

වගුව 7.1: සුළු පරිමාණ කෘෂිකර්මාන්තයේ තරුණ සහභාගීත්වය වර්ධනය කිරීම සඳහා ප්‍රතිචාරීන්ගේ යෝජනා

| යෝජනා | පුද්ගලයින් සංඛ්‍යාව (සංඛ්‍යාව=529) | මුළු නියැදියෙන් ප්‍රතිශතය |
|---|---|---|
| මූලික පහසුකම් සැපයීම | 264 | 49.9 |
| නිෂ්පාදන සඳහා සාධාරණ/යහපත් මිලක් ලබාදීමට කටයුතු කිරීම | 226 | 42.7 |
| රජයෙන් සහනාධාර ලබාදීම | 182 | 34.4 |
| ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුතු යෙදවුම් වෙළඳපොළේ පැවතීම සහතික කිරීම. | 157 | 29.7 |
| අලෙවි පහසුකම් ඇති කිරීම | 156 | 29.5 |
| තරුණයින් සඳහා කෘෂිකර්මාන්තයට අදාළ අනෙකුත් රැකියා සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 140 | 26.5 |
| ගොවිතැනට සම්බන්ධ පුහුණුව තරුණයින් සඳහා ක්‍රියාත්මක කිරීම | 113 | 21.4 |
| තරුණයින්ට තාක්ෂණික සහාය ලබාදීම | 113 | 21.4 |
| පාසැල් අවධියේ සිට කෘෂිකර්මාන්තය කෙරෙහි යහපත් ආකල්ප ජනිත කිරීමට අවශ්‍ය පියවර ගැනීම | 79 | 14.9 |
| ගොවීන්ගේ මහන්සිය/වියදම සඳහා ප්‍රතිලාභ සහතික කිරීම | 79 | 14.9 |
| රජය විසින් මාර්ගෝපදේශ සහ සහාය ලබාදීම | 53 | 10.0 |
| රජය විසින් සිදුකරන වැඩසටහන් පසු විපරම් කිරීම | 47 | 8.9 |
| විශිෂ්ඨ ක්‍රියාකාරකම් සහ ආදර්ශන ඔස්සේ තරුණයින් අභිප්‍රේරණය කිරීම | 42 | 7.9 |
| කළමනාකරණයට අදාළ පුහුණුවීම් ලබාදීම | 35 | 6.6 |
| ඉඩම් බෙදා දීම | 20 | 3.8 |
| රජය විසින් කෘෂි යන්ත්‍රෝපකරණ ලබාදීම | 17 | 3.2 |
| බදු සහන කාල සීමා ලබාදීම සහ නීති සහ රෙගුලාසි සරල කිරීම | 13 | 2.5 |
| යෙදවුම් මිල අඩු කිරීම | 13 | 2.5 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

පළමු පරිච්ඡේදයේ දී ඉදිරිපත් කළ පරිදි නියැදිය විශ්වවිද්‍යාල කිහිපයක කෘෂිකර්ම උපාධිධාරීන් සහ කෘෂිකර්ම උපාධි අපේක්ෂකයින් 28න් සමන්විත විය. සුළු ගොවි අංශයේ තරුණ සහභාගීත්වය වර්ධනය කිරීම සඳහා වන ඔවුන්ගේ යෝජනා 7.2 වගුවෙන් ඉදිරිපත් කෙරේ. මෙම යෝජනා සමස්ත නියැදියේ ප්‍රතිචාරීන්ගේ යෝජනා හා සමාන වේ.

වගුව 7.2: සුළු පරිමාණ කෘෂිකාර්මික අංශයේ තරුණ සහභාගීත්වය වර්ධනය සඳහා කෘෂිකර්ම උපාධිධාරීන් සහ උපාධි අපේක්ෂකයින් ඉදිරිපත් කළ යෝජනා

| යෝජනා | ප්‍රතිචාරීන් සංඛ්‍යාව (සංඛ්‍යාව=529) | මුළු කෘෂිකාර්මික උපාධිධාරී/ උපාධි අපේක්ෂකයිනගෙන් ප්‍රතිශතය |
|---|---|---|
| රජයෙන් සහනාධාර ලබාදීම | 15 | 53.6 |
| බදු සහන කාලසීමාවක් ලබාදීම සහ නීති/ රෙගුලාසි සරල කිරීම | 7 | 25.0 |
| මූලික පහසුකම් සැපයීම | 12 | 42.9 |
| ඉහළ ගුණාත්ම තත්ත්වයෙන් යුතු යෙදවුම් වෙළඳපොළේ ඇති බවට සහතික කිරීමට ක්‍රියා මාර්ග ගැනීම | 20 | 71.4 |
| පාසැල් අවධියේ සිට කෘෂිකර්මාන්තය සම්බන්ධ යහපත් ආකල්ප ඇති කිරීමට පියවර ගැනීම | 18 | 64.3 |
| කෘෂිකර්මාන්තයට සම්බන්ධ අනෙකුත් රැකියා අවස්ථා සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 16 | 57.1 |
| කෘෂිකර්මාන්තය සම්බන්ධ පුහුණු වැඩසටහන් සංවිධානය කොට පවත්වාගෙන යාම | 7 | 25.0 |
| කළමනාකරණ පුහුණුවීම් ලබාදීම | 6 | 21.4 |
| තරුණයින්ට තාක්ෂණික දැනුම ලබාදීම | 12 | 42.9 |
| රජය විසින් ආධාර සහ මාර්ගෝපදේශ ලබාදීම | 7 | 25.0 |
| විශිෂ්ඨ ක්‍රියාකාරකම් සහ ආදර්ශන ඔස්සේ තරුණයින් අභිප්‍රේරණය කිරීම | 8 | 28.6 |
| පෞද්ගලික අංශය සමඟ සබඳතා ගොඩනැගීම | 8 | 28.6 |
| නිෂ්පාදන සඳහා සාධාරණ/හොඳ මිලක් ලබාගැනීමට කටයුතු කිරීම | 19 | 67.9 |
| අලෙවි පහසුකම් සැපයීම | 7 | 25.0 |
| රජය විසින් ක්‍රියාත්මක කරන වැඩසටහන් ඇගයීම සහ පසු විපරම් කිරීම | 4 | 14.3 |
| ගොවීන්ගේ වියදම්/මහන්සිය සඳහා ප්‍රතිලාභ සහතික කිරීම | 13 | 46.4 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

වගු සටහන් 7.2හි දත්තවලින් ඉදිරිපත් කෙරෙන අන්දමට, සුළු පරිමාණ කෘෂිකර්මාන්තයේ තරුණ සහභාගීත්වය වර්ධනය කිරීම සඳහා වඩාත් ම, වැදගත් ක්‍රියාකාරකම ලෙස කෘෂිකර්ම උපාධිධාරීන්/උපාධි අපේක්ෂකයින්ගෙන් වැඩි ප්‍රතිශතයක් පෙන්වා දෙනු ලැබුවේ අලෙවිකරණ ගැටලුව සඳහා විසඳුම් ලබාදීම යි. උදාහරණ වශයෙන් ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුතු යෙදවුම් වෙළඳපොළෙ හි පවතින බව සහතික කිරීම (71.4%), නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් ලබාදීම (67.9%), ගොවීන්ගේ මහන්සියට ගැළපෙන ප්‍රමාණවත්

ප්‍රතිලාභ සහතික කිරීම (46.4%) සහ පෞද්ගලික අංශය සමඟ සබඳතා ගොඩනංවා ගැනීම (28.6%) වැදගත් ලෙස සලකනු ලැබිණි. කෙසේ වුව ද, කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් වන සමාජ ආකල්ප වෙනස් කිරීම සම්බන්ධයෙන් (64.3%) ඉතා වැදගත් ස්ථානයක් ඔවුන් විසින් ලබා දී තිබුණි.

## 7.3 කෘෂිකාර්මික කර්මාන්ත/ව්‍යාපාරවල තරුණ සහභාගීත්වය වර්ධනය කිරීම සඳහා යෝජනා

කෘෂිකාර්මික කර්මාන්ත සහ ව්‍යාපාර සම්බන්ධයෙන් සැලකීමේ දී, එම ක්ෂේත්‍රවල තරුණ සහභාගීත්වය වර්ධනය කිරීම සඳහා යෝජනා රාශියක් තරුණ ප්‍රතිචාරීන් විසින් ඉදිරිපත් කරනු ලැබිණි. මෙම යෝජනා ප්‍රධාන වශයෙන් ම කාණ්ඩ හතරක් යටතේ වර්ග කිරීමට හැකියාව තිබේ. එනම්, වෙළෙඳපොළ ගැටලු සඳහා විසඳුම් ප්‍රතිපත්ති සහ නීතිමය ගැටලු සඳහා විසඳුම්, පුහුණු අවශ්‍යතා සහ සමාජ අගය කිරීම් වශයෙනි.

ප්‍රතිචාරීන් විසින් අලෙවිකරණය සම්බන්ධව පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරනු ලැබිණි (වගුව 7.3). නිෂ්පාදන සඳහා සාධාරණ මිලක්/ලාභයක් ලබාදීමට අදාළ ආයතන සහ නියෝජිත ආයතන කටයුතු කළ යුතු වීම (30.4%), වෙළෙඳපොළෙ හි පවතින ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුතු අමුද්‍රව්‍ය ප්‍රමාණය ඉහළ නැංවීම (9.7%), පෞද්ගලික අංශය සමඟ සබඳතා ගොඩ නැගීමට පියවර ගැනීම (7.5%), රට තුළ නිෂ්පාදනය කළ හැකි කෘෂි පාදක කොට ගත් නිෂ්පාදන ආනයනය නතර කිරීම/අඩුකිරීම (0.6%) සහ අලෙවිකරණ පහසුකම් සහ අලෙවි තොරතුරු මෙන්ම ඒවා වෙත ප්‍රවේශවීමේ හැකියාව සහතික කිරීම (22.6%) එයට අදාළ වේ.

යන්ත්‍රෝපකරණ සහ ඉඩම් වැනි මූලික පහසුකම් සැපයීම සඳහා රජය සහ අනෙකුත් පාර්ශවකරුවන් විසින් ක්‍රියාකිරීම (51.2%), කර්මාන්ත සඳහා සහනාධාර ක්‍රියාත්මක කිරීම (32.9%), නීති සහ රෙගුලාසි ලිහිල් කිරීම සහ බදු සහන කාල ලබාදීම (5.4%) යන ප්‍රතිචාරීන් විසින් ඉදිරිපත් කළ යෝජනා ප්‍රතිපත්ති සහ නීතිමය අංශ සමඟ බැඳී පවතී. ඇතැම් ප්‍රතිචාරීන් සඳහන් කළ අන්දමට තම ව්‍යාපාරය හෝ කර්මාන්තය ලියාපදිංචි කිරීමට උත්සාහ කිරීමේ දී විවිධ ආයතනවල ගැටලු රාශියකට මුහුණු දීමට සිදු වේ. එම නිසා, විශේෂයෙන් ම ව්‍යාපාර/කර්මාන්ත ලියාපදිංචියට අදාළ නීති සහ රෙගුලාසි සරල කිරීමට ඔවුහු යෝජනා කළ හ.

පුහුණු අවශ්‍යතා සම්බන්ධයෙන් සැලකීමේ දී, තාක්ෂණික දැනුම ලබාදීම (31.9%), තරුණයින්ට කළමනාකරණ දැනුම ලබාදීම (16.9%), විශිෂ්ඨ ක්‍රියාකාරකම් සහ ආදර්ශන නැරඹීමටත්, ඉන් යමක් ඉගෙන ගැනීමටත් හැකි වන සේ අධ්‍යාපනික චාරිකා සංවිධානය කර තරුණයින් අභිප්‍රේරණය කිරීම (9.9%), තරුණයින් සඳහා කෘෂිකර්මාන්තයට අදාළ කර්මාන්ත/ව්‍යාපාර අවස්ථා සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම (26.0%) සහ රජය විසින් ආධාර සහ මාර්ගෝපදේශ ලබාදීමට (10.9%) ප්‍රතිචාරීහු යෝජනා කළ හ.

පුස්තකාලය
LIBRARY
ගො.ක.ග.ප.පු.ආ.
HARTI

සමාජ වටිනාකම්/අගය කිරීම් සම්බන්ධයෙන් රජය මෙන් ම සමාජය ද කෘෂිකර්මය හා සබැඳි කර්මාන්ත සහ ව්‍යාපාර සම්බන්ධයෙන් යහපත් ආකල්ප සහ අගය කිරීම් ජනිත කිරීමට කටයුතු කළ යුතු බවට ප්‍රතිචාරිහු (10.1%) යෝජනා කළ හ. වගු සටහන් 7.4න් දැක්වෙන අන්දමට ඉහත ඉදිරිපත් කළ යෝජනාවලට සමාන යෝජනා කෘෂිකර්ම උපාධිධාරීන්/උපාධි අපේක්ෂකයින් විසින් ඉදිරිපත් කරනු ලැබිණි.

වගුව 7.3: කෘෂිකර්මාන්තයට අදාළ කර්මාන්තවල තරුණ සහභාගීත්වය වර්ධනය කිරීමට යෝජනා

| යෝජනාව | සංඛ්‍යාව=529 | සමස්ත නියැදියෙන් ප්‍රතිශතය |
|---|---|---|
| මූලික පහසුකම් සැපයීම | 258 | 51.2 |
| නිෂ්පාදන සඳහා සාධාරණ/ඉහළ මිලක් ලබාදීමට කටයුතු කිරීම | 153 | 30.4 |
| රජයෙන් සහනාධාර ලබාදීම | 166 | 32.9 |
| වෙළඳපොළේ ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුතු යෙදවුම් ඇති බවට සහතික කිරීම | 49 | 9.7 |
| අලෙවි පහසුකම් ඇති බවට සහතික වීම | 114 | 22.6 |
| තරුණයින් සඳහා වන කෘෂිකර්මාන්තයට අදාළ කර්මාන්ත/ව්‍යාපාර අවස්ථා සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 131 | 26.0 |
| තරුණයින් සඳහා වන කර්මාන්තවලට අදාළ පුහුණුවීම් පැවැත්වීම | 123 | 24.4 |
| තරුණයින්ට තාක්ෂණික දැනුම ලබාදීම | 161 | 31.9 |
| කෘෂිකර්මාන්තයට අදාළ කර්මාන්ත සම්බන්ධයෙන් යහපත් ආකල්ප ගොඩනැගීමට පාසැල් වියේ සිට කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගැනීම | 51 | 10.1 |
| රජය විසින් මාර්ගෝපදේශ සහ සහාය ලබාදීම | 55 | 10.9 |
| රජය විසින් සිදු කරන වැඩසටහන් අඛණ්ඩව කරගෙන යාම | 45 | 8.9 |
| විශිෂ්ඨ ක්‍රියාකාරකම් සහ ආදර්ශන හරහා තරුණයින් අභිප්‍රේරණය කිරීම | 50 | 9.9 |
| කළමනාකරණයට අදාළ පුහුණුවීම් ලබාදීම | 85 | 16.9 |
| බදු සහන ලබාදීම සහ නීති රෙගුලාසි සරල කිරීම | 27 | 5.4 |
| පෞද්ගලික අංශය සමග සබඳතා ගොඩනැගීම | 38 | 7.5 |
| කෘෂි පාදක කරගත් භාණ්ඩ ආනයනය නතර කිරීම/අඩු කිරීම | 03 | 0.6 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

වගුව 7.4: **කෘෂිකාර්මික කර්මාන්ත සහ ව්‍යාපාරවල තරුණ සහභාගීත්වය වර්ධනය කිරීම සඳහා කෘෂිකර්ම උපාධිධාරීන්/උපාධි අපේක්ෂකයින් ඉදිරිපත් කළ යෝජනා**

| යෝජනා | ප්‍රතිචාරීන් සංඛ්‍යාව (සංඛ්‍යාව=529) | මුළු කෘෂිකාර්මික උපාධිධාරී/උපාධි අපේක්ෂකයින්ගෙන් ප්‍රතිශතය |
|---|---|---|
| රජය විසින් සහනාධාර ලබාදීම | 14 | 50.0 |
| බදු සහන ලබාදීම සහ නීති/රෙගුලාසි සරල කිරීම | 11 | 39.3 |
| මූලික පහසුකම් සැපයීම | 14 | 50.0 |
| ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුතු අමුද්‍රව්‍ය වෙළෙඳපොළේ පවතින බවට සහතික කිරීම | 12 | 42.9 |
| ළමා වියේ සිට කෘෂිකර්මාන්තයට අදාළ රැකියා පිළිබඳ යහපත් ආකල්ප/අගය කිරීම් ගොඩනැගීමට කටයුතු කිරීම | 13 | 46.4 |
| කෘෂිකර්මාන්තය සහ එයට අදාළ රැකියා අවස්ථා සම්බන්ධයෙන් දැනුවත් කිරීම | 17 | 60.7 |
| කෘෂිකර්මාන්තයට අදාළ කර්මාන්ත/ව්‍යාපාර පිළිබඳ පුහුණුවීම් සංවිධානය කොට පැවැත්වීම | 13 | 46.4 |
| කළමනාකරණ පුහුණුවීම් සංවිධානය කොට පැවැත්වීම | 10 | 35.7 |
| තරුණයින්ට තාක්ෂණික දැනුම ලබාදීම | 12 | 42.9 |
| රජය විසින් සහාය සහ මාර්ගෝපදේශ ලබාදීම | 7 | 25.0 |
| විශිෂ්ඨ ක්‍රියාකාරකම් සහ ආදර්ශන හරහා තරුණයින් අභිප්‍රේරණය කිරීම | 9 | 32.1 |
| පෞද්ගලික අංශය සමග සබඳතා ගොඩනැගීම | 11 | 39.3 |
| නිෂ්පාදන සඳහා සාධාරණ/යහපත් මිලක් ලබාදීමට කටයුතු කිරීම | 18 | 64.3 |
| අලෙවි පහසුකම් ලබාදීම | 10 | 35.7 |
| රජය විසින් සිදු කරන වැඩසටහන් ඇගයීම සහ පසු විපරම් කිරීම | 6 | 21.4 |
| ගොවීන්ගේ වියදම්/ශ්‍රමය සඳහා ප්‍රතිලාභ සහතික කිරීම | 15 | 53.6 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2012

## 7.4 සමාප්තිය

තරුණයින් මෙන් ම ගොවි සංවිධාන නියෝජිතයින් ද ශ්‍රී ලංකාවේ සුළු පරිමාණ කෘෂිකාර්මික අංශයෙහි තරුණ සහභාගීත්වය වර්ධනය කිරීම සඳහා යෝජනා රාශියක් ඉදිරිපත් කොට ඇත. පුළුල් අර්ථයෙන් ගත් කළ මෙම යෝජනා; අලෙවිකරණ, පුහුණු, ප්‍රතිපත්ති සහ ශෛතික ගැටලු, කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් වන සමාජ අගය කිරීම්වල වැඩි දියුණුව, ගොවීන් සඳහා වන සමාජ ආරක්ෂණය සහ නැවත බෙදා හැරීමේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් යටතේ වර්ගීකරණය කිරීමේ හැකියාව පවතී.

# අටවැනි පරිච්ඡේදය
# සාරාංශය සහ නිර්දේශ

## 8.1 සාරාංශය

ශ්‍රී ලංකාවේ සුළු පරිමාණ කෘෂිකාර්මික අංශයට තරුණ සහභාගීත්වය අඩුවීම කෙරෙහි බලපා ඇති හේතු සාධක සොයා බැලීමේ මූලික අරමුණ සහිත ව නුවරඑළිය, අම්පාර, මොණරාගල, මාතලේ, අනුරාධපුර, පොළොන්නරුව, හම්බන්තොට, කුරුණෑගල සහ මඩකලපුව යන දිස්ත්‍රික්ක නවයේ මෙම පර්යේෂණය සිදු කරනු ලැබිණි. මෙරට විවිධ විශ්වවිද්‍යාලවලින් උපාධිය ලත් කෘෂිකාර්මික උපාධිධාරීන් සහ උපාධි අපේක්ෂකයින් 33ක් ද ඇතුළුව සමස්ත නියැදිය 533ක් විය. ප්‍රතිචාරීන් වයස අවුරුදු 15-29 අතර වයස් කාණ්ඩයට අයත් වූ අතර ඉන් 35.6%ක් අවුරුදු 15-20 වයස් කාණ්ඩයේ ද, 24.9%ක් අවුරුදු 20-25 වයස් කාණ්ඩයේ ද, 32.8% ක් අවුරුදු 25-29 වයස් කාණ්ඩයේ ද වූ අතර 6.6% ක් අවුරුදු 15 කාණ්ඩයේ විය. ජනවාර්ගිකත්ව සංයුතිය අනුව 89.1%ක් සිංහල ද, 4.9%ක් ශ්‍රී ලාංකික දෙමළ ද, 4.5%ක් ඉන්දියානු දෙමළ ද, 1.5% ක් මුස්ලිම් ද වූහ. සමස්ත නියැදියෙන් බහුතරය පුරුෂයින් විය.

මුළු නියැදියෙන්, 44.6%ක් 6 වසරේ සිට සා.පෙළ. දක්වා අධ්‍යාපනය ලබා තිබූ අතර 17.3%ක් සා.පෙළ ද, 10.5%ක් උසස් පෙළ ද සමත්ව සිටිය හ. සමස්ත නියැදියෙන් 7.1%ක් ඩිප්ලෝමාධාරීන්. උපාධිධාරීන් සහ උපාධි අපේක්ෂකයෝ වූහ. නියැදියේ සම්පූර්ණ ප්‍රතිචාරීන්ගෙන් 36.2% (ප්‍රතිචාරීන් 193)ක් පරිගණක, විදුලි හා මෝටර් රථ කාර්මික, පෙදරේරු, වඩු කාර්මික, සත්ත්ව පාලනය සහ මී මැසි පාලනය, රූපලාවන්‍ය, ඇඳුම් මැසීම, රෙදි විවීම, අත්කම් නිර්මාණය, හෝටල් පුහුණුව, සමාජ වැඩ සහ රියදුරු යන ක්ෂේත්‍රවල වෘත්තීයමය පුහුණුවීම් ලබා තිබුණි.

ප්‍රතිචාරීන්ගෙන් 34%ට ආසන්නව විවාහකයින් වූ අතර ඉතිරි පිරිස අවිවාහකයෝ වූහ. ප්‍රතිචාරීන්ගෙන් 52.4% ක් සේවා නියුක්තිකයින් වූ අතර 17.5%ක් සේවා වියුක්තිකයින් ද, 7.1%ක් ගෘහණියන් ද, 22.9% ශිෂ්‍යයාවෝ ද වූහ. වයස සහ නියැලෙන කාර්යය අතර පැහැදිළි සබඳතාවක් පැවතිණි. එයට අනුකූලව, අවුරුදු 20 හෝ එයට වැඩි අය අතර සේවා නියුක්ති අනුපාතය ඉහළ ය. සේවා නියුක්ත ප්‍රතිචාරීන් අතුරින් 64.3% (ප්‍රතිචාරීන් 183) ගොවීන් වූ අතර 7.8% (ප්‍රතිචාරීන් 22)ක් පුහුණු ශ්‍රමිකයින් ද, 5.7% (ප්‍රතිචාරීන් 16)ක් නුපුහුණු ශ්‍රමිකයෝ ද වූහ. ප්‍රතිචාරීන්ගෙන් බහුතරයකට ඉඩම් හිමිකම නොමැත. ප්‍රතිචාරීන්ගෙන් 26.8%ට (ඉඩම් කැබලි 124) ගොඩ ඉඩම්වල හිමිකම ද, 23.9%ට (කැබලි 84) මඩ ඉඩම්වල හිමිකම ද පැවතිණි. ඉඩම් කැබලි සියල්ලෙන් 88.2% (කැබලි 779)ක් වගා කර තිබුණි. සමස්ත ඉඩම්වල සාමාන්‍ය භූමි ප්‍රමාණය මෙන් ම වගා කළ ඉඩම්වල භූමි ප්‍රමාණයේ සාමාන්‍යය ද අක්කර දෙකකි. සමස්ත ඉඩම්වලින් 5%ක් අක්කර 1/4ට වඩා අඩු වූ අතර අක්කර 10ට වඩා වැඩි ඉඩම් ප්‍රමාණය 1.1% කි.

ප්‍රතිචාරීන්ගෙන් 70% (ප්‍රතිචාරීන් 375) ආසන්නව පූර්ණ කාලීනව, අර්ධ කාලීනව හෝ පවුලේ ශ්‍රමිකයින් ලෙස කෘෂිකාර්මික කටයුතුවල නිරත වූහ. එම ප්‍රතිචාරීන්ගෙන් 39.5% (ප්‍රතිචාරීන් 148)ක් පූර්ණ කාලීනව කෘෂිකාර්මික කටයුතුවල නිරත වූ අතර එය සමස්ත නියැදියේ ප්‍රතිශතයක් ලෙස ගත්විට 27.8% කි. කුමන ආකාරයකින් හෝ කෘෂිකාර්මික කටයුතුවල නිරත වූ ප්‍රතිචාරීන්ගෙන් 26.4% (ප්‍රතිචාරීන් 99)ක් අර්ධ කාලීනව ද, (සමස්ත නියැදියේ ප්‍රතිශතයක් ලෙස 18.6%), 33.9%ක් (ප්‍රතිචාරීන් 127)ක් පවුලේ ශ්‍රමිකයින් ලෙස ද (සමස්ත නියැදියෙන් 23.8%) කෘෂිකර්මාන්තයට දායක වූහ. කෘෂිකර්මාන්තයේ නියැලි ස්ත්‍රීන්ගෙන් 60.6% (ප්‍රතිචාරීන් 60) පවුලේ ශ්‍රමිකයෝ වූහ. කෙසේ වුව ද, පුරුෂ ප්‍රතිචාරීන්ගෙන් පවුලේ ශ්‍රමිකයින් 24.3% (ප්‍රතිචාරීන් 67) ක් පමණක් විය.

තව ද, වගා ක්‍රම, බෝග සහ භූගෝලීය කලාප අනුව තරුණ සහභාගීත්වයේ ප්‍රමාණය සහ ආකාරය වෙනස් වේ. උදාහරණ වශයෙන්, හේන් සහ අතිරේක ආහාර බෝග වගා කරන ප්‍රදේශවල කෘෂිකර්මාන්තය සඳහා තරුණ සහභාගීත්වය 100% ආසන්න වන අතර උඩරට සහ පහතරට එළවළු, වර්ෂා පෝෂිත වී වගාවන් හි තරුණ සහභාගීත්වය 60% ආසන්න වේ. නුවරඑළිය ප්‍රදේශයේ ඉඩම් හිඟය සහ පවතින ඉඩම් භාවිතා කිරීමේ ගැටලුවත්, අලෙවි ගැටලුත් නොවන්නට උඩරට එළවළු මෙන් ම පහතරට එළවළු වගාවේ ද තරුණ දායකත්වය මෙයට වඩා ඉහළ මට්ටමක් ගනු ඇත. වගා කටයුතුවල නිරතවන්නන්ගෙන් බහුතරය (61.7%) අවුරුදු පහට වඩා අඩු අත්දැකීම් සහිත අය වූ අතර 6.7%ක් වසර 10ට වඩා අත්දැකීම් සහිත අය වූහ.

සම්පූර්ණ නියැදියෙන් 58.2ක් අනාගතයේ දී පූර්ණ කාලීනව කෘෂිකර්මාන්තයේ නියැලීමට කැමති බව ප්‍රකාශ කළ අතර 39.6% එසේ නියැලීමට අකැමැති බවත්, 2.3%ක් ඒ සම්බන්ධයෙන් පැහැදිළි අදහසක් නොමැති බවත් පැවසූ හ. පූර්ණ කාලීනව කෘෂිකාර්මික කටයුතුවල නිරතවීමට කැමැත්තක් දැක් වූ ප්‍රතිචාරීන්ගෙන් බහුතරයකට කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දීර්ඝ කාලීන අත්දැකීම් සහිත, ඉඩම් සහ ශ්‍රමය ද හිමි පිරිසක් වූහ. අනෙක් අතට, ඔවුන්ට හොඳ රැකියාවක් සඳහා අධ්‍යාපනය, පුහුණුව හා නිපුණතාව නො තිබුණි. වයස්ගත, ආබාධිත හෝ කාන්තාවන් පමණක් නිවසේ සිටීමත්, තම ඉඩම් වගා කිරීමට ගමෙහි කිසිවෙකු නො වීමත්, පවුලේ එක ම දරුවා වීමත්, ආදී පවුලේ ප්‍රශ්න නිසා ඔවුන්ගේ ඇතැමෙකුට ගමෙන් බැහැර යාමට හැකියාවක් නොමැත. ඔවුන්ට කෘෂිකර්මාන්තයෙ හි යෙදී උපයන මුදලට වඩා වැඩි ආදායමක් ගමෙන් පිටත රැකියාවල දී ඉපැයිය හැකි ය. එසේ වුව ද, ගමෙන් පිටත දී තමන් උපයන මුදලට වඩා වැඩි වියදමක් දැරීමට ඔවුන්ට සිදු වේ. පූර්ණ කාලීන කෘෂිකර්මාන්තයෙ හි නිරත නො වන ප්‍රතිචාරීන් වෙළෙඳපොළ අවිනිශ්චිතතාව, ලාභය අඩුවීම, වෙනත් රැකියාවක යෙදීමට කැමැත්තක් පැවතීම, අධ්‍යයන කටයුතුවල නිරතවීමට ඇති කැමැත්ත, සමාජ පිළිගැනීමක් නො වීම, කෘෂිකාර්මික වත්කම් නොමැතිවීම හෝ පවතින වත්කම් ප්‍රයෝජනයට ගත නො හැකිවීම ආදී කරුණු තමන්ට පූර්ණ කාලීනව කෘෂිකර්මාන්තයේ නිරත නො වීමට හේතු වන බව පැවසූ හ.

සමස්ත ප්‍රතිචාරීන්ගෙන් 7.3% (ප්‍රතිචාරීන් 39)ක් කෘෂිකර්මාන්තයට අදාළ කර්මාන්ත හෝ ව්‍යාපාරවල නිරත වී සිටිය හ. ඔවුන්ගෙන්, 84.9%ක් පුරුෂයින් වූ අතර 51.3%ක් අවුරුදු 25-29 වයස් කාණ්ඩයට අයත් වූහ. මෙම කටයුතුවලින් බහුතරය කෘෂිකර්මාන්තයට අදාළ කර්මාන්තවලට වඩා කුඩා පරිමාණ ව්‍යාපාර විය.

සමස්ත නියැදියෙන් 76.4%ක් තමන් කෘෂිකර්මාන්තයට අදාළ කරමාන්ත හෝ ව්‍යාපාරවල නිරතවීමට කැමති බව ප්‍රකාශ කළ හ. එවන් කාර්යයක නිරතවීමට තමන් අකැමැති බව ප්‍රකාශ කළ පිරිස (23%6%) ඒ සඳහා හේතු ගණනාවක් සඳහන් කළ හ. එනම්, සාර්ථකත්වයක් අත්කර ගත හැකිවේදැයි යන අවිනිශ්චිතතාව (20.6%), කෘෂිකර්මාන්තයට සම්බන්ධ කර්මාන්තවලින් අඩු ආදායමක් ඉපැයීම (14.3%), අධ්‍යාපන සුදුසුකම් සමග නො ගැළපීම (13.5%), මූලික පහසුකම් සපයා ගැනීමේ දුෂ්කරතාව (9.5%), සමාජයේ අඩු පිළිගැනීම හෝ පිළිගැනීමක් නො වීම (5.6%), පුහුණුවීම් සහ දැනුවත් කිරීම් නො වීම/හිඟය (13.5%), පෞද්ගලිකව අකැමැතිවීම (54.7%), වෙළඳපොළක් නො වීම හෝ වෙළඳපොළක් සොයා ගැනීමේ අපහසුව (8.7%) යනාදිය යි.

තමන් කෘෂිපාදක කොටගත් කර්මාන්තවල නියැළීමට කැමති නමුත් මෙතෙක් එහි නිරත නොවූ බව පැවසූ පිරිස ඒ සඳහා හේතු ගණනාවක් ඉදිරිපත් කළ හ. මූල්‍ය පහසුකම් ලබා ගැනීමේ දුෂ්කරතාව (63.6%), පුහුණුව ලබාගැනීමේ දුෂ්කරතා (38.1%), යන්ත්‍රෝපකරණ සහ යෙදවුම් ලබාගැනීමේ දුෂ්කරතා (28.8%), ගැළපෙන ස්ථානයක්/ගොඩනැගිල්ලක් ලබාගැනීමේ දුෂ්කරතා (25.2%), පුහුණුවක් හෝ දැනුවත් භාවයක් නො වීම (23.6%), අධ්‍යාපන කටයුතුවල නිරතවීම (18.4%), වෙළෙඳපොළ පහසුකම්වල හිඟය (18.1%), අවදානම (0.8%), වෙනත් රැකියාවක නිරතවීම (2.2%), පවුලේ පීඩනය/බර දරා ගැනීමට සිදුවීම (2.2%), නිසි සැලසුමක් නො වීම (1.4%) සහ ශ්‍රම හිඟය (3.8%) එම හේතු විය.

තරුණ ප්‍රතිචාරීන් අනාවරණය කළ අන්දමට, පවතින වෙළඳපොළ පහසුකම්, කෘෂිකාර්මික තොරතුරු, වගා කළ හැකි ඉඩම්, කෘෂි රක්ෂණය, ව්‍යාප්ති සේවය මෙන් ම ඒවාට ප්‍රවේශවීමේ ගැටලු ද, ණය සහ මූල්‍ය පහසුකම් ලබා ගැනීමේ ගැටලු, තම නිෂ්පාදන සඳහා ලැබෙන අඩු මට්ටමේ ගොවිපළ මිල, පුහුණු පහසුකම් සහ නව තාක්ෂණය නොලැබීම සහ පවතින ඒවා ලබාගැනීමේ ගැටලු, අප්‍රමාණවත් වාරි ජලය, ඉහළ පිරිවැයක් දැරීමට සිදුවන නමුත් අඩු ගුණාත්මක තත්ත්වයෙන් යුතු බීජ සහ කෘෂි රසායනික ද්‍රව්‍ය, කෘෂි යන්ත්‍රෝපකරණවල ඉහළ පිරිවැය සහ කුලියට ගැනීමේ දී ගෙවීමට සිදුවන ඉහළ මිල යනා දී ගැටලුවලට ඔවුන්ට මුහුණ දීමට සිදු වේ. තව ද, ගැලපෙන සමාජ ආරක්ෂණ ක්‍රමයක් හෝ විශ්‍රාම වැටුප් ක්‍රමයක්, කෘෂිකර්මාන්තයට අදාළ රැකියාවලට සමාජ පිළිගැනීමක් නො වීම හෝ අඩු සමාජ පිළිගැනීම තරුණයින් කෘෂිකර්මාන්තයෙන් ඉවතට තල්ලු කිරීමට දායක වන සාධක වේ.

මෙරට සුළු පරිමාණ කෘෂිකර්මාන්තයේත්, කෘෂිපාදක කොටගත් කර්මාන්තවලත් තරුණ සහභාගීත්වය ඉහළ නැංවීම සඳහා තරුණ ප්‍රතිචාරීන් මෙන් ම ගොවි සංවිධාන නියෝජිතයෝ ද යෝජනා රාශියක් ඉදිරිපත් කළ හ. තරුණයින් කළ යෝජනා වූයේ, රාජ්‍ය හෝ පෞද්ගලික අංශය විසින් තම නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් ලබාදීම, මූලික පහසුකම් ලබාදීම, රජයෙන් සහනාධාර ලබාදීම, වෙළඳපොළේ ඉහළ තත්ත්වයෙන් යුතු යෙදවුම් පැවතීම සහතික කිරීම, ප්‍රමාණවත් වෙළඳපොළ පහසුකම් සහතික කිරීම, පුහුණු වැඩසටහන් පැවැත්වීම, තාක්ෂණික දැනුම ලබාදීම, පාසැල් මට්ටමේ සිට ම ගොවිතැන සඳහා සමාජ පිළිගැනීමක් ඇතිවන ආකාරයේ ආකල්ප ගොඩනැගීම, ඉඩම් බෙදා දීම, කෘෂිකාර්මික යන්ත්‍ර ලබාදීම, යෙදවුම් මිල අඩු කිරීම, විශිෂ්ඨ ක්‍රියාකාරකම් සහ ආදර්ශන ඇසුරින් තරුණයින් අභිප්‍රේරණය කිරීම, කෘෂිපාදක කොටගත් අපනයන

නතර කිරීම/අඩු කිරීම, බදු සහන ලබාදීම සහ නීති/රෙගුලාසි සරල කිරීම සහ රජය විසින් සිදුකරන වැඩසටහන් පසුවිපරමකට ලක් කිරීම ය.

## 8.2 ප්‍රතිපත්ති නිර්දේශ

### 8.2.1 රැකියාවක් ලෙස කෘෂිකර්මාන්තය සඳහා සමාජ හා ආයතනික ක්ෂේත්‍රවල පවතින අඩු පිළිගැනීම

(අ) පාසැල්වලට ළමුන් ඇතුළත් කිරීමේ දී ගොවි පවුල්වල දරුවන්ට යම් විශේෂිත ලකුණු ප්‍රමාණයක් ලබාදීමට රජය විසින් අවශ්‍ය පියවර ගැනීම. උදාහරණ වශයෙන් සුළු පරිමාණ වගාවන් හි, කෘෂිපාදක කොටගත් ස්වයං රැකියා හෝ කර්මාන්ත/ව්‍යාපාරවල නිරත පවුල්වල ළමුන් සඳහා ලකුණු පහක් ලබාදීම.

(ආ) ගොවිජන සංවර්ධන බල ප්‍රදේශය තුළ අ.පො.ස. සා/පෙළ විභාගයෙන් ඉහළ ම ලකුණු ලබාගන්නා සහ පහ වසර ශිෂ්‍යත්ව විභාගයෙන් අසමත් නමුත් කඩඉම් ලකුණුවලට ඉතා ම ආසන්නයේ සිටින සුළු ගොවි අංශයේ දරුවන්ට විශේෂිත ශිෂ්‍යත්ව ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමෙන් රජයට තරුණ ගොවීන් දිරිමත් කළ හැකි ය. මෙම කාර්යය සඳහා රජයට "ගොවිසෙත" ලොතරැයි අරමුදල හෝ ගොවි බැංකුවල මුදල් උපයෝගී කරගැනීමේ හැකියාව පවතී. රජය විසින් මෙවන් වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් දිවයින පුරා පාසැල් දැනුවත් කළ යුතු ය. තව ද, විද්‍යුත් මාධ්‍ය ඔස්සේ වැඩසටහන සම්බන්ධයෙන් දැනුවත් කිරීමෙන් (තෝරා ගන්නා පිළිවෙළ සහ අයදුම් කරන්නේ කෙසේ ද ආදී වශයෙන්) දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශවල දරුවන්ට එහි ප්‍රතිලාභ ලැබීම සහතික කළ හැකි ය.

(ඇ) පෞද්ගලික විශ්වවිද්‍යාල ද ඇතුළත්ව විශ්වවිද්‍යාල මට්ටමේ සිදු කෙරෙන කෘෂිකර්මාන්තයට අදාළ සියළු පාඨමාලා සඳහා සුළු ගොවි අංශයේ දරුවන්ට විශේෂිත පංගු ක්‍රමයක් ලබාදීම. එම පදනම මත පෞද්ගලික විශ්වවිද්‍යාලවලට තෝරා ගන්නා සිසුන් පාඨමාලා ගාස්තුවලින් නිදහස් කිරීම. 'ගොවිසෙත ලොතරැයි' අරමුදල මගින් ඔවුන් සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම.

(ඈ) වර්තමාන දත්ත අනුව, සමස්ත ශ්‍රම බලකායෙන් 33%ක් කෘෂිකාර්මික අංශයේ රැකියාවල නියුක්තව සිටිති. එම නිසා, නියමිත සුදුසුකම් සපුරා ඇති සුළු ගොවි අංශයේ පවුල්වල තරුණයින්ට රජයේ රැකියාවල අවම වශයෙන් 20%ක පංගු ක්‍රමයක් වෙන් කිරීම. තව ද, කෘෂිකර්මාන්තයට අදාළ රාජ්‍ය අංශයේ රැකියා, විශේෂයෙන් ම, ව්‍යාප්ති සේවාව සහ අර්ධ රාජ්‍ය ආයතනවල රැකියා සඳහා මෙම පංගු ක්‍රමය 30% දක්වා ඉහළ නැංවිය හැකි ය.

(ඉ) ඇතැම් ප්‍රතිචාරීන් යෝජනා කළ අන්දමට, කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ තරුණයින්ගේ මැදිහත්වීම අභිප්‍රේරණය කිරීම පාසැල් අවධියේ සිට ම ආරම්භ කළ හැකි ය. සෑම දරුවෙකුට ම කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ න්‍යායික මෙන් ම ප්‍රායෝගික දැනුම, පුහුණුවීම් හරහා ලබාදිය යුතු ය. එය ප්‍රාථමික අංශයේ දී සරල ක්‍රියාකාරකම්වලින් ආරම්භ කොට ද්විතියික අංශයේ දී අනිවාර්ය විෂයයක් බවට පත් කිරීම යෝග්‍ය ය.

කණ්ඩායම් වශයෙන් පාසැල් ගෙවත්ත වගා කිරීමෙන් ලබාදෙන පුහුණුවට අමතරව ගෙවතු වගාව සඳහා අඛණ්ඩව මැදිහත්වීමට ද ඔවුන් දිරිමත් කළ හැකි ය. වාර්ෂිකව පවත්වන තරඟ ඔවුන් කෘෂිකාර්මික අංශයට ඇද ගැනීමට බලපාන සාධකයකි.

(ඊ) ගොවිතැන යනු රැකියා සඳහා වන අවසාන විකල්පය බවට සමාජයීය ආකල්පයක් පවතී. සියලු දෙනා ම වැදගත් සහ පිළිගත් රැකියාවක නිරතවීමට කැමති හෙයින් මෙම ආකල්පය මත තරුණයින් කෘෂිකර්මාන්තයෙන් ඉවතට ගමන් කරයි. එම නිසා, කෘෂිකර්ම අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, ජනමාධ්‍ය අමාත්‍යාංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පාසැල් සහ මාධ්‍ය වැනි අදාළ ආයතන මැදිහත් වී සිදු කරන වැඩසටහන් ඔස්සේ මෙවැනි අවැඩදායක නීරස ආකල්ප වෙනස් කිරීමට කටයුතු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට යෝජනා කෙරේ. තරුණ ගොවීන් අතර තරග පැවැත්වීම සහ හොඳ ම ගොවියා/ගෙවිලියට විදේශ පුහුණු චාරිකා ලබාදීම. අනෙකුත් රටවල ජීවනෝපායය මාර්ගයක් ලෙස කෘෂිකර්මාන්තය සාර්ථකව සිදු කෙරෙන්නේ කෙසේ ද යන්න පිළිබඳව තෝරා ගත් තරුණ පිරිසකට අත්දැකීම් ලබාදීම සහ ගොවි දිනයට අමතරව 'තරුණ ගොවි දිනය' සැමරීම.

8.2.2 ව්‍යාප්ති සේවාවට අදාළ ගැටලු

(අ) ප්‍රතිචාරීන් විසින් හෙළි කළ අන්දමට, කෘෂිකාර්මික කටයුතු සඳහා ව්‍යාප්ති සේවාව ප්‍රමාණවත් නොවේ. ගම්වල ගොවීන්ගේ අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් කෘෂිකර්ම උපදේශකවරුන්/වරියන් නොමැති බව නිරීක්ෂණය විය. එම නිසා, මේ මොහොත වන විට කෘෂිකර්ම උපදේශකවරුන්ගේ සංඛ්‍යාව සහ ගුණාත්මක භාවය වර්ධනය කිරීම අත්‍යවශ්‍ය කරුණක් ව ඇත. පළාත් සභා මට්ටමින්, කෘෂිකර්ම උපදේශකවරුන්ගේ සංඛ්‍යාව ඉහළ නැංවීමට අවසර ගැනීමට අපහසු නම්, මෑතක රාජ්‍ය සේවයට බඳවාගත් අභ්‍යාසලාභී කෘෂිකර්ම උපාධිධාරීන් කෘෂිකර්ම උපදේශකගේ කාර්යයන් ඉටු කර ගැනීම සඳහා යොදා ගැනීම් හැකියාව පවතී. අවශ්‍යතාව අනුව ග්‍රාම නිලධාරී වසම් කිහිපයකට එක් අයෙකු බැගින් කෘෂිකර්ම උපාධිධාරීන් යෙදවිය හැකි ය. තව ද, ඔවුන්ට ඉලක්ක ලබාදීමත්, මනා පසුවිපරමක් සහ ඉලක්ක සපුරාලන්නන් හඳුනාගැනීම සඳහා මනා ඇගයීම් ක්‍රමයක් ද ක්‍රියාත්මක කළ යුතු ය. කෘෂි ව්‍යාප්ති සේවය පළාත් සභාවලට පැවරුණු විෂයයක් වන හෙයින් අවශ්‍ය නිලධාරීන් සංඛ්‍යාව, ඇගයීමේ ක්‍රමවේදය සහ ඉලක්ක සම්බන්ධයෙන් පළාත් සභා සමග සාකච්ඡා කොට තීරණය කළ යුතු ය.

(ආ) ව්‍යාප්ති සේවාව වඩාත් ඵලදායි කර ගැනීම සඳහා කෘෂි උපදේශක/ව්‍යාප්ති නිලධාරී සහ තරුණ ගොවීන් අතර ශක්තිමත් මෙන් ම සහයෝගී සබඳතාවක් පවත්වාගත යුතු වේ.

(ඇ) නව තාක්ෂණය, වඩා ඵලදායී බීජ/රෝපණ ද්‍රව්‍ය සහ තිරසාර කෘෂිකර්මය සම්බන්ධයෙන් තරුණ ගොවීන් වෙතින් සැලකිය යුතු මට්ටමේ ඉල්ලුමක් පවතී. එම නිසා, කාර්යක්ෂම සහ ඵලදායී සේවාවක් පවත්වාගෙන යාම සඳහා ව්‍යාප්ති සේවකයින්ගේ දැනුම යාවත්කාලීන කළ යුතු ය.

(ඇ) තමන්ගේ සේවා ලැයිස්තුවෙහි ව්‍යාප්ති සේවා සම්බන්ධ ක්‍රියාකාරකම් ඇතුළත් නො වුන ද ඇතැම් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාව හදාරා ඇත. එම නිසා, ඔවුන්ගේ දායකත්වය කෘෂි ව්‍යාප්ති සේවාවට ලබාගැනීම සඳහා කටයුතු කළ යුතු අතර ඔවුන්ගේ කටයුතු අධීක්ෂණයට සහ පසු විපරම් කිරීමට කටයුතු කළ යුතු ය. ඒ අනුව, ඔවුන්ගේ සේවාව වර්තමානයේ පවතින ග්‍රාම නිලධාරී වසම් මට්ටමෙන් ලබා ගත හැකි ය.

(ඉ) ග්‍රාමීය මට්ටමින් ව්‍යාප්ති සේවාවන් සැපයීමට තොරතුරු තාක්ෂණ පහසුකම් පුළුල් කිරීම කළ යුතු වේ. ඇතැම් ප්‍රදේශවල නැණසල මධ්‍යස්ථාන පැවතිය ද ඇතැම් ප්‍රදේශවල එම පහසුකම් නො පවතී. එම නිසා, තරුණ ගොවි සමාජ/කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර හෝ වෙනත් ක්ෂේත්‍ර නිලධාරියෙකුගේ කාර්යාලය හරහා එම පහසුකම් සැපයීමට වඩාත් ප්‍රයෝජනවත් වේ. සහනදායී මිලකට සේවාව සැපයීම මඟින් පිරිවැයෙන් කොටසක් ආවරණය කර ගැනීමට හැකි වනු ඇත.

(ඊ) කෘෂිකාර්මික ප්‍රදේශවල තෝරාගත් පාසැල් ගොවිපළවලට ආරක්ෂිත ගෘහ තුළ සිදු කෙරෙන වගා ක්‍රම **(Poly tunnel),** බිංදු ජල සම්පාදනය සහ වෙනත් අධිතාක්ෂණික කෘෂිකාර්මික ක්‍රියාකාරකම් හඳුන්වා දීමෙන් තරුණයින් පුහුණු කිරීමත්, දිරිමත් කිරීමත් සිදු කළ හැකි ය. තව ද, මෙම සම්පත් අවට පාසැල්වල සිසුන්ට ද භාවිතා කොට පුහුණුවීමට වැඩ පිළිවෙලක් සැකසීමෙන් ඒවා උපරිම උපයෝජනයට ලක් කළ හැකි වේ.

(උ) කෘෂිපාදක කොටගත් කර්මාන්ත, ව්‍යවසායන් සහ නව තාක්ෂණය සම්බන්ධයෙන් පවතින විභවතාවන් සම්බන්ධයෙන් පාසැල් සිසුන් සඳහා සම්මන්ත්‍රණ, වැඩමුළු සහ ප්‍රදර්ශන පැවැත්වීමෙන් තරුණයින් කෘෂිකර්මාන්තයට ආකර්ෂණය කර ගැනීමට හැකි වේ.

(ඌ) කෘෂිකර්මය සහ තිරසාර සංවර්ධනය, ආහාර සුරක්ෂිතතාවයේ දී කෘෂිකර්මාන්තයේ වැදගත්කම පාසැල් විෂය මාලාවට ඇතුළත් කිරීම සහ සිසුන්ගේ දැනුම පුළුල් කිරීම සඳහා ඒ සම්බන්ධයෙන් පැසැල් මට්ටමෙන් හෝ කලාප මට්ටමින් වැඩමුළු/සම්මන්ත්‍රණ සංවිධානය කිරීම. තව ද, කෘෂිකර්මාන්තයට අදාළ සාහිත්‍ය තරඟ පාසැල් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා සංවිධානය කිරීමෙන් සිසුන් දිරිමත් කළ හැකි ය. එයට අමතරව, ජයග්‍රාහකයින්ගේ සාහිත්‍ය නිර්මාණ මුද්‍රණය කොට පාසැල් සහ අනෙකුත් පුස්තකාලවලට බෙදා හැරීමෙන්, ඔවුන්ගේ දැනුම හා කැමැත්ත වර්ධනය කිරීමෙහි ලා සහාය විය හැකි ය.

### 8.2.3 තරුණ ගොවි සමාජවලට අදාළ ගැටලු

(අ) කෘෂිකර්ම උපදේශකවරුන්ගේ මග පෙන්වීම යටතේ තරුණ ගොවි සමාජ පිහිටුවා තිබුණ ද, ඒවා අපේක්ෂිත තරම් ඵලදායී නොවේ. සමුපකාර ගොවිපළවල් පිහිටුවීම සඳහා තරුණ ගොවි සමාජ සඳහා ඉඩම්, අධි තාක්ෂණික ක්‍රමවේද සඳහා පුහුණුවීම් සහ මූල්‍ය සහාය, කළමනාකරණ පුහුණුවීම්, කෘෂි රසායනික සහ ඒවා නිසි පරිදි භාවිතය සඳහා වන දැනීම සහ කෘෂි පාදක කොටගත් කර්මාන්ත සඳහා නිසි දැනුම, පෞද්ගලික අංශය මෙන් ම විභවතාවක් සහිත වෙළඳපොළ සමග සම්බන්ධීකරණයක් ගොඩනැගීම ආදී අත්‍යවශ්‍ය සහායන් ලබාදෙමින් ඵලදායී ලෙස පවතින තරුණ ගොවි සමාජ ශක්තිමත් කිරීමත්, විභවතාවක් පවතින ප්‍රදේශවල නව තරුණ ගොවි සමාජ පිහිටුවීමටත් නිර්දේශ කෙරේ. පුහුණුවීම්වල උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමටත්, ඔවුන්ගේ ජීවනෝපායය ක්‍රියාකාරකම් තිරසාරව පවත්වාගෙන යාමත් සඳහා ක්‍රියාකාරකම්වලට අදාළ වෙළඳපොළ හඳුනා ගැනීමෙන් පසුව එකී පුහුණුවීම් ලබා දිය යුතු ය.

(ආ) දැනට පවතින තරුණ ගොවි සමාජ, මාර්ග ප්‍රතිසංස්කරණය, රෝහල් සහ ආගමික ස්ථාන පිරිසිදු කිරීම වැනි පොදු කටයුතු සහ ගොවි පැන තරග සඳහා ඉදිරිපත් වීම වැනි කටයුතුවල නිරත වේ. මෙම සංවිධාන පවතින තත්ත්වයෙන් ඔබ්බට ගොස් කෘෂිකාර්මික කටයුතු සහ කෘෂි ව්‍යවසායන් සමග සෘජුව ම සම්බන්ධ විය යුතු ය. මෑතක දී රාජ්‍ය සේවාවට බඳවාගත් උපාධිධාරීන්ගේ සහාය සහිතව මෙම සංවිධාන වඩා ඵලදායී ලෙස ක්‍රියාත්මක කළ හැකි ය.

(ඇ) හොඳ ම තරුණ ගොවි සමාජය තෝරා ගැනීමේ වර්තමාන නිර්ණායක (ගොවි පැන තරගය) වෙනුවට වඩාත් ප්‍රායෝගික නිර්ණායක යොදා ගත යුතු ය. තරුණ ගොවි සමාජ විසින් රැකියා අවස්ථා සහ ආදායම් මට්ටම, පවතින දැනුම වර්ධනයට සහ ඒවා ගොවිතැනේ දී යොදා ගැනීමට ක්‍රියාකළ යුතු ය. හොඳ ම තරුණ ගොවි සමාජයේ ක්‍රියාකාරකම් සහ තරගයේ අවස්ථා විද්‍යුත් මාධ්‍ය මගින් ප්‍රචාරය කිරීමෙන් තරුණයින් කෘෂි ක්‍රියාකාරකම් සඳහා දිරිමත් කළ හැකි ය.

(ඇ) කෘෂිකර්මාන්තය සහ කෘෂිපාදක කොටගත් කර්මාන්ත සම්බන්ධයෙන් දැනුම වර්ධනය කිරීමට අධ්‍යාපනික චාරිකා සහ වැඩමුළු උපකාරී විය හැකි ය. එසේ වුව ද, බොහෝ තරුණ ගොවි සමාජවලට එවන් කාර්යයන් සඳහා ප්‍රමාණවත් අරමුදල් නො පවතී. එම නිසා, එකී කාර්යයන් සඳහා අරමුදල් සැපයීමෙන් විෂයය සම්බන්ධයෙන් ඔවුන්ගේ දැනුම වර්ධනය පුළුල් කිරීමට උපකාරී විය හැකි ය.

(ඉ) කෘෂිකර්මාන්තයෙන් තරුණයින් ඈත් කිරීමට බලපාන සාධක අතුරින් එකක් වන්නේ කෘෂි යන්ත්‍රෝපකරණවල මිල අධික වීමයි. එම නිසා, තරුණ ගොවි සමාජවලට යන්ත්‍රෝපකරණ සැපයීම (අවම වශයෙන් තරුණ ගොවි සමාජ කිහිපයක් සඳහා එක් උපකරණ කට්ටලයක් බැගින් හෝ) තුළින් කෘෂිකර්මාන්තයට තරුණයින් ආකර්ෂණය කර ගැනීමට උපකාරී වනු ඇත.



පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

(ට) සාර්ථක තරුණ ගොවීන්ට පුහුණුවීම් සහ අවම පොළියකට ණය මුදල් වැනි පහසුකම් සැපයීමෙන් ඔවුන් දිරිමත් කිරීමේ හැකියාව පවතී. කෘෂිකර්මාන්තයට තරුණයින් ආකර්ෂණය කර ගැනීමේ ආදර්ශ ලෙස සාර්ථක තරුණ ගොවීන් යොදා ගත හැකි ය.

### 8.2.4 කෘෂිපාදක කොටගත් කර්මාන්ත සහ ව්‍යවසායන්ට අදාළ ගැටලු

(අ) වගකීම් දරන නියෝජිත ආයතන විසින් නිසි අධීක්ෂණයක් සහ මඟ පෙන්වීමක් සමඟ නිපුණතා, හැකියාව සහ කැමැත්ත ඇති පුහුණුවීම් ලද තරුණයින් වෙනුවෙන් සාමූහික කර්මාන්ත සහ ව්‍යාපාර පිහිටුවීම. තෝරාගත් සුදුසු තරුණ උපාධිධාරීන් වෙනුවෙන් සාමූහික කර්මාන්ත ආරම්භ කිරීමටත්, ඒවාට උපකාර කිරීමටත් පර්යේෂණ කණ්ඩායම දැඩිව නිර්දේශ කරයි. වසර දහයක බදු සහන ලබාදීම වැනි ඇතැම් උපක්‍රම අනුගමනය කිරීමෙන් ඒ සඳහා තරුණයින් දිරිමත් කළ හැක. අවම පොළී අනුපාතිකයක් යටතේ මූල්‍ය පහසුකම් සැපයීම හෝ මූලික වියදම රජය විසින් දරා එයින්, පිරිවැයෙන් මුල් අවස්ථාවේ ම තීරණය කරන ලද කොටසක් වසර කිහිපයකට පසුව වාරික වශයෙන් ලබාගැනීම සිදු කළ හැකි ය. රජය විසින් මෙකී නිර්දේශය ක්‍රියාත්මක කරන්නේ නම්, ඒ සම්බන්ධයෙන් ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළකර සම්මුඛ පරීක්ෂණ තුළින් යෝග්‍ය පුද්ගලයන් තෝරාගැනීම වඩාත් සුදුසු ය. මෙම වැඩසටහන සකස් කිරීමෙන් පසුව, ඒ සම්බන්ධයෙන් විද්‍යුත් මාධ්‍ය, රාජ්‍ය නිලධාරීන් සහ විශ්වවිද්‍යාලවල මාර්ගයෙන් පුළුල් ප්‍රචාරයක් ලබාදීමට රජය විසින් පියවර ගත යුතු ය.

(ආ) කෘෂිකාර්මික පුහුණුවීම්වලට අමතරව, ව්‍යවසායික සහ කළමනාකරණ පුහුණුවීම් මෙන් ම තොරතුරු තාක්ෂණ පුහුණුවීම් තරුණ ගොවීන්ගේ ජීවනෝපාය මාර්ග තිරසාරව පවත්වා ගෙනයාමට උපකාරී වේ. එබැවින් ඒවා ලබාගැනීමට ඇති අවස්ථා පුළුල් කළ යුතු වේ.

(ඇ) තරුණයින් සඳහා කෘෂි පාදක කොටගත් කර්මාන්ත සහ වගා කටයුතු දිරිගැන්වීම සඳහා රාජ්‍ය–පෞද්ගලික හවුල්කාරිත්වය ගොඩ නැංවීම කළ යුතු වේ. කෘෂිකර්මාන්තයේ තරුණ සහභාගීත්වය වර්ධනය කිරීම සඳහා තරුණ ගොවීන් සඳහා ඉදිරි වෙළඳ ගිවිසුම්, අගය එකතු කළ කර්මාන්ත ස්ථාපිත කිරීම සහ කෘෂි පාදක කොටගත් කර්මාන්ත ඔස්සේ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය හඳුන්වා දිය හැකි ය.

(ඈ) වර්තමානය වන විට බැංකු විසින් තරුණ ව්‍යවසායකයින් සඳහා ණය වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කළ ද, බොහොමයක් ග්‍රාමීය තරුණයින් ඒ සම්බන්ධයෙන් දැනුවත් වී නොමැත. එම නිසා, එවන් වැඩසටහන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබා දිය යුතු ය.

(ඉ) කෘෂිකාර්මික ව්‍යවසායික අවස්ථා, පුහුණුවීම් සහ විවිධ ආයතන මඟින් ලබාදෙන අනෙකුත් සහායන් පිළිබඳ අදාළ සහ වැදගත් තොරතුරු ප්‍රමාදයකින් තොරව ගමට ලබා දිය යුතු ය. කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර (කෘ.ප.නි.ස.) කෘෂිකර්මාන්තය හා සම්බන්ධ කටයුතුවලට වගකිව යුතු

වුව ද, ග්‍රාමීය මට්ටමේ දී ගම් වැසියන් ග්‍රාම නිලධාරී සමග බොහෝ දුරට සම්බන්ධ ය. එම නිසා, එවන් තොරතුරු ග්‍රාම නිලධාරීන් හා කෘ.ප.නි.ස. යන නිලධාරීන් දෙදෙනා හරහා ම ලබාදීම වඩා ප්‍රයෝජනවත් වේ.

(ඊ) පවතින ණය පහසුකම් කෘෂි ව්‍යාපාර/කර්මාන්ත සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර යෙදවුම්, ඒවා ලබාගත හැකි ආකාරය ආදී තොරතුරු නව ව්‍යවසායකයින්ට ඉතා වැදගත් වේ. එම නිසා, එවන් තොරතුරු පුහුණු වැඩසටහන්වල දී ම ලබා දිය හැකි ය.

(උ) කර්මාන්ත/ව්‍යාපාර ලියාපදිංචි කිරීමට අදාළ දීර්ඝ සහ සංකීර්ණ ක්‍රියාවලිය නව ව්‍යවසායකයින් අධෛර්යමත් කරයි. එම නිසා කාලය නිකරුනේ නාස්ති නොකොට තොරතුරු තාක්ෂණය භාවිතා කරමින් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේ පියවර ගණන අඩු කරමින් ක්‍රියාවලිය සරල කළ යුතු ය.

(ඌ) කෘෂි පාදක කොටගත් ව්‍යවසායන්ට අදාළ තාක්ෂණික පුහුණුවීම්වල එක් දුර්වලතාවක් වන්නේ, පුහුණු ලාභීන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ මාර්ගෝපදේශ සැපයීම, පසු විපරම් කිරීම හෝ ඇගයීමක් නොවීම ය. එම නිසා, ඇතැම් ආයතනවල මැදිහත්වීමෙන් තරුණයින් කෘෂි ව්‍යවසායන් හි පුහුණුව ලබා ගත්ත ද, කෘෂි ව්‍යවසායන් ඇරඹීම සඳහා ඔවුන්ගේ එතරම් උනන්දුවක් නොමැත. අනෙක් අතට, ඔවුන් ව්‍යවසායක් ආරම්භ කළ ද, අත්දැකීම්වල හිඟකම, තරගකාරීත්වය සහ වෙනත් හේතු නිසා එය බිඳ වැටීමේ වැඩි හැකියාවක් පවතී. එම නිසා, ළදරු කර්මාන්ත හෝ ව්‍යවසායන් සම්බන්ධයෙන් ග්‍රාමීය මට්ටමේ ක්ෂේත්‍ර නිලධාරීන් මෙන් ම ඉහළ මට්ටම්වල අදාළ නිලධාරීන් ද ක්‍රමවත් අධීක්ෂණයක් පවත්වා ගෙනයාමට වැඩි අවධානයක් යොමු කළ යුතු වේ.

### 8.2.5 අලෙවි පහසුකම් සම්බන්ධ ගැටලු

(අ) ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානවලින් කෘෂිකාර්මික යෙදවුම් මිලට ගත හැකි වුව ද, අවශ්‍ය වේලාවට සහ ප්‍රමාණවත් පරිදි මිලට ගැනීම අපහසු ය. එම නිසා, නියමිත වේලාවට සහ අවශ්‍ය ප්‍රමාණයෙන් යෙදවුම් සැපයිය හැකි වන සේ ගොවිජන බැංකු අරමුදල සහ ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන ශක්තිමත් කිරීමට රජය විසින් කටයුතු කළ යුතු වේ.

(ආ) බොහෝ අවස්ථාවල දී, ගොවි නිවසත් ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානයත් අතර සැලකිය යුතු අන්දමේ දුර ප්‍රමාණයක් පවතී. එම නිසා, ඉහළ මිලක් ගෙවා වුව ද පෞද්ගලික වෙළඳුන්ගෙන් යෙදවුම් මිලට ගැනීමේ නැඹුරුවක් පවතී. ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන විසින් ගමේ කෘ.ප.නි.ස. කාර්යාලයෙන් කෘෂිකාර්මික යෙදවුම් මිලට ගැනීමට අවස්ථාව සලසන්නේ නම් ගොවීන්ට සපයන සේවාව වඩා යහපත් සහ කාර්යක්ෂම වේ.

(ඇ) ගොවි සංවිධාන නියෝජිතයින් මෙන් ම තරුණයින් ද පෙන්වාදුන් අන්දමට කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ තරුණ සහභාගීත්වය අඩුවීමට බලපා ඇති එක් හේතුවක් වන්නේ, කෘෂි ක්‍රියාකාරකම්වලින් ලැබෙන අඩු ලාභය හෝ පාඩු සිදු වීම ය. තව ද, පර්යේෂණයෙන් අනාවරණය වූ අන්දමට, කෘෂි නිෂ්පාදන සඳහා ඉහළ මිලක් ලැබෙන විට කෘෂිකර්මාන්තයේ තරුණ සහභාගීත්වය 80%-90% තරම් ඉහළ අගයක් ගනී. එම නිසා, ආහාර බෝග සඳහා අභ්‍යන්තර හා බාහිර වෙළෙඳපොළ සොයා ගැනීමත්, ගොවීන්/ගොවි සංවිධාන සහ මිල දී ගන්නන් අතර සම්බන්ධතාවක් නැගීමත් කළ යුතු වේ. රට පුරා විසිරී ඇති විවිධ සේවා සමුපකාර සමිති, මහා පරිමාණ ව්‍යාපාර, කෘෂි පාදක කොටගත් කර්මාන්ත, ගොවි සංවිධාන සහ තරුණ ගොවි සමාජ සම්බන්ධීකරණය සඳහා යාන්ත්‍රණයක් ගොඩනැගිය යුතු වේ.

(ඈ) අලෙවිකරණ ගැටලුව හේතුවෙන් ඇතැම් ප්‍රදේශවල විශේෂිත ආර්ථික සංවර්ධන මධ්‍යස්ථාන සඳහා ඉල්ලුමක් පවතී. කෙසේ වුව ද, දිවයින පුරා විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීමේ විභවතාවක් නොමැති නමුත් ගොවීන්ගේ නිෂ්පාදන අලෙවි කර ගැනීමට ප්‍රමාණවත් පහසුකම් නොමැති දුෂ්කර ප්‍රදේශවල සිදු කරනු ලබන ශක්‍යතා අධ්‍යයනයකින් පසුව යෝග්‍ය ප්‍රදේශවල එකතු කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවිය හැකි ය.

(ඉ) යෙදවුම් ලබා ගැනීමට සහ අලෙවිය පිළිබඳ පවතින හැකියාවන් සැලකිල්ලට ගනිමින් ආහාර සැකසුම් කර්මාන්තශාලා පිහිටුවීම.

### 8.2.6 මූලික පහසුකම් සම්බන්ධ ගැටලු

(අ) වගා කළ හැකි නමුත් කෘෂිකාර්මික කටයුතු සඳහා මෙතෙක් භාවිතා කර නොමැති හෝ ඌන උපයෝජනය සහිත රාජ්‍ය හෝ පෞද්ගලික අංශයට අයත් ඉඩම් තාවකාලික කෘෂිකාර්මික කටයුතු සඳහා තරුණ ගොවි සමාජවලට හෝ තරුණ කණ්ඩායම්වලට කෙටි කාලීන බදු ක්‍රමයක් යටතේ ලබාදීම.

(ආ) යුද්ධය නිසා විනාශ වූ සහ දිගු කාලයක් තිස්සේ ප්‍රතිසංස්කරණය නො කරන ලද වාරි ක්‍රම ප්‍රමුඛතා පදනමක් මත ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගැනීම.

(ඇ) ඉහත කී ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අවශ්‍ය ශ්‍රමය තරුණ ගොවි සමාජවල උතුරු-දකුණු ශ්‍රම හුවමාරුව ඔස්සේ ලබා ගැනීමට කටයුතු කිරීම තුළින් ජාතික සමගිය වර්ධනය කිරීමටත්, වෙනස් සංස්කෘතීන් සම්බන්ධයෙන් තරුණ ප්‍රජාවට අත්දැකීම් ලබාගැනීමටත් අවස්ථාව සැලසීම.

(ඈ) යෝග්‍ය ප්‍රදේශවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල තෝරාගත් එක් තරුණ ගොවි සමාජයකට 'බිංදු ජල සම්පාදනය, ආරක්ෂිත ගෘහ තුළ වගාව (Poly tunnel) වැනි අධි තාක්ෂණික කෘෂිකාර්මික භාවිතාවන් සඳහා අවශ්‍ය පුහුණුව සහ උපකරණ ලබාදීම. අදාළ පුහුණුවීම් සහ උපකරණ ලබාදීමෙන් පසුව

කෘෂිකර්ම උපදේශක සහ ගොවිජන සංවර්ධන නිලධාරී විසින් අවම වශයෙන් වසර තුනක් හෝ ගතවන තුරු ඔවුන්ගේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කොට අදාළ ආයතන වෙත වාර්තා කිරීම.

(ඍ) වගාව ආරම්භ කරන අවස්ථාව වන විට අවශ්‍ය ප්‍රමාණයෙන් බීජ/රෝපණ ද්‍රව්‍ය සපයා ගත නො හැකිවීම, බීජ සඳහා ඉල්ලුම වැඩිවන කාලවල දී වෙළඳුන් විසින් ඒවා වැඩි මිලට අලෙවි කිරීම, පැලවීම් ප්‍රතිශතය ඇසුරුමේ සඳහන් ප්‍රමාණයට වඩා අඩුවීම, නැවත නැවත රෝපණ ද්‍රව්‍ය මිලට ගැනීමට සිදු වීම නිසා නිෂ්පාදන පිරිවැය ඉහළ යාම ආදී චෝදනා රාශියක් බීජ සහ රෝපණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් එල්ල වේ. එම නිසා, බීජ පනත නිසි පරිදි ක්‍රියාවට නැංවීමට පියවර ගත යුතු අතර වගා කන්න කිහිපයකට භාවිතා කළ හැකි බීජ/රෝපණ ද්‍රව්‍ය (මුල් බීජයෙන් ලබාගන්නා බීජවලින් නැවත රෝපණය කළ හැකි) ආනයනයට ක්‍රියා කිරීම කළ යුතු ය.

(ඎ) කෘෂි රසායනවලින් සෞඛ්‍යයට සහ ආර්ථිකයට සිදු කරන අයහපත් බලපෑම පිළිබඳ තරුණයින්ට ප්‍රමාණවත් දැනුමක් පවතී. අධ්‍යයන ප්‍රදේශවලින් බොහොමයක තරුණයින් අවම රසායනික භාවිතයකින් සාම්ප්‍රදායික බෝග වගා කිරීමට කැමැත්තක් දැක්වූ හ. තව ද, සාම්ප්‍රදායික බෝග වගා කිරීමට කැමැත්තෙන් පසුවන (ඉහළ ඉල්ලුම, සෞඛ්‍යයට හිතකරවීම මෙන් ම ඉහළ ආදායම සහ පිරිවැය අඩුවීම නිසා) නමුත් සාම්ප්‍රදායික බෝග ප්‍රභේද ලබා ගැනීමේ අපහසුව නිසා වැඩි දියුණු කරන ලද බෝග ප්‍රභේද වගා කරන ගොවීන් සැලකිය යුතු පිරිසක් පර්යේෂණ කණ්ඩායමට මුණ ගැණුනි. ඒ නිසා, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ, සාම්ප්‍රදායික බෝග වගා කිරීමට අදාළව කටයුතු කරන රාජ්‍ය නොවන සංවිධාන, සාම්ප්‍රදායික වගාවන් සඳහා සම්පත් සහිත රාජ්‍ය ආයතන සහ එවන් බෝග වගා කිරීමට කැමැත්තක් දක්වන ගොවි සංවිධාන වැනි සියලු පාර්ශවකරුවන් සම්බන්ධීකරණයට වැඩසටහනක් සකස් කොට ක්‍රියාත්මක කළ යුතු ය.

(ඏ) දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශවල තරුණයින් කාබනික පොහොර නිෂ්පාදනය සඳහා (කුඹුරු ඉඩම් සඳහා යෙදීමට අවශ්‍ය බැවින් පවතින අධික ඉල්ලුම නිසා) සහ බීජ නිෂ්පාදනයට දැඩි කැමැත්තක් දැක්වූ හ. එම නිසා, ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීම, තත්ත්ව සහතික සේවාව සහ සම්බන්ධ කිරීම මෙන් ම දිස්ත්‍රික්කය තුළ පවතින වෙළඳපොළ සමග සම්බන්ධ කිරීම වැනි දෑ ඇතුළත්ව ඔවුන්ට සහාය වීම සඳහා යාන්ත්‍රණයක් සකසා නිසි පරිදි ක්‍රියාත්මක කිරීම ප්‍රයෝජනවත් වේ.

(ඐ) කෘෂිකර්මාන්තයේ හෝ කෘෂි පාදක කොටගත් ව්‍යවසායන් හි යෙදීමට අවශ්‍ය මූලික ප්‍රාග්ධනය සපයා ගැනීම බොහෝ තරුණයින්ට අපහසු ය. වාණිජ බැංකු විසින් තරුණයින්/කෘෂිකාර්මික කටයුතු සඳහා විවිධ ණය වැඩසටහන් යටතේ ණය පහසුකම් සැපයුව ද, එවන් වැඩසටහන් පිළිබඳ පවතින අල්ප දැනුම, ඇපයක් ලෙස තැබීමට වත්කමක් නොවීම සහ බැංකුවේ පළපුරුදු ගනුදෙනුකරුවන් සම්බන්ධයෙන් පවතින විශ්වාසය පළමුවරට ගණුදෙණු කරන්නෙකු කෙරෙහි නොවීම ආදී හේතු ගණනාවක් නිසා තරුණයන්ට එම පහසුකම් භාවිතා කළ නො හැක. තව ද, ජාතික තරුණ සේවා සභාව විසින් 2008/09 වසරේ දී සිදු කරන ලද ජාතික තරුණ සමීක්ෂණයෙන් අනාවරණය කරන

පරිදි, මෙරට තරුණයන්ගෙන් 1/3 ට කිසිදු ආකාරයක බැංකු ගිණුමක් නොමැත. එම නිසා, ඉතුරුම් සඳහා ඉහළ පොළී අනුපාතිකයක් සහ ණය සඳහා අඩු පොළී අනුපාතිකයක් ද වන සේ විශේෂ ඉතුරුම් සහ ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දීමත්, ප්‍රමාණවත් මුදලක් අඩු කොන්දේසි යටතේ තරුණයින්ට ලබාදීමත් කළ යුතු වේ.

### 8.2.7 සමාජ ආරක්ෂණ ක්‍රමය සහ කෘෂි රක්ෂණය සම්බන්ධ ගැටලු

(අ) වර්තමාන සමාජ තත්ත්වය සැලකිල්ලට ගනිමින් ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය සහ කෘෂි රක්ෂණ ක්‍රමය යාවත්කාලීන කිරීමත්, මෙම වැඩසටහන් සම්බන්ධ ප්‍රතිපත්ති සහ වැඩසටහන් වෙනස් කිරීමට පෙර ඒ සම්බන්ධයෙන් පූර්ණ පර්යේෂණයක් සිදු කිරීම වඩාත් යෝග්‍ය ය.

(ආ) රක්ෂණ මුදල නිදහස් කිරීමට ප්‍රමාදවීම, අස්වනු හානි සඳහා ප්‍රමාණවත් මුදලක් ලබාගැනීමේ අපහසුව ආදී ඇතැම් හේතු නිසා බොහෝ ගොවීන් තුළ කෘෂි රක්ෂණ වැඩසටහන සම්බන්ධයෙන් විශ්වාසයක් නොමැත. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් වසර කිහිපයකට පෙර සිදු කරන ලද කෘෂි රක්ෂණය පිළිබඳ අධ්‍යයන වාර්තාවෙ හි වර්තමානයට ගැළපෙන නිර්දේශ වේ නම් එම රක්ෂණ ක්‍රමය වැඩි දියුණු කිරීම සඳහා එකී නිර්දේශ භාවිතා කළ හැකි ය.

### 8.2.8 තරුණයින් සඳහා වන වයස් සීමාව

(අ) ඇතැම් දෘෂ්ටි කෝණයන්ට සහ ඇතැම් කාර්යයන්ට අනුව ශ්‍රී ලංකාවේ තරුණයින් සඳහා වන වයස් සීමාව අවුරුදු 18-30 ලෙස සලකනු ලැබුව ද ඇතැම් අවස්ථාවල දී එය අවුරුදු 14-29 ලෙස සලකනු ලබයි. මෙරට උපතේ දී අපේක්ෂිත ආයු කාලය සැලකිය යුතු මට්ටමකින් වැඩි වී ඇති අතර අධ්‍යාපනය සඳහා දිගු කාලයක් ගතකිරීම නිසා රැකියාවක් වෙත යොමුවීමේ වයස් සීමාව ඉහළ ගොස් ඇත. එම නිසා, කෘෂිකර්මාන්තයේ තරුණ සහභාගීත්වය වර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්වල දී තරුණයින්ගේ වයස් සීමාව අවුරුදු 15-40 ලෙස සැලකීම වඩාත් යෝග්‍ය ය.

### 8.2.9 සමාජ සාධාරණත්වය, යහපාලනය සහ සමානාත්මතාවය

(අ) මෙයට පෙර සිදු කරන ලද අධ්‍යයනයන්ගෙන් සහ තරුණයින් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවෙන් (1990) හෙළි කරන අන්දමට සමාජ සාධාරණත්වය සහ යහපාලනය සම්බන්ධ බරපතල ප්‍රශ්නවලට ශ්‍රී ලාංකික සමාජය මුහුණ දෙමින් සිටී. කාලිංග ටියුඩර් සිල්වා සහ තවත් අය විසින් ප්‍රකාශිත කුල රහිත බව හෝ කුල අන්ධතාව: ශ්‍රී ලංකාවේ අප්‍රකාශිතව කුල අනුව වෙනස් කොට සැලකීමේ ගතිකතා, සමාජ බැහැර කිරීම් සහ විරෝධතා (2009) (Casteless or Caste-blind?

Dynamics of Concealed Caste Discrimination, Social Exclusion and Protest in Sri Lanka) පර්යේෂණ කෘතියෙන් ඉදිරිපත් කරන අන්දමට, ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 20%-30% අතර ප්‍රමාණයක් තම කුලය නිසා දෙවැනි ගණයේ පුරවැසියෙකු ලෙස සැලකුම් ලබා ඇත. නන්දසේන රත්නපාල (1982) පෙන්වා දෙන අන්දමට මෙරට පළමු තරුණ කැරැල්ල සඳහා තරුණයින් මෙහෙය වූ එක් ප්‍රධාන ගාමක බලවේගයක් වූයේ සමාජ අසාධාරණය පිළිබඳ ඔවුන් තුළ පැවති හැඟීම සහ රැකියා සඳහා අවස්ථා මඳවීම බව පෙන්වා දී ඇත. ජාතික තරුණ සමීක්ෂණය (2008/2009) හෙළි කරන අන්දමට තරුණයින්ගෙන් 81%ක් ඡන්දය පාවිච්චි කරන නමුත් දේශපාලන ආයතන සම්බන්ධයෙන් ඔවුන්ගේ විශ්වාසය අඩු මට්ටමක පවතී. එම අධ්‍යයනයට අනුව, පාර්ලිමේන්තුව, පළාත් සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා යන දේශපාලන ආයතන සම්බන්ධයෙන් තමන් තුළ විශ්වාසයක් ඇති බව පවසන ප්‍රතිශතය තරුණයින්ගෙන් පිළිවෙලින් 29.1%, 25.8%, 25% සහ 31%කි. තව ද, තරුණයින්ගෙන් 54.4% තම ප්‍රදේශයේ පාර්ලිමේන්තු නියෝජිතයින් සහ පළාත් සභා නියෝජිතයින් කෙරෙහි තමන්ට කිසිදු විශ්වාසයක් නොමැති බව ප්‍රකාශ කොට ඇත. තරුණයින් සහ දේශපාලනය: ඔවුන් අරගල කරන්නේ මන් ද? යන ලිපියේ දී මහාචාර්ය ලක්සිරි ප්‍රනාන්දු විග්‍රහ කරන අන්දමට හමුදා, අධිකරණ, පොලීසිය සහ නිලබල තන්ත්‍රය (සිවිල් සේවාව) ඇතුළත් වූ රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් දැඩි විශ්වාසයක් පවතින තරුණ ප්‍රතිශතය 26.3%ක් වන අතර එම ආයතන සම්බන්ධයෙන් කිසිසේත් විශ්වාසයක් නොමැති තරුණ ප්‍රතිශතය 20.4%කි. කෙසේ වුව ද, එම අධ්‍යයනයෙන් පෙන්වා දෙන අන්දමට නිලබල තන්ත්‍රය කෙරෙහි තමන්ට දැඩිව විශ්වාස බව පැවසූ ප්‍රතිශතය 8.1%කි. සිවිල් සහ දේශපාලන පක්ෂ පිළිබඳව සම්පූර්ණ විශ්වාසයක් තමන්ට පවතින බව තරුණයන්ගෙන් 4%ක් පවසා ඇති අතර තරුණයින්ගෙන් 47%ක් දේශපාලන පක්ෂ සම්බන්ධයෙන් තමන්ට කිසිසේත් විශ්වාසයක් නොමැති බව පවසා ඇත. මේ ආකාරයට රජය සහ දේශපාලන ආයතන සම්බන්ධයෙන් විශ්වාසය පවතින තරුණ ප්‍රතිශතය අඩුවීමට හේතුවක් ලෙස ඉහත අධ්‍යයනය පෙන්වා දෙනු ලබන්නේ යහපාලන මූලධර්ම ක්‍රියාත්මකවීමේ අඩුව සහ සමස්ත සමාජය දේශපාලනීකරණයට ලක්වීම ය. මෙම තත්ත්වය 1990 තරුණයින් සම්බන්ධයෙන් වූ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවෙන් ද දැඩිව අවධාරණය කර ඇත.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් සිදුකළ අධ්‍යයනයේ දී රාජ්‍ය ආයතන සහ මහජන නියෝජිතයින් සම්බන්ධයෙන් තරුණයින් සම්බන්ධයෙන් වන ආකල්ප පරීක්ෂාවට භාජනය නො කළ ද, අධ්‍යයනය සඳහා තොරතුරු ලබාදුන් තරුණ පිරිස සේ ම ගොවි සංවිධානවල නියෝජිතයින්ගේ අදහස් දැක්වීම් තුළ ද බොහෝ දුරට ගම්‍ය වූයේ එම ආයතනවල කාර්යභාරය බොහෝ විට යහපාලන මූලධර්ම මත ක්‍රියාත්මක නොවේ ය යන මතයයි. ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක රාජ්‍ය සේවාව සහ දේශපාලන ආයතන, නියෝජිතයින් සම්බන්ධයෙන් වන මහජන විශ්වාසය අත්‍යවශ්‍ය සාධකයක් වන අතර කෘෂිකාර්මික ක්ෂේත්‍රයට තරුණ සහභාගීත්වය වර්ධනය කිරීම සඳහා ගනු ලබන සියළු ම ක්‍රියා මාර්ග රාජ්‍ය නිලධාරීන්, දේශපාලන ආයතන සහ මහජන නියෝජිතයින් කෙරෙහි විශ්වාසය තහවුරු කරන අන්දමින් ක්‍රියාත්මක වීම අත්‍යවශ්‍ය වේ. එම නිසා, කෘෂිකර්මාන්තය සඳහා තරුණ සහභාගීත්වය වර්ධනය කිරීමට ලබාදෙන දිරිගැන්වීම්, වරප්‍රසාද සහ



පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.,ප.පු.ආ
HARTI

පහසුකම් සියළු ආන්තික ජන කොටස් ආවරණය වන පරිදි කුසලතා පදනම මත විනිවිදභාවයෙන් යුතුව ලබාදීමට කටයුතු කිරීමෙන් තරුණ කොටස්වල විශ්වාසය දිනා ගැනීමට හැකි වේ.

## 8.3 වැඩිදුර පර්යේෂණයට ලක් කළ යුතු ක්ෂේත්‍ර

1. බොහෝ ගොවීන් බීජ/රෝපණ ද්‍රව්‍යවල සහ කෘෂි රසායනිකවල පහළ ගුණාත්මක බව සහ මිල සම්බන්ධයෙන් තම දුක් ගැනවිලි ඉදිරිපත් කළ හ. තව ද, ගොවීන් සහ කෘෂි රසායනික වෙළෙඳුන් අතර පවතින අනියම් ගිවිසුම (කෘෂි රසායනික සහ බීජ වර්ග ණය පදනම මත ලබාදීම නිසා) මත වෙළෙඳුන් විසින් ගොවීන් පාලනය කිරීමට උත්සාහ දරන බව නිරීක්ෂණය විය. මෙය ගොවීන්ට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට විවිධ අන්දමින් බලපාන බව පෙනී යයි. එම නිසා, ගොවීන් සහ කෘෂි රසායනික වෙළෙඳුන් අතර පවතින බැඳීමේ ස්වභාවය සහ ඉන් ගොවියාට සහ ගොවි පවුල්වල සාමාජිකයින්ට සිදුවන බලපෑම වැඩිදුර අධ්‍යයනය කළ යුතු ක්ෂේත්‍රයකි.

2. ගැටුම් පැවති කලාපයන්ට යාබද ගම්මාන හෝ ගැටුම් පැවති ප්‍රදේශවල දෙමාපියන් අහිමි වූ හෝ දෙමාපියන්ගෙන් එක් අයෙකු පමණක් ජීවත්වන තරුණයෝ විශාල පිරිසක් වෙසෙති. ඔවුන්ගේ අභිලාශයන් සහ අවශ්‍යතා රටේ අනෙකුත් ප්‍රදේශවල තරුණයින්ට වඩා වෙනස් බවත්, බොහෝ පැතිකඩවලින් ඔවුන් අසරණ බවත් පර්යේෂණ කණ්ඩායමට නිරීක්ෂණ විය. ඔවුන්ගේ අවශ්‍යතා සහ ශක්තීන් අවබෝධ කර ගැනීම සඳහා ගැඹුරු අධ්‍යයනයක් සිදු කළ යුතු ය. තව ද, ඔවුන්ගේ යහපැවැත්ම උදෙසා ක්‍රියාමූල පර්යේෂණයක් සිදු කිරීම වඩාත් යෝග්‍ය ය.

# ආශ්‍රිත ග්‍රන්ථ


දමයන්ති, එම්.කේ.එන්. සහ බුලන්කුලම, එස්.ඩබ්.පී.කේ., 2006. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිය, කොළඹ: හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, පර්යේෂණ අංක 41 (සිංහල මුද්‍රණය).

Bennell, P., 2007. *Promoting Livelihood Opportunities for Rural Youth*, Rome, IFAD.

Available at: http://www.ifad.org/events/gc/30/roundtable/youth/benell.pdf [accessed 17th June 2012].

Butt, T., 2011. Role of Rural Youth in Agricultural and Rural Development: A self perceived case study of Okara District, Punjab, Pakistan, *Journal of Agricultural Extension and Rural Development,* Vol. 3(2), pp. 23-28, February 2011. Available at: http://www.academicjournals.org/jaerd/PDF/Pdf%202011/February/Butta%20et%20al.pdf [accessed 27th June 2012].

Chandrasiri, C. and Karunagoda, K., 2011. "Youth Perception on Farming as an Occupation: Case Study in Polonnaruwa District", *Annals of the Sri Lanka Department of Agriculture*, 13, 35-46.

Clawson, D.L., 1985. "Harvest Security and Intraspecific Diversity in Traditional Tropical agriculture". *Economic Botany*. vol. 39, no. 1, pp. 56–67

Damayanthi, M.K.N. and Gamage, D., 2011. Transformation of Smallholder Agriculture Sector in Sri Lanka, An annotated Compendium of Statistics, Colombo: Hector Kobbekaduwa Agrarian Research and Training Institute

Damayanthi, M.K.N. and Nanayakkara, V.K.., 2008. Impact of the Provncial Council System on the Smallholder Agriculture in Sri Lanka, Colombo: Hector Kobbekaduwa Agrarian Research and Training Institute

Department of Census and Statistics, 2002. Census of Agriculture – 2002 Sri Lanka-Small Holding Sector, Colombo: Department of Census and Statistics.

Department of Census and Statistics, 2009. Labour Force Survey-2009, Colombo: Department of Census and Statistics.

Dixon, J., Taniguchi, K. and Wattenbach, H., (eds) 2003. Approaches to Assessing the Impact of Globalization on African Smallholders: Household and village economy modeling, proceedings of a working session on Globalization and the African Smallholder study, Rome: FAO.

Fernando, L., 2002. Youth and Politics: Why they Rebel? In *Sri Lankan Youth: Challenges and Responses*, Hettige, S.T., and Mayer, M. (ed.), Colombo: Ebert Stiftung.

Geest, van, der., 2010. Rural Youth Employment in Developing Countries: A Global View, Rome: FAO. Available at: http://typ03.fao.org/fileadmin/user_upload/faoilo/ pdf/Vandergeest_2010_ RurYouthEmpl150_ppi.pdf [accessed 17th June 2012].

Gamage, D. and Damayanthi, M.K.N., 2012. *Major Dimensions of Contemporary Smallholder Agriculture Sector in Sri Lanka*, Colombo: HARTI.

Ganesh, T. and Raghav, G., 2011. Smallholder Farming in Asia and the Pacific: Challenges and Opportunities, Conference proceedings on new directions of smallholder agriculture, Rome: IFAD. Available at: http://www.ifad.org/ events/agriculture/doc/papers /ganesh.pdf [accessed 12 July 2012].

Government of Ceylon, 1967. Youth in Ceylon Part I &II, Sessional Paper III, February 1967, Colombo: The Government Press.

Hazell, P.and et. Al., 2007. The Future of Small Farms for Poverty Reduction and Growth, International Food Policy Research Institute (IFPRI), 2020 Discussion Paper 42, Washington D.C.: IFPRI. Available at: http://www.ifpri.org/sites/default/files/publicati ons/vp42.pdf [accessed 12 June 2012].

Heltberg, R. and Vodopivec, M., 2008. "Sri Lanka: Unemployment, Job Security and Labour Market Reform", *The Peradeniya Journal of Economics*. 2(1& 2) available at http://www.arts.pdn.ac.lk/econ/ejournal/v2/C_Heltberg-article.pdf. accessed [accessed 3 March 2012].

Hennessy, T.C. and Rehman, T.n.d. An Investigation in to Factors Affecting the Occupational Choices of Nominated Farm Heirs in Ireland, working paper 04-WP-Re-01. Ireland: The Rural Economy Research Centre. Available at www.agreresearch teagasc.ice/rerc/down [accessed 3 March 2012 ].

Hettige, S.T. and Mayer, M., 2002. *Sri Lankan Youth: Challenges and Responses*, Colombo: Friedrich Ebert Stiftung.

Ibarguen, C., 2004. Poverty and Youth Issues in Sri Lanka, briefing paper series, poverty brief 5-2004, Colombo: Centre for Poverty Analysis.

Jayatissa, R.L.N., Seneviratne, D.G.P. and Sankar, M.S.S.G., 2005. "Performance, Consequence and Strategies in Relation to Rural Youth Out Migration from Agriculture in Sri Lanka: Critical Overview and Needed Policy Matrix", Paper presented at COE/JEPA International Conference, Kobe, Japan, 17-18 December 2005.

Karunagoda, K., 2004. "Changes in Labour Market and Domestic Agriculture". *Sri Lanka Journal of Agricultural Economics*, 6 (1), 82-97. Available at: www.slageconr. net/sjae/sjae61f/sjae06106.pdf [accessed 3 March 2012].

Livingstone, S., 2011. "Agriculture's Future Depends on Attracting the Next Generation: put youth in the picture" in *The Weekly Times*, January 26, 2011. Opinion, Available at: http://www.marcusoldham.vic.edu.au/_literature_82236/Journal_Put_Youth_In_The_P icture [accessed 01 March 2012].

24 18 3

Lundell, A., 2007. *Voice of Sri Lanka's Youth: Aspirations and Perceptions of Freedom and Possibilities*, Sweeden: Vaxjo University. Available at: www.diva-portal.org [accessed 3 March 2012].

Ministry of Labour Relations and Manpower, 2006. National Policy for Good Jobs in Sri Lanka, Colombo: Ministry of Labour Relations and Manpower

Ministry of Labour Relations and Manpower, Central Bank of Sri Lanka and Department of Census and Statistics, 2009. Labour and Social Trends in Sri Lanka 2009, Colombo: Ministry of Labour Relations and Manpower.

Nanayakkara, A.G.W., 2004. Employment and Unemployment in Sri Lanka - Trends, issues and options, Colombo: Department of Census and Statistics.

National Youth Service Council, 2009. National Survey on Needs of Youth in Sri Lanka-2008/09, Maharagama: National Youth Service Council

Rathnayake, I. and Fernando, P., (Ed.) 2009. Opportunities for the Productive Poor: perspectives on Agriculture and rural livelihoods in Sri Lanka, Colombo: Centre for Poverty Analysis.

Rathnapala, N., 1982. The Role of Youth in the Process of Political Decision Making in Seminar Report, Colombo: Sri Lanka Foundation Institute.

Sessional Paper No.1-1990, Report of the Presidential Commission on Youth, Colombo: Department of Government Printing.

Sharma, A., 2007. The Changing Agricultural Demography of India: Evidence from a Rural Youth Perception Survey. *International Journal of Rural Management*, 3 (1). 27-41 available at http://irm.sagepub.com/cgi/content/abstract/3/1/27 [accessed 1 March 2012].

Siddhisena, K.A.P., 2005. Socio-Economic Implications of Ageing in Sri Lanka: An Overview, Oxford Institute of Ageing Working Paper Available at: www.ageing.ox.ac.uk/files/ workingpaper_105.pdf [accessed 2 March 2012].

Silva, K.T, Sivapragasam, P.P. and Thanges, P., 2009. Casteless or Caste-blind? Dynamics of Concealed Caste Discrimination, Social Exclusion and Protest in Sri Lanka, Colombo-Chennai: Kumaran Book House.

Spiller. Achim., & Voss. Julian., 2006. Vocational Training in the Field of Agriculture: empirical results, Germany: University of Goettingen. Available at: http://ageconsearch. umn.edu/bitstream/7876/1/cp070024.pdf [accessed 15 June 2012].

Vodopivec, M. and Arunatilake, N., 2008. The Impact of Population Ageing on the Labour Market: The Case of Sri Lanka, Discussion Paper No. 3456, Germany: IZA. Available at: ftp.iza.org/dp3456.pd. [accessed 2 March 2012].

World Bank, 2003. Reaching the Rural Poor: A renewed Strategy for Rural Development, Washington, D.C.: World Bank. Available at: http://www.worldbank.org [accessed 17 June 2012].

Xia, Q., N.d. How the Chinese Rural Workers Choose Occupation: A Case Study of Nine Villages in the Northeast China. Available at: www.cepr.org/meets/wkcn/7/746/papres/ Xia.pdf [accessed 3 March 2012].

Zhoul, Y., 2010. Smallholder Agriculture, Sustainability and Syngenta Foundation, New Delhi: Syngent Foundation Availble at:http://www.synegentfoundation.org.temp/Smallholder _Agriculture__Sustainability_and_the_Syngenta_Foundation.pdf [accessed 17 May 2012].

242193

P.O. Box 1522
Colombo
Sri Lanka

Tel: 94112696981
94112696437
Fax: 94112692423

E-mail:library@harti.lk

Web : www.harti.gov.lk

ISBN 978-955-612-158-2

Rs 300/-

National Digitization Project

*National Science Foundation*

Institute : National Science Foundation

1. Place of Scanning : Sanje (Private) Ltd, Hokandara
2. Date Scanned : 02/06/2017
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : Angelo Melvin Luwis

Signature : A. M. Luwis

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Information Officer

Name : Renuka Sugathadasa

Signature : K.P. Sugathadasa

Date : 02/06/2017

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*